# SAMANTA KÚṬA WARṆANÁ,

BY THE

VENERABLE VÉDÉHA MAHÁ STHAVIRA.

*Principal of the Pratirája Parivéna.*

[illegible]

TRANSLATED INTO SIṆHALESE AND EDITED BY


W. ṢRÍ SIDDHÁRTHA DHARMÁNANDA,

*High Priest, Principal of the Dhammachétiya Parivéṇa at Ratmaláṇa;*

AND

MAHAGODA SIRI ÑÁṆISSARA THÉRA,

*M.R.A.S.(C. B.), Vice Principal, Vidyódaya Oriental College;*


AT THE SUGGESTION OF THEIR TEACHER,

THE VEN. H. SIRI SUMAṄGALA,

*M.R.A.S.; Chief Náyaka Théra of the Western Province and of the Ṣrípáda; Principal of the Vidyódaya Oriental College, Colombo.*

SECOND EDITION.


J. D. FERNANDO. PRINTER, BOOK SELLER & AGENT FOR Govt. School Books COLOMBO.



COLOMBO:

H. C. COTTLE, GOVERNMENT PRINTER, CEYLON.

1910.

# සමන්තකූටවණ්ණනාව.

ප්‍රතිරාජ පරිවෙණාධිපති

පූජ්‍යාචාර්ය්‍ය වෛදේහ මහාස්වාමිපාදයන්වහන්සේ විසින්

විරචිතයි.

---

කොළඹ මාලිගාකන්දේ විද්‍යෝදය පරිවෙණාධිපති

**පූජ්‍යාචාර්ය්‍ය හික්කඩුවේ ශ්‍රීසුමඞ්ගලාභිධාන**

දකුණු බටහිර පලාත් සහිත

ශ්‍රීපාදස්ථානයෙහි ප්‍රධාන සඞ්ඝනායක ස්වාමිපාදයන්වහන්සේගේ ශිෂ්‍යවූ

රත්මලානේ පරමධම්මචේතිය පරිවෙණාධිපති

**ආචාර්ය්‍ය වලානේ ශ්‍රී සිද්ධාර්ථ ධම්මානන්ද නායකස්වාමීන් සහ**

විද්‍යෝදය පිරිවෙණේ උපප්‍රධාන

**ආචාර්ය්‍ය ශ්‍රී ඥානේශ්වරාභිධාන මහගොඩ සාමීන් විසින්**

**සකස්කොට ලියනලද පදාර්ථවර්ණනා සමෙතයි.**

**ආර්තර් හැමිල්ටන් ගෝර්ඩන් ලඞ්කෙශ්වරොත්තමයන් විසින්**

පිළිගන්නාලදී.

---

කොළඹ:

එච්. සී. කොට්ල්, ලංකාවේ රාජකීය මුද්‍රායන්ත්‍රාලයෙහි

ප්‍රධානතැන විසින් මුද්‍රණය කරනලදී.

2433.

TO

HIS EXCELLENCY

THE HONOURABLE ARTHUR HAMILTON GORDON,

KNIGHT GRAND CROSS OF THE MOST DISTINGUISHED ORDER OF
ST. MICHAEL AND ST. GEORGE,

GOVERNOR AND COMMANDER-IN-CHIEF IN AND OVER

THE ISLAND OF CEYLON,

ETC. ETC.

AS A TOKEN OF GRATITUDE FOR THE ENCOURAGEMENT OF
ORIENTAL LITERATURE AND THE
PATRONISING OF THE PRINCIPAL SEATS OF LEARNING IN THE COLONY,

This Work is respectfully inscribed by

THE EDITORS.

శ్రీ [illegible]

## INTRODUCTION.

THE "Samanta Kúṭa Warṇaná" is a Páli poem composed by a renowned Elder of the Buddhist Church, named Védéha, about six hundred and fifty years ago, at the request of Ráhula Mahá Thera, an Abbot of the Brotherhood. The name of the poet is quite familiar to the student of Páli literature as the author of several excellent works, including the only ancient Siṇhalese grammar now extant, "The Sidatsangaráwa."

The author has introduced his poem, entitled "A Description of the Peak," with a life of Gautama Buddhá, describing in detail many extraordinary incidents in his history. In the course of the narrative of Buddhá's visits to Laṇká, the poet takes occasion to describe, in glowing language, many parts of the Island, little known or explored at that time,--its hills and dales, mountains and rivers, especially the Kẹlaṇi and the Mahavẹli-gaṇga—their fountains and scenery.

The descriptions of mountains and rivers, some by name, are truthful, though poetic. Forests and cities and their inhabitants are vividly depicted. Every part is duly apportioned and put in its proper place; and the whole poem is replete with chaste and beautiful imagery, clothed in language at once graceful and elegant,—all showing the master-hand of one who was a poet born and bred.

The want of a Siṇhalese paraphrase to this work has, however, deterred beginners in Páli studies from taking full advantage of its attractive contents. The Editors have, therefore, endeavoured to supply this need by subjoining a Siṇhalese translation to the Páli text.

In this work, as well as in that of revising and settling the text, we have received, and beg to acknowledge with thanks, the able assistance of our learned tutor, H. SUMAṄGALA, Mahánáyaka Théra, the celebrated Principal of the Vidyódaya Parivéṇa.

We trust that the work, as now presented, will facilitate its study, and attract greater attention from students of the Páli classics.

W. DHARMÁNANDA.

M. ÑÁṆISSARA.

*Parama Dhammachétiya College,*

*Ratmaláṇa, May 4, 1890.*

## විඥාපනය.

සුමනකූටවර්ණනා නම්වූ මෙම මාගධී පද්‍යප්‍රබන්ධයෙහි අප මහබෝසතාණන් තුසිත දිව්‍යලෝකයෙහි "සන්තුසිත" දිව්‍යපුත්‍රව උපන් තැන් පටන් අනවැස්සක් සමගවූ උරුවෙල්කසුප් මහතෙරුසාණන්ගේ අග්‍රඵලප්‍රාප්තිය දක්වා ඇති ශෞද්ධෝදනී සම්බුද්ධචරිතය සම්පූර්ණයෙන් ප්‍රකාශවී තිබේ

එම ශාක්‍යමුනීන්ද්‍රචරිතය ප්‍රකාශවූ බෝධිවංස, ධාතුවංස, ජිනචරිතාදි වෙනත් නොයෙක් ග්‍රන්ථ ඇති නමුත් ඒ එකම ප්‍රකරණයකින් වත් ප්‍රකාශ නොවන සෞගත චරිත රාශියක් විශේෂවශයෙන් මෙහි ප්‍රකාශවෙයි.—එනම් අප බුදුන් ලක්දිව් වැඩි ගමන් ආදියයි. මේ ප්‍රකරණ කර්තෘ ආචාර්යයන්වහන්සේගේ මුඛ්‍යාපේක්ෂාවත් ඒම විෂයුතුයි. ඒ අප ගෞතම මාහිමියානන් ලක්දිව් වැඩි ප්‍රස්තාවන්හිදී ලක්දිව යක්ෂභය සංසිඳවීම්, නාග දබර සංසිඳවීම්, කැලණි වැඩි ගමන්, සමන්දෙව්රජුන් අයදිමින් සමන්කූළ පව්වෙහි සිරිපාලකුණු පිහිටුවීම්, ආදිය මෙහි විසදකොට දක්වා තිබෙන හෙයින් විශිෂ්ට සම්බුද්ධචරිත රාශියක් මෙහි ප්‍රකාශ වන බව වැඩිදුරටත් සැලකියයුතුයි. එසේ ඒ විශේෂවර්ණනාප්‍රකාශයෙහිදී ලංකාවේ ඒ ඒ පලාත් විශේෂ හා ඒ ඒ පලාත්වල පර්වතාදීන්ගේ විශේෂවිභාගද, කැලණි, මහවැලි ආදි ගඞ්ගා සම්භවාකෘතිද මනාසේ විභාවනයකොට තිබේ.

ග්‍රන්ථකරණයෙහි ප්‍රාප්තස්ථානයන්හි ප්‍රමාණ සලකා කවිජනයන්ගේ සිත් දිනාගන්නාලෙස පුරවර්ණනා වන වර්ණනාදියෙන් සාලඞ්කෘතකොට තිබෙනහෙයින් ඡන්දෝලඞ්කාරාදියෙන්ද සමුල්ලසිත බව පෙනෙයි.

එහෙයින්ම ලංකාවේ මාගධී කාව්‍ය කර්තෘවරයන් විසින් මෙම පද්‍යබන්ධනය සමාදරයෙන් පරිශීලනය කරගෙණ එන සිරිත මේ දක්වා පවතිනවා මෙන් ධාතුවංස, අත්තනගලුවංස, ජිනචරිතාදි උසස් පඞ්ක්තියේ මාගධී කාව්‍ය විෂ

යෙහි මෙම සමන්තකූටවණ්ණනා නම් පාලිකාව්‍යයත් වෘද්ධ පණ්ඩිතයන් විසින් බුහුමන්පෙරටුව පිළිගන්නාලදී.

මෙම ගාථාමය ප්‍රකරණයෙහි ගෞරවය මාගධී කාව්‍ය භාවිතාර්ථයෙහි තත්පරවූ වෘද්ධජනයන් විෂයෙහි ස්වතඃසිද්ධයි. මෙහි කාලය කලිකාලසාහිත්‍ය සර්වඥපණ්ඩිත පරාක්‍රමබාහු මහරජතුමන්ගේ කාලය හෙයින් පූජ්‍යපණ්ඩිතයන්ගෙන් ලඞ්කාව එකොහාස කාලයයි.

මීට අර්ථවර්ණනාවක් කොට අපේ ධර්මාචාර්‍ය්‍යොත්තම විද්‍යොදයපිරිවෙන් මාහිමියානන්ට ආචාර්‍ය්‍යප්‍රාභෘතයක් වශයෙන් පුදනලෙස රත්මලානේ පරමධම්මචෙතියාරාමවිහාරාධිපති අපගේ ආචාර්‍ය්‍යවූ දෙහිපිටියේ සඞ්ඝරක්ඛිතාභිධාන ස්ථවිර ස්වාමිපාදයන් විසින් කරණලද ආරාධනාව පිළිගෙණ අපේ ඤාණිස්සරාභිධාන යතින් සමග මෙම අර්ථවර්ණනාව ලියා ඉන් සුදු, යථොක්ත විද්‍යොදයපරිවෙණාධිපති අපේ ආචාර්‍ය්‍යොත්තම ශ්‍රීසුමඞ්ගලාභිධාන නායකස්ථවිරස්වාමිපාදයන්වහන්සේගේ විශිෂ්ටොපදෙශයෙන් ශුද්ධකරණලදී.

අපේ මේ අර්ථව්‍යාඛ්‍යානයට පෙර තුබුනැයි අසනුලැබී දුකසේ සොයාගන්නාලද මෙහි ගැටපද පත්ඉරු තුණ ඉවහල්වූ බව සතුටින් මතක්කරමු.

යථොක්ත අප ආචාර්‍ය්‍යොත්තම විද්‍යොදයපරිවෙණාධිපතීන් වහන්සේ විසින් මේ පොත සම්බන්ධ කාරණ ලඞ්කාණ්ඩුකාර උතුමානන්වහන්සේට මතක්කරණලදින්, එම අති ගෞරවාර්හ ශ්‍රීමත් ආර්තර් හැමිල්ටන් ගෝර්ඩන් ලඞ්කාණ්ඩුවරොත්තමයන්ගේ අණුවපිට රාජකීය මුද්‍රායන්ත්‍රාලයෙහි මුද්‍රණය කර වනලදී.

මුද්‍රණයෙහිදී එහි ප්‍රධානතැන්පත් ස්කීන් මහතා සහ උප ප්‍රධානවූ කොටල් මහතාත් ඉතා ඕනෑකමින් සහ සැලකිල්ලෙනුත් මෙහි කටයුතු ඉෂ්ටකළ බවද මතක්කරමු.

මෙම්වහට, වලානේ ධම්මානන්ද ස්ථවිරයෝය.

ශ්‍රී බු. ව. 2433 වෙසක්පුර 15වක් ලත් රිවි දින
රත්මලානේ පරමධම්මචෙතිය පිරිවෙණේදීය.

J. D. FERNANDO, PRINTER, BOOK SELLER & AGENT FOR School Books, COLOMBO.



## PREFACE TO THE SECOND EDITION.

THE Páli poem "Samanta Kúṭa Warṇaná," with our paraphrase, was for the first time printed at the Government Printing Press in 1890, by permission of Sir ARTHUR HAMILTON GORDON, then Governor of Ceylon, whose ardent zeal for the promotion of Oriental studies has produced a most beneficial result, and whose name will therefore be long remembered by the Oriental scholar with feelings of gratitude.

The students of the Páli classics are at present put to no little inconvenience to procure a copy of the first edition, the whole stock of available copies having been within a few years exhausted by the increasing demand for it.

We have, therefore, to acknowledge with the deepest gratitude the great help rendered by the Venerable Principal of this College by securing to us from the Government permission to reprint this edition at the Government Printing Press. We have also to thank Mr. H. C. COTTLE, Government Printer, and Mr. H. M. RICHARDS, Assistant Government Printer, for so kindly seeing the work through the press.

THE EDITORS.

*Vidyódaya Oriental College,*
*Máligákanda, October 29, 1910.*

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය

## සමන්තකූටවණ්ණනා

ද්විතීය මුද්‍රාඞ්කනය.

සන්න සහිත මෙම සමන්තකූටවණ්ණනාව 1890දී (මින් අවුරුදු විස්සකින් ඔබ්බෙහිදී) සාර් ආර්තර් හැමිල්ටන් ගෝර්ඩන් ලඞ්කේශ්වරොත්තමයන්ගේ භාෂාශාස්ත්‍රාන්තර ප්‍රචාරාභිලාෂා සහගත කරුණාඥයෙන් ආණ්ඩුවේ මුද්‍රායන්ත්‍රාලයෙහි මුද්‍රිතවිය,

ඒ මුද්‍රණ කල පොත් ඉන් අවුරුදු කීපයකින් නිමාවටම තදභිලාෂීන් අතට යාමෙන් දුර්ලභවී ආධුනිකයන්ට පොත නොමැත්තෙන් බොහෝ කරදර විඳින්ට සිදුවිය, එබැවින් පළමු වාරයෙහි මෙන් මේ දෙවෙනි වාරයෙහිත් විද්‍යෝදය පරිවෙණාධිපති අප මාහිමියානන්වහන්සේ විසින් මේබව ලඞ්කාණ්ඩුවට මතක්කරණලදින් ආණ්ඩුවේ භාෂාශාස්ත්‍රාන්තරානුග්‍රාහක අඥාදානයෙන් පෙරසේම ආණ්ඩුව ගණෙන් මුද්‍රණයට පමුණුවනලදී.

මුද්‍රණයේදී රාජකීය මුද්‍රණාලයේ ප්‍රධාන තැන්පත් එච්. සී. කොටල් මහතා සහ එහි උප ප්‍රධාන තැන්පත් එම්. ඇම්. රිචර්ඩ්ස් මහතාත් ආදර සැලකිල්ලෙන් මෙහි කටයුතුකර දුන්බව සතුති පෙරටුව සඳහන් කරමු.

ව්‍යාඛ්‍යා කර්තෘවරු.

$\frac{2454}{1910}$ ඔක්තෝබර් මස 29 වෙනි දින
කොළඹ මාලිගාකන්දේ විද්‍යෝ
දය පිරිවෙණේදීය.

## ප්‍රස්තාවනා.

නමාම සාරයනමාමකාසකිං
සකිං මහාකාරමහානතිප්පභං,
පභඞ්කරං සඞ්කරසාබුද්ධස්සිනං
සිනං ජනන්තස්ස ජනන්තකාරිනං.

නමාමරාමායනමාමරායනං
යනං නිරොධස්ස නිරොධමග්ගදං
ගදං මුනින්දස්ස මුනින්දපූජිතං
ජිතප්පදං ධම්මපදං පරායණං.

නමාම සන්තං පනමාම සඟගුණං
ගුණප්පදං ධම්මපදං සුබොධිතං,
ධිතඞ්ගසුඛිං තරණුඛිදූනිරං
නිරඞ්ගණං තං ගණනීරජාකරං.
(සන්ධියමකා.)

---

විවාදිසන්දෙහපදප්පධංසිනා
පසත්ථසත්ථන්තරපාරදස්සිනා,
විදූහ වෙදෙහ මහාසිවෙසිනා
කතා කතා යා සුමනාදිවණ්ණනා.

තස්සාත්ථජාතමවගන්තුමනප්පපඤ්ඤා,
පඤ්ඤාතතානතිනිපුණා නිපුණත්ථදස්සී,
හොනතිප්පභූ න පහවො කිල යෙ'ප්පපඤ්ඤා,
තන්නං හිතත්ථවරමත්ථ සමිජ්ඣතූති.

විනීතවාණී නිජවාණිරීතියා
පාඨප්පසුඛීකරණානුපුබ්බකං,
විතන්විතුන්තං හතසබ්බකිබ්බිසා
වනපාරිතෙහාම මයං මනන්තකා.

## සමන්තකූටවර්ණනාව.

"සංඥං නිමිත්තං කර්ත්තාරං පරිමාණං ප්‍රයොජනම්,
ප්‍රාගුක්ත්වා සර්වතන්ත්‍රාණං පශ්චාත්තන්ත්‍රානුවර්ණයෙත්."

යනු ප්‍රාක්තනාචාර්ය්‍ය වචනහෙයින් ප්‍රථමකොට සංඥාද්‍යර්ථ පඤ්චක විභාවනය වර්ණනාකාරයන්ගේ පුරොභාග්‍ය ධර්මතාවක්ව තිබේ. එහෙයින් එකී ආචාර්ය්‍ය වචනානුසන්තව "සමන්තකූට වර්ණනා" නම්වූ මෙම පද්‍යප්‍රකරණය සම්බන්ධ සංඥාද්‍යර්ථ පඤ්චකය යථාක්‍රමයෙන් දක්වනු ලැබේ.

**සංඥා**—"සමන්තකූට වර්ණනා" යනු මෙහි සංඥා (නාම)යි. හුදෙක් සමන්තකූට පර්වතය සම්බන්ධ වර්ණනාවම නොව තදාශ්‍රිත අන්‍යාර්ථ ප්‍රබන්ධ ඇතද මුඛ්‍යවශයෙන් සමන්තකූට පර්වත වර්ණනාවිෂයකොට ග්‍රන්ථකර්තෘ ආචාර්ය්‍යයන්වහන්සේ ප්‍රකරණ ක්‍රියායෙහි ප්‍රසක්තහෙයින් අන්වර්ථ වශයෙන් මේ ප්‍රකරණය "සමන්තකූට වර්ණනා" නම් වී.

**නිමිත්ත**—බාහ්‍යාභ්‍යන්තර වශයෙන් විවිධයි—ඉන් බාහ්‍ය නිමිත්තනම්, අරණ්‍යවාසී රාහුල මහාස්ථවිරොත්තමයන්වහන්සේගේ ආරාධනාවයි; අන්තර්නිමිත්ත හෙවත් අභ්‍යන්තර නිමිත්තනම්, මේ ප්‍රකරණ පරිශීලනයෙන් පශ්චිම ජනතාවට අර්ථසිද්ධියක් උවමැනව යන කරුණාපරචෙතනායි.

**කර්තෘ**—කවිකුලතිලකායමාන වනරත්නානන්දාභිධාන මහාස්ථවිරොත්තමයන්වහන්සේගේ ශිෂ්‍යවූ, කලිකාලසාහිත්‍ය සර්වඥපණ්ඩිතපරාක්‍රමබාහු මහරජානන්ගේ ප්‍රතිරාජදෙව නම් ඇමතියානන් විසින් කරවනලදහෙයින් ප්‍රතිරාජ නම් පිරිවෙන්හි අධිපතිවූ බ්‍රාහ්මණවංශොද්භූත පූජ්‍යාචාර්ය්‍ය වෛදෙහ මහාස්වාමිපාදයෝයි.*

---

* මහානාම රජු දවස අර්ථකථාචාර්ය්‍ය බුද්ධඝොෂ මහාස්ථවිර ස්වාමින් පටන් කලිකාලසාහිත්‍යසර්වඥපණ්ඩිතපරාක්‍රමබාහු මහරජානන් කාලය දක්වා ඇතිවූ ග්‍රන්ථකරණාදියෙන් බොහෝ ශාසනසංග්‍රහ කළ උතුමන් "ශාසනාවතාර" නම් ප්‍රකරණයෙහි "යටකී මහානාමරජු දවස බුද්ධඝොෂ නම් අටුවාචාරී මහාස්ථ

**පරිමාණ**—ප්‍රථම මාරවිජයකථා, ද්විතීය මාරවිජයකථා, තෘතීය මාරවිජයකථා, චතුර්ථ මාරවිජයකථා, පඤ්චම මාරවිජයකථා, ෂෂ්ඨ මාරවිජයකථා, සප්තම මාරවිජයකථා, අෂ්ටම මාරවිජයකථා, නවම මාරවිජයකථා, දශම මාරවිජයකථා, එකාදශම මාරවිජයකථා, (තත්සාමාන්‍ය) අභිසම්බෝධිකථා, ප්‍රථම සප්තාහ, ද්විතීය සප්තාහ, තෘතීය සප්තාහ, චතුර්ථ සප්තාහ, පඤ්චම සප්තාහ, ෂෂ්ඨ සප්තාහ, සප්තම සප්තාහ, ලබ්ධකාය ප්‍රථමාගමනකථා, ද්විතීයාගමනකථා, කල්‍යාණීදේශාගමනකථා, සමන්තකූට වර්ණනාකථායයි, භාගවශයෙන් දෙවිස්සක්, ගාථාවශයෙන් ෂණ්ණවත්‍යධික සප්තශත* ගාථාකෙනෙක් වෙති.

**ප්‍රයෝජන**—මෙම කථාප්‍රබන්ධය දැනගැණීමෙන් ලෝකයාගේ ශාස්ත්‍රාගම ප්‍රවෘත්තිය හා එසේසින්ම රත්නත්‍රය කෙරෙහි භක්තිශ්‍රද්ධාතිශය ඇතිවීමෙන් සර්වදුඃඛක්ෂයවූ ශාන්තසුඛ ප්‍රාප්තියෙහි කෞශල්‍යයයි.

මේ මෙහි සංක්ෂිප්තපඤ්චකවිභාවනයයි.

---

විරපාදයන් පටන් මේ අතුරෙහි බුද්ධදින්නය, ධම්මපාලය, ජෝතිපාලය, ඛේමය, ධර්මශ්‍රීය, නන්දය, ආනන්දය, අනුරුද්ධය, උපතිෂ්‍යය, බුද්ධරක්ෂිතය, මෞද්ගල්‍යායනය, යනාදි ආචාර්ය මහාස්ථවිරයන් හා එකශ්‍රැතින් නෛකසහස්‍ර ග්‍රන්ථධාරණයට සමර්ථවූ වජ්‍රඥානඇති ශාරිපුත්‍ර මහාස්වාමිපාදයන් පටන් සංඝරක්ෂිතය, සුමඞ්ගලය, වාගීශ්වරය, ධර්මකීර්තිය, නාගසේනය, ආනන්දය, වෛදේහය, බුද්ධප්‍රියය, අනවමදර්ශිය, යනාදී මහාස්ථවිරයෝ නොයෙක් ටීකාටීකා හා තත්ප්‍රවේශෝපායවූ අනෙකප්‍රකාර ධර්මප්‍රබන්ධ හා සන්න ගැට පද පිටපත් ආදිය උපදවා බුදුන්ගේ පර්ය්‍යාප්ති ශාසනය බැබලූහ" යනාදීන් දක්වා තිබෙන ආකාර සලකාගැන්මම ග්‍රන්ථ ගෞරවය හා ග්‍රන්ථකර්තෘ ආචාර්ය්‍යයන්ගේ ගෞරවියපිණිසත් ප්‍රමාණවෙයි.

* ග්‍රන්ථකර්තෘ සන්දර්ශනාදි ජේතනක ෂඩ්ගාථා හැරයි.

## ERRATA. ශුද්ධිපත්‍රය.

| පිට. | පෙළ. | අශුද්ධ. | ශුද්ධ. |
|---|---|---|---|
| 2 | 20 | ඝරලණ්ලද | ඝරණ්ලද |
| 6 | 8 | නිච්ඡං | නිච්චං |
| 8 | 28 | මෙමෙහසි | මෙමෙහසී විය |
| 12 | 23 | ඤාතිඞ්ඝස්ස | ඤාතිසඞ්ඝස්ස |
| 20 | 5 | තෙ | තා |
| 20 | 19 | තෙසකෙ, ඒ සවකීය | සකෙ, සවකීය |
| 20 | 20 | කඤ්ඤා, කනකමෙව් | තා කඤ්ඤා, ඒ කනකමෙව් |
| 21 | 21 | නෙකානී | අනෙකානි |
| 25 | 2 | පසෙතනා | පසෙතතා |
| 26 | 26 | කෙසකලපය | කෙශකලාපය |
| 27 | 21 | ඒ හත්සළුව | තං, ඒ හත්සළුව |
| 29 | 16 | පුරස්ත්‍රීන්ගේ | පුරස්ත්‍රීන්ගේ, සොම්ම, සෙඅම්මවූ ; |
| 37 | 26 | තලිය | තළිය |
| 40 | 7 | සතත | සතතං |
| 59 | 3 | වනසසති | වනප්පති |
| 59 | 14 | වනාසපති | වනප්පති |
| 65 | 12 | ධාවිංසු | හාහසා, අහසින්, ධාවිංසු |
| 66 | 28 | දුම්මනො | දුම්මනොහුත්වා, අසන්තු ෂ්ටසිත් ඇතිව ; |
| 68 | 9 | පතිසුං | පතිංසු |
| 92 | 9 | කුඹෙ | කුඹො |
| 98 | 22 | ජයමඞගලං | මහන්තං, මහත්වූ ; ජය මඞගලං |
| 115 | 24 | තථාඅපි | සාමි, සාමිනි ; තථාඅපි, |
| 121 | 29 | කල්ඝි ; | කල්ඝි ; ද්වෙහෝ නො හොත්, නයමානානං, සත්වයන් නිවණට පමු ණුවන්නාවූ ; විජානනං, චතුස්සත්‍යය දන් නවුන්ට ; |
| 141 | 27 | උරුනාගවනාභිධානං, | තං උරුනාගවනාභිධානං, ඒ මහා නාගවනය ; |
| 142 | 10 | තුන්කළු | තුන්කුළු |
| 142 | 14 | තුඹුනු දිය | තුඹු නදිය |
| 152 | 31 | ආකාසි | අකාසි |
| 155 | 31 | ඕතුයා | දුහිතුයා |
| 157 | 17 | පොහොසත්මි | පොහොසත්මි, ගජ්ජනං ගජ්ජයන්තා, ගර්ජනා කරන්නාවූ ; |
| 174 | 27 | නිගගත | පරිනිගගත |

සන්න සහිත

# සමන්තකූට වර්ණනාව.

## SAMANTAKÚṬA WARṆANÁ.

නමො තස්ස භගවතො අරහතො
සම්මාසම්බුද්ධස්ස.

1. සතතවිතතකිත්තිං ධස්තකන්දප්පදප්පං
තිභවහිතවිධානං සබ්බලොකෙකකෙතුං,
අමිතමතිමනග්ඝං සන්තිදං මේරුසාරං
සුගතමහමුදාරං රූපසාරං නමාමි.

---

"අහං සුගතං නමාමි" යනු මෙහි ක්‍රියාකාරකපදසම්බන්ධයි. අහං, මම; සුගතං, සර්වඥයන්වහන්සේ; නමාමි, වඳිමි.

(කෙබඳුවූ සර්වඥකෙනෙක්ද යත් ?)

1. සතත, අනවරතයෙන්; විතත, පතළාවූ; කිත්තිං, ("ඉතිපි සො භගවා අරහං" යනාදීන් උක්ත) කීර්තිඇති; ධස්ත, නසනලද; කන්දප්පදප්පං, අනඞ්ගාභිමාන ඇති; තිභව, භවත්‍රයට; හිතවිධානං, අභිවෘද්ධි කරන්නාවූ; සබ්බලොක, මුළුලොවට; එකකෙතුං, අද්විතීයධ්වජයක් වැනිවූ; අමිතමතිං, අප්‍රමාණප්‍රඥාතිශය ඇති; අනග්ඝං, අනර්ඝවූ; සන්තිදං, ශාන්ති සඞ්ඛ්‍යාත නිර්වාණය දෙන්නාවූ; මේරුසාරං, (චතුර්විධ වීර්‍ය්‍යාධිෂ්ඨානාදි ගුණයෙන්) මහාමේරුපර්වතය මෙන් ස්ථිරසාරවූ; රූපසාරං, (ද්වාත්‍රිංශත්වර මහාපුරුෂලක්ෂණසමෙත) රූපයෙන්සාර (උතුම්)වූ; උදාරං, (ගුණයෙන්) මහත්වූ; සුගතං, සර්වඥයන්වහන්සේ; අහං, මම; නමාමි, (සකස) වඳිමි.

2. හතදුරිතතුසාරං මොහපඞ්කාපතාපං
මනකමලවිකාසං ජන්තූනං සෙසකානං,
කුමතිකුමුදනාසං බුද්ධපුබ්බාචලග්ගා
උදිතමහමුදූරං ධම්මභානුං නමාමි.

3. සකලවිමලසීලං ධූතපාපාරිජාලං
සුරනරමහනීයං පාහුණෙය්‍යාහුණෙය්‍යං,
උජුපථපටිපන්නං පුඤ්ඤක්ඛෙත්තං ජනානං
ගණමහමභිවන්දෙ සාරදං සාදරෙන.

---

2. හතදුරිතතුසාරං—හත, නසනලද; දුරිතතුසාරං, පාප නැමති තුහින ඇති; මොහපඞ්කාපතාපං, අවිද්‍යා නැමැති කැඳුම ශුෂ්ක කරන්නාවූ; සෙසකානං, සහපත් නිර්වාණමාර්ග නොවෙණිවූ; (නොහොත්) අසෙසකානං, නිරවශෙෂවූ; ජන්තූනං, සත්වයන්ගේ; මනකමලවිකාසං, චිත්තසන්තාන නැමැති පද්ම ප්‍රබොධකාරීවූ; කුමති, දුර්බුද්ධි නැමැති; කුමුද නාසං කෛරව නාශකාරීවූ; බුද්ධ, සර්වඥනැමැති; පුබ්බාචලග්ගා, උදයපර්වතාග්‍රයෙන්; උදිතං, පහළවූ; උදූරං, (ගුණයෙන්) මහත්වූ; ධම්මභානුං, සද්ධර්ම නැමැති සූය්‍ර්‍යයා; අහං, මම; නමාමි, (සකසා) වඳිම්.

3. සකලවිමලසීලං, අශෙෂ නිර්මලශීල (සකසා) ඇති; ධූත පාපාරිජාලං—ධූත, කම්පාකොට හරලණලද; පාපඅරිජාලං, පාපනැමැති ශත්‍රුසමූහ ඇති; සුරනර, දෙවමනුෂ්‍යයන් විසින්; මහනීයං, පිදියයුතුවූ; පාහුණෙය්‍ය, අමුත්තු පඬුරු පිදීමට සුදුසුවූ; ආහුණෙය්‍යං, සියලු සත්කාරයට සුදුසුවූ; උජුපථපටිපන්නං, (ආය්‍ය අෂ්ටාංගිකමාර්ගසඞ්ඛ්‍යාත) සෘජුවූ මාර්ගයට පිළිපන්නාවූ; ජනානං, සත්වයන්ට; පුඤ්ඤක්ඛෙත්තං, පුණ්‍යක්ෂෙත්‍රවූ; සාරදං, උත්තමඵල දායකවූ; ගණං, ආය්‍ය සඞ්ඝයාවහන්සේ; අහං, මම; සාදරෙන, ආදරාන්විත සිතින් යුක්තව හෙවත් ස්වකීයාදරයෙන්; අභිවන්දෙ, (සකසා) වඳිම්.

4. ඉති කළිතපණාමො හන්ත්වා සබ්බොපසග්ගෙ
සුගතවිමලපාදම්භොජසම්පාතපූතං,
සුමනසිඛරිරජ්ජං වණ්ණයිස්සං සුරානං
වසතිමතුලමෙතං සාධුජන්තූ සුණන්තු.

5. සවණා ලපනාචෙව සතියාචාපි වන්දනා,
යස්ස සම්මා සුඛී හොති නිබ්බාණඤ්චාධිගච්ඡති.

6. තස්මා සප්පුරිසෙහෙදං පත්ථෙන්තෙහි තිසම්පදං,
සවණීයංහි සාධූහි අවික්ඛිත්තෙන චෙතසා.

4. ඉති, මෙසේ; කළිත, කරනලද; පණාමො, ප්‍රණාමහෙතුවෙන්; සබ්බුපසග්ගෙ, සියලු උපද්‍රවයන්; හන්ත්වා, නසා; සුගත, සර්වඥයන්වහන්සේගේ; විමලපාදම්භොජ, නිර්මල ශ්‍රීපාදපද්මය; සම්පාත, තැබීමෙන්; පූතං, පවිත්‍රවූ; සුරානං, දෙවියන්ගේ; වසතිං, වාසස්ථානවූ; සුමනසිඛරිරජ්ජං, සමන්තකූටපර්වතරාජයා; වණ්ණයිස්සං (පද්‍යබන්ධ සම්බන්ධයෙන්) වර්ණනාකරන්නෙමි: ජන්තූ, සත්වයෝ; සාධු, මනාකොට; (නොහොත්) සාධුජන්තූ, සජ්ජනයෝතුමූ; අතුලං, අසදෘශවූ; එතං, මේ (වක්‍ෂ්‍යමාණ) වර්ණනාව; සුණන්තු, (ශ්‍රොත්‍රාවධාන කොට) අසත්වා.

5. යස්ස, යම් ප්‍රබන්ධයක් හෝ යම් (සර්වඥ) කොණේකුගේ; සවණා, (ගුණ) ශ්‍රවණයෙන්ද; ලපනාචෙව, (ගුණ) කීමෙන්ද; සතියාච, (ගුණ) සිහිකිරීමෙන්ද: අපි, නැවත; වන්දනා, (යම් සර්වඥකොණේකුට) වැඳීමෙන්ද; සම්මා, මනාකොට; සුඛී හොති, (යම්හෙයකින් ...තෙම) සුව ඇත්තේවේද; නිබ්බාණඤ්ච අධිගච්ඡති, නිර්වාණයටත් පැමිණේද.

6. තස්මා, එහෙයින්; තිසම්පදං, (මානුෂික දිව්‍ය නිර්වාණයන) ත්‍රිවර්ගසම්පත්තිය; පත්ථෙන්තෙහි, ප්‍රාර්ථනා කරන්නාවූ; සාධූහි සප්පුරිසෙහි, සාධුසත්පුරුෂයන් විසින්; ඉදං, මේ ප්‍රකරණය; අවික්ඛිත්තෙන චෙතසා, වික්‍ෂිප්තනොවූ සිතින් යුක්තව; සවණීයංහි, ශ්‍රවණය කටයුත්තේමය.

උපෝද්ඝාතයි.

ශ්‍රී ලංකා ජාතික පු...

7. යො ලොකතිලකො නාථො පූරෙත්වා දසපාරමි,
ජාතො'සි තුසිතෙ කායෙ සන්තුසිතො'ති විස්සුතො.

8. ආරාධිතො සුරාදීහි කාලො මාරිස තෙ අයං,
තිණ්ණො තාරයිමං ලොකං බහූ අප්පරජක්ඛකා.

9. එතදත්ථාය තෙ වීර පූරිතා දසපාරමී,
බාහුං පිතුස්ස පුත්තො'ව ලොකො ආලම්බතෙ තුවං.

10. තෙසං තං වචනං සුත්වා මහාසත්තො මහාමති,
ච්ලොකනෙ විලොකෙත්වා පඤ්චාමලවිලොචනො.

---

7. ලොකතිලකො, තුන්ලොවට තිලකායමානවූ; යො නාථො, යම් (ලොක) ස්වාමිකෙණෙක්; දසපාරමී. දශපාරමී ධර්මයන්; පූරෙත්වා, පුරා; තුසිතෙ කායෙ, තුසිතදෙවනිකායෙහි; ජාතො, උපන්නෙ; සන්තුසිතොති, සන්තුසිත දිව්‍ය (පුත්‍රයා)යයි; විස්සුතො, ප්‍රසිද්ධවූයෙ; අසි, වූයේද.

8, 9. මාරිස, නිදුකානන්වහන්ස; තෙ, තුබවහන්සේට; අයංකාලො, (බුදුවීමට) මේ කල් වන්නේය; තිණ්ණො, (සසර සයුරෙන්) එතරවූයෙක්ව; ඉමං ලොකං, මේ ලෝවැසිජනයා; තාරය, (සසරින්) එතර කරව; අප්පරජක්ඛකා, ප්‍රඥාචක්ෂුෂෙහි අල්පවූ රාගාදි රජස් ඇත්තෝ; බහූ, බොහෝ වෙති.

වීර, වීරයන්වහන්ස; තෙ, තුබවහන්සේ විසින්; එතදත්ථාය, මේ අර්ථය පිණිස; දසපාරමී, දශපාරමිධර්මයෝ; පූරිතා, පුරණලද්දහ; පිතුස්ස බාහුං, පියා අත (එල්ලෙන්නාවූ); පුත්තො ඉව, පුතකුමෙන්; ලොකො, ලොවැසිතෙමේ; තුවං, තුබවහන්සේ; ආලම්බතෙ, එල්ලේයයි; සුරාදීහි, දිව්‍ය බ්‍රහ්මාදීන් විසින්; ආරාධිතො, ආරාධනා කරණලද්දේද.

10. මහාමතී, මහත් බුද්ධිමත්වූ; අමලවිලොචනො, නිර්මල ප්‍රඥාචක්ෂුසැති; මහාසත්තො, ඒ මහාබොධිසත්වතෙම; තෙසං, ඔවුන්ගේ; තං වචනං, ඒ (ආයාචනා) වචනය; සුත්වා, අසා; පඤ්චවිලොකනෙ, පස්බැලුම්; විලොකෙත්වා, බලා.

11. ජම්බුදීපඞ්ගකමලෙ කණ්ණිකා'ව මනොරමා,
පුරී කපිලවත්ථු'සි විසාණා'ව සුධාසිනං.

12. සිඞ්ගික්ඛමයාභාස තුඞ්ගසිඞ්ගසමඞ්ගිතා,
මණිසීහපඤ්ජරාකිණ්ණා (1) පාසාදා යත්ථ භාසරෙ.

13. සඝනෙ ගගනෙ නිච්චං සතෙරතාසතානි'ව,
අනිලෙරිතපජ්ජොතසොණ්ණකෙතූ අභූ යහිං.

14. ජනානං නීලනෙත්තාභි වදනෙභි තු යා පුරී,
මධුපාලිසමොනද්ධ කඤ්ජනීසිරිමාවහෙ.

---

11. ජම්බුදීප, ජම්බුද්වීප නැමැති; අඞ්ගකමලෙ, උතුම්වූ පද්ම යෙහි; මනොරමා, සිත් කලුවූ; කණ්ණිකා ඉව, අන්තඃකර්ණිකාවක් වැනිවූද; සුධාසිනං, දෙවියන්ගේ; විසාණා ඉව, විෂාණ නම් රාජධානිය වැනිවූද; කපිලවත්ථු, කිඹුල්වත් නම්වූ; පුරී, නගරියක්; ආසි, වී.

12. යත්ථ, යම් පුරයෙක්හි; සිඞ්ගික්ඛමය, සිඞ්ගි ස්වර්ණයෙන් කරණලද්දාවූ; ආභාස, ආලොක ඇත්තාවූ; තුඞ්ග, ප්‍රාංශුවූ; සිඞ්ග, (ප්‍රාසාද) ශෘඞ්ගයෙන්; සමඞ්ගිතා, සමුපෙතවූ; මණිසීහපඤ්ජර, මිණිසිමැදුරෙන්; ආකිණ්ණා, ගැවසීගත්තාවූ; පාසාදා, ප්‍රාසාදයෝ; භාසරෙ, බබලත්ද.

13. යහිං, යම් පුරයෙක්හි; සඝනෙ, මෙඝ සහිතවූ; ගගනෙ, අහස්තෙලෙහි; සතෙරතාසතානි ඉව, සියගණන් විදුලි සෙයින්; අනිලෙරිත, වාතයෙන් කම්පිතවූ; පජ්ජොත, (එළෙ සින්ම) බබලන්නාවූ; සොණ්ණකෙතූ, ස්වර්ණධ්වජයෝ; නිච්චං, සතතයෙන්; අභූ, වූද.

14. යා පුරී, යම් නගරියෙක්; ජනානං, ජනයන්ගේ; නීලනෙත්තාභි, නීලවර්ණනෙත්‍රයෙන්ද; වදනෙභි තු, වක්ත්‍රයෙන්ද; මධුපාලි, භෘඞ්ගශ්‍රේණීන් විසින්; සමොනද්ධ, ගැවසීගත්තාවූ; කඤ්ජනීසිරිං, පද්මිනී විලාසයක්; ආවහෙ, උසුලන්නීද.

15. රථතුඟතුරඞ්ගෙහි ගජ්ජිතෙහිච යා පුරී,
සඞ්ඝොසුත්තුඞ්ගකල්ලොල ලොලසාගරසන්නිභා.

16. අවහමානා'ව දෙවානං පුරලච්ඡි භුජාරිව,
මන්දානිලෙරිතා තුඞ්ගනානාරාගධජා යහිං.

17. නානාවෙසධරා යස්මිං නානාභූසනභූසිතා,
නානාසම්පත්තිසංයුත්තා නානාවිජ්ජාසු පාරගා.

18. නවයොබ්බනඋද්දාමා රූපෙන ච මනොහරා,
සච්චෙසු නිරතා නිච්චං අනක්කුට්ඨකුලා සියුං.

---

15. යා පුරී, යම් පුරියක්; රථ, රථයන් ග්‍රහණය කළාවූ; තුඟ, උස්වූ; තුරඞ්ගෙහිච, අශ්වයන් කාරණකොටගෙණද; ගජ්ජිතෙහිච, (හස්ත්‍යාදීන්ගේ) ගජ්ජිතායෙන්ද; සඞ්ඝොස, ඝොෂා සහිතවූ; උත්තුඞ්ග, උස්ව නැංගාවූ; කල්ලොල, රළපතරින්; ලොල, ලුලිතවූ; සාගරසන්නිභා, සමුද්‍රය සමාන වීද.

16. යහිං, යම් පුරයෙක්හි; දෙවානං, දෙවියන; අවහමානා ඉව, සැඳවත්නාන් වැනී; පුරලච්ඡි, නගරශ්‍රියගේ; භුජා ඉව, බාහුන් මෙන්; මන්දානිල, මන්දමාරුතයෙන්; ඊරිතා, කම්පිතවූ; තුඞ්ග, ප්‍රාංශුවූ; නානාරාගධජා, නානාවර්ණ ධවජයෝ, (බබලත්ද.)

17. යස්මිං, යම් පුරයෙක්හි; නානාවෙසධරා, අනෙකවෙසධාරීහුද; නානාභූසනභූසිතා, නානාභරණයෙන් සැරසුනාහුද; නානාසම්පත්ති, නොයෙක් සම්පත්තීන්; සංයුත්තා, යුක්තවූවාහුද; නානාවිජ්ජාසු, නොයෙක් විද්‍යාවන්හි; පාරගා, පරතෙරට ගියාහුද :—

18. නවයොබ්බන, අභිනව යෞවනයෙන්; උද්දාමා, අතිශයින් උඩඟුවූවාහුද; රූපෙන, රූපලාවණ්‍යයෙන්; මනොහර ච, මනොඥයෝද; නිච්චං, සතතයෙහි; සච්චෙසු, සත්‍යයෙහි; නිරතා, ඇළුණාහුද; අනක්කුට්ඨකුලා, (ජාතිවාදයෙන්) ආක්‍රොශ නොකරණලද වංශවත්හුද; සියුං, වෙද්ද.

19. නිච්චං කීළාවිදඩ්ඪාහි නරනාරීහි සෙවිතා,
යා පුරී සාධු රූපා'සි මධුරාලාපිනීහිව.*

20. තස්මිං සද්ධාදයොපෙත ඔක්කාකකුල කෙතුකො,
සුද්ධොදනව්හයො ආසි විස්සුතො භුවනත්තයෙ.

21. යස්සඞ්ඝිකමලෙ සබ්බභූභුජානං මහීතලෙ,
කිරීටමණිභිංගාලී කීළන්තීව නිරන්තරං.

22. යස්ස පත්ථට තෙජෙන සුරනෙත්තාපි දිවාකරෙ,
වහතීවම්බරෙ ලීලං ඔසධීපතිනො දිවා.

---

19. යාපුරී, යම් පුරයක්තොමෝ ; නිච්චං, නිරන්තර යෙන් ; කීළාවිදඩ්ඪාහි, ක්‍රීඩාවන්හි නිපුණවූ ; නරනාරීහි, පුරුෂස්ත්‍රීන් විසින්ද ; මධුරාලාපිනීහිව, මියුරුයි කියන්නියන් විසින්ද ; සෙවිතා, සෙවිතලද්දී ; සාධුරූපා ආසි, මනොහර ස්වරූප ඇත්තියක් වීද.

20. තස්මිං, ඒ පුරයෙහි : සද්ධාදයොපෙත, ශ්‍රද්ධාවෙන් හා දයාවෙන් යුක්තවූ ; ඔක්කාකකුල, ඉක්ෂ්වාකුවංශයට : කෙතුකො, ධ්වජයක්වූ ; භුවනත්තයෙ, ලෝකත්‍රයෙහි ; විස්සුතො, ප්‍රසිද්ධවූ ; සුද්ධොදනව්හයො, ශුද්ධොදන නම් පෘථිවීශ්වරොත්තම යෙක් ; ආසි, වී.

21. මහීතලෙ, පෘථිවීතලයෙහි ; සබ්බභූභුජානං, සියලු නරෙන්ද්‍රයන්ගේ ; කිරීටමණී, මකුටමාණික්‍ය නැමැති ; භිංගාලී, භෘංගශ්‍රේණිහු ; යස්ස, යම් රජෙකුගේ : අඞ්ඝිකමලෙ, පාපියුම්හි ; නිරන්තරං, සතතයෙන් ; කීළන්ති ඉව, ක්‍රීඩා කරන්නාන් මෙන් වෙත්ද.

22. අම්බරෙ, අකාශයෙහි ; යස්ස, යමෙකුගේ ; පත්ථටතෙජස, පතළාවූ තෙජෝමහිමයෙන් ; සුරනෙත්තා, සාගරිකාන්තාරයෙහිවූ ; දිවාකරෙ අපි, හිරුතොමෝද ; දිවා, දවල්හිවූ ; ඔසධීපතිනො, චන්ද්‍රයාගේ ; ලීලං, ලීලාව ; වහතිඉව, උසුලන්නාක් මෙන් වීද.

* මධුරාලාපිනීවසා.

ශ්‍රී ලංකා ජාතික පු...

23. යස්ස දානප්පවාහොතු නානායාචකජන්තුනං,
මනොදධීසු වෙලනොතික්කමන්තොව සන්තතං.

24. මතියා සුරමන්තීව ධනෙන ධනදෙවිය,
රූපෙන කුසුමෙසූ'ව යො පුමහති මහීතලෙ.

25. තස්සාභිසිත්තා රජ්ජෙන මහාමායා'ති විස්සුතා,
චණ්ඩිකා විය චන්දස්ස ගිරිජා'ව කපාලිනො,

26. ලක්ඛී'ව වාසුදෙවස්ස සීතා'ව රාමරාජිනො,
මහෙසී'සි වරාරොහා සුන්දරී සුන්දරාධරා.

---

23. යස්ස, යමෙකුගේ ; දානප්පවාහොතු, දාන නැමැති ජලප්‍රවාහයතෙම ; නානායාචකජන්තුනං, නොයෙක් යාචක ජනයන්ගේ ; මනොදධීසු, චිත්තාර්ණවයන්හි ; වෙලනොත, වෙරළ කණ ; සන්තතං, නිරන්තරයෙන් ; අතික්කමන්තො ඉව, (පුරා) ඉක්මවන්නෙක් මෙන් විද.

24. යො, යමෙක්තෙම ; මතියා, ප්‍රඥාවෙන් ; සුරමන්තී ඉව, බෘහස්පති මෙන්ද ; ධනෙන වස්තුවෙන් ; ධනදෙවිය, කුවෙරයා මෙන්ද ; රූපෙන, රූපශොභාවෙන් ; කුසුමෙසු ඉව, පුෂ්පබාණයාමෙන්ද ; මහීතලෙ, මිහිතෙලෙහි ; පුමහති, බබලාද.

25, 26. චන්දස්ස, චන්ද්‍රයාගේ ; චණ්ඩිකාවිය, මරීචිය වැනිවූ ; කපාලිනො, ඊශ්වරයාගේ ; ගිරිජා ඉව, පාර්වතිය වැනිවූ ; වාසුදෙවස්ස, විෂ්ණුගේ ; ලක්ඛීඉව, ශ්‍රීකාන්තාව වැනිවූ ; රාමරාජිනො, (දශරථ පුත්‍රවූ) රාමරජහුගේ ; සීතා ඉව, (ජනකරාජ දුහිතෘවූ) සීතාදේවිය වැනිවූ ; වරාරොහා, ප්‍රශස්ත නිතම්බප්‍රදෙශ ඇති ; සුන්දරාධරා, සොඳුරුවූ (බිම්බුපල වන්) තොල් ඇති ; රජ්ජෙන, රාජ්‍යයෙන් ; අභිසිත්තා, අභිෂෙකකරණලද්දවූ ; මහාමායාති විස්සුතා, මහාමායායයි ප්‍රසිද්ධවූ ; සුන්දරී, සුන්දරාඞ්ගනාතොමෝ ; තස්ස, ඒ ශුද්ධොදන මහරජහට ; මහෙසී අසි, මෙහෙසි

27. තස්සා කුච්ඡිකරණ්ඩම්හි අනග්ඝරතනං විය,
බත්තිංසානි නිමිත්තානි විම්හාපෙන්තො සදෙවකං.

28. සිතම්බුජකරො සන්තො සිතෙභච්ඡාපකො විය,
කත්වා පදක්ඛිණං මාතු පටිසන්ධිමගණ්හි සො.

29. දසෙසාදසමාසෙන තස්සෙවං ආසි චෙතනා,
පස්සිතුං සකඤාතීනං ගන්ත්වාන නගරං තදා.

30. නිවෙදෙත්වා තමත්ථං සා රඤ්ඤො තෙන සුසජ්ජිතෙ,
සපරිච්ඡදා තදා මග්ගෙ (2) ගච්ඡන්ති අන්තරාපථෙ.

---

27. තස්සා, ඒ මායාදේවීන්ගේ; කුච්ඡිකරණ්ඩම්හි, කුසැති පැමැති සුඹුලෙහි; අනග්ඝරතනං විය, අනගි මිණිරුවනක් මෙන්; බත්තිංසානි නිමිත්තානි, දෙතිස් පූර්වනිමිතියන්; සදෙවකං, දෙවියන් සහිත ලෝකයා; විම්හාපෙන්තො, විස්මය ප්‍රාප්ත කෙරෙමින්.

28. සිත අම්බුජකරො, සෙලපියුම්ගත් සොඬ ඇති; සිතෙභච්ඡාපකොවිය සන්තො, ශ්වෙත හස්තිපොතකයෙකු මෙන් වෙමින්; සො, ඒ මහාසත්වතෙම; මාතු, මව; පදක්ඛිණං කත්වා, පැදකුණුකොට,* පටිසන්ධිං අගණ්හි, පිළිසිඳගත්තේය.

29. තදා, එකල්හි; දසෙසාදසමාසෙන, දසමාසාධි මාසයකින්; නගරං ගන්ත්වාන, (ස්වකීය) නුවරට ගොස්; සකඤාතීනං, සියනෑයන්; පස්සිතුං, දක්නට; තස්සා, ඒ මහාමායා දෙවින්ට; එවං, මෙසේ; චෙතනා ආසි, සිතිවිල්ලක් විය.

30. තදා, එකල්හි; සා, ඒ මහාමායා දෙවිතොමෝ; රඤ්ඤො, ශුද්ධොදන මහරජහට, තමත්ථං, ඒ අභිලාෂය (නොහොත්) ඒ සිතිවිල්ල; නිවෙදෙත්වා, දන්වා; තෙන, ඒ රජහු විසින්; සුසජ්ජිතෙ, මොනවට සදනලද; මග්ගෙ, මාර්ගයෙහි; සපරිච්ඡදා, පිරිවර සහිතවූවා; ගච්ඡන්ති, යන්නී; අන්තරාපථෙ, අතරමගදී :—

---

* ස්වප්නයෙන් පෙණුනු පරිදිසි.

31. දෙවතානං මනොනන්දකර නන්දනසන්නිභං,
දිස්වාන ලුම්බිනිං නාම උය්‍යානං මනනන්දනං.

32. තස්මිං කීළිතුමුස්සාහා පවිසිත්වාන තං වනං,
කීළන්ති උපගන්ත්වාන මඞ්ගලං සාලපාදපං.

33. විලොලපල්ලවාකිණ්ණං සුඵුල්ලකුසුමොනතං,
ගණ්හෙත්වා සාලසාඛං සා සුරත්ත කරපල්ලවා.

34. දෙවෙහි ගහිතාරක්ඛා මහමානෙ සදෙවකෙ,
ජනෙසි තනයං මායා තත්‍රට්ඨා ලොකලොචනං.

---

31. දෙවතානං, දෙවියන්ගේ; මනොනන්දකර, චිත්තානන්දකරවූ; නන්දනසන්නිභං, නන්දනොද්‍යානය වැනිවූ; මනනන්දනං, චිත්තානන්දකරවූ; ලුම්බිනිං නාම, ලුම්බිනීනම්වූ; උය්‍යානං, (සල්) උයන; දිස්වාන, දැක.

32. තස්මිං, ඒ සල්වෙනෙහි; කීළිතුං, ක්‍රීඩාකරන්ට; උස්සාහා, උත්සාහ ඇත්තී (නොහොත්) උත්සාහයෙන්; තංවනං, ඒ වනයට; පවිසිත්වාන, ප්‍රවිෂ්ටව; කීළන්ති, ක්‍රීඩාකරන්නී; මඞ්ගලං සාලපාදපං, මගුල්සල්රුකක් වෙත; උපගන්ත්වාන, පැමිණ.

33. සා, ඒ මායාදෙවීතොමෝ; සුරත්ත, අතිරක්තවූ; කරපල්ලවා, අත්තල නැමති ලපලුපතින්; විලොල, විශෙෂයෙන් චඤ්චලවූ; පල්ලවාකිණ්ණං, ලපලුයෙන් ගැවසිගත්තාවූ; සුඵුල්ල, සුපිපුලුවූ; කුසුමොනතං, පුෂ්පභාරයෙන් නතවූ; සාලසාඛං, සල් අත්තක්; ගණ්හෙත්වා, ගෙණ.

34. සදෙවකෙ, දෙවියන්සහිත ලොකයා; මහමානෙ, පූජාවිධි පවත්වන කල්හි; තත්‍රට්ඨා, ඒ සල්රුක වෙත සිටියාවූ; මායා, මහාමායා දෙවීතොමෝ; දෙවෙහි, දෙවියන් විසින්; ගහිතාරක්ඛා, ගන්නාලද ආරක්ෂා ඇත්තී; ලොකලොචනං, තිලොවට නෙත්‍රයක් වැනිවූ; තනයං, පුත්‍රරත්නය; ජනෙසි, වැදූ.

35. බ්‍රහ්මානො ලොකපාලා ච මනුස්සා සමෙතා තදා,
සොණ්ණජාලාජිනාදීහි ගණ්හිංසු ජනනන්දනං.

36. මහිං පතිට්ඨිතො ධීරො පස්සිත්වාන තතො දිසා,
උත්තරාභිමුඛො සත්තපදං ගන්ත්වාම්බුජෙ ඨිතො.

37. දිසන්තමවලොකෙත්වා සුඵුල්ලම්බුජලොචනො,
නිච්ඡාරෙසාසභිං වාචං අග්ගො සෙට්ඨො'ති ආදිනා.

38. බ්‍රහ්මාමරනරාදීහි පූජිතො ච නමස්සිතො,
කමෙන අභිවඩ්ඪන්තො පුණ්ණපක්ඛෙ සසී යථා.

---

35. තදා, එකල්හි; බ්‍රහ්මානො, බ්‍රහ්මරාජයෝද; ලොකපාලාච, ලොකපාල දෙවියෝද; මනුස්සාච, (උතුම්) මනුෂ්‍යයෝද; සොණ්ණජාල, රන් දැල්ය; අජිනාදීහි, අඳුන්දිවි සම් යන මේ ආදීන්; සමෙතා, අනුක්‍රමයෙන්; ජනනන්දනං, ජනානන්දකරවූ මහාබෝධිසත්වයන්වහන්සේ; ගණ්හිංසු, පිළිගත්හුය.

36. තතො, ඉක්බිත්තෙන්; ධීරො, ප්‍රාඥවූ ඒ මහාබෝධිසත්වතෙම; මහිං, පෘථිවියෙහි; පතිට්ඨිතො, පිහිටියේ; දිසා පස්සිත්වාන, දිශා විලොකන කොට; උත්තරාභිමුඛො, උත්තර දිශාභිමුඛව; සත්තපදං, සත් පියවරක්; ගන්ත්වා, ගොස්; අම්බුජෙ, (සත්බුමු) පියුම් පිට; ඨිතො, සිටියේක්.

37. සුඵුල්ල, ප්‍රඵුල්ලවූ; අම්බුජලොචනො, නීලොත්පල වැනි නෙත් ඇති මහබෝසත්තෙම; දිසන්තං, දිශාන්තය; අවලොකෙත්වා, විලොකනයකොට: "අග්ගො සෙට්ඨො" ඉති, අග්‍රයෙමි ශ්‍රෙෂ්ඨයෙමි; ආදිනා, මේආදීන්; ආසභිං, නර්සිහවූ; වාචං, වචනයක්; (නොහොත්) ආසභිංවාචං, අභීතසිංහනාදයක්; නිච්ඡාරෙසි, නිකුත්කළසේක (නොහොත් උදුළු සේක.)

38. බ්‍රහ්ම, බ්‍රහ්මරාජයෝය; අමර, දෙවියෝය; නර, මනුෂ්‍යයෝය; ආදීහි, යන මේ ආදීන් විසින්; පූජිතො ච, පුදනලද්දේද; නමස්සිතො ච නමස්කාර කරණලද්දේද; පුණ්ණපක්ඛෙ, ශුක්ලපක්ෂයෙහි; සසී යථා, චන්ද්‍රයා මෙන්; කමෙන, ක්‍රමයෙන්; අභිවඩ්ඪන්තො, වැඩෙන්නේ.

39. බ්‍රහ්මූනං ඡත්තඡායාය මන්දාරකුසුමන්තරෙ,
සානන්දමන්දදෙවෙහි ධුතචාමරමජ්ඣගො.

40. දිබ්බෙහි රූපසද්දෙහි ගන්ධෙහි ච රසෙහි ච.
ඵොට්ඨබ්බෙහි ච දිබ්බෙහි මොදමානො අනෙකධා.

41. දිබ්බෙහි රමණීයෙහි නච්චෙහි වාදිතෙහි ච,
පදූනෙකසහස්සෙහි ථූයමානගුණාකරො.

42. පත්වා සොළසමං වස්සං ඤාතිසඞ්ඝස්ස මජ්ඣගො,
දස්සෙත්වා'සෙසසිප්පං තං ලොකෙ විජ්ජති යං තදා.

---

39. බ්‍රහ්මූනං, බ්‍රහ්මයන්ගේ; ඡත්තඡායාය, සේසත් සෙවනෙහි; මන්දාරකුසුමන්තරෙ, මඳාරමල් අතුරෙහි; සානන්ද, සන්තොෂසහිතවූ; අමන්ද, ඉතා බොහෝවූ; දෙවෙහි, දෙවියන් විසින්; ධුත, සලනලද; චාමරමජ්ඣගො, චල්විදුනා මධ්‍යගතවූයේ.

40—41. දිබ්බෙහි, දෙවියන් විසින් පරිභොග කටයුතුවූ; රූපසද්දෙහිච, රූපයෙන් හා ශබ්දයෙන්ද; ගන්ධෙහිච, සුගන්ධයෙන්ද; රසෙහිච, රසයෙන්ද; දිබ්බෙහි, දිව්‍යවූ; ඵොට්ඨබ්බෙහිච, ස්පෘෂ්ටව්‍යයෙන්ද; දිබ්බෙහි, දිව්‍යවූ; රමණීයෙහි, සිත්කලුවූ; නච්චෙහි, නෘත්‍යයෙන්ද; වාදිතෙහිච, වාද්‍යයෙන්ද; අනෙකධා, අනෙකප්‍රකාරයෙන්; මොදමානො, සතුටුවන්නේ; පදූනෙක සහස්සෙහි, නොයෙක් දහස්ගණන් පද්‍යයෙනුදු; ථූයමාන, සතුතිකරණුලබන්නාවූ; ගුණ, ගුණයන්ට; ආකරො, උත්පත්තිස්ථාන වූයේ.

42. ඤාතිසඞ්ඝස්ස, නෑසමූහයාගේ; මජ්ඣගො, මධ්‍යගතවූ ඒ මහාබොධිසත්වතෙම; සොළසමංවස්සං, සොළසැවිරිදි වයසට; පත්වා, පැමිණ; තදා, එකල්හි; ලොකෙ, ලොකයෙහි; යං, යම් ශිල්පයක්; විජ්ජති, විද්‍යමානවේද; තං අසෙස සිප්පං, ඒ සියලු ශිල්ප; දස්සෙත්වා, දක්වා.

43. ඤාතිසඞ්ඝං පමොදෙන්තා දෙවෙ ච මනුජේ'පි ච,
ලද්ධා යසොධරං දෙවිං 'නුකූලං ජාතිජාතියං.

44. සොණ්ණදප්පණසඞ්කාස සොම්මානන විභූසිතං,
නීලනීරජසඞ්කාසවිසාලායතලොචනං.

45. සිඞ්ගාරමන්දිරවාරෙ ධජොපමභමුවයං,
හෙමකාහලසඞ්කාස නාසිකං රූපලක්ඛියා.

46. නීලවෙල්ලිතධම්මිල්ල ජීමූතොභයකොටියං,
නිච්චවිජ්ජුලතාචක්කමනුඤ්ඤකණ්ණපාසකං.

---

43. ඤාතිසඞ්ඝං, නෑසමූහයාද ; දෙවෙ ච, දෙවියන්ද ; මනුජෙපිච, මනුෂ්‍යයන්ද ; පමොදෙන්තා, පොලඹවන්නේ ; ජාතිජාතියං, ජාතියෙක් ජාතියෙක්හි ; අනුකූලං, චිත්තානුකූලවූ ; යසොධරං දෙවිං, යශොධරා නම් දෙවින් ; ලද්ධා, ලැබ ; (කොබඳුවූ යශොධරා නම් දෙවියක් ලබාද යත්.)

44. සොණ්ණදප්පණ සඞ්කාස, රන්කැටපත්බඳුවූ ; සොම්ම, සෞම්‍යවූ ; ආනන, මුහුනින් ; විභූසිතං, විශෙෂයෙන් අලඞ්කෘතවූ ; නීල නීරජ සඞ්කාස ; නිලුපුල් සමානවූ ; විසාල, පුළුල්වූ ; ආයත, දික්වූ ; ලොචනං, නෙත්‍ර ඇත්තාවූ.

45. රූපලක්ඛියා, රූපශ්‍රියගේ ; සිඞ්ගාර මන්දිරවාරෙ, නෘත්‍යශාලාවාරයෙහි (බඳිනලද්දාවූ) ; ධජොපම, ධවජයක් බඳුවූ ; භමුවයං, භෘයුගමයක් ඇත්තාවූ ; හෙමකාහලසඞ්කාස, රත්කාලමකට බඳුවූ ; නාසිකං, නාසයක් ඇත්තාවූ.

46. නීල, නිල්පැහැ ඇත්තාවූ ; වෙල්ලිත, අක්බඹුරුවූ ; ධම්මිල්ල, කෙශකලාප නැමැති ; ජීමූත, මෙඝයාගේ ; උභය කොටියං, දෙකෙලවරෙහි ; නිච්ච, නිරන්තරයෙන් (පවත්නාවූ) ; විජ්ජුලතා චක්ක, විදුලිය කලඹක් මෙන් ; මනුඤ්ඤ, මනොඥවූ ; කණ්ණපාසකං, (සොභමාන) කන්වැල් සගලක් ඇත්තාවූ.

47. සාතකුම්භනිභාභාසපයොධරඝටද්වයං,
සුවණ්ණද්දිතටායාත නිජ්ඣරාකාරහාරකං.

48. දෙහදෙවද්දුමාලම්බ පාරොහාභභුජද්වයං,
අඞ්ගුලීපල්ලවනතාඹු බින්දුචාරුනඛාවලිං.

49. දෙහමාලාලිමාලාභ රොමරාජිවිරාජිතං,
රූපණ්ණවතරඞ්ගාභ වලිත්තය විචිත්තකං.

50. සොණ්ණරම්භාසමාවට්ට පීණොරුවයසුන්දරං,
සනීරකලිකාකාරචාරුජඞ්ඝාවිභූසිතං.

---

47. සාතකුම්භනිභ, උතුම්වූ ස්වර්ණවර්ණ සමාන ; ආභාස, දීප්ති ඇත්තාවූ ; පයොධර, පියයුරු නැමැති ; ඝට ද්වයං, පුන්කලස් දෙකක් ඇත්තාවූ ; සුවණ්ණද්දිත, ස්වර්ණ පර්වතතටයෙකින් ; ආයාත, පැමිනියාවූ ; නිජ්ඣරාකාර, ගඟුල් හැල්ලක් බඳුවූ ; හාරකං, මුක්තාහාර ඇත්තාවූ.

48. දෙහ, ශරීර නැමැති; දෙවද්දුම, සුරතුරෙහි ; ආලම්බ, (හටගෙණ) එල්ලෙන්නාවූ ; පාරොහාභ, අරලුවැනිවූ ; භුජ ද්වයං, බාහුයුගමයක් ඇත්තාවූ; අඞ්ගුලී, ඇඟිලි නැමැති ; පල්ලව නත, ලපලු අග ලැසිගත් ; අඹුබින්දු, දියබින්දු බඳුවූ ; චාරු, මනොඥවූ ; නඛාවලිං, නියපඞ්ක්ති ඇත්තාවූ.

49. දෙහමාලා, ශරීර නැමැති මල්දම්හි ; අලිමාලාභ, භෘඞ්ග මාලාවකට බඳුවූ; රොමරාජි, රොමශ්‍රෙණීන් ; විරාජිතං, බැබලියාවූ; රූපණ්ණව, රූප නැමැති සාගරයාගේ ; තරඞ්ගාභ, රළ පන්තියක් වැනිවූ ; වලිත්තය, වලිත්‍රයකින් ; විචිත්තකං, විසිතුරුවූ.

50. සොණ්ණරම්භා, ස්වර්ණකදලිස්කන්ධයක් මෙන් ; සමාවට්ට, මොනවට වටවූ ; පීණ, පිරුණුවූ ; ඌරුවය, සක්ථි යුගලයෙන් ; සුන්දරං, සොඳුරුවූ ; සනීරකලිකාකාර, තැඹිලිමල්කැකුලු බඳුවූ ; චාරු, මනොඥවූ ; ජඞ්ඝා, කෙණ්ඩා යුගමයෙන් ; විභූසිතං, අලඞ්කෘතවූ.

51. පච්චක්ඛරූපලක්ඛිංව ලීලානිච්චයසන්නිභං,
ගුණන්නමාකරං සාධු වෙලංව රතිසාගරෙ.

52. කන්තො වසන්තරාජා'ව කන්දප්පො'ව සුරූපවා,
සසී'ව දස්සනීයො ච සුරියො විය තෙජවා.

53. අචලත්තෙන මෙරූව ගම්භීරෙනණ්ණවො විය,
බ්‍රහ්මස්සරො පියංවාදී පඤ්ඤවා ච අනූපමො.

54. වසන්තො සො මහාවීරො පුරස්මිං කපිලව්හයෙ
දිස්වා නිමිත්තෙ චතුරො උය්‍යානගමනජ්ජසෙ.

---

51. පච්චක්ඛ, ප්‍රත්‍යක්ෂවූ ; රූප, රූඇති ; ලක්ඛිං ඉව, ශ්‍රී දෙවිය වැනිවූ ; ලීලානිච්චයසන්නිභං, ලීලා පුඤ්ජයක් වැනිවූ ; ගුණන්නං, (ශීලාදි) ගුණයන්ට ; ආකරං, උත්පත්තිස්ථානවූ ; රතිසාගරෙ, රති සයුරෙහි ; සාධු, යහපත්වූ ; වෙලංඉව, වෙරළක් වැනිවූ ; (යසොධරං දෙවිං, යශෝධරා නම් දෙවීන් ; ලබා, ලැබ.)*

52, වසන්තරාජා ඉව, වසත්රජු මෙන් ; (3) කන්තො, මනොඥවූ ; කන්දප්පො ඉව, අනඞ්ගයා මෙන් ; සුරූපවා, යහපත් රූඇති; සසී ඉව, චන්ද්‍රයා මෙන් ; දස්සනීයොච, දැකුම් කටයුතුවූ; සුරියො විය, සූර්‍ය්‍යයාමෙන් , තෙජවා, තේජස් ඇත්තාවූ.

53. අචලත්තෙන, නිශ්චලභාවයෙන් ; මෙරු ඉව, මහා මෙරුපර්වතය වැනිවූ ; ගම්භීරෙන; ගැඹුරු ගුණයෙන් ; අණ්ණවොවිය, සාගරය වැනිවූ ; බ්‍රහ්මස්සරො, බ්‍රහ්මධ්වනි ඇත්තාවූ ; පියංවාදී, ප්‍රියතෙපුල් බණන සුලුවූ ; පඤ්ඤවාච, ප්‍රඥාවන්ද ; අනූපමො, උපමා රහිතවූයේ.

54. කපිලව්හයෙ පුරස්මිං, කපිලවස්තු නම්වූ පුරප්‍රවර යෙහි ; වසන්තො, වාසයකරන්නාවූ ; සො මහාවීරො, ඒ මහාවීරවූ බොධිසත්වතෙම ; උය්‍යානගමනජ්ජසෙ, උද්‍යාන මාර්ගයෙහිදී ; චතුරො නිමිත්තෙ, (ජරාය, රොගය, මෘතය, ප්‍රව්‍රජිතය යන) සිවුවැදෑරුම් නිමිති (රූපයන්) ; දිස්වා, දැක.

---

* "සමීපො'පි න සම්බන්ධො අසම්බන්ධ සභාවතො,
දූරට්ඨො'පිච සො හොති වච්ඡාවිය සමාතරං." යි
කියනලද හෙයින් "යසොධරං දෙවිං ලබා" යනු සම්බන්ධයි.

– 14863

ශ්‍රී ලංකා ජාතික

55 පබ්බජ්ජාභිරතො නාථො රත්වා උය්‍යානභූමියං,
සුඵුල්ලචම්පකාසොකනාගාදීහගෙහි මණ්ඩිතං.

56. ඵුල්ලපඞ්කජකල්හාර ජලාලයසතාකුලං,
මන්දමන්දානිලායාතනානාමොදෙහි වාසිතං.

57. සරා සරං සමායාතමධුබ්බතතිසෙවිතං,
ඵලපුප්ඵරසුද්දාම විජසඞ්ඝනිකූජිතං.

58. නච්චන්තා* මත්තමොරානං නිච්චං මණ්ඩපසන්නිභං,
දිබ්බන්තා† මිගසඞ්ඝානං කීළාමණ්ඩපසන්නිභං.

---

55. පබ්බජ්ජාභිරතො, පැවිදිවීමෙහි ඇලුනාවූ ; නාථො, අනාථයන්ට නාථවූ ඒ මහාබොධිසත්ත්වතෙමෙ ; උය්‍යානභූමියං, උද්‍යාන භූමියෙහි ; රත්වා, රමණීය කොට ; සුඵුල්ල, සුපිපුණුවූ ; චම්පක, සපුය ; අසොක, හෝපලුස ; නාගාදි, නාගස් ආදිවූ ; අගෙහි, වෘක්ෂයන්ගෙන් ; මණ්ඩිතං, හෙබියාවූ.

56. ඵුල්ල, පිපියාවූ ; පඞ්කජ, පියුම්ය ; කල්හාර, හෙල් මැලිය යන මෙයින් යුක්තවූ ; ජලාලයසතාකුලං, සියගණන් ජලාශයයන්ගෙන් ගැවසුනාවූ ; මන්දමන්දානිල, මඳ මඳ පවන් ; ආයාත, පැමිණියාවූ ; නානාමොදෙහි, අනෙකපරාගයෙන් ; වාසිතං, සුවඳ කවනලද්දවූ.

57. සරාසරං, විලින්විලට ; සමායාත, සඤ්චාරණය කරන්නාවූ ; මධුබ්බතතිසෙවිතං, භෘඞ්ගශ්‍රෙණීන් සෙවිනාවූ ; ඵලපුප්ඵරස, මල්පල රස (පාන) යෙන් ; උද්දාම, උසස්වූ මද ඇති ; විජසඞ්ඝනිකූජිතං, පක්ෂි සමූහයා විසින් රැව්පිළිරැව් දෙනලද්දවූ.

58. නිච්චං, නිරන්තරයෙන් ; නච්චන්ත, නටන්නාවූ ; මත්තමොරානං, මත්ත මයුරයන්ට ; මණ්ඩප සන්නිභං, රඟමඩුල්ලක් වැනිවූ ; දිබ්බන්ත, ක්‍රීඩාකරන්නාවූ ; මිගසඞ්ඝානං, මෘග සමූහයන්ට ; කීළාමණ්ඩපසන්නිභං කෙළිමඩුවක් වැනිවූ.

---

* නච්චන්තානං. † දිබ්බන්තානං.

59. සමීරසිසිරොදාර ධාරාසීකරවාරිහි,
ධාරාම්බුපපාතෙහි ජනානන්දකරං වරං

60. උය්‍යානවනමාගම්ම දෙවරාජාව නන්දනං,
කීළන්තො නිජපුත්තස්ස සුත්වාන ජිනසාසනං.

61. නිවත්තො විස්සකම්මෙන සහස්සක්ඛොව භූසිතො,
පුරං පවිසමානොව කිසාගොතමිභාසිතං.

62. සුත්වාන නිබ්බුතපදං* තදා චිත්තානුකූලකං,
සන්තුට්ඨො සානුරාගොව ලක්ඛග්ඝං හාරභාසුරං.

59. සමීර, මාරුතයෙන්; සිසිර, සිහිල්වූ; උදාර, මහත්වූ; ධාරා, ජලධාරාවෙන්ද; සීකරවාරිහි, ජලකණිකා ජලයෙන්ද; ධාරම්බුපපාතෙහි, ජලයපාත්‍රම්බපපෙලින්ද; ජනානන්දකරං, ජනයාගේ චිත්තානන්දකරවූ; වරං, උතුම්වූ.

60. උය්‍යානවනං, උයන්වනයට; ආගම්ම, පැමිණ; නන්දනං, නන්දනොද්‍යානයට (පැමිනියාවූ); දෙවරාජා ඉව, සක්දෙව්රජු සෙයින්; කීළන්තො, ක්‍රීඩාකරන්නේ; නිජපුත්තස්ස, තම පුත්‍ර; ජිනසාසනං, උපන් හස්න; සුත්වාන, අසා.

61. නිවත්තො, නැවැත්තේ; විස්සකම්මෙන, විශ්වකර්මයා විසින්; භූසිතො, සරසනලද්දේ; සහස්සක්ඛො ඉව, ශක්‍රදෙවෙන්ද්‍ර විලාසයෙන්; පුරං, පුරයට; පවිසමානොව, (පෙරලා) ප්‍රවිෂ්ටවන්නේම; කිසාගොතමි භාසිතං, කෘශාගොතමින් විසින් කියනලද්දාවූ

62. තදා, එකල්හි; චිත්තානුකූලකං, චිත්තානුරූපවූ; නිබ්බුතපදං, ("නිබ්බුතා නූන සා මාතා" යනාදීන් ප්‍රකාශිත) නිර්වෘතපදය; සුත්වාන, අසා; සන්තුට්ඨො, සතුටුවූයේ; සානුරාගොව, අනුරාගසහිත සිත් ඇත්තේ; ලක්ඛග්ඝං, ලක්ෂයක් අගනාවූ; හාර, මහත්වූ; භාසුරං, බබලන්නාවූ.

* නිබ්බුතිපදං.

63. හාරං තිස්සාය පෙසෙත්වා ගන්ත්වාන සකමන්දිරං,
දෙවරාජවිලාසෙන නිසීදි පවරාසනෙ.

64. අථාගම්ම තදා නෙකනාටිකා පරිවාරයුං,
වජ්ජන්ති භෙරියො තාසු පගායන කාචි නාරියො.

65. නානාලයසමාකිණ්ණං ගීතං ගායන්ති කාචි'පි,
ධමන්ති සුසිරං කාචි කාචි වාදෙන්ති තන්තියො,*

66. චාරුබිම්බාධරා රම්මපයොධරභරා සුභා,
විසාලායතනීලක්ඛා සොම්මසොම්මානනා තදා.

---

63. හාරං, මුක්තාහාරය; තිස්සාය, ඒ කෘශාගෞතමියට; පෙසෙත්වා, යවා; සකමන්දිරං, ස්වකීය භවනයට; ගන්ත්වාන, ගොස්; දෙවරාජවිලාසෙන, ශක්‍රදෙවෙන්ද්‍රාකාරයෙන්; පවරාසනෙ, උත්තමාසනමස්තකයෙහි; නිසීදි, වැඩහුන්සේක.

64. අථ, ඉක්බිත්තෙන්; තදා, එකල්හි; අනෙකනාටිකා, නොයෙක් නළඟනෝ; ආගම්ම, එළඹ; පරිවාරයුං, පිරිවැරූහ; තාසු, ඔවුන් අතුරෙන්; කාචි නාරියො, ඇතම් ස්ත්‍රීහු; භෙරියො, භෙරින්; පගායන, ගෙණ; වජ්ජන්ති, වයත්.

65. කාචි අපි, ඇතම් තැනැත්තියෝද; නානාලය සමාකිණ්ණං, අනෙක තාලයෙන් යුක්තවූ; ගීතං, ගීතිකා; ගායන්ති, ගායනාකෙරෙත්; කාචි, සමහරු; සුසිරං, කුලල් (නළා); ධමන්ති, පිඹිත්; කාචි, සමහරු; තන්තියො, තන්ත්‍රීන්; වාදෙන්ති, වාද්‍ය කෙරෙත්.

66. තදා, එසමයෙහි; චාරු, මනොඥවූ; බිම්බඅධරා, බිඹුපල වැනි තොල් ඇත්තාවූ; රම්ම, සිත්කලුවූ; පයොධරභරා, පියයුරින් බරවූ; සුභා, සොභමානවූ, විසාල, මහත්වූ; ආයත, දික්වූ; නීලඅක්ඛා, නිල්වන් ඇස්ඇත්තාවූ; සොම, චන්ද්‍රයා වැනිවූ; සොම්මආනනා, සෞම්‍ය වක්ත්‍ර ඇත්තාවූ :—

---

* "කාචි තන්ති වයන්ති ච."

67. නච්චන්ති පුරතො තස්ස හෙරිම්බලුම්මජ්ඣගා,
දෙවකඤ්ඤාව රඞ්ගම්හි රසභාවනිරන්තරං.*

68. දිස්වාන සො තමච්ඡරියං විරත්තො විසයෙ තදා,
උරත්තාලං'ව අද්දක්ඛි සබ්බන්තං හෙරිතාලනං.

69. පරිදෙවං'වුපට්ඨාසි ගීතං සංසාරසාගරෙ,†
වායුවෙගවිකාරං'ව නච්චං චින්තෙසි නායකො.

---

67. හෙරිම්බලුමජ්ඣගා, බෙරම්බුලු මැදට පැමිනි නළඟනෝ; දෙවකඤ්ඤා, ඉව, දිව්‍ය කන්‍යාවන් මෙන්; රඞ්ගම්හි, රඟමඬුල්ලෙහි; තස්ස, ඒ මහබෝසතුන්ගේ; පුරතො, ඉදිරියෙහි; රසභාවනිරන්තරං, (අෂ්ටවිධ) නාට්‍යරසයෙන් හා ‡ (අෂ්ටවිධ) නාට්‍යභාවයෙන් § නිරතුරුකොට; නච්චන්ති, නටත්.

68. තදා, එකල්හි; සො, ඒ මහබෝසත්තෙම; තං අච්ඡරියං, ඒ ආශ්චර්‍ය්‍යය; දිස්වාන, දැක; විසයෙ, කාමයෙහි; විරත්තො, නොඇලුණේ; තං සබ්බං හෙරිතාලනං, ඒ සියලු බෙරවැසීම; උරත්තාලං ඉව, ළෙහි ගැසීමක් මෙන්; අද්දක්ඛි, දිටී.

69. ගීතං, ගීතිකාව; පරිදෙවං ඉව, විලාපයක් සෙයින්; උපට්ඨාසි, වැටහිනි; නායකො, ලොකනායකතෙම; නච්චං, නෘත්‍යය; සංසාරසාගරෙ, සසරනැමැති සයුරෙහි; වායුවෙගවිකාරං ඉව, වාතවෙගයෙන් හටගත් විකාරයක් මෙන්; චින්තෙසි, සිතී.

---

* "රසභාවනිරන්තරා." † "සංසාරදුත්තරෙ."

‡ "ශෘඞ්ගාර, හාස්‍ය, කරුණ, රෞද්‍ර, වීර, භයානකාඃ
බීභත්සාද්භුත ඉත්‍යෂ්ටෞ මන්‍යන්තෙ තෙ මුනීශ්වරාඃ" යි
ශෘඞ්ගාරරසය අෂ්ටවිධ කොට දැක්වූවද, ආචාර්‍ය්‍ය මෞද්ගල්‍යායන යන් විසින් "සිඞ්ගාරෙ කරුණෙ" යනාදින් නවනාට්‍යරසයැයි දක්වනලදී.

§ "හාසශ්ච, ශොකශ්ච, ක්‍රොධ, උත්සාහස්සභයං තථා
ජුගුප්සා, විස්මයශ්චාෂ්ටෞ ස්ථායිභාවා ඉමෙ මතාඃ" යි
අෂ්ටවිධභාවය උක්තයි.

70. කදාහං ඝරමොස්සජ්ජ පබ්බජ්ජාසිරිමුබ්බහෙ,
ඉච්චෙවං චින්තයන්තො සො සුපන්තොව සයී තහිං.

71. යං නිස්සාය මයං එත්ථ නච්චගීතෙසු වාවටා,
සො'යං දානි සුපී අම්හෙ කස්ස දානි කරොම තං.

72. ඉති චින්තිය තා තත්ථ තූරියෙසු සකෙ සකෙ,
ආලම්බා සයිතා කඤ්ඤා, සුසඤ්ඤඤ්ඤමඤ්ඤනිස්සිතා.

73. ඛාදන්ති කාචි දන්තානි කාචි ලාලා වහන්තියො,
කාචි රුදන්තියො තත්ථ විලපන්ති අථාපරා.

---

70. අහං, මම; කදා, කවරනම් දිනයෙක්හි; ඝරං ඔස්සජ්ජ, ගිහිගෙය හැර; පබ්බජ්ජාසිරිං, ප්‍රව්‍රජ්‍යා ශ්‍රීය; උබ්බහෙ, උසුලන්නෙම්දෝහෝයි; ඉති එවං, මෙයාකාරයෙන්; චින්තයන්තො, සිතන්නාවූ; සො, ඒ මහබෝසත්තෙම; සුපන්තො ඉව, නිදන්නෙක් මෙන්; තහිං, එහි; සයී, හොත්තේයි.

71. මයං, අපි; එත්ථ, මෙහි; යං නිස්සාය, යමෙකුනිසා; නච්චගීතෙසු, නැටීම් ගී කීම්හි; වාවටා, යුක්තවූවෝ වෙමුද; සො අයං, ඒ මේ මහාසත්වතෙම; ඉදානි, දැන්; සුපී, සයනය කෙළේය; අම්හෙ, අපි; කස්ස, කවරෙක්හට; තං, ඒ නෘත්‍ය ගීතිකා; ඉදානි, දැන්; කරොම, කරමුද.

72. ඉති, මෙසේ; චින්තිය, සිතා; තා සකෙ සකෙ තූරියෙසු,* ඒ ස්වකීය ස්වකීය තූර්‍ය්‍යභාණ්ඩයන්හි; ආලම්බා, එල්බුනාවූ; සුසඤ්ඤා, යහපත් සංඥද; අඤ්ඤං, (අරමුණු) දන්මද; අනිස්සිතා, ඇසුරු නොකළාවූ; (නොහොත්) සුසු, තරුණවූ; කඤ්ඤා, කන්‍යාවෝ; අඤ්ඤමඤ්ඤං, ඔවුනොවුන්; අනිස්සිතා, නිශ්‍රිතනුවූවාහු; තත්ථ, ඒ රඟමඩුල්ලෙහි; සයිතා, සයනය කළාහුයි.

73. කාචි, ඇතම් තැනැත්තියෝ; දන්තානි, දත්; ඛාදන්ති, කන්නීයෝය; කාචි, ඇතම් තැනැත්තියෝ; ලාලා වහන්තියො, (කුණු) කෙළ වගුරුවන්නීයෝය; කාචි, සමහර ස්ත්‍රීහු; රුදන්තියො, හඬන්නීයෝය; අථ, තවද; තත්ථ, එහි; අපරා, අන්තැනැත්තියෝ; විලපන්ති, වැලපෙත්.

---

* "සු" නිපාතයි.

74. කාසවජන්ති'පි සෙම්හම්පි ගිලන්ති ච වමන්ති ච,
කරොන්ති නාදං නාසාය ඝරු'ති ච ඛිපන්ති ච.

75. මුත්තායන්ති තදා කාචි රහස්සං විවරන්ති ච,
දුග්ගන්ධං වාති තං ඨානං සුසානං ආමකං යථා.

76. පබුද්ධො අඩ්ඪරත්තම්හි ගතෙ තත්ථ නිසීදිය,
අද්දක්ඛි තාසං නෙකානි විකාරානි තහිං තදා.

77. තස්සෙවං පෙක්ඛමානස්ස භවෙ සංවිග්ගචෙතසො,
ආදිත්තංව උපට්ඨාසි මනෙ බලු භවත්තයං.

---

74. අපි, යලිත් ; කාසවජන්ති, (සමහරක්) කැසිත් ; සෙම්හම්පි, සෙම්ද ; ගිලන්තිච, (සමහරක්) ගිලිත් ; වමන්ති ච, (සමහරක්) වමාරත් ; නාසාය, නාශිකාවෙන් ; ඝරු ඉති, "ඝරු" යන ; නාදංච, ශබ්දයද ; කරොන්ති, කෙරෙත් ; ඛිපන්තිච, (සමහරු) කිවිසිත්.

75. තදා, එකල්හි ; කාචි, කිසියම් ස්ත්‍රීහු ; මුත්තායන්ති, මුත්‍රකෙරෙත් ; රහස්සං, ගුහ්‍යස්ථානය ; විවරන්තිච, විවෘතද කෙරෙත් ; තං ඨානං, ඒ ස්ථානය ; ආමකං සුසානං යථා, අමු සොහොනක් මෙන් ; දුග්ගන්ධං වාති, දුගඳ හමයි.

76. තදා, එකල්හි ; අඩ්ඪරත්තම්හි, මධ්‍යමරාත්‍රිය ; ගතෙ (ඉක්ම) ගියකල්හි ; පබුද්ධො, ප්‍රබුද්ධවූ ඒ මහාසත්වතෙම ; තත්ථ, එහි ; නිසීදිය, වැඩහිඳ ; තහිං, ඒ රඟමඩලෙහිවූ ; තාසං, ඒ ස්ත්‍රීන්ගේ ; නෙකානි විකාරානි, නොයෙක් විකාරයන් ; අද්දක්ඛි, දිටි.

77. එවං, මෙසේ ; පෙක්ඛමානස්ස, බලන්නාවූ ; භවෙ, සංසාරයෙහි ; සංවිග්ගචෙතසො, සංවෙගයට පැමිනි සිත් ඇත්තාවූ ; තස්ස, ඒ මහබෝසතුන්ගේ ; මනෙ, සිත්හි ; භවත්තයං, තුන්ලොව ; බලූ, එකාන්තයෙන් ; ආදිත්තංඉව, ගිනි ඇවිලගත්තාක් මෙන් ; උපට්ඨාසි, වැටහුනේය.

78. දවානලසමාදිත්ත* මහාරඤ්ඤා, යථා ගජො,
තථෙවාපි නරින්දස්ස ගෙහතො ගමනෙ මති.†

79. තතො වුට්ඨාය සයනා කරොන්තො අභිනික්ඛමං,
චින්තෙසි මහාරාජා පස්සිතුං සකමත්‍රජං.

80. පවිසිත්වා තතො ගබ්භං සන්තිකං සන්තමානසො.
පස්සිත්වා සහ පුත්තෙන නිද්දායන්තිං යසොධරං.

81. චිරාගතං මහාපෙමං ධාරයං සකමානසෙ,
බුද්ධො හුත්වාපිමං සක්කා පස්සිතුං ඉති චින්තිය.

---

78. දවානල, ලැව්ගින්නෙන්; සමාදිත්ත, අතිශයින් ඇවිළගෙණ දිලියෙන්නාවූ; මහාඅරඤ්ඤා, මහවනයකින් (නික්මෙන්නාවූ); ගජො යථා, හස්තියෙක් යම්සේද; තථා එව, එපරිද්දෙන්ම; නරින්දස්ස, නරෙන්ද්‍රවූ මහාබොධිසත්ව යන්ට; ගෙහතො, (තම ගිහි) ගෙන්; ගමනෙ, (නික්ම) යාමෙහි (අභිනිෂ්ක්‍රමණයෙහි); මති, අදහසක්; ආසි, වී.

79. තතො, ඉක්බිති; සයනා උට්ඨාය, ශයනයෙන් නැගිට; අභිනික්ඛමං කරොන්තො, මහබිනික්මන් කරන්නාවූ; මහාරාජා, මහාරාජවූ ඒ මහාබොධිසත්වතෙම; සකං අත්‍රජං, ස්වකීය පුත්‍රයා; පස්සිතුං, දක්නට; චින්තෙසි, චින්තණය කෙළේය (හෙවත්) සිතුසේක.

80. තතො, ඉක්බිත්තෙන්; සන්තමානසො, සන්සුන් සිත් ඇති මහබෝසත්තෙම; සන්තිකං, සෙමින්; ගබ්භං, සැතපෙන ගෙට; පවිසිත්වා; ප්‍රවිෂ්ටව; පුත්තෙනසහ, පුත්‍රයා සමග; නිද්දායන්තිං, නිදන්නීවූ; යසොධරං, බිම්බාදෙවීන්; පස්සිත්වා, දැක.

81. චිරාගතං, දීර්ඝකාලයක පටන් පැවත ආවාවූ; මහාපෙමං, මහත්වූ ප්‍රෙමය; සක්මානසෙ, සියසිත්හි; ධාරයං, දරමින්; බුද්ධොහුත්වාපි, බුදුවද; ඉමං, මේ (පුත්‍රයා); පස්සිතුං, දක්නට; සක්කා ඉති, හැකියහී; චින්තිය, සිතා.

---

* "දවග්ගිදහනාදිත්ත." † "මනං."

82. ගතො නාථො තතො ඨානා බොධියාබද්ධමානසො*
තදහෙවාසි බුද්ධො'ති කාමුකො කො න විජානතෙ.

83. සිනෙරුං'මුද්ධරන්තොව පාදුද්ධරිය නික්ඛමං,
ඡන්නමාහුය ආනීතං කන්ථකං තුරගාධිපං.

84. අස්සරජ්ජං තමාරුය්හ සහ ඡන්නෙන රත්තියං,
දෙවෙහි විවටද්වාරා පටිපජ්ජි මහාපථං.

85. චක්කවාළෙසු නෙකෙසු දෙවතා සුසමාගතා,†
දීපධූපධජෙහෙව ගන්ධමාලෙහි‡ පූජයුං.

---

82. බොධියාබද්ධමානසො, සම්‍යක්සම්බොධිය කෙරෙහි බැඳුනු සිත් ඇති; නාථො, ලොකස්වාමීවූ මහාසත්වතෙම; තතොඨානා, එතැනින්; ගතො, (නික්ම) වැඩිසේක; තදහෙව, එදවසම; බුද්ධොආසි ඉති, බුදුවූසේකැයි; කො කාමුකො, කවරනම් කාමී පුද්ගලයෙක්; නවිජානතෙ, නොසිතාද; සිතාමය.

83. සිනෙරුං, මහමෙර; උද්ධරන්තො ඉව, උදුරන්නාක් මෙන්; පාදං, පාදය; උද්ධරිය, උදුරා; (පයනගා); නික්ඛමං, මහබිනික්මන් නික්මෙන්නේ; ඡන්නං, ඡන්නනම් ඇමතියා; ආහුය, කැඳවා; ආනීතං, ගෙණඑනලද; තුරගාධිපං, තුරගශ්‍රෙෂ්ඨවූ; කන්ථකං, කන්ථක නම්වූ.

84. තං අස්සරජ්ජං, ඒ අශ්වරාජයාපිට; ආරුය්හ, නැඟී; ඡන්නෙන සහ, ඡන්න නම් අමාත්‍යයා සමග; රත්තියං, (මධ්‍යම) රාත්‍රියෙහි; දෙවෙහි, දෙවියන් විසින්; විවටද්වාරා, හළ දොරින් (නික්ම); මහාපථං, මහාවීථිමාර්ගයට; පටිපජ්ජි, පිළිපැද්දේය.

85. අනෙකෙසු චක්කවාළෙසු, නොයෙක් සක්වළ; දෙවතා, දෙවියෝ; සුසමාගතා, රැස්වූවාහු; දීපධූපධජෙහි එව, පහන්දුම් කොඩියෙන්ද; ගන්ධමාලෙහි, සුවඳමලින්ද; පූජයුං, පිදූ.

---

* "බොධිබද්ධාවමානසා." † "දෙවතාසු සමාගතා."
‡ "දීපධූපධජෙචෙව ගන්ධමාලෙව."

86. පුරතො සට්ඨිසහස්සානි දණ්ඩදීපානි ධාරයුං,
තථා දක්ඛිණපස්සම්හි වාමපස්සෙ ච පච්ඡතො.

87. ගගනා පුප්ඵවස්සානි වස්සාපෙසුං ජදෙවකා,*
මන්දාරවං කොකනදං සුගන්ධං චිත්තපාටලිං.

88. චම්පකාසොකපුන්නාග නාගපූගාගසම්භවං,
මාලතීවස්සිකියාදි නානාවල්ලීහි සම්භවං.

89. පදුමුප්පලකල්හාර කුමුදම්බුසම්භවං,
සුගන්ධමධුමත්තාහි ජප්පදාලීහි කූජිතං.

---

86. පුරතො, ඉදිරියෙහි; සට්ඨිසහස්සානි, සැටදහසක් පමණ; දණ්ඩදීපානි, දඬුවැටපහන්; ධාරයුං, දැරූහ; තථා, එසේම; දක්ඛිණපස්සම්හි, දකුණුපස්හිද; වාමපස්සෙ ච, වම් පස්හිද; පච්ඡතො, පිටිපස්හිද; [දණ්ඩදීපානි, දඬුවැට පහන්; ධාරයුං, දැරූහ].

87. ජදෙවකා, සදෙව්ලොව දෙවසමූහයෝ; ගගනා, අහසින්; සුගන්ධං, සුවඳැත්තාවූ; මන්දාරවං, මඳාරා (පරසතු) ය; කොකනදං, රත්පියුම්ය; චිත්තපාටලිං, චිත්‍රපාටලීය (යන මේ); පුප්ඵවස්සානි, මල්වැසි; වස්සාපෙසුං, වැස්සූහ.

88. චම්පක, සපුය; අසොක, හෝපලුය; පුන්නාග, දොඹය; නාග, නාය; පූග, පුවක්ය (යන); අගසම්භවං, වෘක්ෂයන්ගෙන් හටගත්තාවූ (මල්වැසිද); මාලතී, සිනිදෑය (හොහොත්) සමන්ය, වස්සිකියාදි, දෑසමන්ය යනමේ ආදිවූ; නානාවල්ලීහිසම්භවං, නන්ලියෙන් හටගත්තාවූ (මල්වැසිද).

89. සුගන්ධමධු, සුවඳම් බීමෙන්; මත්තාහි, මත්වූ; ජප්පදාලීහි, භෘංගපඞ්ක්තීන් විසින්; කූජිතං, නාදපවත්වනලද; පදුම, පියුම්ය; උප්පල, උපුල්ය; කල්හාර, හෙල්මැලීය; කුමුද, හෙලුපුල්ය යන; ආදි, මේ ආදිවූ; අම්බුසම්භවං, ජලජවූ (මල් වැසිද).

---

* "සදෙවකා."

90. පුප්ඵවස්සං පවස්සිත්වා තිංසයොජනමජ්ඣෙ,
පසන්නො තස්ස* තුරගො දුක්ඛතො අගමී තදා.

91. එවං පූජාවිධානෙහි ගන්ත්වානොමං මහානදිං,
සිතසෙතසඞ්කිණ්ණං බහුමීනකුලාකුලං.

92. තීරම්හා පස්සි සො ධීරො ගඞ්ගානාරිං රසාවහං,
කරොන්තිං වීචිබාහාහි ඵෙණපුප්ඵොපහාරකං.

93. අස්සෙන තං මහානොමං ලඞ්ඝාපෙත්වා මහාමති,
පරතීරෙ පතිට්ඨාසි විමලෙ වාලුකාතලෙ.

---

90. පුප්ඵවස්සං, (යනමේ) මල්වැසි ; තිංසයොජනමජ්ඣෙ, තිස්යොදුන් මාර්ගයෙහි; පවස්සිත්වා, වැස්සේය ; තදා, එකල්හි ; [තස්ස, ඒ මහාසත්වයන්ගේ]; තුරගො, අශ්වතෙම ; තස්ස, ඒ මල්හි ; පසන්නො, එරුණේ ; දුක්ඛතො, දුකින් ; අගමී, ගියේය.

91. එවං, මෙසේ ; පූජාවිධානෙහි, පූජාවිධියෙන් යුක්තව ; සිතසෙතසඞ්කිණ්ණං, සුදුවැල්ලෙන් ගැවසුනාවූ; බහු, බොහෝවූ ; මීනකුලාකුලං, මත්ස්‍යසමූහයාගෙන් ගැවසීගත්තාවූ ; අනොමං මහානදිං, අනොමා නම් මහාගඟාතීරයට ; ගන්ත්වා, වැඩ.

92. ධීරො, ධෘතිමත්වූ ; සො, ඒ මහාසත්වතෙම ; තීරම්හා, ඉවුරෙහි සිටිමේ; රසාවහං, සත්‍රිරස නැමැති ජලවහනය කරන්නාවූ; වීචිබාහාහි, තරඞ්ග නමැති බාහුවලින්; ඵෙණපුප්ඵ, පෙණනැමති මලින්; උපහාරකං, අසෙතිසමල්පූජා ; කරොන්තිං, කරන්නාවූ; ගඞ්ගානාරිං, ගඞ්ගානැමති කාන්තාව, අපස්සි, දිටී.

93. මහාමති, මහාප්‍රාඥවූ ඒ බොධිසත්වතෙම ; අස්සෙන, අශ්වරාජයාලවා ; තං මහානොමං, ඒ අනෝමා නම් මහගඟ; ලඞ්ඝාපෙත්වා, ඉක්මවා; පරතීරෙ, පරතෙරවූ; විමලෙ, නිර්මලවූ ; වාලුකාතලෙ, වැලිතලාපිට ; පතිට්ඨාසි, පිහිටියේයි.

---

* "එස්සනෙතා තස්ස."



ශ්‍රී ලංකා ජාතික පුස්...

94. පබ්බජිතුං මයෙත්ථෙව යුත්තං නො මෙ පපඤ්චිතුං,
ඉති චින්තිය ඔහාය ධාරිතාභරණානි සො.

95. ඡන්නස්ස පරියාදෙත්වා කණ්ඨකඤ්ච හයාධිපං,
නිසිතං ඛග්ගමුග්ගය්හ සමොලිං ඡින්දි කුන්තලං.

96. එවමාවජ්ජයං නාථො සචෙ'හං සුගතො භවෙ,
තිට්ඨතු ගගනෙ ගන්ත්වා ඉති උක්ඛිපි ච'ඹරං.

97. තතො සක්කො මහග්ඝෙන මණිචඞ්ගොටකෙන තං,
පටිග්ගහෙත්වා සිරසා නෙත්වා දෙවපුරං වරං.

---

94. මයා, මා විසින්; එත්ථෙව, මෙහිම; පබ්බජිතුං, පැවිදි වන්ට; යුත්තං, යුතුය; මෙ, මට; පපඤ්චිතුං, පමාවන්ට, නො (යුත්තං), යුතුනොවෙයි; ඉති, මෙසේ; සො, ඒ බොධිසත්ත්ව තෙම; චින්තිය, සිතා; ධාරිතාභරණානි, පැලඳි ආභරණයන්; ඔහාය, මුදා.

95. හයාධිපං, තුරඟශ්‍රෙෂ්ඨවූ; කණ්ඨකඤ්ච, කණ්ඨකයාද; ඡන්නස්ස, ඡන්න ඇමතියනට; පරියාදෙත්වා, භාරකොට; නිසිතං, තියුණුකරණලද; ඛග්ගං, කඩුව; උග්ගය්හ, ඔසවා ගෙණ; සමොලිං, මෞලිසහිතවූ; කුන්තලං, කෙසකලාපය; ඡින්දි, සිඳී.

96. නාථො, ලොකනාථවූ ඒ මහාසත්ත්වතෙම; සචෙ, ඉදින්; අහං, මම; සුගතොභවෙ, බුදුවන්නෙම්නම්; ගගනෙ, අහස්කුස; ගන්ත්වා, (කෙශකලාපය) ගොස්; තිට්ඨතු ඉති, සිටීවයි; එවං, මෙසේ; ආවජ්ජයං, ආවර්ජනාකරමින්; අඹරං, අහසට; උක්ඛිපිච, දැමීය.

97. තතො, ඉක්බිති; සක්කො, ශක්‍රදෙවෙන්ද්‍රතෙම; මහග්ඝෙන, මාහැඟිවූ; මණිචඞ්ගොටකෙන, මිණිමුවාසුමුගකින්; වරං, උතුම්වූ; තං, ඒ කෙසකලාපය; සිරසා, මස්තකයෙන්; පටිග්ගහෙත්වා, පිළිගෙණ; දෙවපුරං, දිව්‍යපුරයට; නෙත්වා, ගෙණගොස්.

98. කාරෙත්වා මණිථූපං සො නිධෙත්වා තං සිරොරුහං,
අන්වහං පතිමානෙති සහ දෙවෙහි නෙකධා.

99. මහාබ්‍රහ්මොපනීතට්ඨපරික්ඛාරං මහාමති,
පටිග්ගහෙත්වා කාසාවං නිවත්ථො පාරුතො තදා.

100. පුබ්බ වියම්බරං ගය්හ අම්බරෙ ඛිපි නායකො.
පටිග්ගහෙත්වා තං බ්‍රහ්මා නෙත්වා බ්‍රහ්මපුරං වරං.

101. ද්වාදසයොජනුබ්බෙධං කත්වා ථූපවරං සුභං,
තත්ථ තං නිදහිත්වාන පණිපාතෙති සබ්බදා.

---

98. සො, ඒ ශක්‍රදෙවේන්ද්‍රතෙම; මණිථූපං, මිණිසෑයක්; කාරෙත්වා, කරවා; තං සිරොරුහං, ඒ කෙශධාතුව; නිධෙත්වා, (එහි) පිහිටුවා (නිධානකොට); සහ දෙවෙහි, දෙවියන් සමග; අනෙකධා, නානාප්‍රකාරයෙන්; අන්වහං, දවස්පතා; පතිමානෙති, පුදයි.

99. තදා, එකල්හි; මහාමති, මහාප්‍රාඥවූ බොධිසත්වතෙම; මහාබ්‍රහ්ම, (ඝටීකාර නම්) මහබඹහු විසින්; උපනීත, එළවන ලද; අට්ඨපරික්ඛාරං, අටපිරිකර; පටිග්ගහෙත්වා, පිළිගෙණ; කාසාවං, කාෂාය වස්ත්‍ර; නිවත්ථො, හැන්දේ; පාරුතො, පෙරවියේද වී.

100. නායකො, ලොකනායකවූ මහා බොධිසත්වතෙම; පුබ්බවිය, පෙරමෙන් (සිතා); අම්බරං, හන්සළුසඟල; ගය්හ, ගෙණ; අම්බරෙ, අහසෙහි; ඛිපි, දැමීය; වරං, උතුම්වූ (ඒ හන් සළුව); බ්‍රහ්මා, මහාබ්‍රහ්මතෙම; පටිග්ගහෙත්වා, පිළිගෙණ: බ්‍රහ්මපුරං, බ්‍රහ්මලොකයට; නෙත්වා, ගෙණගොස්.

101. ද්වාදසයොජනුබ්බෙධං, දොළොස් යොදුනක් උස ඇති; සුභං, මනොඥවූ; ථූපවරං, උතුම් චෛත්‍යයක්; කත්වා, කොට; තත්ථ, එහි; තං, ඒ වස්ත්‍ර ධාතුව; නිදහිත්වාන, නිධානකොට; සබ්බදා, සෑමකල්හි; පණිපාතෙති, නමස්කාර කරයි.

102. සම්පුණ්ණමනසඞ්කප්පො පබ්බජ්ජසිරිමුබ්බහං,
ඡාදෙන්තො කමලෙනෙව මරුං වඩ්ඪමි නායකො.

103. තතො අම්බවනං ගන්ත්වා වින්දන්තො පීතිජං සුඛං,
වීතිනාමයි සත්තාහං රම්මෙ පාදපමණ්ඩපෙ.

104. තතො රාජගහං ගන්ත්වා පාරුපිත්වාන චීවරං,
ගහෙත්වා මණිවණ්ණං සො පත්තං කරතලම්බුජෙ.

105. බත්තිංසලක්ඛණූපෙතො අනුබ්‍යඤ්ජනමණ්ඩිතො,
බ්‍රහ්මුජ්ජුගත්තො භගවා පුරසෙට්ඨමුපාගමි.

---

102. නායකො, ලොක නායකවූ මහාබොධිසත්වතෙම; සම්පුණ්ණ මනසඞ්කප්පො, පරිපූර්ණ මනස්සඞ්කල්පනා ඇත්තේ; පබ්බජ්ජසිරිං, ප්‍රව්‍රජ්‍යාශ්‍රීය (ශොභාව); උබ්බහං, උසුලන්නේ; කමලෙන, පද්මයකින්; මරුං, වැලිතලාව; ඡාදෙන්තො ඉව, ප්‍රතිච්ඡාදනය කරන්නාක්මෙන්; වඩ්ඪමි, සක්මන් කළසේක.

103. තතො, ඉක්බිති; අම්බවනං, (අනුපිය නම්) අඹ උය නට; ගන්ත්වා, ගොස්; පීතිජං, ප්‍රීතියෙන්නිපන්; සුඛං, සැපය; වින්දන්තො, විඳිමින්; රම්මෙ, සිත්කළුවූ; පාදපමණ්ඩපෙ, වෘක්ෂච්ඡායාමණ්ඩපයෙහි; සත්තාහං, සත් දිනක්; වීතිනාමයි, ඉක්මවී.

104. තතො, ඉක්බිත්තෙන්; සො, ඒ මහාසත්වතෙම; චීවරං, සිවුරු; පාරුපිත්වා (සුපිළිසන්ව) පොරවා; මණිවණ්ණං, (ඉඳුනිල්) මිණිපැහැ ඇති; පත්තං, (ඝන ශෛලමය) පාත්‍රය; කරතලම්බුජෙ, හස්තතල නැමැති පද්මයෙන්; ගහෙත්වා, ගෙණ; රාජගහං, රාජගෘහ නගරයට; ගන්ත්වා, වැඩ.

105. බත්තිංසලක්ඛණ, දෙතිස් මහාපුරුෂ ලක්ෂණයෙන් උපෙතො, යුක්තවූ; අනුබ්‍යඤ්ජන, අසූ අනුව්‍යඤ්ජනයෙන්; මණ්ඩිතො, හෙබියාවූ; බ්‍රහ්මුජ්ජුගත්තො, බ්‍රහ්මකාය මෙන් ඍජුවූ කයක් ඇත්තාවූ; භගවා, භාග්‍යවත් (වූ මහාබොධිසත්ව) තෙම; පුරසෙට්ඨං, ශ්‍රෙෂ්ඨවූ රාජගෘහ නම් නගරයට; උපාගමි, එළඹිසේක.

106. විසිඛන්තරෙන ගච්ඡන්තං ලොකෙකනායකං ජනා,
දිස්වා එවං විචින්තෙසුං නායං යො සො ජනාධිපො.

107. කාමං පුරවධූසොම්මවත්තසම්බන්ධකාරණා,
චන්දෙ'යමාගතො අජ්ජ සකවෙසෙන නො මති.

108. සුත්වාන තං තදා කෙචි හසන්තා වචනන්තරං,
නායං සසී සසඞ්කො සො භානුමෙසොති නොමති.

109. බොධෙතුමාගතො කාමං පොරීනං වදනම්බුජෙ.
සකීයෙනෙව රූපෙන විම්හයං පොරිමානුසෙ.

---

106. ජනා, ජනයෝ ; විසිඛන්තරෙන, වීථි මධ්‍යයෙන් ; ගච්ඡන්තං, වඩනාවූ ; ලොකෙකනායකං, ලොවට අසහාය නෙතෘවූ මහාබොධිසත්වයන් ; දිස්වා, දැක ; යො, යමෙක්; ජනාධිපො, රජද; සො, හෙතෙම; අයං න, මෙතෙම නොවේයයි; (නොහොත්) අයං ජනාධිපො, මේ ජනශ්‍රෙෂ්ඨතෙම ; න යො සො, එසේ මෙසේ කෙනෙක් නොවේයයි ; එවං, මෙසේ : විචින්තෙසුං, සිතූහු.

107. කාමං, ඒකාන්තයෙන්; පුරවධූ, පුරස්ත්‍රීන්ගේ; වත්තසම්බන්ධ කාරණා, වක්ත්‍රසම්බන්ධ හෙතුවෙන් ; අජ්ජ, අද ; චන්දෙ, චන්ද්‍රතෙම ; සකවෙසෙන, ස්වකීයවිලාසයෙන් ; ආගතො, ආයේයයි ; නො, අපගේ ; අයං මති, මේ මතයයි.

108., 109. තදා, එකල්හි ; කෙචි (නරා), ඇතම් (මනුෂ්‍යයෝ) තං වචනන්තරං, ඒ වාග්විශෙෂ; සුත්වාන, අසා ; හසන්තා, සිනාසෙන්නාහු (මෙසේ කීවූ); අයං, මෙතෙම ; සසී න, චන්ද්‍රයාද නොවන්නේය ; සො, ඒ චන්ද්‍රතෙම ; සසඞ්කො, සසලෙබාඇත්තෙක; එසො භානුමා, මේ සූර්‍ය්‍යතෙම; සකීයෙනෙව, ස්වකීයවූම ; රූපෙන, රූපයෙන් යුක්තව ; පොරිමානුසෙ, පුරවාසි මිනිසුන් ; විම්හයං, විස්මයප්‍රාප්ත කරමින්; කාමං, ඒකාන්තයෙන්; පොරීනං, පුරවැස්සන්ගේ; වදනම්බුජෙ, වක්ත්‍රපද්මයන් ; බොධෙතුං, ප්‍රබොධකරන්ට ; ආගතො ඉති, ආයේයයි; නො, අපගේ; මති, මතයයි.

110. කිං හො උම්මත්තකා අත්‍ථි එවං මා වදථාධුතා,
සතරංසි උණ්හරංසී න සො එසො අවිග්ගහො.

111. කාමෙනාලසජන්තූහි කීළිතුං පුරමාගතො,
සරූපෙන න නො අත්‍ථි සංසයො ඛලු මානසෙ.

112. තෙසං තං වචනං සුත්‍වා හසන්තා කෙචි ජන්තුනො,
තුම්හෙ ඛලු න ජානාථ සබාණෙ සධනූ හි සො.

113. ඉස්සරො කන්තරූපෙන තුඞ්ගමන්දිරතා පුරං,
කෙලාසො ඉති සම්පත්තො ජහාථ විමතිං ඉධ.

110, 111. කිං, කිමෙක්ද ; හො, භවත්හි ; උම්මත්තකා අත්‍ථි, උමතුවූවහුද ; එවං, මෙසේ ; අධුතා, ධූත් ; මාවදථ, නොකියව් ; න සතරංසි, සූර්‍ය්‍යයාද නොවේ ; සො, එතෙම ; උණ්හරංසී, උෂ්ණවූ රශ්මි ඇත්තෙකි ; එසො, මේ ; අවිග්ගහො, අනඞ්ගතෙම ; කාමෙන, කාමයෙන් ; අලසජන්තූහි, මැලිවූ ලොකයා සමග ; කීළිතුං, රතික්‍රීඩාකරණු පිණිස ; සරූපෙන, ස්වකීය රූපයෙන් යුක්තව ; පුරං, (අප) පුරයට ; ආගතො, ආයේය ; නො, අපගේ ; මානසෙ, සිත්හි ; ඛලු, ඒකාන්තයෙන් ; සංසයො, ශංකාවෙක් ; න අත්‍ථි, නොම ඇත්තේයි (කීහු).

112. කෙචි ජන්තුනො, ඇතම් දනෝ ; තෙසං, ඔවුන්ගේ ; තං වචනං, ඒ වචනය ; සුත්‍වා, අසා ; හසන්තා, සිනාසෙන් නාහු ; තුම්හෙ ඛලු, තෙපිදු ; න ජානාථ, නොදන්නාහුය ; හි, යම්හෙයකින් ; සො, ඒ අනඞ්ගතෙම ; සබාණෙ, ඊසහිතද ; සධනූ, දුනු සහිතද (එහෙයිනි).

113. ඉස්සරො, ඊශ්වරතෙම ; කන්තරූපෙන, මනොඥවූ රූපයකින් ; තුඞ්ගමන්දිරතාය, ප්‍රාංශුවූ ගෘහ ඇති බැවින් ; කෙලාසො ඉති, කෛලාසපර්වත[illegible]හෝයි ; පුරං, (මේ අප) පුරයට ; සම්පත්තො, පැමිණියේයි ; ඉධ, මෙහි ; විමතිං, විවිධ මතිය ; ජහාථ, අත්හරිව් (සි කීහු).

114. තෙසම්පි වචනං සුත්වා හසන්තෙකෙ ජනා තදා,
නායං හරෙ තිනෙත්තො සො කෙසවෙසො ඉධාගතො.

115. විචිණන්තො සිරිං අජ්ජ පුරසෙට්ඨමුපාගතං,
වෙසෙනඤ්ඤෙන මඤ්ඤාම එත්ථ නො නත්ථි සංසයො.

116. පහරිත්වා කරං කෙචි සුත්වා තං වචනං නරා,
හසන්තෙවං තදාවොචුං වාසුදෙවො න වෙ අයං.

114, 115. තදා, එකල්හි ; එකෙ ජනා, ඇතම් ජනයෝ ; තෙසං අපි, ඔවුන්ගේද ; වචනං, කීම ; සුත්වා, අසා ; හසන්තා, සිනා පහළකරන්නෝ ; අයං, මේතෙම ; හරෙ න, ඊශ්වරද නොවන්නේය ; සො, හෙතෙම ; තිනෙත්තො, නෙත් තුණක් ඇත්තෙක ; එසො, මේ ; කෙසවො, ශ්‍රීවිෂ්ණු තෙම ; පුරසෙට්ඨං, පුරප්‍රවරයට ; උපාගතං, පැමිණියාවූ ; සිරිං, ලක්ෂ්මිය ; විචිණන්තො, සොයමින් ; අඤ්ඤෙන වෙසෙන, අප්‍රසිද්ධ වෙශයකින් ; අජ්ජ, අද ; ඉධාගතො, මෙහි ආයේයයි ; මඤ්ඤාම, හඟිමු ; එත්ථ, මෙහිලා ; නො, අපට ; සංසයො, සැකයක් ; නත්ථි, නැති (යි කීහු).

116. තදා, එකල්හි ; කෙචි නරා, ඇතැම් මනුෂ්‍යයෝ ; තං වචනං, ඒ වචනය ; සුත්වා, අසා ; කරං පහරිත්වා, හස්ත ස්ඵොටනය කොට ; හසන්තා, සිනාසෙන්නාහු ; එවං, මෙසේ ; අවොචුං, කීවූ ; අයං, මේතෙම ; වෙ, එකාන්තයෙන් ; වාසුදෙවො න, විෂ්ණුද නොවන්නේය.

117. කාමං සරොජනාභො සො වාමනො කණ්හවිග්ගහො,
අයමඤ්ඤතරවණ්ණෙන ආගතො පාකසාසනො.

118. පුරං දෙවපුරමෙතං මඤ්ඤමානො මහාජුතිං,
පස්සිතුන්ති පටිඤ්ඤාතො මා භොන්තො විලපන්තු වෙ.

119. සුත්වා තෙසං ගිරං කෙචි කෙළිං කත්වාන නෙකධා.
තුම්හෙ සක්කං න ජානාථ සො හි භො වජිරායුධො.

120. එසො හි භො මහාබ්‍රහ්මා බ්‍රහ්මලොකා ඉධාගතො,
පමත්තා කින්නු වෙදම්හි බ්‍රහ්මබන්ධූ පුරෙ ඉධ.

---

117, 118. සො, ඒ විෂ්ණුතෙම ; කාමං, එකාන්තයෙන් ; සරොජනාභො, පද්ම නාභිය ; වාමනො, වාමනාවතාර ඇත්තෙක හෙවත් ලකුණ්ටකය ; කණ්හවිග්ගහො, කෘෂ්ණ වර්ණ ශරීර ඇත්තේය ; අයං, මේ ; පාකසාසනො, ශක්‍ර දෙවේන්ද්‍රතෙම ; එතං පුරං, මේ නුවර ; දෙවපුරං ඉති, (ඔහුගෙ) දිව්‍යපුරයයි ; මඤ්ඤමානො, හඟනේ ; මහාජුතිං, මහත්වූ ශොභාව ; පස්සිතුං ඉති, දක්නටයයි ; පටිඤ්ඤාතො, ප්‍රතිඥා කොළේ ; අඤ්ඤතර වණ්ණෙන, එක්තරා (අප්‍රසිද්ධ) විලාසයකින් ; ආගතො, (මෙහි) ආයේය ; භොන්තො, පින්වත්හු ; වෙ, එකාන්තයෙන් ; මා විලපන්තු, ප්‍රලාප නොදෙඩත්වා (යි කීහු).

119. කෙචි, සමහරෙක් ; තෙසං, ඔවුන්ගේ ; ගිරං, (ඒ) කීම ; සුත්වා, අසා ; අනෙකධා, අනෙක ප්‍රකාරයෙන් ; කෙළිං කත්වාන, පරිහාස කොට ; තුම්හෙ, තෙපි ; සක්කං, ශක්‍රයා ; න ජානාථ, නොදන්නහුද ; භො, භවත්නි ; සොහි, ඒ ශක්‍රතෙම වනාහි ; වජිරායුධො, වජ්‍රායුධයක් ඇත්තේයි.

120. භො, පින්වත්නි ; එසොහි මහාබ්‍රහ්මා, මේ මහාබ්‍රහ්ම තෙම වනාහි ; ඉධ පුරෙ, මේ නගරයෙහි ; බ්‍රහ්මබන්ධූ, බ්‍රහ්මබන්ධූ (බ්‍රාහ්මණයෝ) ; වෙදම්හි, වේද හැදෑරීමෙහි ; කින්නු, කිමෙක්දෝ ; පමත්තා, ප්‍රමාදවූවාහුදැයි ; බ්‍රහ්මලොකා, බඹලොවින් ; ඉධ ආගතො, මෙහි ආයි (කීහු).

121. අථෙසං වචනංසුත්වා කෙචි පණ්ඩිතජාතිකා,
නෙතෙ වන්ද්‍යයො කාමං මා මොහං භො
පකාසථ. (3)

122. චතුරානනො මහාබ්‍රහ්මා සොමසොම්මානනො අයං,
ස මන්තපොත්ථකො බ්‍රහ්මා පත්තහත්ථො'බ්භුතො.

123. කාමං පාරමිතාපුණ්ණ* පසත්ථො පුරිසො අයං,
නිච්චං වන්දථ පූජෙථ ථොමෙථෙතං මහාජුතිං.

---

121. අථ, ඉක්බිත්තෙන්: කෙචි පණ්ඩිතජාතිකා, ඇතම් පණ්ඩිත ජාතිකයෝ; එසං වචනං, ඔවුන්ගේ වචනය; සුත්වා, අසා; කාමං, ඒකාන්තයෙන්; එතෙ වන්ද්‍යයො න, තෙල සඳ අදිනු නොවෙත්; භො, පින්වත්නි; මොහං, මොහය; මා පකාසථ, නහමක් ප්‍රකාශකරව්.

122. මහාබ්‍රහ්මා, මහබඹතෙම; චතුරානනො, චතුර්මුඛයක් ඇත්තේය; අයං, මේතෙම; සොම, චන්ද්‍රයාවැනිවූ; සොම්මානනො, සෞම්‍ය මුහුනක් ඇත්තේය; සො මහාබ්‍රහ්මා, ඒ මහාබ්‍රහ්මතෙම; මන්තපොත්ථකො, වෙදපුස්තක ධාරිය; අයං, මේතෙම; පත්තහත්ථො, පාත්‍රයක් ගත් අත් ඇත්තේය; අබ්භුතො, අද්භූතයි.

123. අයං, මේතෙමේ; කාමං, ඒකාන්තයෙන්; පාරමිතා පුණ්ණ, පාරමීධර්මයන්ගෙන් පිරුණාවූ (නොහොත්) පිරිණූ පෙරුම්දම් ඇති; පසත්ථො, ප්‍රශස්තවූ; පුරිසො, පුරුෂයෙක්; එතං මහාජුතිං, මේ මහාද්‍යුතිමත් පුරුෂොත්තමයන්; නිච්චං, අනවරතයෙන්; වන්දථ, වඳිව්; පූජෙථ, පුදව්; ථොමෙථ, පසසව් (සි කීහු.)

---

* "කාමං පාරමි සම්පුණ්ණො."

124. එවං වදන්තා සබ්බෙ තෙ නාගරා පුරිසුත්තමං,
ගන්ධපුප්ඵෙහි පූජෙන්තා නමස්සන්තා තමන්වගුං.

125. නෙත්තාරිත්තෙහි පාජෙන්තා මුනිනො රූපසාගරෙ.
ජනතාවො මනනාවායො පාරං පස්සිංසු නො තදා.

126. තදා ලොකෙකනයනො සපදානෙන වීථියං,
චරං යාපනමත්තංව ලද්ධාගම්ම පුරා බහි.

127. පණ්ඩවං ගිරිමාසජ්ජ තස්සච්ඡායාය සො මුනි,
සඞ්ඝාටිං පඤ්ඤපෙත්වාන නිසජ්ජ පුරිසාසභො.

---

124. එවං වදන්තා, මෙසේ කියන්නාවූ; සබ්බෙ තෙ නාගරා, ඒ මුළුනුවර වැස්සෝ; තං පුරිසුත්තමං, ඒ පුරුෂොත්තමයන්; ගන්ධපුප්ඵෙහි, ගඳමලින්; පූජෙන්තා, පුදන්නාහු; නමස්සන්තා, නමස්කාරකරන්නාහු; අන්වගුං, (ඔහු) අනුව (පස්සේ) ගියාහුයි.

125. තදා, එකල්හි; ජනතාවො, ලොකවාසීහු; මුනිනො, මුනීන්ද්‍රවූ බෝසතානන්වහන්සේගේ; රූපසාගරෙ, රූප නැමැති සාගරයෙහි; මනනාවායො, සිත් නැමති නෞකා වන්; නෙත්තාරිත්තෙහි, නුවන් නැමැති පළුපතින්; පාජෙන්තා, පදින්නාහු; පාරං, පරතෙර; නො පස්සිංසු, නොමදුටු.

126. තදා, එකල්හි; ලොකෙකනයනො, ලොවට අසහාය නෙත්‍රවූ බෝසත්තෙම; සපදානෙන, ගෙපිළිවෙළින්; වීථියං, වීථියෙහි; චරං, හැසිරෙන්නේ; යාපනමත්තං එව, යැපෙන පමණක්වූම ආහාරය; ලද්ධා, ලැබ; පුරා, පුරයෙන්; බහි ආගම්ම, පිටතට අවුත්.

127. පුරිසාසභො, පුරුෂොත්තමවූ; සො මුනි, ඒ මුනීන්ද්‍රවූ බොධිසත්වතෙම; පණ්ඩවංගිරිං, පාණ්ඩව නම්වූ පර්වතප්‍රාන්තයට; ආසජ්ජ, පැමිණ; තස්ස, ඒ පර්වතයාගේ; ඡායාය, සෙවෙනෙහි; සඞ්ඝාටිං, සඟළ සිවුර; පඤ්ඤපෙත්වාන, පණවා ගෙණ; නිසජ්ජ, වැඩහිඳ.

128. අදිට්ඨපුබ්බං දිස්වාන පත්තෙ මිස්සකභොජනං,
සඤ්ජාතපටිකූල්‍යො තං නුදිත්වා පච්චවෙක්ඛණා.

129. අමතං විය තං භුත්වා වික්ඛාලෙත්වා මුඛං දකා,
පත්තෙ වත්තං චරිත්වාන මුහුත්තං තත්‍ථ විස්සමි.

130. පවත්තිං තං නිසාමෙත්වා බිම්බිසාරො නරිස්සරො,
සීඝං තමුපගන්ත්වාන කතානුඤ්ඤො නිසීදිය.

131. නිමන්තයිත්වා රජ්ජෙන අනිච්ඡන්තෙ යතිස්සරෙ,
අනුග්ගහාය මෙ යුත්තං බුද්ධභූතෙනිධාගමං.

---

128. පත්තෙ, පාත්‍රයෙහි; අදිට්ඨපුබ්බං, නුදුටුවිරූ; මිස්සකභොජනං, මිශ්‍රකාහාරය; දිස්වා, දැක; සඤ්ජාතපටිකූල්‍යො, හට ගත් පිළිකුල් ඇත්තේ; පච්චවෙක්ඛණා, ප්‍රත්‍යවෙක්ෂා හෙතුවෙන්; තං, ඒ ප්‍රාතිකූල්‍යය; නුදිත්වා, දුරුකොට.

129. තං, ඒ ඇවිලිලි ආහාරය; අමතං විය, අමෘතයක් මෙන්; භුත්වා, වළඳා; මුඛං, මුඛය; දකා, පැනින්; වික්ඛාලෙත්වා, පවිත්‍රකොට නොහොත් සෝදා; පත්තෙ, පාත්‍රයෙහි; වත්තං චරිත්වාන, වත්කොට; මුහුත්තං, මුහූර්ත කාලයක්; තත්‍ථ, එහි; විස්සමි, විඩා හළසේක.

130. බිම්බිසාරො නරිස්සරො, බිම්සර රජතෙම; තං පවත්තිං, ඒ ප්‍රවෘත්තිය; නිසාමෙත්වා, අසා; සීඝං, යුහුව; තං උපගන්ත්වාන, උන්වහන්සේවෙත එළඹ; කතානුඤ්ඤො, කරණලද අනුඥ ඇත්තේ; නිසීදිය, හිඳ.

131. රජ්ජෙන, රාජ්‍යයෙන්; නිමන්තයිත්වා, පවරා; යතිස්සරෙ, යතීශ්වරවූ බෝසත්හු; අනිච්ඡන්තෙ, නොකැමැති කල්හි; බුද්ධභූතෙන, බුදුවූ නුඹවහන්සේ විසින්; මෙ, මට; අනුග්ගහාය, අනුග්‍රහයපිණිස; ඉධාගමං, මෙහි ඊම; යුත්තං, යුතු වන්නේයි (කි.)

132. එවං නිමන්තිතො තෙනාධිවාසෙත්වා මහාමති,
අගමාසුරුවෙලාය මතුලොරුපරක්කමො.

133. පධානං පදහිත්වාන ඡබ්බස්සමතිදුක්කරං,
පකාසෙත්වාන ලොකස්ස මොක්ඛං නත්ථීති
තෙන සො.

134. තතොප්පභුති වත්තනෙතා මජ්ඣිමප්පටි
පත්තියං,
කායස්සානුග්ගහං කත්වා තතො සම්පීණිති
න්ද්‍රියො.

135. මූලෙ'ජපාලනිග්‍රොධපාදපස්ස මහාමුනි,
නිසීදි නිජසොභාහි ඔභාසෙන්තො දිසොදිසං.

---

132. තෙන, ඒ රජහු විසින්; එවං, මෙසේ; නිමන්තිතො, ආරාධනා කරණලද්දූවූ; අතුලො, අසදෘශවූ; උරුපරක්කමො, මහත් පරාක්‍රමඇති; මහාමති, මහාප්‍රාඥවූ බෝසත්තෙම; අධිවාසෙත්වා, (ඒ) ඉවසා; උරුවෙලායං, උරුවෙල් දනව්වට; අගමාසි, වැඩිසේක.

133. සො, ඒ මහබෝසත්තෙම; ඡබ්බස්සං, සාවුරුද්දක් මුලුල්ලෙහි; අතිදුක්කරං, අතිශයින් දුෂ්කරවූ; පධානං පදහිත්වාන, වීර්‍ය්‍යකොට නොහොත් වීර්‍ය්‍ය වඩා; තෙන, ඒ වීර්‍ය්‍ය කරණයෙන්; මොක්ඛං, මොක්‍ෂයක්; නත්ථි ඉති, නැතැයි; ලොකස්ස, ලොවට; පකාසෙත්වාන, ප්‍රකාශකොට.

134. තතොප්පභුති, එතැන්පටන්; මජ්ඣිමප්පටිපත්තියං; මධ්‍යම ප්‍රතිපදාවෙහි; වත්තනෙතා, පවත්නේ; කායස්ස, ශරීරයට; අනුග්ගහං කත්වා, අනුග්‍රහ කොට; තතො, එයින්; සම්පීණිත ඉන්ද්‍රියො, පිණාගිය ඉඳුරන් ඇත්තේ

135. මහාමුනි, මහාතපස්වීවූ බොධිසත්වතෙම; අජපාලනිග්‍රොධපාදපස්ස, අජපාල න්‍යග්‍රොධවෘක්‍ෂයාගේ; මූලෙ, මුල (සමීපයෙහි); නිජසොභාහි, ස්වකීය ශොභාවෙන්; දිසොදිසං, දිශානුදිශාවන්; ඔභාසෙන්තො, බබුලුවමින්; නිසීදි, වැඩඋන්සේක.

136. තදා සෙනානිගමෙ සුජාතා ඛීරදායිකා,*
සම්පුණ්ණමනසඞ්කප්පා යාචිත්වා වටදෙවතං.

137. ඛීරං දෙවොති මඤ්ඤන්ති තුට්ඨහට්ඨා පමොදිතා,
හෙමපාතිං සපායාසං දත්වාන ඉදමබ්‍රවි.

138. යථා මය්හං මහාදෙව ඉද්ධා පත්ථිත පත්ථනා,
තථෙව තව සඞ්කප්පා ඛිප්පමෙව සමිජ්ඣතු.

139. ඉති වත්වාන වන්දිත්වා කත්වා ච නං පදක්ඛිණං,
පක්කන්තාය සුජාතාය ධීරො පාතිං සමාදිය.

---

136. තදා, එකල්හි; සෙනානිගමෙ, සෙනානීනම් නියම් ගම්හි; සුජාතා ඛීරදායිකා, සුජාතා නම් ක්ෂීරදායිකාතොමෝ; වටදෙවතං, නුගරුක්වැසි දෙවියා; යාචිත්වා, යැද; සම්පුණ්ණ, පිරුණාවූ; මනසඞ්කප්පා, චිත්ත සඞ්කල්පනා ඇත්තී :—

137. ඛීරං, ප්‍රාඥවූ ඒ බෝසතානන්; දෙවොඉති, (වෘක්ෂාධිවාසී) දෙවියායයි; මඤ්ඤන්ති, හඟනී; තුට්ඨහට්ඨා, තුටුපහටු වූවා; පමොදිතා, ප්‍රමොදයට පැමිනියා; සපායාසං, කිරිපිඬු සහිතවූ; හෙමපාතිං, රන්තැටිය; දත්වාන, දී; ඉදං, මේ මතු කියන කාරණය; අබ්‍රැවී, කී.

138. මහාදෙව, මහාදෙවයන්වහන්ස; මය්හං, මාගේ; පත්ථිත පත්ථනා, පතනලද ප්‍රාර්ථනාව; යථා ඉද්ධා, යම්සේ සමෘද්ධවූවාද; තථා එව, එපරිද්දෙන්ම; තව, නුඹවහන්සේගේ; සඞ්කප්පො, සඞ්කල්පනාව; ඛිප්පං එව, වහාම්; සමිජ්ඣතු, සමෘද්ධ වේවා.

139. ඉති වත්වාන, මෙසේ කියා; නං, උන්වහන්සේ; වන්දිත්වා, වැඳ; පදක්ඛිණං ච කත්වා, පැදකුණුද කොට; සුජාතාය, සුජාතාවන්; පක්කන්තාය, බැහැර ගිය කල්හි; ධීරො, ප්‍රාඥවූ මහබෝසත්තෙම; පාතිං, තලිය; සමාදිය, රැගෙණ:

---

* සුජාතා ඛිර දරිකා.

140. උපගන්ත්වානාතිරම්මං නදිං සො නීලවාහිනිං
සුප්පතිඨිතනාමම්හි නදීතිත්ථෙ නිසීදිය.

141. භුඤ්ජිත්වා ඌනපඤ්ඤාසපිණ්ඩං කත්වාන භොජනං,
විස්සජ්ජෙත්වා තතො පාතිං පටිසොතං නරාසභො.

142 තතො සාලවනුය්‍යානෙ විස්සමෙන්තො දිවාදිනෙ,
දිස්වාන සුපිනෙ පඤ්ච අත්ථං තෙසං විචින්තිය.

143. ආබොධිමූලතො (4) මග්ගෙ දෙවෙහි සමලඞ්කතෙ
මණිතොරණපාලීහි* පුණ්ණකුම්භධජාදිහි.

---

140. සො, ඒ මහබෝසත්තෙම; අතිරම්මං, ඉතාරම්‍යවූ; නීලවාහිනිං, නිල්දලානම්වූ; නදිං, හොය කරා; උපගන්ත්වාන, එළඹ; සුප්පතිඨිත නාමම්හි, සුප්‍රතිෂ්ඨිත යන නාමයක් ඇත්තාවූ; නදීතිත්ථෙ, ගංතොට; නිසීදිය, වැඩහිඳ.

141. නරාසභො, නරශ්‍රෙෂ්ඨවූ මහබෝසත්තෙම; ඌන පඤ්ඤාස පිඬං කත්වාන, එකුන්පණස් පිඬක් කොට; භොජනං, බොජුන; භුඤ්ජිත්වා, වළඳා; තතො, ඉක්බිති; පාතිං, රන්තලිය; පටිසොතං, උඩුගං බලා; විස්සජ්ජෙත්වා, යවා.

142. තතො, ඉක්බිති; දිවාදිනෙ, දවල්දවසැ; සාලවනුය්‍යානෙ, ශාලවනොද්‍යානයෙහි; විස්සමෙන්තො, පරිශ්‍රමය දුරුකරන්නේ; පඤ්චසුපිනෙ, පස ස්වපනයන්; දිස්වාන, දැක; තෙසං, ඒ ස්වපනයන්ගේ; අත්ථං, අර්ථය; විචින්තිය, සිතා.

143. ආබොධිමූලතො, බොධිවෘක්ෂමූලය දක්වා; මණිතොරණපාලීහි, මිණිතොරන්පෙළින්ද; පුණ්ණකුම්භ, පුන්කලස් හා; ධජාදීහි, ධ්වජාදියෙන්ද; දෙවෙහි, දෙවියන් විසින්; සමලඞ්කතෙ, මොනවට සරසනලද්දවූ; මග්ගෙ, මාර්ගයෙහි.

* "මණිතොරණද පාලීහි."

144. සායණ්හසමයෙ නාථො ගච්ඡන්තො බොධිසන්තිකං,
දිස්වාන සොත්ථියං නාම ථූයමානං දිජුත්තමං.

145. තෙන දින්නට්ඨ මුට්ඨීනාතු ගහෙත්වා නීලසද්දලං,
බොධිමූලමුපාගම්ම කත්වාන තං පදක්ඛිණං.

146. අකාසි තිණසන්ථාරං පාචීනාභිමුඛං තදා,
තතො මහිං* විධා කත්වා සමුට්ඨාසි මහාසනං.

147. උච්චං චුද්දසහත්ථෙන නානා චිත්ත විචිත්තිතං,
අධිට්ඨහිත්ව තත්‍රට්ඨො ඉච්චෙවං දළ්හමානසො.

---

144. නාථො, ලොකස්වාමිවූ ඒ මහබෝසත්තෙම; සායණ්හසමයෙ, සවස්වේලෙහි; බොධිසන්තිකං, බොධිද්‍රුම සමීපයට; ගච්ඡන්තො, වඩනේ; ථූයමානං, ස්තුති ගායනාකරන්නාවූ; සොත්ථියං නාම, සොත්ථිය නම්වූ; දිජුත්තමං, බමුණුතුමන්; දිස්වාන, දැක.

145. තු, වැලි; තෙන, ඒ සොත්ථිය නම් බමුණන් විසින් දින්න, දෙනලද; අට්ඨමුට්ඨිං, අටමිටවූ; නීලසද්දලං, නිල් කුසතණ; ගහෙත්වා, ගෙණ; බොධිමූලං, බොධිවෘක්ෂ සමීපයට, උපාගම්ම, පැමිණ; තං, ඒ බෝරුක; පදක්ඛිණං කත්වාන, පැදකුණු කොට.

146, 147. තදා, එකල්හි; පාචීනාභිමුඛං, පැදුම්දෙසට අභිමුඛ කොට; තිණසන්ථාරං, තණඇතිරියක්; අකාසි, කෙළේය; තතො, ඉක්බිති; මහිං, පෘථිවිය; විධා කත්වා, දෙපළු කොට; චුද්දසහත්ථෙන, තුදුස් රියනකින්; උච්චං, උස්වූ; නානා චිත්ත, අනෙක ප්‍රකාර සිතියමින්; විචිත්තිතං, විසිතුරු කරණලද්දුවූ; මහාසනං, මහත්වූ ආසනයක්; සමුට්ඨාසි, පැණනැංගේය; තත්‍රට්ඨො, ඒ වජ්‍රාසනස්ථවූසේක්; දළ්හමානසො, දැඩිසිත් ඇතිසේක්; ඉති එවං, මේ වක්ෂ්‍යමාණාකාරයෙන්; අධිට්ඨහිත්ව ඉටී.

---

* "මහි."

14[8]. කාමං තචො නහාරූ ච අට්ඨී ච අවසිස්සතු,
උපසුස්සතු මෙ ගත්‍තෙ සබ්බන්තං මංසලොහිතං.

149. න උඨ්ඨහාමබුජ්ඣිත්වා න ජහෙ විරියං මම,
අභිඤ්ඤිත්වා එවං සො නිසීදි වජිරාසනෙ.

150. අනතික්කමං ඨපෙත්වාන චරණං චරණූපරි,
කමලං කමලෙනෙව මණිබන්ධං විධාය සො.

151. බාලාසොකදලාසත්තා පරංවාසොකපල්ලවං,
නිධාය නයනානන්ද පාණිං පාණිතලෙ ජිනො.

---

148, 149. මෙ, මාගේ; ගත්‍තෙ, ශරීරයෙහි; තචො, සමද; නහාරූ ච, නහර ද; අඨී ච, ඇට ද; අවසිස්සතු, අවශිෂ්ටවේවා; තං සබ්බං, ඒ සියල්ල; මංස ලොහිතං, මස් ලේ; උපසුස්සතු, වියලී යේවා; කාමං, ඒකාන්තයෙන්; අබුජ්ඣිත්වා, බුදුනොවී හෙවත් සත්‍යාවබොධ නොකොට; න උඨ්ඨහාමි, නොනැගී සිටිමි; මම, මාගේ; විරියං, වීර්‍ය්‍යය; න ජහෙ, නොහරිමි; සො, ඒ මහාබොධිසත්ත්වතෙම; එවං, මෙසේ; අභිඤ්ඤිත්වා, අධිෂ්ඨානකොට; වජිරාසනෙ, විදුරසුන් මතුයෙහි; නිසීදි, වැඩහුන්සේක.

150. සො, ඒ මහාබොධිසත්ත්වතෙම; කමලං, පදමයක්; කමලෙන ඉව, පදමයකින් (වසන්නාක්) මෙන්; චරණං, ශ්‍රීපාදය; අනතික්කමං, නොඉක්මවමින්; චරණූපරි, ශ්‍රීපාදය පිට; ඨපෙත්වාන, තබාගෙණ; මණිබන්ධං, මිණිබඟන්ද; විධාය, (එක්නෙක පිට) පිහිටුවාගෙණ (එරමිණිය ගොතාගෙණ):

151. ජිනො, ඒ මහාබොධිසත්ත්වයන්වහන්සේ; බාලාසොකදලං, ලා හෝපලුපතෙක්හි; අසත්තා, වැලඳුනාවූ; පරං අසොකපල්ලවං ඉව, අනික් හෝපලුපතක් මෙන්; පාණිතලෙ, අත්ලෙහි; නයනානන්ද, නෙත්‍රොත්සවවූ; පාණිං, ශ්‍රීහස්තය; නිධාය, පිහිටුවාගෙණ.

152. යථා සඞ්ඛාසනාලීඪ තුඞ්ගකඤ්චනපබ්බතො,
සුරත්තචීවරච්ඡන්න චාරුගත්තවිරාජිතො.

153. උදයාචලකොටිම්හි දිප්පමානොව දිවාකරො,
කන්ධරොපරි දිප්පන්ත මුඛමණ්ඩලමණ්ඩිතො.

154. යථා චාමීකරබ්‍යම්හෙ සුනීලං සීහපඤ්ජරං,
අසම්පකම්පපම්හෙහි* පිහිතඩ්ඪසුලොචනො.

155. නීලුප්පලකලාපංව ජනනෙත්තාලිපාතනං,
සජ්ජුද්දණ්ඩසමාබද්ධබොධික්ඛන්ධම්අපස්සි සො.

---

152. සඞ්ඛාසන, සඞ්ඛවලාමයෙන් ; ආලීඪ, වැලඳගත් තාවූ ; තුඞ්ග, ප්‍රාංශුවූ ; කඤ්චන පබ්බතො, සවර්ණපර්වත යක් ; යථා, යම්සේද (එපරිද්දෙන්) ; සුරත්ත, අතිරක්තවූ චීවරච්ඡන්න, සිවුරින් වැසුනාවූ ; චාරු, මනොඥවූ ; ගත්ත ශ්‍රීශරීරයෙන් ; විරාජිතො, බබලන්නාවූ.

153. උදයාචලකොටිම්හි, උදයගිරි මුදුනෙහි ; දිප්පමානො, බබලන්නාවූ ; දිවාකරො ඉව, සූර්‍ය්‍යයා මෙන් ; කන්ධරොපරි ග්‍රීවයෙහි මත්තෙහි ; දිප්පන්ත, බබලන්නාවූ ; මුඛමණ්ඩල, මුහුණුමඬලින් ; මණ්ඩිතො, විභූෂිතවූ.

154. චාමීකරබ්‍යම්හෙ, සවර්ණප්‍රාසාදයෙක්හි ; සුනීලං, ඉතා නිල්වූ ; සීහපඤ්ජරං, සීමැදුරක් ; යථා, යම්සේද (එමෙන්); අසම්පකම්පපම්හෙහි, අකම්පමාන පක්ෂ්මමාලා යෙන් උපලක්ෂිතවූ ; පිහිතඩ්ඪ, අඩක් පියනලද ; සුලොචනො, මනා නෙත්සගල ඇත්තාවූ.

155. සො, ඒ මහාබොධිසත්වතෙම ; සජ්ජුද්දණ්ඩසමාබද්ධ, ඍජු දණ්ඩක බඳනාලද ; නීලුප්පලකලාපං ඉව, නිලුපුල්කල ඹක් වැනිවූ (එහෙයින්ම) ; ජන, ජනයාගේ ; නෙත්ත, නෙත්‍ර නැමැති ; අලිපාතනං භෘඞ්ග (ශ්‍රේණී) පතනය ඇත් තාවූ ; බොධික්ඛන්ධං, සිරිමහ බෝකඳට ; අපස්සි, පිටදී හුන්සේක.

---

* අකම්ප කම්ප පම්හෙහි.

156. නිසින්නෙ බොධිතො ජෙජ්ජ පවාළතරුණඞ්කුරා,
පතමානා සමන්තාසුං තොජං විය කුම්බිනං.

157. දෙවා තත්‍ථ සමාගඤ්ඡුං ඛිප්පං දසසහස්සියං,
කමලාසනොරගා චෙව සිද්ධවිජ්ජාධරාදයො.

158. සහම්පති මහාබ්‍රහ්මා බ්‍රහ්මසෙනාපුරක්ඛතො,
සිතාතපත්තං ධාරෙන්තො ඨිතො සම්බුද්ධසන්තිකෙ.

159. වීසං* රතනසතායාමං විජයුත්තරනාමකං,
සඞ්ඛං ධමෙන්තො අට්ඨාසි සාදරො පාකසාසනො.

---

156. නිසින්නෙ, (බොධිසත්ත්වයන්) වැඩඋන් කල්හි; පවාළ තරුණඞ්කුරා, පබළු වැනි ලෙදලු ; කුම්බිනං, දුර්බුඹ (මිස දිවුව)න්ගේ ; තොජං විය, තොදු මෙන් ; බොධිතො, බොධි ද්‍රුමයෙන් ; ජෙජ්ජ, සිඳී ; සමන්තා, හාත්පස ; පතමානා ආසුං, හෙන්නාහු වූ.

157. දසසහස්සියං, දසදහසක් ලෝදෙහි ; දෙවා, දෙවි යෝද ; කමලාසන, බ්‍රහ්මයන් හා ; උරගාචෙව, නාගයෝද ; සිද්ධ, සිද්ධය; විජ්ජාධර, විද්‍යාධරය; ආදයො, මේ ආදීහුද; තත්‍ථ, එතන්හි ; ඛිප්පං, වහා ; සමාගඤ්ඡුං, රැස්වූ.

158. සහම්පති මහාබ්‍රහ්මා, සහම්පතිනම් මහාබ්‍රහ්මතෙමේද ; බ්‍රහ්මසෙනාපුරක්ඛතො, බඹසෙනඟ පිරිවැරදෑයේ ; සම්බුද්ධ සන්තිකෙ, සම්බුදුවන බෝසතුන් වෙත ; සිතාතපත්තං ධවලච්ඡත්‍රය ; ධාරෙන්තො, දරමින් ; ඨිතො, සිටියේයි.

159. පාකසාසනො. ශක්‍රදෙවේන්ද්‍රතෙම ; සාදරො, ආදර සහිතවූයේ ; වීසං රතනසතායාමං, එක්සිය විසිරියන් අයම් වූ ; විජයුත්තර නාමකං, විජයොත්තර නම්වූ ; සඞ්ඛං, (දක්ෂිණාවෘත්ත ශංඛ) ශඞ්ඛය ; ධමෙන්තො, පිඹිමින් ; අට්ඨාසි, සිටියේය.

---

* “වීසරතන.”

160. සුයාමො සහ සෙනාය ථොමයන්තො නරාධිපං,
මණිතාලවණ්ටං පග්ගය්හ (5) මන්දමන්දං වීජති.

161. ජාතකිත්තිලතග්ගම්හි සස්ස* පුප්ඵංව පුප්ඵිතං,
වාලබීජනිමුග්ගය්හ අට්ඨා සන්තුසිතො තහිං.

162. බෙලුවං වීණමාදාය ගීතං නානාලයානුගං,
පඤ්චසිඛො ඨිතො තත්‍ථ ගායමානො අනෙකධා.

163. මහාකාලො'පි නාගින්දො නාගසඞ්ඝපුරක්ඛතො,
ථොමෙන්තො තත්‍ථ අට්ඨාසි නවාරහගුණාදිහි.

---

160. සුයාමො, සුයාම නම් දිව්‍යපුත්‍රතෙම; සහ සෙනාය, සෙනාව සමග; නරාධිපං, නරෙශ්වර (වූ ඒ මහාබොධිසත්ව) යන්වහන්සේට; ථොමයන්තො, ස්තුතිකරමින්; මණිතාලවණ්ටං, මිණිතල්වැට; පග්ගය්හ, රැගෙණ; මන්දමන්දං, මඳින්මඳ; වීජති, පවන් සලයි.

161. සන්තුසිතො, සන්තුෂිත නම්වූ; සො, ඒ දිව්‍යපුත්‍රතෙම; අස්ස, ඒ මහබෝසතාණන්ගේ; ජාත කිත්තිලතග්ගම්හි, ජයකීර්ති නැමති ලතාග්‍රයෙහි; පුප්ඵිතං, පිපියාවූ, පුප්ඵංඉව, පුෂ්පයක් වැනිවූ; වාලබීජනිං, වල්විදුනාව; උග්ගය්හ, ඔසවාගෙණ; තහිං, එතන්හි; අට්ඨා, සිටියේයි.

162. පඤ්චසිඛො, පඤ්චශිඛ නම්වූ දිව්‍යපුත්‍රතෙම; බෙලුවං වීණං, බෙලුව නම් වීණාව; ආදාය, ගෙණ; නානා ලයානුගං, අනෙකප්‍රකාර ලයානුගත කොට (නොහොත්) අනෙක ප්‍රකාර තාලානුරූපවූ; ගීතං, ගීතිකා; අනෙකධා, අනෙක ප්‍රකාරයෙන්; ගායමානො, ගායනා කෙරෙමින්; තත්‍ථ, එහි; ඨිතො, සිටියේයි.

163. මහාකාලො නාගින්දො අපි, මහාකාල නම් නාගෙන්ද්‍ර තෙමේද; නාගසඞ්ඝපුරක්ඛතො, නාග සමූහයා විසින් පෙරටුකරණලද්දේ; නවාරහගුණාදිහි, නව අරහාදි ගුණයෙන්; ථොමෙන්තො, ස්තුතිකරමින්; තත්‍ථ, එහි; අට්ඨාසි, සිටියේයි.

---

* "යස්ස-යස."

164. රඞ්ගභූමිං මාපයිත්වා ගන්ධබ්බාන වරඞ්ගනා,
උපහාරං කරොන්තට්ඨා තිම්බරූසුරියවච්චසා.

165. ආගන්ත්වා සහ සෙනාය සිතඞ්ගො සිතභූසනො,
ධතරට්ඨො ඨිතො පුබ්බෙ(6)ආරක්ඛං කුරුමානකො.

166. පුරෙන්තා සකසෙනාය දක්ඛිණස්සං විරූළ්හකො,
ආරක්ඛං කුරුමානට්ඨා නීලඞ්ගො නීලභූසනො.

167. විරූපක්ඛො'පි අට්ඨාසි පාලයං පච්ඡිමං දිසං,
රත්තඞ්ගාභරණො වම්මී නිජසෙනාපුරක්ඛතො.

---

164. රඞ්ගභූමිං, නෘත්‍යභූමියක් ; මාපයිත්වා, මවා; වරඞ්ගනා, උත්තමාඞ්ගනාවන් ; ගන්ධබ්බාන, ගෙණ ; උපහාරං කරොන්ති, උපහාර (පූජා) කරමින් ; තිම්බරූ සුරියවච්චසා, එනම් දෙව්දූ තොමෝ ; අට්ඨා, සිටියා.

165. සිතඞ්ගො, ශ්වෙතවර්ණගාත්‍ර ඇති ; සිතභූසනො, ශ්වෙතවර්ණාභරණ ඇති ; ධතරට්ඨො, ධෘතරාෂ්ට්‍ර නම් වරම් මහරජතෙම ; සහසෙනාය, සෙනා සමග ; ආගන්ත්වා, අවුත් ; ආරක්ඛං කුරුමානකො, ආරක්ෂා කරමින් ; පුබ්බෙ, පූර්වදිශා වෙහි ; ඨිතො, සිටියේය.

166. නීලඞ්ගො, නීලවර්ණ දෙහයක් ඇත්තාවූ ; නීලභූසනො, නීලවර්ණාභරණයෙන් සැරසුනාවූ ; විරූළ්හකො, විරූඪ නම් වරම්මහරජතෙම ; සකසෙනාය, සියසෙනඟින් ; පුරෙන්තා, (දිශාව) පුරවන්නේ ; ආරක්ඛං කුරුමානො, ආරක්ෂාකරමින් ; දක්ඛිණස්සං, දකුණුදිග ; අට්ඨා, සිටියේය.

167. රත්තඞ්ගාභරණො, රක්තවර්ණ ශරීර හා ආභරණ ඇත්තාවූ ; වම්මී, සන්නාහ සන්නද්ධවූ ; නිජසෙනා පුරක්ඛතො, ස්වකීය සෙනා විසින් පෙරටුකරණලද්දවූ ; විරූපක්ඛො අපි, විරූපාක්ෂ නම් වරම් මහරජතෙමේද ; පච්ඡිමං දිසං, පශ්චිම දිශාව ; පාලයං, ආරක්ෂාකරමින් ; අට්ඨාසි, සිටියේය.

168. උත්තරස්සං සසෙනාය ආරක්ඛං කුරුමානකො,
සො ණණ්ණවණ්ණාභාහරණො අඩාසි නරවාහනො.

169. කිමෙත්ථ බහුලාපෙන ජාතික්ඛෙත්තම්හි දෙවතා,
නාගතා නෙව වාහෙසුං සබ්බ එත්ථෙ'ව ඕසටා.

170. ගගනාතොතිණ්ණකෙතු පාදෙහි පඨවීතලෙ,
නාගාදයො න ධූතාසුං කෙතූනං බහු කා කථා.

171. න ධූතා ධජපාදෙහි වායුතුඅද්දුමවුත්තිහි,
තාරකා ගගනෙ බ්‍රෑමො කිනාහු තත්ථ ධජඑතා.

168. සොණණ්ණවණ්ණාභාහරණො, සුවර්ණවර්ණ ශරීර හා ආභරණ ඇති; නරවාහනො, වෛශ්‍රවණ නම් වරම් මහරජතෙම; සසෙනාය, සිය සෙනඟින්; ආරක්ඛං කුරුමානකො, ආරක්ෂා කරමින්; උත්තරස්සං, උතුරුදිගැ; අඩාසි, සිටියේය.

169. එත්ථ, මෙහිලා; බහුලාපෙන, බොහෝකොට කීමෙන්; කිං, කිම; ජාතික්ඛෙත්තම්හි, ජාතික්ෂෙත්‍රයෙහි (හෙවත් දසදහසක සක්වළ); දෙවතා, දෙවියෝ; නාගතා, නොඇවාහු; නෙවව අහෙසුං, නොම වූහ; සබ්බඑව, සියල් ලෝම; එත්ථ, මෙතැන්හි; ඔසටා, රැස්වූහ.

170. ගගනා (ගගනාතො), අහසින්; ඔතිණ්ණ, බටුවාවූ; කෙතුපාදෙහි, ධවජපාදයන් කාරණකොටගෙණ; පඨවි තලෙ, පෘථිවිතලයෙහි; නාගාදයො, නාගාදීහු; නධූතාසුං, කම්පිත නුවූහ; කෙතූනං, ධවජයන්ගේ; බහු, බහුත්වය; කාකථා, කියනුම කවරේද.

171. වායුතො, පවනින්; උද්දුමවුත්තිහි, චඤ්චලවූ පැවතුම් ඇති; ධජපාදෙහි, ධවජ පාදයන් කාරණකොටගෙණ; ගගනෙ, අහසෙහි; තාරකා, තාරකාවෝ; නධූතා, කම්පිත නුවූහ; තත්ථ, එහි; ධජඑතා, ධවජ බාහුල්‍යයයි; කිනනු බ්‍රෑමො, කුමට කියමුද?

172. පුබ්බදිසාචක්කවාළසිලායුග්ගතකෙතුනං,
පාදූනි පරභාගාදි චක්කවාළසිලන්වගුං.

173. චක්කවාළමහාමෙරුයුගන්ධරනගාදයො,
පුප්ඵාවතංසකා'වාසුං නානාවණ්ණෙහි සඞ්ඛතා.

174. චාමාමන්දමකරන්දබින්දුසන්දෙහසුන්දරං,
උල්ලොල* පදුමාකිණ්ණ විතානංවාසි අම්බරං.

175. ඛිත්තසොගන්ධචුණ්ණෙහි දෙවබ්‍රහ්මාදිනා තහිං,
විතානං විය භායන්ති චක්කවාළග්ගමණ්ඩපෙ.

---

172. පුබ්බදිසා, පූර්වදිශාවෙහිවූ ; චක්කවාළසිලාය, සක්වළගලින් ; උග්ගත කෙතූනං, නැගුනාවූ ධ්වජයන්ගේ ; පාදූනි, පාදයෝ ; අපරභාගාදි, අවරදිගු ආදිවූ ; චක්කවාළ සිලා, සක්වළගල දක්වා ; අන්වගුං, ගියාහුයි.

173. චක්කවාළ, චක්‍රවාට පර්වතය ; මහාමෙරු, මහාමේරු පර්වතය ; යුගන්ධර නගාදයො, යුගන්ධර පර්වතය යනාදීහු ; නානාවණ්ණෙහි, අනෙකප්‍රකාර වර්ණයෙන් ; සඞ්ඛතා, අභිසංස්කරණය කරනලද්දාහු : පුප්ඵාවතංසකා ඉව, පුෂ්ප ශෙඛර මෙන් ; අසුං, වූහ.

174. චාම, මනොඥවූ ; අමන්ද, මඳනොවූ ; මකරන්දබින්දු සන්දෙහ, මුවරද පොදරැසින් ; සුන්දරං, සොඳුරුවූ ; අම්බරං, ආකාශය ; උල්ලොල, ලෙලෙන ; පදුමාකිණ්ණ, පද්මයන් ගෙන් ගැවසීගත්තාවූ ; විතානං ඉව, වියනක් මෙන් ; ආසි, වී.

175. තහිං, එහි ; දෙවබ්‍රහ්මාදිනා, දිව්‍ය බ්‍රහ්මාදී ලොකයා විසින් ; ඛිත්ත, විසුරුවනලද ; සොගන්ධචුණ්ණෙහි, සෞගන්ධික චූර්ණයෝ ; චක්කවාළග්ගමණ්ඩපෙ, චක්‍රවාට නැමැති උතුම් මඩුවෙහි ; විතානං ඉව, වියනක් මෙන් ; භායන්ති, වැටහෙත්.

---

* "උල්ලොක."

176. කප්පූරාගරුධූපෙහි තත්‍ථ තත්‍ථුග්ගතෙහි සො,
කාලබ්භකූටවච්ඡන්නොව ආසි මඤ්ඤෙ කථෙමු කිං.

177. ජාතික්ඛෙත්තවාසු දෙවෙහි කතඟ්ගිකුසුමාදිනා,
නොසීනා ධරණී භාරා දිසෙභානං බලං අහො.

178. අම්බරාලම්බමානාහි පුප්ඵදාමාහි භූතලං,
ආකඩ්ඪනාය දෙවෙහි* බද්ධරජ්ජුව භාසරෙ.

179. අඤ්ඤමඤ්ඤකරමුග්ගය්හ ගගනෙ සුරසුන්දරී,
පරිබ්භමන්තා ගායන්ති තත්‍ථ තත්‍ථ මනොරමං.

---

176. තත්‍ථ තත්‍ථ, ඒ ඒ තන්හි; උග්ගතෙහි, නැගුණාවූ; කප්පූරාගරුධූපෙහි, කපුරු හා අගිල්දුමින්; සො, එශෛලතෙම; කාලබ්භකූටවච්ඡන්නො ඉව, කාලාබ්භ්‍රකූටයකින් වැසුනාක් මෙන්; ආසි, විය; අඤ්ඤං කිං කථෙමු, අන්කක් කුමට කියමුද?

177. ජාතික්ඛෙත්තවාසු, ජාතික්‍ෂෙත්‍රයෙහි (දසදහසක් සක්වල වාසයකරන්නාවූ); දෙවෙහි, දෙවියන් විසින්; කතඟ්ගී කුසුමාදිනා, කරණලද ඇඟෑ කුසුම් ආදීන් කරණකොට ගෙණ; භාරා, බරවූ; ධරණී, පෘථිවිතොමෝ; නඔසීනා, නොබැස්සාය; දිසෙභානං, දිගැතුන්ගේ; බලං, බලය; අහො, ආශ්චර්ය්‍යයී.

178. අම්බරෙ, ආකාශයෙහි; ආලම්බමානාහි, එල්බෙන්නාවූ; පුප්ඵදාමාහි, මාලාදාමයෝ; පඨවිතලං, පෘථිවිතලය; ආකඩ්ඪනාය, ආකර්ෂණය කරණු පිණිස; දෙවෙහි, දෙවියන් විසින්; බද්ධ, බදිනලද; රජ්ජුව, රැහැන් මෙන්; භාසරෙ, බබලත්.

179. සුරසුන්දරී, දිව්‍යාප්සරාවෝ; අඤ්ඤමඤ්ඤකරං, ඔවුනොවුන් අත; උග්ගය්හ, අල්වාගෙණ; ගගනෙ, ආකාශයෙහි; තත්‍ථ තත්‍ථ, ඒ ඒ තන්හි; පරිබ්භමන්තා, පරිභ්‍රමණය කරන්තියෝ; මනොරමං, සිත්කලුකොට; ගායන්ති, ගායනා කෙරෙත්.

---

* "ආකඩ්ඪණසා දෙවෙහි."

180. උභො භුජෙ විකාසෙත්වා මණ්ඩිතා සුරසුන්දරී,
භමන්ති භන්තභෙණ්ඩුව තත්ථ තත්ථම්බරෙ යුගා

181. නීලුප්පලකලාපාදී ගහෙත්වාන සුරඞ්ගනා,
ඨිතාසුං පරිවාරෙත්වා පූජමානා නරිස්සරං.

182. රත්තපල්ලවකල්හාරකමලුප්පලසඞ්ගතෙ,
සතනීරකුසුමාකිණ්ණෙ පුණ්ණෙ සොගන්ධවාරිහි

183. කඤ්චනාදිඝටෙ ගය්හ අම්බරෙ සුරසුන්දරී,
කත්වාන සුගතං මජ්ඣෙ පූජයිංසු සමන්තතො

184. කඤ්චනාදාසහත්ථා ච කාචි කඤ්ඤා තහිං ඨිතා,
තාලවණ්ටෙ ගහෙත්වාන ඨිතාසුං කාචි දෙවතා.

---

180. මණ්ඩිතා, සැරසුනාවූ; සුරසුන්දරී, දිව්‍යාඞ්ගනාවෝ; උභොභුජෙ, දෙඅත්; විකාසෙත්වා. දිගහැර; අම්බරෙ, අහස් තලයෙහි; තත්ථ තත්ථ, ඒ ඒ තන්හි; යුගා, යුගලවූවාහු; භන්තභෙණ්ඩුව, කරකැවෙන බම්බරමෙන්; භමන්ති, භ්‍රමණය කෙරෙත්.

181. නීලුප්පලකලාපාදී, නිලුපුල්කලඹ ආදින්; ගහෙත්වාන, ගෙණ; සුරඞ්ගනා, දිව්‍යාඞ්ගනාවෝ; නරිස්සරං, නරෙශ්වරවූ මහාබොධිසත්වයන්; පූජමානා, පුදමින්; පරිවාරෙත්වා, පිරිවරා; ඨිතාඅසුං, සිටියෝ වූහ.

182, 183. රත්තපල්ලව, රත් ලපලුයෙන්ද; කල්හාර, හෙල්මැල්ලෙන්ද; කමල, පියුමෙන්ද; උප්පල, උපුලින්ද; සඞ්ගතෙ, ගැවසිගත්තාවූ; සතනීරකුසුමාකිණ්ණෙ, සතනීර පුෂ්පයෙන් ආකීර්ණවූ; සොගන්ධවාරිහි, සුවඳ පැනින්; පුණ්ණෙ, පිරුණාවූ; කඤ්චනාදිඝටෙ, සුවර්ණමයාදි ඝටයන්; ගය්හ, රැගෙණ; අම්බරෙ, අහසෙහි; සුරසුන්දරී, සුරඟනෝ; සුගතං, සුගතවූ බොධිසත්වයන්; මජ්ඣෙ කත්වාන, මැදිකොට; සමන්තතො, හාත්පසින්; පූජයිංසු, පිදූ.

184. කඤ්චනාදාසහත්ථා ච, රන්කැටපත් ගත් අත් ඇත්තාවූද; කාචිකඤ්ඤා, කිසි කන්‍යාකෙනෙක්; ඨිතා, සිටියාහ; තහිං, එපරිද්දෙන්; කාචි දෙවතා, කිසි දෙවතාකෙනෙක්; තාලවණ්ටෙ ගහෙත්වාන, තල්වැට ගෙණ; ඨිතාසුං, සිටියාහුයි.

185. කාචි මඞ්ගලසංයුත්තවචනා තව පත්ථනා,
සම්පජ්ජතූති ඝොසෙන්ති පරිවාරෙත්වා ඨිතා ජිනං

186. සිරිවච්ඡාදි පග්ගය්හ අට්ඨමඞ්ගලමුත්තමං,
ඨිතාසුං ගගනෙ නාරී පරිවාරෙත්වා මුනිස්සරං.

187. නච්චන්ති කෙචි කීළන්ති සෙළෙන්ති ච ලළන්ති ච,
වාදෙන්ති කෙචි ගායන්ති වෙළුක්ඛෙපං කරොන්ති ච.

188. නෙකපුප්ඵග්ගිපන්ති ච තථා දීපග්ගිපන්ති ච,
මණිචාමීකරසජ්ඣුඅග්ගිකාපන්තියො තථා.

---

185. කාචි, ඇතැම් දෙවඟනෝ; තව, තුඹවහන්සේගේ; පත්ථනා, ප්‍රාර්ථනාව; සම්පජ්ජතූති, සමෘද්ධවේවයි; ඝොසෙන්ති, ඝෝෂාකරන්නියෝ; මඞ්ගලසංයුත්තවචනා, මඞ්ගල්‍යසම්ප්‍රයුක්ත වචන ඇත්තියෝ; ජිනං, ජිනවූ මහබෝසතාණන්; පරිවාරෙත්වා, පිරිවර; ඨිතා, සිටියාහුයි.

186. නාරී, (ඇතැම්) ස්ත්‍රීහු; සිරිවච්ඡාදි, ශ්‍රීවත්සාදීයද; උත්තමං, උතුම්වූ; අට්ඨමඞ්ගලං, අටමඟලද; පග්ගය්හ, රැගෙණ; මුනිස්සරං, මුනිශ්වරවූ බෝධිසත්වයන්; පරිවාරෙත්වා, පිරිවර ගෙණ; ගගනෙ, ආකාශයෙහි; ඨිතාසුං, සිටියෝ වූ.

187. කෙචි, කිසිකෙනෙක්; නච්චන්ති, නටත්; කීළන්ති, (කිසිකෙනෙක්) ක්‍රීඩාකෙරෙත්; සෙළෙන්ති, (කිසිකෙනෙක්) එළිසම්ලත්; ලළන්තිච, ලලිතද වෙත්; කෙචි, කිසිකෙනෙක්; වාදෙන්ති, වාද්‍යකෙරෙත්; ගායන්ති, (සමහරු) ගායනාකෙරෙත්; වෙළුක්ඛෙපංච, පිළි හිස සිසෑරීමද; කරොන්ති (ඇතම් අය) කරත්.

188. නෙකපුප්ඵග්ගිපන්තිච, නොයෙක් පුෂ්ප ඇගෑ පඞ්ක්තීද; තථා, එසේම; දීපග්ගිපන්තිච, පහන් ඇගෑ පන්තීහුද; තථා, එසේම; මණි, මිණිය; චාමීකර, රන්ය; සජ්ඣු, රිදීය (යන මෙයින් නිපදවනලද); අග්ගිකාපන්තියො, අග්ගිකාපන්තීහුද :

189. ආබ්‍රහ්මභවනුග්ගම්ම චක්කවාළසමන්තතො,
තිට්ඨන්ති ජලමානායො බුද්ධස්ස මඞ්ගලුස්සවෙ.

190. සත්තරතනසම්භූතා නානා තොරණපන්තියො,
හෙමරම්මාමයා චාපි තථා දුස්සමයා සියුං.

191. නානාවණ්ණෙහි නෙකෙහි ඡත්තෙහි ච නිරන්තරං,
චක්කවාළොදරං ආසි සරංව කමලාකුලං.

192. තත්ථ තත්ථුජ්ජලානෙක ඝනදීපාවලී මහී,
තාරකාජාලකාකිණ්ණ ගගනඞ්ගනසන්නිභා.

193. ධජන්තරිතඡත්තා'සුං චක්කවාළගිරූපරි,
නිරන්තරා'සුං තත්ථෙව ඝටදීපා ච තොරණා.

---

189. ජලමානායො, දිලිසෙමින්: ආබ්‍රහ්මභවනා, බඹ විමන් දක්වා; උග්ගම්ම, උස්වගොස්; බුද්ධස්ස, බුදුන්ගේ; මඞ්ගලුස්සවෙ, මඟලුත්සවයෙහිදී; චක්කවාළසමන්තතො, සක්වලගල හාත්පස; තිට්ඨන්ති, සිටිත්.

190. හෙමරම්මාමයා ච, රන්රඹමුවාවූ ද; අපි, නැවත; තථා, එසේම; දුස්සමයා, වස්ත්‍රමයවූද; නානා තොරණ පන්තියො, නන්වැදෑරුම් තොරන් පන්ති: සත්තරතන සම්භූතා, සප්තවිධ රත්නයෙන් සැදුනාහු; සියුං, වූ.

191. නෙකෙහි, නොයෙක්; නානාවණ්ණෙහි; නානා ප්‍රකාර වර්ණඇති; ඡත්තෙහි ච, ඡත්‍රයන්ගෙන්ද; නිරන්තරං, නිරතුරුවූ; චක්කවාළොදරං, සක්වළහැබ; කමලාකුලං, පියුමින් ගැවසුනු; සරං ඉව, තඩාගයක් මෙන්; ආසි, වී.

192. තත්ථ තත්ථ, ඒ ඒ තන්හි; උජ්ජල, උජ්ජ්වලවූ; අනෙක, නොයෙක්; ඝනදීපාවලී, ඝන ප්‍රදීප පඞ්ක්ති ඇති; මහී, පෘථිවිතොමෝ; තාරකා ජාලකාකිණ්ණ, *තරු රැසින් ගැවසීගත්තාවූ; ගගනඞ්ගනසන්නිභා, ආකාශාඞ්ගනය වැන්නීය..

193. චක්කවාළගිරූපරි, චක්‍රවාටපර්වත මස්තකයෙහි; ධජන්තරිතඡත්තා, ධ්වජාන්තරගත ඡත්‍රයෝ; ආසුං, වූහ; තත්ථ එව, එහිම; ඝටදීපා ච, පුන්කලස් හා ප්‍රදීපයෝද; තොරණා ච, තොරන් (පන්ති) හුද; නිරන්තරා ආසුං, නිරතුරු වූ.

194 නානාතුරියනාදෙහි නානාසඞ්ගීතිකාහි ච,
සාධුවාදෙහි නෙකෙහි චක්කවාලො ඵුටො අහු.

195. අහො මහන්තතා තස්ස බුද්ධස්ස කතමඞ්ගලෙ,
පූජාවිසෙසං තං කො හි මුඛෙනෙකෙන භාසති.

196. චතුම්මුඛො සහස්සක්ඛො විසහස්සනයනො ඵණී,
දසකණ්ඨො'පි තං සබ්බං නෙව සක්කොන්ති
භාසිතුං.

197. එවං සුරාසුරබ්‍රහ්ම වෙනතෙය්‍යොරගාදිහි,
නිරන්තරං කතානෙක මහාමහසමාකුලෙ.

---

194. නානා තුරියනාදෙහි, නොයෙක් තූර්‍ය්‍යනාදයෙන්ද; නානා සඞ්ගීතිකාහි ච, නොයෙක් ගීතිකා නාදයෙන්ද; නෙකෙහි, නොයෙක්; සාධුවාදෙහි, සාධුකාරවචනයෙන්ද; චක්කවාලො, චක්‍රවාටය; ඵුටො අහු, ස්ඵුට වී.

195. තස්ස බුද්ධස්ස, ඒ සම්බුද්ධවූ මහාබොධිසත්ත්වයන්වහන්සේගේ; කතමඞ්ගලෙ, කෘතමඞ්ගලොත්සවයෙහි; මහන්තතා, විපුලත්වය; අහො, ආශ්චර්‍ය්‍යය; තං පූජාවිසෙසං, ඒ පූජාවිශෙෂය; කො හි, කවරෙක් නම්; එකෙන මුඛෙන, එක් මුඛයකින්; භාසති, කියාද (නොකියාමය.)

196. චතුම්මුඛො, මහාබ්‍රහ්මතෙමේද; සහස්සක්ඛො, ශක්‍රදෙවෙන්ද්‍රතෙමේද; විසහස්සනයනො, දෙදහසක් නෙත් ඇති; ඵණී, (අනන්ත නම්) නාගරාජතෙමේද; දසකණ්ඨොපි, රාවණතෙමේද; තං සබ්බං, ඒ සියල්ල; භාසිතුං, කියන්ට; නෙව සක්කොන්ති, නොම හැකිවෙත්.

197. එවං මෙසේ; සුර, දෙවිය; අසුර, අසුරය; බ්‍රහ්ම, බ්‍රහ්මය; වෙනතෙය්‍ය, ගරුඩය; උරගාදීහි, නාගය යන මේ ආදීන් විසින්ද; නිරන්තරං, අනවරතයෙන්; කත, කරණලද: අනෙක, නොයෙක්; මහාමහසමාකුලෙ, මහත් පූජොත්සවයෙන් ගැවසීගත්තාවූ :—

198. තස්මිංතු වාසරෙ මාරො පස්සිත්වා භුවනං ඉදං,
ආමන්තෙත්වා සානුචරෙ ආහෙවං සකුතූහලො.

199. සබ්බෙදිබ්බවිමානා හො සුඤ්ඤා දිස්සන්ති ඡඩ්ඩිතා,
පුරපාලම්පහාපෙත්වා කුව ගතා'සුං සදෙවකා.

200. කිමෙසො මාර නජානාසි මත්තො සුත්තො'සි අජ්ජ කිං,
සුද්ධොදනියසිද්ධත්ථො මායාය තනයො අයං.

201. පූරෙත්වා පාරමී සබ්බා කත්වාන අභිනික්ඛමං,
බොධිමූලෙ නිසින්නො'සි අජ්ජ බුද්ධො භවාමිති.

---

198. තස්මිංතුවාසරෙ, එදවස; මාරො, මාර නම් දිව්‍ය පුත්‍රතෙම; ඉදං භුවනං, මේ ලොකය; පස්සිත්වා, බලා; සකුතූහලො, කුතුහල් සහිතවූයේ; සානුචරෙ, ස්වකීය අනුචරයන්ට; ආමන්තෙත්වා, අමන්ත්‍රණයකොට; එවං, මෙසේ; ආහ, කීය.

199. හො, භවත්නි; සබ්බෙ දිබ්බවිමානා, සියලු දිව්‍යභවනයෝ; සුඤ්ඤා, ශූන්‍යවූවාහු; ඡඩ්ඩිතා, හරණලද්දාහු; දිස්සන්ති, පෙණෙත්; සදෙවකා, දෙවියන් සහිතවූවෝ; පුරපාලම්පි, නගරපාලයාත්; අහාපෙත්වා, නොපහා; කුව ගතාසුං, කොයි ගියාහුද?

200. හො මාර, භවත් මාරය; කිං, කිම; න ජානාසි, නොදන්නෙහිද; කිං, කිම; අජ්ජ, අද; මත්තො, (ඔබ) මත්වූයෙහිද; සුත්තොසි, සයනය කෙළෙහිද; මායාය, මහාමායා දෙවියගේ; තනයො, පුත්‍රවූ; අයං, මේ; සුද්ධොදනිය සිද්ධත්ථො, ශුද්ධොදනී සිද්ධාර්ථ කුමාරතෙම :—

201. සබ්බා පාරමී, සියලු පාරමිධම්මයන්; පූරෙත්වා, පූරණයකොට; අභිනික්ඛමං, මහාභිනිෂ්ක්‍රමණය; කත්වාන, කොට; අජ්ජ, අද; බුද්ධොභවාමි ඉති, බුදුවෙමියි; බොධිමූලෙ, බොධිද්‍රුම මූලයෙහි; නිසින්නො ආසි, වැඩඋන්සේක් වී.

202. තස්ස පූජාවිධානත්ථං දසසහස්සීසු දේවතා,
සමාගතා හට්ඨතුට්ඨා කරෙන්තජ්ජ මහාමහං.

203. කින්නු තෙ බධිරං සොතං කින්නු පරිහායි
ලොචනං,
ධජග්ගා තෙ න දිස්සන්ති උල්ලොලං තෙ න සූයති.

204. තෙසං තං වචනං සුත්වා අන්තකො ඛලු පාපිමා,
දුක්ඛිතො දුම්මනො තෙසං සොචන්තොඉදමබ්‍රවි.

205. අහො වත'තිපරිහානි සංසාරස්ස මහා අයං,
අසාරො ඛලු සංසාරො සිද්ධත්ථෙ විභවං ගතෙ.

---

202. තස්ස, උන්වහන්සේට ; පූජාවිධානත්ථං, පූජාකරණු පිණිස ; දසසහස්සීසු, දසදහසක් ලෝකධාතුවාසිවූ; දේවතා, දෙවියෝ ; සමාගතා, රැස්වූවාහු; හට්ඨතුට්ඨා, තුටුපහටුවූවාහු; අජ්ජ, අද ; මහාමහං, මහත්වූ පූජාවක් ; කරෙන්ති, කෙරෙත්.

303. කින්නු, කිමෙක්දෝ ; තෙ, ඔබගේ ; සොතං, කණ ; බධිරං, බිහිරිද ; කින්නු, කිමෙක්ද ; ලොචනං, ඇස් ; පරිහායි, පිරිහිනිද ; තෙ, ඔබට ; ධජග්ගා, ධවජාග්‍රයෝ, න දිස්සන්ති, නොපෙණේද්ද; තෙ, ඔබ විසින් ; උල්ලොලං, උස්සවූ කැලඹීම ; නසූයති, අසනුනොලැබේද.

204. පාපිමා, පාපීවූ; අන්තකො, මාරතෙම ; තෙසං, ඔවුන්ගේ; තං වචනං, ඒ කීම; සුත්වා, අසා; ඛලු, ඒකාන්ත යෙන් ; දුක්ඛිතො, දුඃඛිතවූයේ; දුම්මනො, නොසතුටු සිත් ඇත්තේ ; සොචන්තො, ශොකකරමින්; තෙසං, ඔවුන්ට; ඉදං, මෙය; අබ්‍රවි, කී.

205. අහො, ඛෙදය ; වත, ඒකාන්තයෙන් ; සංසාරස්ස, සංසාරයට (වූයේ); අතිපරිහානි, ඉතාපිරිහීමක ; සිද්ධත්ථෙ, සිද්ධාර්ථකුමාරයා ; විභවං ගතෙ, නිවන් ගිය කල්හි* ; අයං මහා සංසාරො, මේ මහාසංසාරය ; අසාරො ඛලු, නිස්සාර මැයි.

---

*"අර්ථාත් ප්‍රකරණාල්ලිඞ්ගාද් ඖචිත්‍යාද් දේශකාලතඃ
ශබ්දාර්ථාඃ ප්‍රවිභජ්‍යන්තෙ න ශබ්දාදෙව කෙවලාත්"
යි උක්තහෙයින් "විභවං ගතෙ" යන තන්හි ප්‍රකරණයෙහි නිර්ණය ගතයුතුයි.

206. අහො වතා'තිනට්ඨමහා තිවට්ටං පරිපූරිතං,
හොති හො දහනා දඩ්ඪවනංවාතිඅලක්ඛිකං.

207. නිරාලොකං තිලොකං හො අසූරං වාසරං යථා,*
පරිමොසරතනං හොති රජ්ජංවෙදං† ජගත්තයං.

208. මමෙස විසයං හිත්වා යාති සිද්ධත්ථදූරකො,
තෙන යාතෙන මග්ගෙන නික්ඛමන්ති බහුජ්ජනා.

209. භවන්තං න කරොතෙසො යාව සුද්ධොදනත්‍රජො,
එථ ගච්ඡාම සිද්ධත්ථමසිද්ධත්ථං කරොම හො.

---

206. අහො, ඛෙදය ; වත, එකාන්තයෙන් ; අතිනට්ඨමහා, විනෂ්ටවූමු ; හො, භවත්නි ; පරිපූරිතං, සම්පූර්ණවූ ; තිවට්ටං, (කම්වට ආදි) තිවට ; දහනා, වහ්නියෙන් ; දඩ්ඪ, දනලද ; වනං ඉව, වනලැහැබක්මෙන් ; අතිඅලක්ඛිකං හොති, අතිශයින් නිශ්‍රීක වේ.

207. හො, පින්වත්නි; අසූරං, සූර්‍ය්‍යයා නැත්තාවූ; වාසරං, දවස ; යථා, යම්සේද (එමෙන්) ; තිලොකං, තුන්ලොව ; නිරාලොකං, ආලොක රහිතය; ඉදං ජගත්තයං, මේ ජගත්ත්‍රය; පරිමොසරතනං, පැහැරගන්නාලද රත්න ඇති; රජ්ජං ඉව, රාජ්‍යයක් මෙන් ; හොති, වේ.

208. එසො සිද්ධත්ථදූරකො, මේ සිද්ධාර්ථකුමාරතෙම ; මම, මාගේ ; විසයං, ගොචරය ; හිත්වා, හැර ; යාති, යන්නේය ; තෙන යාතෙන මග්ගෙන, ඒ ඔහු ගියමගින් ; බහුජ්ජනා, බොහෝවූ ජනයෝ ; නික්ඛමන්ති, නික්මෙත්.

209. හො, පින්වත්නි; එසො සුද්ධොදනත්‍රජො, මේ ශුද්ධොදන මහාරාජපුත්‍රතෙම ; යාව, යම්තාක් ; භවන්තං, භවයාගේ කෙළවර; නකරොති, නොකරේද (ඒතාක්); එථ, එව් ; ගච්ඡාම, යමු ; සිද්ධත්ථං, සිද්ධාර්ථකුමාරයා; අසිද්ධත්ථං කරොම, නොසිදුහත් (සිද්ධනොවූ අර්ථ ඇත්තාක්හු) කරමු.

---

* "අසරං වාසරං යථා." † "රජ්ජංවායං."

210. මාපෙසි භෙරවං වණ්ණං බීභච්ඡං දුද්දසං ඛරං,
සද්දෙනෙව පලාපෙසි තූලභට්ටංව වායුනා.

211. තස්ස තං වචනං සුත්වා මාරසෙනා සමාගමුං,
නානාවෙසධරා හුත්වා නානායුධසමඞ්ගිනො.

212. යොජනානං තදා මාරො දියඩ්ඪසතමුච්චතො,
ගිරිමෙඛලමාරුය්හ සෙනාය සහසාගමි.

213. දිස්වාන දූරතො එන්තං දෙවා මාරං සවාහිනිං,
භයට්ටාපගමුං* ඛිප්පං ධාවමානා දිසොදිසං.

---

210. භෙරවං, භයානකවූ; බීභච්ඡං, නොකැමැතිවූ; දුද්දසං, නොබැලිය හැකිවූ; ඛරං, කෲරවූ; වණ්ණං, රූප; මාපෙසි, නිර්මිත කරවී; වායුනා, වාතයෙන් (දුර ගසන්නාවූ); තූලභට්ටං ඉව, පුලුන්පෙදක් මෙන්; සද්දෙන එව, ශබ්දයෙන්ම; පලාපෙසි, (උහු) පලවා හැරිවී.

211. මාරසෙනා, මාරසෙනාවෝ; තස්ස, ඔහුගේ; තං වචනං, ඒ වචන; සුත්වා, අසා; නානායුධසමඞ්ගිනො, අනෙකායුධයෙන් යුක්තවූවාහු; නානාවෙසධරා හුත්වා, නානාප්‍රකාර වෙසධාරීව; සමාගමුං, රැස්වූහු.

212. තදා, එකල්හි; මාරො, මාරතෙම; උච්චතො, උසින්; යොජනානං, යොදුන් සම්බන්ධිවූ; දියඩ්ඪසතං, යෙළසියයක් ඇත්තාවූ; ගිරිමෙඛලං, ගිරිමෙඛල නම් ඇතු පිට; ආරුය්හ, නැඟී; සෙනාය, සෙනඟින් යුක්තව; සහසා, යුහුව; ආගමි, ආයේය.

213. දෙවා, දෙවියෝ; සවාහිනිං, සෙනාසහිතවූ; එන්තං, (දිව) එන්නාවූ; මාරං, වශවර්ත්තිමාරයා; දූරතො, දුරින්; දිස්වාන, දැක; භයට්ටා, භයින් පෙළුනාහු; දිසොදිසං, දිශානුදිශාවන්හි; ධාවමානා, දිවන්නාහු; ඛිප්පං, වහා; අපගමුං, පහව ගියාහුයි.

---

* "භයඩ්ඪාපගමුං."

214. සඞ්ඛිප්ප ඛිප්පං සච්ඡත්තං බ්‍රහ්මා ධාවි පරම්මුඛො,
කත්වාන පිඨියං සඞ්ඛං සක්කො ධාවි විසඞ්කිතො.

215. මහාකාළො'පි නාගින්දො නිමුජ්ජ මහියං තදා,
වත්තාදත්තාකරෙ ජිරැ සකෙ නිපති මඤ්චකෙ.

216. සං සං* පූජාවිධානත්තු ඡඩ්ඩෙත්වාන සදෙවකා,
ගතාසුං සුඤ්ඤකං ආසි චක්කවාළමිදං තදා.

217. නිස්සිරිකං පදෙසං තං අසොභං අසමඤ්ජසං,
අහොසි පතිතානෙක පූජාභණ්ඩසමාකුලං.

---

214. බ්‍රහ්මා, මහාබ්‍රහ්මතෙම; සච්ඡත්තං, ස්වකීය ධවලාතපත්‍රය; සඞ්ඛිප්ප, හකුළුවාදමා; ඛිප්පං, වහා; පරම්මුඛො, පරාඞ්මුඛ වූයේ; ධාවි, දිවීය; සක්කො, ශක්‍රදෙවෙන්ද්‍රතෙම; සඞ්ඛං, (විජයුත්තර නම්) ශඞ්ඛය; පිඨියං කත්වාන, පිටිපසැ කොට; විසඞ්කිතො, විශෙෂයෙන් ශඞ්කිත වූයේ; ධාවි, දිවීය.

215. තදා, එකල්හි; ජිරැ, බකසුලුවූ; මහාකාලො, මහාකාල නම්වූ; නාගින්දො අපි, නාගෙන්ද්‍රතෙමේද; මහියං, පොළොවෙහි; නිමුජ්ජ, ගැලී; වත්තාදත්තාකරෙ, මුහුනට දෙනලද අත් ඇත්තේ; සකෙ මඤ්චකෙ, ස්වකීය මඤ්චකයෙහි: නිපති, වැතිරගත්තේයි.

216. සදෙවකා, දෙවියන් සහිතවූවෝ; සං සං පූජාවිධානත්තු, තමතමන්ගේ පූජාවිධාන; ඡඩ්ඩෙත්වාන, හැරදමා; ගතා ආසුං, බැහැර ගියෝ වූහ; තදා, එකල්හි; ඉදං චක්කවාළං, මේ සක්වළ; සුඤ්ඤකං ආසි, ශූන්‍ය විය.

217. තං පදෙසං, ඒ ප්‍රදෙශය; අසොභං, ශොභාරහිත වූයේ; අසමඤ්ජසං, සම මාර්ග නැත්තේ; පතිත, වැටුනාවූ; අනෙක, නොයෙක්; පූජාභාණ්ඩසමාකුලං, පූජාභාණ්ඩයෙන් ගැවසීගත්තේ; නිස්සිරිකං අහොසි, නිශ්‍රීක විය.

---

* "යං යං."

218. එකොව තත්ථ සුගතො නිසීදි වජිරාසනෙ.
පජ්ජලං නිජසිරියා සුරියොව යුගන්ධරෙ.

219. අකම්පො ච අසන්තාසී ලොමහංසවිවජ්ජිතො,
අභීතො සීහරාජාව මිගච්ඡාපානමග්ගතො.*

220. තතො ධම්මිස්සරස්සග්ගෙ දුන්නිමිත්තානි ජායරුං,
අන්ධකාරා දිසා ආසුං ධූමකෙතු ච අම්බරෙ.

221. දිනං දුද්දිනකං ආසි හතරංසි දිවාකරො,
උක්කාපාතො'පි පක්ඛන්දසි දිසාඩාහොපපජ්ජථ.

---

218. යුගන්ධරෙ, යුගන්ධර මත්තෙහි; සුරියො ඉව, සූර්‍ය්‍යයා මෙන්; නිජසිරියා, ස්වකීය ශ්‍රීයෙන්; පජ්ජලං, ප්‍රජ්වලවූ; සුගතො, සුගතවූ මහාබොධිසත්ත්වතෙම; එකො එව, තනිවම; තත්ථ, එතන්හි; වජිරාසනෙ, විදුරසුන් මත්තෙහි; නිසීදි, වැඩහුන්සේක.

219. මිගච්ඡාපානං, මුවපොල්ලන්ගේ; අග්ගතො, ඉදිරියෙහි; අභීතො, නිර්භීතවූ; සීහරාජා ඉව, මෘගරාජ (වූ සිංහ) යෙක්මෙන්; ලොමහංස විවජ්ජිතො, තොරකරණලද ලොමු ඩැහැගැනුම් ඇති මහාබොධිසත්ත්වතෙම; අකම්පොච, නිශ්චලද විය; අසන්තාසී, සන්ත්‍රාස රහිතයෙක්ද වී.

220. තතො, ඉක්බිති; ධම්මිස්සරස්ස, ධර්මෙශ්වරවූ මහාබොධිසත්ත්වයන්ගේ; අග්ගෙ, ඉදිරියෙහි; දුන්නිමිත්තානි, දුර්නිමිත්තයෝ; ජායරුං, උපන්නාහුය; දිසා, චතුර්දිශාවෝ; අන්ධකාරා ආසුං, අඳුරුවූහ; අම්බරෙ, අහසෙහි; ධූමකෙතුච (ආසුං), ධූමකෙතුද ඇතිවූවාහුය.

221. දිනං, දවස; දුද්දිනකං ආසි, වලාහක ප්‍රතිච්ඡන්න දිනක් විය; දිවාකරො, සූර්‍ය්‍යදිව්‍යරාජතෙම; හතරංසි, විනෂ්ට රශ්මි ඇතිවිය; උක්කාපාතො අපි, උල්කාපාතද; පක්ඛන්දසි, පෙණීන; දිසාඩාහො, දිග්දාහයද; උපපජ්ජථ, උපන.

---

* "මිගච්ඡාපකමජ්ඣගො."

222. අඝනෙ ගගනෙ ආසුං ඉන්දචාපාචිරජ්ජුති,
අනලාසනියො දිත්තා තත්ථ තත්ථ පතන්ති ච.

223. කාකොලූසඞ්ඝා වස්සිංසු උණ්ණා සකුණකොසියා,
චරිංසු අම්බරෙ පෙතා කබන්ධා* ච භයාවහා.

224. සෙනං† සංවිදහිත්වාන තතො මාරො අභිද්දුවි,
ආගන්ත්වා චක්කවාළම්හි ඨිතො ජිනමුදික්ඛිය.

225. එකකස්ස මනුස්සස්ස සන්තිකොපගමං මම,
න යුත්තං හි ගජො යාති ගජං නො යාති කොත්ථුකං.

---

222. අඝනෙ, අපගත මෙඝ ඇති; ගගනෙ, ආකාශයෙහි; ඉන්දචාපා, ඉන්ද්‍රචාපයෝද ; අචිරජ්ජුති, විදුලිද ; ආසුං, වූහ ; දිත්තා, දීප්තිමත්වූ ; අනලාසනියොච, ගිනිහෙනද ; තත්ථ තත්ථ, තන්හි තන්හි; පතන්ති, හෙත්.

223. කාකොලූසඞ්ඝා, මහවනකවුඩුසමූහයෝද ; උණ්ණා සකුණකොසියා, උණ්ලිහිණියන් හා මහමූහුණෝද; වස්සිංසු, (අමනොඥ) නාද කළාහුය; අම්බරෙ, අහසෙහි ; භයාවහා, බිය එළවන්නාවූ; පෙතා, ප්‍රෙතයෝද; කබන්ධාච, හිස් සුන් රූද; චරිංසු, හැසුරුණාහුයි.

224. මාරො, වශවර්තිමාරතෙම ; සෙනං සංවිදහිත්වාන, සෙනඟහට විධානකොට (සෙනඟ සදා); අභිද්දුවි, දිවීය ; තතො, ඉක්බිත්තෙන්; ආගන්ත්වා (පැණ) අවුත්; ජිනං, ජිනවූ මහාබොධිසත්වයන් ; උදික්ඛිය, බලාගෙණ ; චක්කවාළම්හි, සක්වළගල මත්තෙහි; ඨිතො, සිටියේය.

225. එකකස්ස, හුදකලාවූ; මනුස්සස්ස, මනුෂ්‍යයෙකුගේ, සන්තිකං, සමීපයට ; මම, මාගේ; උපගමං, එළඹිම; නයුත්තං, නුසුදුසුය; හි, ඒ එසේමැයි; ගජො, හස්තියෙක් ; ගජං, හස්තියෙකු කරා ; යාති, යෙයි ; කොත්ථුකං, ශෘගාලයෙකු කරා ; නො යාති, නොම යයි.

---

* "කවන්ධා." † "තෙසං."

226. නෙතං ගරූ පල්ලාපෙතුං කාලො ඉති චින්තිය,
මාපෙසි කුපිතො ඛිප්පං කප්පානිල* සමානිලං.

227. ඛිපන්තො ගගනෙ ඛිප්පං උබ්බරිත්වා වනස්පතී,
කත්වාන වනමුම්මූලං විධංසෙන්තො අසෙසකං.

228. චාලෙත්වා තාලසාලාදිං ලුඤ්චිත්වා ගගනෙ ඛිපං,
පාතෙන්තො චක්කවාළන්ත වාජිසීහගජාදයො.

229. පහරිත්වා විවත්තෙත්වා† ගිරිකූටානි උක්ඛිපං,
භමයන්තො නභොමජ්ඣෙ ධාවතෙව තතො
තතො.

226. එතං, මොහු; පල්ලාපෙතුං, පන්නාහරින්ට; න ගරූ, බර නොවේ; ඉති, මෙසේ; කාලො, වශවර්තිමාරතෙම්; (නොහොත්) කාලො ඉති, (ඊට) කලැයි; චින්තිය, සිතා; කුපිතො, කිපියේ; කප්පානිලසම, කල්පාන්ත මාරුතය වැනිවූ; අනිලං, වාතයක්; ඛිප්පං, වහා; මාපෙසි, මැවීය.

227. (සො, ඒ වාතයතෙම); වනස්පතී, (අශ්වත්ථාදි) වනස්පතී වෘක්ෂයන්; උබ්බරිත්වා, උදුරා; ඛිප්පං, වහා; ගගනෙ, අහසෙහි; ඛිපන්තො, දමන්නේ; අසෙසකං වනං, සියලු වනය; උම්මූලං කත්වාන, මූලොත්පාටනය කොට; විධංසෙන්තො, විධ්වංසනය කරන්නේ.

228. තාලසාලාදිං, තල් සල් ආදි වෘක්ෂ; චාලෙත්වා, අඹරා; ලුඤ්චිත්වා, උදුරා; ගගනෙ ඛිපං, අහසෙහි දමන්නේ; වාජී; අශ්වය; සීහ, සිංහය; ගජාදයො, හස්තිය යනාදීන්; චක්කවාළන්තෙ, චක්‍රවාටාන්තයෙහි; පාතෙන්තො, හෙළන්නේ.

229. ගිරිකූටානි, පර්වතකූටයන්; උක්ඛිපං, ඔසවමින්, පහරිත්වා, ගසා; විවත්තෙත්වා, පෙරළා; නභොමජ්ඣෙ; ආකාශ මධ්‍යයෙහි; භමයන්තො, (බඹර මෙන්) කරකවමින්; තතො තතො, ඒ ඒ තැනින්; ධාවති එව, ධාවනය කෙරේමැයි.

* "පලයානිල." † "පරිවත්තෙත්වා."

230. සිලාහි සිලුසඞ්ඝට්ට මහානාදං පවත්තයං,
පාතෙන්තො දහනඤ්චාපි ධූමමම්බරමුක්ඛිපං.

231. භමයන්තො ගහෙත්වාන අම්බරෙ ඡදනිට්ඨිකා,
පාසාදෙ පරිවත්තෙත්වා පහරන්තො නගාදිසු.

232. ඛනන්තො පඨවිං පංසුං ගහෙත්වාම්බරමණ්ඩලෙ,
ඛන්ධන්තොව පරං භූමිං භින්දන්තො තුඞ්ගපබ්බතෙ.

233. භයානකෙන සද්දෙන උපගම්ම මහාමුනිං,
චාලෙතුං නෙව සො සක්ඛි අංසුමත්තම්පි චීවරෙ.

234. තදාසි විජයො තස්ස සම්බුද්ධස්ස සිරිමතො,
පඨමෙ මාරයුද්ධම්හි මාරස්සාසි පරාජයො.

---

230. සිලාහි, ගලින්; සිලාසඞ්ඝට්ට, පර්වත ගල් ගැහැටී මෙන්වූ; මහානාදං, මහත්වූ ශබ්ද; පවත්තායං, පවත්වමින්; දහනඤ්ච, ගිනිද; පාතෙන්තො, හෙළමින්; අපි, නැවත; ධූමං, දුම්ද; අම්බරෙ, අහසැ; උක්ඛිපං, නගන්නේ.

231. ඡදනිට්ඨිකා, පියසි උළු; ගහෙත්වාන, ගෙණ; අම්බරෙ, නභස්තලයෙහි; භමයන්තො, භ්‍රමණය කරවන්නේ; පාසාදෙ, ප්‍රාසාදයන්; පරිවත්තෙත්වා, පෙරළා; නගාදිසු, පර්වතාදීන්හි; පහරන්තො, ගසන්නේ.

232. පඨවිං, පෘථිවිය; ඛනන්තො, කනින්නේ; පංසුං ගහෙත්වාන, පස් ගෙණ; අම්බරමණ්ඩලෙ, ආකාශමණ්ඩලයෙහි; අපරං භූමිං, අන්‍ය භූමියක්; ඛන්ධන්තො ඉව, බඳින්නෙක් මෙන්; තුඞ්ගපබ්බතෙ, ප්‍රාංශු පර්වතයන්; භින්දන්තො, බිඳිමින්.

233. සො, ඒ වාතයතෙම; භයානකෙන, භය එළවන්නාවූ; සද්දෙන, ශබ්දයෙන් යුක්තව; මහාමුනිං, මහාමුනිවූ බොධිසත්වයන්වහන්සේ කරා; උපගම්ම, පැමිණ; චීවරෙ, සිවුරෙහි; අංසුමත්තම්පි, හුයක් පමණකුත්; චාලෙතුං, සොලවන්ට; නෙවසක්ඛි, නොම හැකිවිය.

234. තදා, එසමයෙහි; පඨමෙ මාරයුද්ධම්හි, පළමුවන මාර යුද්ධයෙහි; සිරිමතො, ශ්‍රීමත්වූ; තස්ස සම්බුද්ධස්ස, ඒ සම්‍යක් සම්බුද්ධයන්වහන්සේට; විජයො ආසි, ජය විය; මාරස්ස, වශවර්ති මාරයාට; පරාජයො ආසි, පරාජය විය.

235. එවං මහානුභාවොති මන්ත්වාන නරසාරථිං,
නිච්චං වන්දථ පූජෙථ සොහි වො සරණං සදා.

ඉති පඨමො විජයො.

---

236. දිස්වා නමුචි ධීරස්ස මාලුතෙනානුපද්දවං,
දුක්ඛී ච දුම්මනො ආසි කොධෙනාතුරමානසො.

237. හොතු දානි මහොඝෙන පවාහෙමි ඉමං යතිං,
මාපෙත්වාන මහාමෙඝං සොචනාය අලං මම.

238. ඉති චින්තිය සො මාරො මහාමෙඝමමාපයි,
දිසාසුමපිහිතා සබ්බා අන්ධකාරො අවත්ථරි.

---

235. නරසාරථිං, නරදම්‍යසාරථිවූ මහොත්තමයන්; එවං, මෙසේ; මහානුභාවො ඉති, මහත් ආනුභාව ඇත්තෙකැයි; මන්ත්වාන, දැන; නිච්චං, නිරන්තරයෙන්; වන්දථ, වඳිව්; පූජෙථ, පුදව්; සොහි, ඒ මහොත්තමතෙම වනාහි; වො, තොපට; සදා, හැමකල්හි; සරණං, පිහිටයි.

පළමුවෙනි මාරවිජය කථාවයි.

---

236. කොධෙන, ක්‍රොධයෙන්; ආතුරමානසො, පීඩිත සිත් ඇති; නමුචි, වශවර්තීමාරතෙම; ධීරස්ස, ධෛර්‍යමත් බෝසතාණන්ට; මාලුතෙන, වාතයෙන්; අනුපද්දවං, නිරුපද්‍රවය; දිස්වා, දැක; දුක්ඛී ච, දුක් ඇත්තේද; දුම්මනො ච ආසි, නොසතුටු සිත් ඇත්තේද වී.

237. හොතු, (එසේ) වේවා; ඉදානි, දැන්; මහාමෙඝං, මහත් මෙඝයක්; මාපෙත්වාන, මවා; මහොඝෙන, මහවතුරෙන්; ඉමං යතිං, මේ තවුසා; පවාහෙමි, උල්පවා හරිමි; සොචනාය, ශොක කිරීමෙන්; මම, මට; අලං, කම් නැත.

228. සො මාරො, ඒ වශවර්තීමාරතෙම; ඉති, මෙසේ; චින්තිය, සිතා; මහාමෙඝං, මහාමෙඝයක්; අමාපයි, මැවීය; සබ්බාදිසා, සියලු දිශාවෝ; පිහිතා ආසුං, වැසුනාහ; අන්ධකාරො, මෙඝාන්ධකාරය, අවත්ථරි, පැතුරුණේය.

ශ්‍රී ලංකා ජාතික

239. උපරූපරි (7) ගුණී හුත්වා සහස්සානි සතානි'පි,
ධාරාධරා මහාධාරා වත්තාසිංසු (8) සමන්තතො.

240. සොදාමිනීසහස්සෙහි විනද්ධංව නභං අහු,
තත්ථ තත්ථ දිසාභාගෙ ඉන්දචාපා අවත්තාථු.

241. මහාරජතරජ්ජූහි සිබ්බිතාව නභාවනී,
ධාරාධරොරුධාරාහි නිරන්තරපවත්තිහි.

242. තත්ථ තත්ථ පතන්තානි ඝොරසනිසතා අහුං,
මහාභිමනභොභෙරිස්සනා* ආසුං තහිං තහිං.

---

239. ධාරාධරා, මෙඝයෝ; උපරි උපරි, මතුමත්තෙහි; සතානි අපි, සියගණන් ද; සහස්සානි අපි, දහස්ගණන් ද; ගුණීහුත්වා, ගුණීතව (වැඩිව); මහාධාරා, මහත් ජලධාරා; සමන්තතො, හාත්පසින්; වත්තාසිංසු, පැවැත්වූ.

240. නභං, ආකාශය; සොදාමිනී සහස්සෙහි, දහස්ගණන් විදුලියෙන්; විනද්ධංව අහු, වලදිනා ලද්දක්ම විය; තත්ථ තත්ථ දිසාභාගෙ, ඒ ඒ දිසාභාගයෙහි; ඉන්දචාපා, ඉඳුසැවි; අවත්තාථු, (පැතිරගෙණ) පැවැත්තාහ.

241. නිරන්තරපවත්තිහි, නිතර පවත්නාවූ; ධාරාධර, මෙඝයන්ගේ; උරුධාරාහි, මහත්වූ ජලධාරාවන් කරණකොට ගෙණ; නභාවනී, අහස් පොලෝ දෙක; මහාරජත රජ්ජූහි, මහරිදී රැහැණින්; සිබ්බිතා ඉව, විනද්ධිත මෙනි.

242. තත්ථ තත්ථ, ඒ ඒ තැන්හි; පතන්තානි, පතිත වෙන්නාවූ; ඝොර, දරුණුවූ; අසනිසතා, සිය ගණන් හෙන අහුං, වූහ; තහිං තහිං, තන්හි තැන්හි; මහාභීම, මහත් භය උපදවන්නාවූ, නභොභෙරිස්සනා, ආකාශභෙරීධ්වනීහු; ආසුං, වූ.

---

* "නභොභෙරිසනා."

243. උද්ධරෙන්තා මහාසෙලෙ මහොඝො ච තදුබ්භවෙ,
කෙලාසසිඛරාකාර ඵෙණපුඤ්ජෙ සමුබ්බහං.

244. මහාථූපප්පමාණාදි මහාබුබ්බුළමුබ්බහං,
ගම්භීරෙ පුථුලො චණ්ඩො උපගම්ම ජිනන්තිකං.

245. සරීරෙ ලොමමත්තම්පි තෙමෙතුමසමත්ථකො,
ගතො මහොඝො බුද්ධස්ස'හො'නුභාවමහන්තතා.*

246. තදාසි විජයො තස්ස සම්බුද්ධස්ස සිරීමතො,
දුතියෙ මාරයුද්ධම්හි මාරස්සාසි පරාජයො.

---

243. මහොඝො, (ඒ) මහාජලෞඝයතෙම; මහාසෙලෙ, විපුල ශෛලයන්; උද්ධරෙන්තා, උදුරන්නේ; තදුබ්භවෙ, තජ්ජාතවූ; කෙලාසසිඛරාකාර, කෛලාසගිරිශිඛරාකෘතිවූ; ඵෙණපුඤ්ජෙ ච, පෙණ පිඬුද; සමුබ්බහං, උසුලන්නේ (නගන්නේ.)

244. මහාථූපප්පමාණාදි, මහාස්තූප ප්‍රමාණාදිවූ; මහාබුබ්බුළං, මහත් බුබුළු; උබ්බහං, නගන්නේ; ගම්භීරෙ, ගැඹුරුවූයේ; පුථුලො, පළල්වූයේ; චණ්ඩො, සැඩවූයේ; ජිනන්තිකං, සර්වඥයන්වහන්සේ සමීපයට; උපගම්ම, පැමින :—

245. සරීරෙ, (උන්වහන්සේගේ) සිරුරෙහි; ලොමමත්තම්පි, ලොමමාත්‍රයකුදු, තෙමෙතුං, තෙමන්ට; අසමත්ථකො, පොහොසත් නුවූයේ; මහොඝො, මහෞඝයතෙම; ගතො, (පහව) ගියේය; බුද්ධස්ස, සම්බුද්ධයන්වහන්සේගේ; අනුභාව මහන්තතා, අනුභාව මහිමය; අහො, ආශ්චර්‍ය්‍යයි.

246. තදා, එකල්හි; දුතියෙ, දෙවෙනිවූ; මාරයුද්ධම්හි, මාර සංග්‍රාමයෙහිදී; සිරීමතො, ශ්‍රීමත්වූ; තස්ස සම්බුද්ධස්ස, ඒ සම්බුද්ධයන්වහන්සේට; විජයො ආසි, (ශත්‍රුමර්ධනය වීමෙන්) ජයවිය: මාරස්ස, වශවර්තීමාරයාට, පරාජයො ආසි, පැරදීම විය.

---

* "බුද්ධස්ස හො'නුභාවමහන්තතා."

247\. එවං මහානුභාවොති මනසිකාන නරසාරථිං,
නිච්චං වන්දථ පූජෙථ සොහි වො සරණං සදා.

දුතියො විජයො.

---

248\. තතොමාරො අසක්කොන්තොනාවසෙසාසෙන උපද්දවං,
කාතුං තස්ස උසූයාදි කොපාකුලමනො තදා.

249\. භවතජ්ජ කිමෙතෙන මාරණෙ තස්ස කිං ගරු,
ඉදානගාරවුට්ඨීහි ඛිපාපෙමි සහසා ඉමං.

250\. ඉති චින්තිය සො මාරො මාපෙත්වගාරවුට්ඨියො,
පෙසෙසි නභසා තස්ස සබ්බඤ්ඤස්ස උපන්තිකං.

---

247\. එවං, මෙසේ ; මහානුභාවො ඉති, මහානුභාව ඇති තෙනැයි ; මනසිකාන, සලකා ; නරසාරථිං, නරදම්‍යසාරථීන් ; නිච්චං, නිරන්තරයෙන් ; වන්දථ, වඳිව් ; පූජෙථ, පුදව් ; සොහි, හෙතෙම වනාහි ; වො, යුෂ්මතුන්ට ; සදා, හැමකල්හි ; සරණං, පිහිටයි.

දෙවෙනි මාරවිජය කථාවයි.

---

248\. තදා, එකල්හි ; මාරො, වශවර්තිමාරතෙම ; තස්ස, උන්වහන්සේට ; වසෙසාසෙන, වර්‍ෂාප්‍රවාහයෙන් ; උපද්දවං කාතුං, උපද්‍රවයක් කරන්ට ; අසක්කොන්තො, නොහැකි වන්නේ ; තතො, එහෙයින් හෝ ඉක්බිති ; උසූයාදි, ඊර්ෂ්‍යා ආදියෙන් හා ; කොපාකුල මනො, කොපයෙන් අවුල්වූ සිත් ඇත්තේ :—

249\. භවතු, වේවා ; අජ්ජ, අද ; එතෙන, මෙයින් ; කිං, කිම ; එතස්ස මාරණෙ, මොහු මැරවීමෙහි ; කිං ගරු, කුමන බරක්ද ; ඉදානි, දැන් ; ඉමං, මොහු ; අඟාරවුට්ඨීහි, කිහිරඟුරු වැස්සෙන් ; සහසා, වහා ; ඛිපාපෙමි, දවමි.

250\. සො මාරො, ඒ වශවර්තිමාරතෙම ; ඉතිචින්තිය, මෙසේ සිතා ; අඟාරවුට්ඨියො, අඟුරුවර්‍ෂාවන් ; මාපෙත්වා, නිර්මිත කොට ; තස්ස සබ්බඤ්ඤස්ස, ඒ සබ්බඥන්වහන්සේගේ ; උපන්තිකං, සමීපයට ; නභසා, අහසින් ; පෙසෙසි, යැවී.

251. මහාපබ්බතසඞ්කාස ජලිතඞ්ගාරරාසයො,
ධාවිංසු නභසා තත්‍ථ අච්චිමන්තා මහබ්භයා.

252 චිච්චිටායන සද්දෙහි පූරයන්තා දිසන්තරං,
ධූපායන්තා ඵුලිඞ්ගෙහි මාරස්සාපි භයාවහා.

253. උජ්ජලන්තා මහාරුක්ඛෙ පබ්බතෙ'පි ච සම්මුඛෙ,
නරකොදරුග්ගතා අග්ගි (9) රාසිවාතිභයාවහා.

254. උපගන්ත්වා මුහුත්තෙන නිසින්නං මුනිපුඞ්ගවං,
මධුමත්තාලිඣඞ්කාර (10) නාදකුලදිසාමුඛා.

---

251. අච්චිමන්තා, ගිනිසිළු ඇත්තාවූ; මහබ්භයා, මහත් භය එළවන්නාවූ; මහාපබ්බතසඞ්කාස, මහත් පර්වත බඳුවූ; ජලිතඞ්ගාරරාසයො, දිලියෙන අඟුරුරාශීහු; තත්‍ථ, එහි (බෝසතාණන් සමීපයෙහි); ධාවිංසු, දිවුවාහුය.

252. චිච්චිටායනසද්දෙහි, "චිච්චිට" යන අනුකරණ ශබ්ද යන් කරණකොටගෙණ; දිසන්තරං, දිශාන්තර; පූරයන්තා, පුරවන්නාහු; ඵුලිඞ්ගෙහි, ගිනිකණින් යුක්තව; ධූපායන්තා, දුමන්නාහු; මාරස්ස අපි, වශවර්තීමාරයාට පවා; භයාවහා, භය එළවන්නාහු වූ.

253. සම්මුඛෙ, හමුවූ; මහාරුක්ඛෙ, මහාවෘක්ෂයන්ද; පබ්බතෙපි ච, පර්වතයන්ද; උජ්ජලන්තා, දල්වන්නාහු; නරකොදර, නරකාභ්‍යන්තරයෙන්; උග්ගතා, නැංගාවූ; අග්ගිරාසි ඉව, වහ්නිරාශීන් මෙන්; අතිභයාවහා, ඉතා බිය එළවන්නාහුය.

254 නිසින්නං, වැඩඋන්නාවූ; මුනිපුඟවං, මුනිශ්‍රෙෂ්ඨයන් කරා, උපගන්ත්වාන, එළඹ; මුහුත්තෙන, මොහොතකින්; මධුමත්ත, මීපානයෙන් මත්වූ; අලි, භෘංගයන්ගේ; ඣඞ්කාර නාද, ඣඞ්කාරනාදයෙන්; ආකුල, ගැවසීගත්තාවූ; දිසාමුඛා, දිශාමුඛයෙන් හෝ දිශාමුඛ ඇති :—

255. පාතෙනන්ති සතතාමන්දමකරන්දපබින්දවො,
මාලාවතංසකා හුත්වා පාදමූලෙ පතිංසු තා.

256. තදාසි විජයො තස්ස සම්බුද්ධස්ස සිරීමතො,
තතියෙ මාරයුද්ධම්හි මාරස්සාසි පරාජයො.

257. එවං මහානුභාවොති මහන්තාන නරසාරථිං,
නිච්චං වන්දථ පූජෙථ සො හි වො සරණං සදා.

තතියො විජයො.

---

258. තෙනානුපද්දුතං බුද්ධං පස්සිත්වාන පජාපති,
දුක්ඛිතො දුම්මනො හුත්වා එවං චින්තෙසි දුම්මති.

---

255. සතත, නිරන්තරයෙන්; අමන්ද, මඳනොවූ; මකරන්දපබින්දවො, මුවරදින් හටගත් බිඳුන්; පාතෙනන්ති, හෙළන්නාවූ; තා, ඒ අභාරවෘෂ්ටීහු; මාලාවතංසකා හුත්වා, පුෂ්පශිරොභූෂණව ; පාදමූලෙ, (බුදුන්ගේ) ශ්‍රීපාද මූලයෙහි; පතිංසු, වැටුනාහුයි.

256. තදා, එසමයෙහි ; තතියෙ, තෙවැනිවූ; මාරයුද්ධම්හි, මාරයුද්ධයෙහිදී ; සිරීමතො, ශ්‍රීමත්වූ; තස්ස සම්බුද්ධස්ස, ඒ සම්බුද්ධයන්වහන්සේට; විජයො ආසි, අතිශයින් ජයවිය; මාරස්ස, වශවර්තිමාරයාට; පරාජයො ආසි, පරාජය වී.

257. එවං, මෙසේ; නරසාරථිං, නරදම්‍යසාරථිවූ මහ බෝධිසත්වයන් ; මහානුභාවො ඉති, මහානුභාවමහිම ඇත්තෙකැයි ; මහන්තාන, දැන; නිච්චං, සතතයෙන්; වන්දථ, වඳිව්; පූජෙථ, පුදව්; සොහි, හෙතෙම වනාහි ; වො, යුෂ්මතුන්ට; සදා, සැමකල්හි ; සරණං, පිහිටයි.

**තෙවැනි මාරවිජය කථාවයි.**

---

258. දුම්මති, දුර්බුද්ධිවූ; පජාපති, වශවර්තිමාරතෙම ; තෙන, එයින්; අනුපද්දුතං, උපද්‍රැත නොවූ; බුද්ධං, බෝධිසත්වයන්; පස්සිත්වාන, බලා ; දුක්ඛිතො, දුඃඛිතවූයේ; දුම්මනො, අසන්තුෂ්ට සිත් ඇතිවූයේ; එවං, මෙපරිද්දෙන්; චින්තෙසි, සිතී.

259. පාසාණවස්සං මාපෙත්වා චුණ්ණෙත්වා පතිමං යතිං,
විධංසෙමීති චින්තෙත්වා මාපෙසුපලවස්සකං.

260. තස්මිං වසෙස'තිබීභච්ඡා ධූමායන්තා සජොතිකා,
ජලිතඞ්ගාරසඞ්කාසා පාසාණුච්චාවචා බහූ.

261. ඝරනෙඤ්ඤමඤ්ඤසඞ්ඝට්ටා මහන්තං භෙරවං රවං,
දුද්දිනං ධූමජාලාහි කුරුමානා සමන්තතො.

262. සත්ථුපගන්ත්වාභිමුඛං සන්තමාලාගුලා විය,
පතිංසු සිරිපාදෙ තෙ අමන්දාමොදවාහිනො.

263 තදාසි විජයො තස්ස සම්බුද්ධස්ස සිරීමතො,
චතුත්ථෙ මාරයුද්ධම්හි මාරස්සාසි පරාජයො.

---

259. පාසාණවස්සං, පාෂාණවර්ෂාවක් ; මාපෙත්වා, මවා ; ඉමං යතිං, මේ යතියා ; චුණ්ණෙත්වාපන, සුණුකොටම ; විධංසෙමීති, විනාශකරමියි ; චින්තෙත්වා, (යථොක්තාකාරයෙන්) සිතා; උපලවස්සකං, පාෂාණ වර්ෂාවක්; මාපෙසි, මැවී.

260. තස්මිං වසෙස, ඒ වර්ෂායෙහි; අතිබීභච්ඡා, ඉතා භයානකවූ; ධූමායන්තා, දුමන්නාවූ; සජොතිකා, ස්වකීයාලොක ඇත්තාවූ; උච්චාවචා, කුඩා මහත්වූ; ජලිතඞ්ගාරසඞ්කාසා, දිලෙන ගිනිඅඟුරු බඳුවූ ; පාසාණා, පාෂාණයෝ ; බහූ, බොහෝයි.

261. අඤ්ඤමඤ්ඤසඞ්ඝට්ටා, ඔවුනොවුන් ගැටීමෙන් ; මහන්තං, මහත්වූ; භෙරවං, භයානකවූ ; රවංකරොන්තා, නාද කරන්නාහු ; සමන්තතො, හාත්පස ; ධූමජාලාහි, දුම්දලින්; දුද්දිනං කුරුමානා, වැලැලි දිනක් කරන්නෝ වූහ.

262. තෙ, ඒ පාෂාණයෝ, සත්ථු, ශාස්තෲන්වහන්සේගේ ; අභිමුඛං, අභිමුඛයට ; උපගන්ත්වාන, පැමිණ ; අමන්ද, නොමඳවූ; ආමොදවාහිනො, දුර හමනා සුවඳ වහනය කරන්නාහු; සන්ත, යශපත්වූ ; මාලාගුලාවිය, පුෂ්පපිණ්ඩයන් මෙන් ; සිරිපාදෙ, ශ්‍රීපාද සමීපයෙහි; පතිංසු, පතිතවූහ.

263. තදා, එසමයෙහි; චතුත්ථෙ, සිව්වෙනිවූ; මාරයුද්ධම්හි, මාරයුද්ධයෙහි ; සිරීමතො, ශ්‍රීමත්වූ ; තස්ස සම්බුද්ධස්ස, ඒ සම්බුද්ධයන්වහන්සේට; විජයො ආසි, ජයවූයේය; මාරස්ස, මාරයාට; පරාජයො ආසි, පරාජය විය.

264. එවං මහානුභාවොති මන්ත්වාන නරසාරථිං
නිච්චං වන්දථ පූජේථ සොහි වො සරණං සදා.

චතුත්ථො විජයො.

---

265. දිස්වානත්තමනො මාරො දිත්තො කොධග්ගිනා තදා,
මාපෙත්වා'යුධවස්සං සො පෙසෙසි තදුපන්තිකං.

266. නෙත්තිංසච්ඡුරිකාසත්ති හෙණ්ඩිවාලගදාදයො,
තිණ්හධාරා පජ්ජලිතා අචිරජ්ජුතිසන්නිභා.

267. යථා පුප්ඵොපහාරෙපගන්ත්වාන ගගනඞ්ගනා,
එවං සබුද්ධපාදෙසු පතිසුං පරිවත්තිතා.

---

264. එවං, මෙසේ ; මහානුභාවො ඉති, මහදනුභාව ඇත්තෙකැයි ; නරසාරථිං, නරදම්‍යසාරථීන්වහන්සේ ; මන්ත්වාන, දැන ; නිච්චං, සතතයෙන් ; වන්දථ, වඳිව් ; පූජේථ, පුදව් : සොහි. උන්වහන්සේ වනාහි ; වො, තොපට ; සදා හැමකල්හි ; සරණං, පිහිටයි.

**සිව්වෙනි මාරවිජය කථාවයි.**

---

265. තදා, එකල්හි ; තං, ඒ උපද්‍රැත නූවූ උත්තමයන් දිස්වා, දැක ; අනත්තමනො, නොසතුටු සිත් ඇත්තාවූ ; සො මාරො, ඒ මාරදිව්‍යපුත්‍ර තෙම ; කොධග්ගිනා, ක්‍රොධාග්නියෙන් ; දිත්තො, දිලිසුනේ ; ආයුධවස්සං, ආයුධවර්‍ෂාවක් ; මාපෙත්වා, මවා ; උපන්තිකං, (මහාබොධිසත්ත්වයන්) සමීපයට ; පෙසෙසි, යැවී.

266. තිණ්හධාරා, තියුණු මුවහත් ඇති ; පජ්ජලිතා, විශෙෂයෙන් දිලියෙනලද ; අචිරජ්ජුතිසන්නිභා, විද්‍යුල්ලතාබඳුවූ ; නෙත්තිංස, කඩුය ; ඡුරිකා, සිරිය ; සත්ති, අඩයටිය ; හෙණ්ඩිවාල, නාඩිකාශස්ත්‍රය ; ගදාදයො, ගදායුධය යනාදීහු :—

267. පුප්ඵ, (ගෙතූ නොගෙතූ) මල්ය ; උපහාර, අසෙනිය මල්ය යන මොහු ; යථා, යම්සේද ; එවං, එපරිද්දෙන් ; ගගනඞ්ගනා, ආකාශාඞ්ගනයෙන් ; උපගන්ත්වාන, සම්පසථව ; පරිවත්තිතා, පෙරළියාහු ; සබුද්ධපාදෙසු, බුදුන් පාමුල්හි ; පතිංසු, හුනුවාහුයි.

268 තදා'සි විජයො තස්ස සබ්බස්ස සිරිමතො,
පඨමෙ මාරයුද්ධම්හි මාරස්සාසි පරාජයො.

269. එවං මහානුභාවොති මන්තවාන නරසාරථිං,
නිච්චං වන්දථ පූජෙථ සො හි වො සරණං සදා.

පඨමො විජයො.

---

270. තං දිස්වා පාපිමා කුද්ධො යංයං තස්ස කරොමහං,
තංතං දානි න සක්කොති කිඤ්චි කාතුමුපක්කමං.

271. මාපෙසි කුක්කුළං වස්සං මාරෙමීති බුධො මුනිං,
සො'ගා කාසා සම්පදිත්තො ධූමායන්තොවපජ්ජලං.

---

268. තදා, එසමයෙහි; පඨමෙ, පස්වැනිවූ; මාරයුද්ධම්හි, මාරයුද්ධයෙහිදී; සිරිමතො, ශ්‍රීමත්වූ; තස්ස සබ්බස්ස, ඒ සබුධ සන්වහන්සේට; විජයො ආසි, විශෙෂයෙන් ජයවිය; මාරස්ස, මාරයාට; පරාජයො ආසි, පරාජය වී.

269. එවං, මෙසේ; නරසාරථිං, නරදම්මසාරථීන්වහන් සේ; මහානුභාවො ඉති, මහත් අනුභාව ඇත්තෙකැයි; මන්තවාන, දැන; නිච්චං, නිරන්තරයෙන්; වන්දථ, වඳිව්; පූජෙථ, පුදව්; සො හි, හෙතෙම වනාහි; වො, තොපට; සදා, සියලුකල්හි; සරණං, පිහිටයි.

පස්වෙනි මාරවිජය කථාවයි.

---

270. පාපිමා, වශවර්තිමාරතෙම; තං දිස්වා, ඒ දැක; කුද්ධො, කිපියේ; අහං, මම; යං යං, යම් යම් කම්මයක්; කරොමි, කෙරෙම්ද; තං තං, ඒ ඒ කම්මය තෙම; ඉදානි, දැන්; තස්ස, ඔහට; කිඤ්චි උපක්කමං කාතුං, කිසි උපක්‍රමයක් කරන්ට; නසක්කොති, නොහැකිවෙයි.

271. මුනිං, මුනීන්ද්‍රයන්; අබුධො, දැන්; මාරෙමීති, මරම්යි; කුක්කුළං වස්සං, උණු අළු වර්ෂාවක්; මාපෙසි, මැවිය; සො, ඒ උණු අළු වැස්ස; සම්පදිත්තො, විශෙෂයෙන් දිලිසුනේ; පජ්ජලං, ඇවිලෙමින්; ධූමායන්තොඑව, දුමන්නේම; අකාසා අහසින්; අගා, ගියේය.

272. ජිනස්සාභිමුඛං ගන්ත්වා කුකකුලො පරිවත්තිය,
චන්දනස්ස සිතාබ්භස්ස ධූලි හුත්වාන පග්ඝරි.

273. තදාසි විජයො තස්ස සම්බුද්ධස්ස සිරිමතො,
ඡට්ඨෙ නමුචියුද්ධම්හි මාරස්සාසි පරාජයො.

274. එවං මහානුභාවොති මන්ත්වාන නරසාරථිං,
නිච්චං වන්දථ පූජෙථ සො හි වො සරණං සදා.

ඡට්ඨො විජයො.

---

275. තතො දිස්වාන තං කණ්හො කණ්හසෙනා පුරක්ඛතො,
සඞ්කුද්ධො පෙසසී තත්ථ වස්සං සො සිකතාමයං.

---

272. කුකකුලො, උණුඅළු; ජිනස්ස, ජිනේන්ද්‍රයන්ගේ; අභිමුඛං ගන්ත්වා, සම්මුඛයට ගොස්; පරිවත්තිය, පෙරළී; චන්දනස්ස, ශ්වෙතචන්දන සම්බන්ධවූද; සිතාබ්භස්ස, කර්පූර සම්බන්ධවූද; ධූලි හුත්වාන, දූවිලිව; පග්ඝරි, වැගුරුණේයි.

273. තදා, එකල්හි; ඡට්ඨෙ, සවැනිවූ; නමුචියුද්ධම්හි, මාර යුද්ධයෙහිදී; සිරිමතො, ශ්‍රීමත්වූ; තස්ස සම්බුද්ධස්ස, ඒ සම්බුද්ධයන් වහන්සේට; විජයො ආසි, විජය විය; මාරස්ස, මාරයාට; පරාජයො ආසි, පරාජය වී.

274. නරසාරථිං, නරසාරථින්වහන්සේ; එවං, මෙසේ; මහානුභාවො ඉති, මහත් අනුභාව සම්පන්නයෙකැයි; මන්ත්වාන, විජානනයකොට; නිච්චං, අනවරතයෙන්; වන්දථ, වඳිව්; පූජෙථ, පුදව්; සො, උන්වහන්සේ; වො, තොපට; සදා, හැමකල්හි; සරණං හි, පිහිටමැයි.

සවෙනි මාරවිජය කථාවයි.

---

275. තතො, ඉක්බිත්තෙන්; කණ්හසෙනා පුරක්ඛතො, මාරවාහිනීන් විසින් පිරිවරණලද්දාවූ; සො කණ්හො, ඒ වශවර්තිමාරතෙම; තං, එය; දිස්වාන, දැක; සඞ්කුද්ධො, කිපියේ; සිකතාමයං, වාලුකාමයවූ; වස්සං, වැස්සක්; තත්ථ, එහි (බෝසතානන් සමීපයෙහි); පෙසසී, යැවී.

276. ඛදිරඞ්ගාරසඞ්කාසා වාලුකා ගගනාගතා,
භස්සන්තා ජිනපාදන්තෙ වාසචුණ්ණත්තමාගතා.

277. තදාසි විජයො තස්ස සම්බුද්ධස්ස සිරීමතො,
සත්තමෙ මාරයුද්ධම්හි මාරස්සාසි පරාජයො.

278. එවං මහානුභාවොති මන්ත්වාන නරසාරථිං,
නිච්චං වන්දථ පූජෙථ සො හි වො සරණං සදා

සත්තමො විජයො.

---

279. තම්පි දිස්වා අසජ්ජන්තො අහිරී කොපකෙතුකො,
මාපෙත්වා පලිපඤ්ඤති තත්ථ ඔසීදයාමි තං.

---

276. ගගනාගතා, ආකාශයෙන් ආවාවූ; ඛදිරඞ්ගාරසඞ්කාසා, කිහිරඟුරු බඳුවූ; වාලුකා, වැලි; ජිනපාදන්තෙ, ජිනෙන්ද්‍රයන් පාමුල; භස්සන්තා, බසින්නාහු; වාසචුණ්ණත්තං, සුවඳසුණුබවට; ආගතා, පැමිණියාහුයි.

277. තදා, එකල්හි; සත්තමෙ, සත්වෙනිවූ; මාරයුද්ධම්හි, මාරයුද්ධයෙහිදී; සිරීමතො, ශ්‍රීමත්වූ; තස්සසම්බුද්ධස්ස, ඒ සම්බුදුන්වහන්සේට; විජයො ආසි, ජය වීය; මාරස්ස, මාරයාට; පරාජයො ආසි, පරාජය වී.

278. නරසාරථිං, නරසාරථින්වහන්සේ; එවං, මෙසේ; මහානුභාවො ඉති, මහත් ආනුභාව ඇත්තෙකැයි; මන්ත්වාන, විජානනයකොට; නිච්චං, නිරන්තරයෙන්; වන්දථ, වඳිව්; පූජෙථ, පුදව්; සො හි, හෙතෙම වනාහි; වො, තොපට; සදා, හැමකල්හි; සරණං, පිහිටයි.

**සත්වෙනි මාරවිජය කථාවයි.**

---

279. අහිරී, ලජ්ජා නැත්තාවූ, කොපකෙතුකො, ක්‍රෝධය ධ්වජකොට ඇත්තාවූ (මාරතෙම); තං අපි, හෙද; දිස්වා දැක; අසජ්ජන්තො, නොපැකිළෙන්නේ; ඉදානි, දැන්; පලිපං, ඝෝරවූ මහ මඩක්; මාපෙත්වා, මවා; තං, ඔහු; තත්ථ, ඒ කලලෙහි; ඔසීදයාමි, ගල්වමි.

ශ්‍රී ලංකා ජාතික ...

280. ඉති චින්තිය මාපෙත්වා පෙසෙසි පලිපං* ඝනං,
ධූපායන්තො පජ්ජලන්තො ගන්ත්වා සො
නභසා ලහුං.

281. සම්බුද්ධසිරිපාදම්හි සම්පත්තො නිබ්බුතො තතො,
නානාසුගන්ධසම්භූත ගන්ධකද්දමත්තං ගතො.

282. තදාසි විජයො තස්ස සම්බුද්ධස්ස සිරීමතො,
අට්ඨමෙ මාරයුද්ධම්හි මාරස්සාසි පරාජයො.

283. එවං මහානුභාවොති මන්ත්වාන නරසාරථිං,
නිච්චං වන්දථ පූජෙථ සො හි වො සරණං සදා.

අට්ඨමො විජයො.

---

280. ඉති, මෙසේ; චින්තිය, සිතා; ඝනං, දැඩිවූ; පලිපං, මහාකර්දමයක්; මාපෙත්වා, මවා; පෙසෙසි, (බෝසතාණන් හමුවට) යැවීය; සො ඒ කර්දමයතෙම; ධූපායන්තො, දුමන්නේ; පජ්ජලන්තො, ඇවිලෙන්නේ; නභසා, ආකාශයෙන්; ලහුං, වහා; ගන්ත්වා, (බෝසතුන් සමීපයට) ගොස්:—

281. සම්බුද්ධසිරිපාදම්හි, බුදුන් සිරිපා වෙතට; සම්පත්තො, සම්ප්‍රාප්ත වූයේ; නිබ්බුතො, නිවියේ; තතො, ඉක්බිත්තෙන්; නානා සුගන්ධ, අනෙකප්‍රකාර සුවඳින්; සම්භූත, හටගත්තාවූ; ගන්ධකද්දමත්තං, සුවඳ මඩබවට; ගතො, ගියේය.

282. තදා, එකල්හි; අට්ඨමෙ, අටවෙනිවූ; මාරයුද්ධම්හි, මාරයුද්ධයෙහිදී; සිරීමතො, ශ්‍රීමත්වූ; තස්සසම්බුද්ධස්ස, ඒ සම්බුද්ධයන්වහන්සේට; විජයො ආසි, විජය වීය; මාරස්ස, මාරයාට; පරාජයො ආසි, පරාජය වී.

283. නරසාරථිං, නරසාරථීන්වහන්සේ; එවං, මෙසේ; මහානුභාවො ඉති, මහත් අනුභාව ඇත්තේකැයි; මන්ත්වාන, දැන; නිච්චං, නිරන්තරයෙන්; වන්දථ, වඳිව්; පූජෙථ, පුදව්; සොහි, හෙතෙම වනාහි; වො, තොපට; සදා, හැමකල්හි; සරණං, පිහිටයි

**අටවෙනි මාරවිජය කථාවයි.**

---

* පලලං.

284. ඔලොකෙන්තො තතො මාරො මාරාරිං සිරියුජ්ජලං,
දිස්වා චිත්තමපසාදෙතුමසක්කොන්තො'ති කොපවා.

285. අජ්ජෙතමන්ධකාරස්මිං පක්ඛිපිත්වා පමොහිතුං,
මය්හං භාරොති චින්තෙත්වා මාපෙසි තිමිරං ඝනං.

286. ලොකන්තරෙසු සම්භූත තිමිසොව භයාවහො,
ගන්ත්වාන ගගනා සොහි පත්වාන මුනිසන්තිකං.

287. යථා තිමිරමායාති විනාසං සුරියුග්ගතෙ,
එවමාසි ජිනග්ගම්හි අන්ධකාරො තථාවිධො.

---

284. තතො, ඉක්බිති; මාරො, මාරතෙම; ඔලොකෙන්තො, බලන්නේ; සිරියා උජ්ජලං, ශ්‍රී සමෘද්ධියෙන් බබලන්නාවූ; මාරාරිං, මාරශත්‍රුවූ බෝසතාණන්; දිස්වා, දැක; චිත්තමපසාදෙතුං, සිත පහදවන්ට; අසක්කොන්තො, නොහැකිවන්නේ; අතිකොපවා, ඉතා කොප ඇත්තේ:—

285. අජ්ජ, අද; එතං, මොහු; අන්ධකාරස්මිං, අඳුරෙහි; පක්ඛිපිත්වා, බහා; පමොහිතුං, මුලාකරන්ට; මය්හං භාරොති, මට භාරයයි; චින්තෙත්වා, සිතා; ඝනං, බහලවූ; තිමිරං, අන්ධකාරයක්; මාපෙසි, මැවී.

286. ලොකන්තරෙසු, ලොකාන්තරික නරකයන්හි; සම්භූත, හටගත්තාවූ; තිමිසොඉව, අන්ධකාරය වැනිවූ; භයාවහො, භය එළවන්නාවූ; සොහි, ඒ අන්ධකාරය වනාහි; ගගනා, ආකාශයෙන්; ගන්ත්වාන, ගොස්; මුනිසන්තිකං, මුනීන්ද්‍රයන් සමීපයට; පත්වාන, පැමින:—

287. යථා, යම්සේ; සුරියෙ, සූර්‍ය්‍යයා; උග්ගතෙ, උදාවූ කල්හි; තිමිරං, අන්ධකාරය; විනාසං, විනාශයට; ආයාති, පැමිණේද; ජිනග්ගම්හි, බුදුන් ඉදිරියෙහි; තථාවිධො අන්ධකාරො, එබඳු (යථොක්තාකාර) වූ ඝනාන්ධකාරයතෙම; එවං ආසි, එමෙන් වී.

288. තදාසි විජයො තස්ස සබ්බුධස්ස සිරීමතො,
නවමෙ මාරයුද්ධම්හි මාරස්සාසි පරාජයො.

289. එවං මහානුභාවොති මන්ත්වාන නරසාරථිං,
නිච්චං වන්දථ පූජෙථ සො හි වො සරණං සදා.

නවමො විජයො.

---

290. එවං නවහි වුට්ඨීහි කත්වා මාරො මහාහවං,
න තස්සොපද්දවං දිස්වා දිත්තකොපානලාකුලො.

291. ගහෙත්වාන තතො ඛිප්පං ඨපිතං අත්තගුත්තියා,
චක්කායුධං මහාතෙජං කුපිතො ඛිපි වෙගසා.

---

288. තදා, එකල්හි ; නවමෙ, නවවෙනිවූ ; මාරයුද්ධම්හි, මාරයුද්ධයෙහිදී ; සිරීමතො, ශ්‍රීමත්වූ ; තස්ස සබ්බුධස්ස, ඒ සම්බුද්ධයන්වහන්සේට ; විජයො ආසි, විජය විය; මාරස්ස, මාරයාට; පරාජයො ආසි, පරාජය වී.

289. නරසාරථිං, නරසාරථීන්වහන්සේ ; එවං, මෙසේ ; මහානුභාවො ඉති, මහත් අනුභාව ඇත්තෙකැයි ; මන්ත්වාන, දැන ; නිච්චං, නිරන්තරයෙන් ; වන්දථ, වඳිව් ; පූජෙථ, පුදව් ; සො හි, උන්වහන්සේ නම් ; වො, තොපට ; සදා, හැමකල්හි ; සරණං, පිහිටයි.

## නවවෙනි මාරවිජය කථාවයි.

---

290. මාරො, වසවත් මරුතෙම ; එවං, මෙසේ ; නවහි වුට්ඨීහි, (වාතාදී) නවවර්ෂාවකින් ; මහාහවං කත්වා, මහත් යුද්ධ කොට ; තස්ස, ඒ බොධිසත්ත්වයන්ට ; උපද්දවං, උපද්‍රවයක් ; න දිස්වා, නොදැක ; දිත්ත, දිලියෙනලද ; කොපානල, ක්‍රොධාග්නියෙන් ; ආකුලො, අවුල්වූයේ;—

291. තතො, ඉක්බිත්තෙන් ; කුපිතො, කිපියේ ; අත්තගුත්තියා, ආත්මාරක්ෂා පිණිස; ඨපිතං, තැබූ; මහාතෙජං, මහත් තෙජස් ඇති; චක්කායුධං, චක්‍රායුධය ; ඛිප්පං, වහා ; ගහෙත්වාන, රැගෙණ ; වෙගසා, වෙගයෙන් ; ඛිපි, දමාගැසීය.

292. ධරාධරං* තමුග්ගය්හ කුද්ධො පහරන්තෙ යදි,
කළීරංව අසජ්ජන්තො විඛණ්ඩෙති පජාපති.

293. තථෙව සො මහිං කුද්ධො මාරො ඛිපති වෙගවා†,
‡න භවන්තොසධා පාණී විසුස්සන්ති සරාදයො.

294. තථෙව කුපිතො තෙන ඛිපන්තෙ සො මහම්බුධිං,
විලයං ජලජා යන්ති සුස්සන්තෙ සො මහණ්ණවො.

295. එවං මහානුභාවො සො ගච්ඡන්තො ජලමම්බරෙ,
පත්වාන පතිතො නාථං හුත්වාන පුප්ඵචුම්බටං.

---

292. යදි, ඉදින් ; පජාපති, වශවර්තීමාරතෙම ; කුද්ධො, කිපියේ ; තං, ඒ චක්‍රායුධය ; උග්ගය්හ, ඔසවාගෙණ ; ධරාධරං, පර්වතයකට ; පහරන්තෙ, ගසාද ; අසජ්ජන්තො, නොපැකිලෙන්නේ ; කළීරං ඉව, කිලිළක්මෙන් ; විඛණ්ඩෙති, කඩ කෙරෙයි.

293. තථෙව, එසේම ; සො මාරො, ඒ වසවත්මරුතෙම ; කුද්ධො, කිපියේ ; වෙගවා, වෙග ඇත්තේ ; මහිං, පෘථිවියට ; ඛිපති, (ඒ) දමාද ; ඔසධා, ඔසුදු ; පාණී, ප්‍රාණීහුදු ; නභවන්ති, නැතිවෙත් ; සරාදයො, තඩාගාදි ජලාශ්‍රයයෝ : විසුස්සන්ති, වියලෙත්.

294. තථෙව, එසේම ; සො, හෙතෙම ; කුපිතො, කිපියේ ; තෙන, ඒ චක්‍රායුධයෙන් ; මහම්බුධිං, මහාණ්ණවය ; ඛිපන්තෙ ; කලම්බාද ; ජලජා, මත්ස්‍යයෝ ; විලයං යන්ති, විනාශයට යෙත් ; සො මහණ්ණවො, ඒ මහාසමුද්‍රයතෙම ; සුස්සන්තෙ, වියලෙන්නේයි.

295. එවං, මෙසේ ; මහානුභාවො, මහානුභාව ඇත්තාවූ ; සො, ඒ චක්‍රායුධයතෙම ; ජලං, දිලිසෙමින් ; අම්බරෙ, ආකාශයෙහි ; ගච්ඡන්තො, යන්නේ ; නාථං, නාථවූ බෝසතානන් කරා ; පත්වාන, පැමින ; පුප්ඵචුම්බටං හුත්වාන, මල් සුඹුලක්ව ; පතිතො, හුනුයේය.

---

* "ධාරාධරං." † "වෙගසා." ‡ "මාභවන්තොසධා."

296. තදාසි විජයො තස්ස සම්බුද්ධස්ස සිරිමතො,
දසමෙ මාරයුද්ධම්හි මාරස්සාසි පරාජයො.

297. එවං මහානුභාවොති මන්ත්වාන නරසාරථිං,
නිච්චං වන්දථ පූජෙථ සො හි වො සරණං සදා.

දසමො විජයො.

---

298. ඉති කොපග්ගිනා දිත්තමනං මාරං තදා ජිනො,
කරුණාජලසෙකෙන නිබ්බාපෙන්තො නිසීදි සො.

299. එවං කත්වාපි සො කුද්ධො අලද්ධවිජයො තදා,
ආමන්තෙසි සකං සෙනං පලයානලභෙරවං.*

---

296. තදා, එසමයෙහි ; දසමෙ, දසවැනිවූ ; මාරයුද්ධම්හි, මාරයුද්ධයෙහිදී ; සිරිමතො, ශ්‍රීමත්වූ; තස්ස සම්බුද්ධස්ස, ඒ සම්බුද්ධයන්වහන්සේට ; විජයො ආසි, ජය විය ; මාරස්ස, මාරයාට ; පරාජයො ආසි, පරාජය වී.

297. එවං, මෙසේ ; නරසාරථිං, නරසාරථීන්වහන්සේ ; මහානුභාවො ඉති, මහත් අනුභාව ඇත්තෙකැයි ; මන්ත්වාන, දැන ; නිච්චං, නිරන්තරයෙන් ; වන්දථ, වඳිව් ; පූජෙථ, පුදව්; සොහි, හෙතෙම වනාහි ; වො, තොපට ; සදා, හැමකල්හි ; සරණං, පිහිටයි.

දසවෙනි මාරවිජය කථාවයි.

---

298. සො ජිනො, ඒ ජිනවූ මහාබොධිසත්වතෙම ; තදා, එකල්හි ; ඉති, මෙසේ ; කොපග්ගිනා, කොප ගින්නෙන් ; ආදිත්තමනං, ඇවිලගත් සිත් ඇත්තාවූ ; මාරං, මාරයා ; කරුණාජලසෙකෙන, කරුණා නැමැති ජලය ඉසීමෙන් ; නිබ්බාපෙන්තො, නිවමින් ; නිසීදි, වැඩඋන්සේක.

299. එවං කත්වාපි, මෙසේ කොටද ; අලද්ධවිජයො, ජය නොලැබූ ; කුද්ධො, කිපියාවූ ; සො, ඒ වශවර්තිමාරතෙම ; තදා, එකල්හි ; පලයානලභෙරවං ; කල්පාන්ත වහ්නියක් මෙන් භයානකවූ ; සකං සෙනං, තම සෙනඟට ; ආමන්තෙසි, ආමන්ත්‍රණය කෙළේය (කැඳවී).

---

* “පලයානිල භෙරවං.”

300. එථාසු වත'රෙ මය්හං අස්සවා මාරකිඞ්කරා,
නානාවෙසධරා හොථ ධාරෙථ විවිධායුධෙ.

301. සද්දෙහෙතං පලාපෙථ යාථ ගණ්හථ බන්ධථ,
පාදෙ ගහෙත්වා ඛිපථ චක්කවාළන්තරං ඉතො.

302. අථාගා සහ වාචාහි භිංසා සා මාරවාහිනී,
තුරඞ්ගව්‍යග්ඝමාතඞ්ග සීහාදිරූප* භිංසනා.

303. සා මාරස්සුභතො පස්සෙ චතුවීසතියොජනෙ,
ඨිතා පච්ඡිමභාගම්හි චක්කවාළසිලාවධිං.

304 බහලත්තෙන සා ආසි සම්පුණ්ණනවයොජනා,
යක්ඛපෙතපිසාචාදි වෙසෙහි භයවාහිනී.

---

300. අරෙ, කොලෙනි; මය්හං, මාගේ; අස්සවා මාරකිඞ්කරා, කීකරු මාරභටයෙනි; වත, ඒකාන්තයෙන්; ආසු, වහා; එථ, එව්; නානාවෙසධරා හොථ, නන්වෙස්දරනු වව්; විවිධායුධෙ, අනෙකප්‍රකාර ආයුධයන්; ධාරෙථ, දරව්.

301. යාථ, යව්; එතං, මෙල ශ්‍රමණයා, සද්දෙහි, ශබ්දයෙන්; පලාපෙථ, පන්නා හරිව්; ගණ්හථ, අල්වාගනිව්; බන්ධථ, බඳිව්; පාදෙ ගහෙත්වා, පා ගෙණ; ඉතො, මේ සක්වළින්; චක්කවාළන්තරං, අන් සක්වළකට; ඛිපථ, දමව්.

302. අථ, ඉක්බිත්තෙන්; භිංසා, භයානකවූ; සා මාරවාහිනී, ඒ මාරසෙනාතොමෝ; සහවාචාහි, වචනය හා සමග; තුරඞ්ග, අශ්වය; ව්‍යග්ඝ, ව්‍යාඝ්‍රය; මාතඞ්ග, හස්තිය; සීහ, සිංහය; ආදි, යනාදීන්ගේ; රූපභිංසනා, රුවින් බිහිසුනුවූවා; අගා, ගියාය.

303. සා, ඒ මාරවාහිනීතොමෝ; මාරස්ස, මාරයාගේ; උභතොපස්සෙ, උභයපාර්ශ්වයෙහි; චතුවීසතියොජනෙ, සූවිසි යොදුන්තැන්හි; පච්ඡිමභාගම්හි, පශ්චිමදිග්භාගයෙහි; චක්කවාළසිලාවධිං, චක්‍රවාටපර්වතය හිම්කොට; ඨිතා, සිටියාය.

304. සා, ඒ මාරසෙනාතොමෝ; යක්ඛ පෙත පිසාචාදි, යක් පේ පිසස් ආදිවූ; වෙසෙහි, වෙසින්; භයවාහිනී, බිය එලවන්නී; බහලත්තෙන, බහලභාවයෙන් හෝ බහලාත්මයෙන්; සම්පුණ්ණනවයොජනා ආසි, සම්පූර්ණ නවයොදුනක් ඇත්තී වූවාය.

---

* "සීහරූපාදි."

305. සංවට්ටවාතසම්පාත ඛුභිතම්බුධිනො විය,
උල්ලොලාලම්භීමඝොසොත්තු ගතො* බ්‍රහ්මපුරාවධිං.

306. දන්තසඞ්ඝට්ටසඤ්ජාත ජාලාමාලාසමාකුලා,
තෙසංගාරාව දිත්තාසුං කොධුම්මීලිතලොචනා.

307. වහන්ති ධූමක්ඛන්ධානි මුඛකොටරකොටිහි,
නීහටා නීහටා ජිව්හා සුභිමොරගතං ගතා.

308. උබ්බරිත්වාන තාලාදී කරිත්වාන සරාසනෙ,
භුජඞ්ගෙව ගුණෙ කෙචි ගාලහමාකඩ්ඪයන්ති ච.

---

305. සංවට්ට, කල්පාන්තයෙහි හටගත්තාවූ; වාත, වායූහුගේ; සම්පාත, හීමෙන් (හැපීමෙන්); ඛුභිත, කැලඹුනාවූ; අම්බුධිනො විය, සාගරයාගේ මෙන්; උල්ලොල, උල්ලලවූ; භීමඝොසොත්තු, භයානක (මාරසෙනොද්භූත) ඝොෂය වනාහි; බ්‍රහ්මපුරාවධිං, බඹලොව සීමාකොට; ගතො, ගියේය.

306. තෙසං, ඒ මාරකිඞ්කරයන්ගේ; දන්තසඞ්ඝට්ට, දත් ගැටීමෙන්; සඤ්ජාත, හටගත්තාවූ; ජාලාමාලා, වහ්නිජ්වාලා මාලාවෙන්; සමාකුලා, ගැවසිගත්තාවූ; කොධුම්මීලිත, ක්‍රොධයෙන් හෙරවනලද; ලොචනා, නෙත්‍රයෝ; අඟාරා ඉව, (ගිනි) අඟුරු මෙන්; දිත්තා අසුං, දිලිහුනෝ වූවාහුයි.

307. මුඛකොටරකොටිහි, මුවකුහර කෙළවරින්; ධූමක්ඛන්ධානි, ධූමස්කන්ධයෝ; වහන්ති, පැණනගිත්; නීහටා නීහටා, බැහැර කරණ කරණලද්දවූ; ජිව්හා, ජිහ්වාතුමූ; සුභිම, අතිශයින් භයානකවූ; උරගතං, සර්ප බවට; ගතා, ගියාහුයි.

308. කෙචි, ඇතම් කෙනෙක්; තාලාදී, තල් (කිතුල්) ආදීන්; උබ්බරිත්වාන, උදුරා; සරාසනෙ කරිත්වාන, දුනු කොට; භුජඞ්ගෙ, සර්පරාජයන්; ගුණෙව කරිත්වාන, දුනුදියද කොට; ගාලහං, දෘඪතර කොට; ආකඩ්ඪයන්ති ච, ආකර්ෂණයද කෙරෙත්.

---

* "ඝොසනතුගතං."

309. පුණ්ඩරීකච්ඡසීහාදී ඛිපන්තාභිමුඛෙ තදා,
ධාවන්තෙකෙ සමුග්ගය්හ පුරතො දිත්තපබ්බතෙ.

310. භයානකානි නෙකානි සීසානෙකකලෙබරෙ,
මාපයිත්වාන පුරතො ධාවන්ති කෙචි කිඞ්කරා.

311. සීසෙන සීහසඞ්කාසා ගත්තෙන මනුජොපමා,
බුද්ධස්සාභිමුඛං කෙචි ධාවන්ති මාරකිඞ්කරා.

312. කණ්ඨීරවාකාරදෙහා මුඛෙන බලූ රක්ඛසා,
හුත්වාන අභිධාවන්ති කෙචි මාරස්ස කිඞ්කරා.

313. දණ්ඩමානවකා සීසභාගෙනාතිභයාවහා,
ගත්තෙන රක්ඛසා හුත්වා කෙචි ධාවන්ති කිඞ්කරා.

---

309. තදා, එකල්හි ; එකෙ, ඇතැම් අය ; පුණ්ඩරීක, දිවිය ; අච්ඡ, වලස්ය ; සීහ, සිංහය (යන); ආදී, (මේ) ආදීන් ; අභිමුඛෙ, හමුවෙහි ; ඛිපන්තා, දමාගසන්නාහු ; දිත්තපබ්බතෙ, දිලිහිගිය පර්වතයන් ; සමුග්ගය්හ, ඔසවාගෙණ ; පුරතො, ඉදිරියෙන් ; ධාවන්ති, දුවත්.

310. කෙචි කිඞ්කරා, සමහර මාරසෙවකයෝ ; එකකලෙබරෙ, එක් ශරීරයෙහි ; භයානකානි, භයඞ්කරවූ ; අනෙකානි, අනෙකප්‍රකාරවූ ; සීසානි, ශීර්ෂයන් ; මාපෙත්වාන, මවාගෙණ ; පුරතො, අභිමුඛයෙන් ; ධාවන්ති, දුවත්.

311. කෙචි මාරකිඞ්කරා, සමහර මාරසෙවකයෝ ; සීසෙන, ශීර්ෂයෙන් ; සීහසඞ්කාසා, සිංහයන් බඳුවූවාහු ; ගත්තෙන, ගාත්‍රයෙන් ; මනුජොපමා, මිනිසුන් වැන්නාහු ; බුද්ධස්ස, සර්වඥයන්වහන්සේගේ ; අභිමුඛං, සම්මුඛයට ; ධාවන්ති, දුවත්.

312. මාරස්ස, මාරයාගේ ; කෙචි කිඞ්කරා, ඇතැම් සෙවකයෝ ; කණ්ඨීරවාකාරදෙහා, සිංහයන්ටබඳු ශරීර ඇත්තෝ ; මුඛෙන, මුඛයෙන් ; බලූ, ඒකාන්තයෙන් ; රක්ඛසා හුත්වාන, රාක්ෂසයෝව ; අභිධාවන්ති, (බෝසතාණන් හමුවට) දුවත්.

313. කෙචි කිඞ්කරා, සමහර මාරභටයෝ ; සීසභාගෙන, ශීර්ෂභාගයෙන් ; දණ්ඩමානවකා, දණ්ඩමාණවකයෝව ; ගත්තෙන, ශරීරයෙන් ; අතිභයාවහා, අතිශයින් භය උපදවන්නාවූ ; රක්ඛසා හුත්වා, රාක්ෂසයෝව ; ධාවන්ති, (බෝසතාණන් හමුවට) දුවත්.

ශ්‍රී ලංකා ජාතික

314. දීපච්ඡෙභතුරඞ්ගානං ව්‍යග්ඝඛග්ගවිසාණිනං,
වරාහමහිසාදීනං කණ්ණපාවුරභොගිනං.

315. සීසාකාර* මහාසීසෙ තබ්බිරූපෙ කලෙබරෙ,
මාපෙත්වා අභිධාවන්ති කෙචි මාරස්ස කිඞ්කරා.

316. ආකඩ්ඪන්තා කපොලානං කරසාඛාහි සම්මුඛෙ,
දස්සයන්තා මහාදාඨං කෙචෙන්ති මාරකිඞ්කරා.

317. තිඛිණග්ගනඛා කෙචි ඵාලයන්තා සකොදරෙ,
අන්තෙ ගලෙ පිලන්ධිත්වා ධාවන්ති කිඞ්කරාපරෙ.

---

314. දීපි, දිවිය : අච්ඡ, වලස්සුය ; ඉභ, හස්තිය ; තුරඟානං, අශ්වය යන මොවුන්ගේද ; ව්‍යග්ඝ, ව්‍යාඝ්‍රය ; ඛග්ගවිසාණිනං, කඟවෙහෙණුය යන මොවුන්ගේ ද ; වරාහ, ශූරාය ; මහිසාදීනං, මීවෝය යන මේ ආදීන්ගේද ; කණ්ණපාවුර, කණ්පොරළුවෝය ; භොගිනං, සර්පයෝය යන මොවුන්ගේද.

315. සීසාකාරමහාසීසෙ, ශීර්ෂාකාරවූ මහාශීර්ෂයන් ද ; තබ්බිරූපෙ, ඊට විරූපවූ ; කලෙබරෙ, සිරුරු ද ; මාපෙත්වා, මවාගෙණ ; මාරස්ස, වශවර්තිමාරයාගේ ; කෙචි කිඞ්කරා, සමහර භටයෝ ; අභිධාවන්ති, (බෝසතුන්) ඉදිරියට දුවත්.

316. කෙචි මාරකිඞ්කරා, සමහර මාරභටයෝ ; කපොලානං, කොපුල් ; සම්මුඛෙ, හමුවෙහි ; කරසාඛාහි, ඇඟිලි වලින් ; ආකඩ්ඪන්තා, අදිමින් ; මහාදාඨං, මහත්දළ ; දස්සයන්තා, දක්වමින් ; එන්ති, එත්.

317. අපරෙ, අන්‍යවූ ; කෙචි කිඞ්කරා, ඇතම් මාරභටයෝ ; තිඛිණග්ගනඛා, තියුණු නියග ඇත්තෝ හෝ තියුණු නියගින් ; සකොදරෙ, ස්වකීය ජඨරයන් ; ඵාලයන්තා, පළමින් ; අන්තෙ, අතුණු ; ගලෙ, ගෙලෙහි ; පිලන්ධිත්වා, පැලඳගෙණ (වෙළාගෙණ) ; ධාවන්ති, දුවත්.

---

* "සීහාකාර."

318. ගිලන්තා කෙචි එණ්ණො උග්ගිරන්තා තථෙව ච,
සීසකන්ධරකණ්ණන්ත බාහුඅඞ්ගුලිආදිසු.

319. සකලෙසු සරීරෙසු විසධූමග්ගිසඞ්කුලෙ,
ධාරෙන්තාසිවිසෙ කෙචි ධාවන්ත්‍යග්ග භයාවහා.

320. පදිත්තායොගුලෙ ගය්හ ඛිපන්තෙනකෙ අනෙකධා
දිත්තපබ්බතමුබ්බච්ච කෙචි අග්ගිකපාලකෙ,
ඛිපන්තා අභිධාවන්ති දඨොඨා භීමලොචනා.

321. ලාලයන්තා සකා ජිව්හා බන්ධ කත්වාන මුග්ගරෙ,
මත්තබ්‍රහ්මජඞ්ග*වෙසෙන ධාවන්ති අපරෙ භටා.

---

318. කෙචි, සමහර මාරභටයෝ; එණ්ණො, සර්පයන්; ගිලන්තා, ගිලින්නාහු; තථෙව, එසේම; උග්ගිරන්තා, වමාරන්නාහු; සීස, හිස්ය; කන්ධර, ග්‍රීවාය; කණ්ණන්ත, කණ්ණාන්තය; බාහු, බාහුය; අඞ්ගුලි, ඇඟිලිය; ආදිසු, (මේ) ආදිවූ:—

319. සකලෙසු සරීරෙසු, සියලුශරීර (අවයව) යන්හි; විසධූමග්ගි, විෂධූමාග්නීන්; සඞ්කුලෙ, ගැවසීගත්තාවූ; ආසිවිසෙ, සර්පයන්; ධාරෙන්තා, දරන්නාවූ; භයාවහා, (එහෙයින්ම) බියඑලවන්නාවූ; කෙචි, ඇතම් කෙනෙක්; අග්ග, (බෝසතුන්) ඉදිරියෙහි; ධාවන්ති, දිවත්.

320. එකෙ, ඇතම් භටකෙණෙක්; අනෙකධා, අනෙක ප්‍රකාරයෙන්; පදිත්ත, ඇවිලගත්තාවූ; අයොගුලෙ, යගුලි; ගය්හ, රැගෙණ; ඛිපන්ති, දමාගසත්; දඨොඨා, තොල්මිපි කාලද්දවූ; භීමලොචනා, භයානක ඇස් ඇත්තාවූ; කෙචි, ඇතම් භටයෝ; දිත්තපබ්බතං, ඇවිලගත් පර්වත; උබ්බච්ච, උද්ධරණයකොට; අග්ගිකපාලකෙ, ගිනිකබල්; ඛිපන්තා, හෙලමින්; අභිධාවන්ති, (බෝසතුන් ඉදිරියට) දිවයෙත්.

321. අපරෙ භටා, අන්‍යභට කෙණෙක්; සකා ජිව්හා, ස්වකීය ජිහ්වාවන්; ලාලයන්තා, ලෙලවන්නාහු; මුග්ගරෙ, මුගුරු; බන්ධ කත්වාන, කරෙහිකොට (කරපිට තබාගෙණ); මත්තබ්‍රහ්මජඞ්ගවෙසෙන, මත්වූ බ්‍රාහ්මණයන්ගේ වෙශයෙන්; ධාවන්ති, දිවත්.

---

* "මත්තබ්භමර."

322. පිබන්තා ලොහිතානෙකෙ ඛාදන්තා පිසිතෙ පරෙ,
පිසාචාව'චරුං කෙචි මුනිරාජස්ස අග්ගතො.

323. උල්ලඞ්ඝන්තා ච සෙලෙන්තා ධාවන්තා ජලිතායුධා,
භිමවෙසධරා යක්ඛා කෙචෙන්ති භකුටීමුඛා.

324. පණුණ්ණසරවස්සෙහි කුන්තතොමරවුට්ඨිහි,
භෙණ්ඩිවාලාසිචක්කෙහි නිබ්භරාසි දිගන්තරං.

325. යං දිට්ඨසුතමත්තෙන මරණං චිත්තවිබ්භමං,
යාති ලොකො කථං කො තං නිස්සෙසං
භාසතෙ නරො.

---

322. එකෙ, සමහර භටකෙණෙක්; ලොහිතානි, රුධිර යන්; පිබන්තා, පානය කරන්නාහු; අපරෙ, (එසින්) අන්‍ය භටකෙණෙක්; පිසිතෙ, මාංසපෙසීන්; ඛාදන්තා, කන්නාහු; කෙචි, සමහරු; පිසාචා ඉව, පිශාචකයන් මෙන්; මුනිරාජස්ස, මුනිරාජයන්ගේ; අග්ගතො, ඉදිරිපිට; අචරුං, හැසුරුණාහුයි.

323. ජලිතායුධා, දිලිසුනු ආයුධ (ගත් අත්) ඇත්තාවූ; භිමවෙසධරා, භයානක රූපධාරිවූ; භකුටීමුඛා, භ්‍රැකුටිතමුඛ ඇත්තාවූ (නැමූ බැම යුත් මුහුණු ඇත්තාවූ); කෙචි යක්ඛා, සමහර යක්‍ෂයෝ; උල්ලඞ්ඝන්තා, උඩපනින්නාහු; සෙලෙන්තා, එළුසත් ලත්නාහු නොහොත් ශරීරචාලනය කරන්නාහු; ධාවන්තා; දිවමින්; එන්ති, එත්.

324. පණුණ්ණ, හරණලද; සරවස්සෙහි, ශරවර්‍ෂාවෙන්ද; කුන්තතොමරවුට්ඨිහි, කොන්තය තොමරය යන ආයුධ වර්‍ෂායෙන්ද; භෙණ්ඩිවාලාසිචක්කෙහි, භෙණ්ඩිවාලය කඩුය චක්‍රායුධය යන මොවුන්ගෙන්ද; දිගන්තරං, දිග්භෙදය; නිබ්භරං ආසි, නිරන්තර විය.

325. ලොකො, ලෝවැසිතෙම; යං, යමක්; දිට්ඨසුතමත්තෙන, ඇසූ දුටු පමණකින්; මරණං, ප්‍රාණහානියටද; චිත්තවිබ්භමං, චිත්තභ්‍රමයටද (චිත්තොන්මත්තතාවට); යාති, යේද; තං, ඒ මාරයුද්ධය; නිස්සෙසං, නිරවශෙෂකොට; කො නරො, කවරනම් මනුෂ්‍යයෙක්; කථං භාසතෙ, කෙසේ කියාද? (නොකියාමය.)

326. නෙකදන්තසහස්සෙහි නික්ඛන්තග්ගිසිඛායුතං,
දුන්නිජ්ඣරසම්පාතං භිමගජ්ජනගජ්ජිතං,

327. නෙකසතකරග්ගෙහි ධතායොලගුළාදිකං,
සන්නද්ධං කවචාදීහි ගිරිංව ගිරිමෙඛලං.

328. ආරූළ්හො පාපිමා තත්ථ උස්සාපෙත්වා ජයද්ධජං,
විසාලාවත්තදාඨග්ගො විපිටග්ගභග්ගනාසිකො.

329. දට්ඨොට්ඨභිම්මවදනො භකුටී වලීලලාටකො,
කොධානලෙහි සන්දිත්ත මහනෙත්තො තම්බදාඨිකො.

---

326. නෙකදන්තසහස්සෙහි, නොයෙක් දහස්ගණන් දන්තයන්ගෙන්; නික්ඛන්ත, නික්මුනාවූ; අග්ගිසිඛායුතං, වහ්නිශිඛාවන්ගෙන් යුක්තවූ; දුන්නිජ්ඣරසම්පාතං, මදදිය හැලිහීම් ඇති; භිමගජ්ජන, භයානක ගර්ජනාවෙන්; ගජ්ජිතං, ඝොෂිතවූ.

327. නෙකසත, නොයෙක් සියගණින්; කරග්ගෙහි, සොඬගින්; ධත, දරණලද; අයොලගුළාදිකං, යමුගුරුඈදිය ඇත්තාවූ; කවචාදීහි, සන්නාහාදියෙන්; සන්නද්ධං, සන්නද්ධවූ; ගිරිං ඉව, පර්වතයක් වැනිවූ; ගිරිමෙඛලං, ගිරිමෙඛල නම් හස්තිරාජයා පිට.

328. ආරූළ්හො, නැංගාවූ; පාපිමා, වශවර්තිමාරතෙම; තත්ථ, ඒ ඇතුපිට; ජයද්ධජං, විජයධ්වජය; උස්සාපෙත්වා, ඔසවා; විසාල, මහත්වූ; ආවත්ත, කරකැවුනාවූ; දාඨග්ගො, දංෂ්ට්‍රාග්‍රඇති; විපිටග්ග, පෙතැලිවූ අග්‍රඇති; භග්ගනාසිකො, බුන් නාසා ඇති.

329. දට්ඨොට්ඨ, ඩැහැගන්නාලද තොල් ඇති හෝ තොලින්; භිම්මවදනො, භයානක මුහුණු ඇති; භකුටී වලීලලාටකො, හැකුළුණුවූ රැලිනැගුණු නලල ඇති; කොධානලෙහි, ක්‍රොධාග්නියෙන්; සන්දිත්ත, රඳනලද; මහනෙත්තො, විසාලනෙත්‍ර ඇති; තම්බදාඨිකො, තාම්‍රවර්ණවූ දාඨා ඇති.

330. නීලපබ්බතසඞ්කාස විසමදෙහා මහොදරෙ,
ගොනසොරගසප්පාදි අග්ගිකතසුහිංසනො.

331. සහස්සබාහුං මාපෙත්වා ඡුරිකා යට්ඨි සත්තිච,
කොදණ්ඩචණ්ඩබාණෙ ච චක්කකුන්තගදාදි ච.

332. සඞ්කු වෙතාලිකා එරසු(11) පාසමුග්ගරඅඞ්කුසෙ,
ගණ්හිත්වා කණයමාථ තිසූලවජිරායුධෙ

333. පරිවත්තෙන්ති ආකාසෙ තෙසමඤ්ඤොඤ්ඤඝට්ටනා,
උග්ගතෙහි ඵුලිඞ්ගෙහි ධාවන්තෙහි සමන්තතො.

---

330. නීලපබ්බතසඞ්කාස, නිල්පව් (කුළු) බඳුවූ; විසමදෙහා, විෂමවූ ශරීරාවයව ඇති; මහොදරෙ, (එල්බෙන) මහ බඩක් ඇත්තාවූ; ගොනස, පොළොන්ය; උරග, නාගය යන; සප්පාදි, සර්පාදීන්; අග්ගිකත, සවිකෘතවූ හෝ අග්නිකාර යෙන්; සුහිංසනො, ඉතා බිහිසුනුවූ; (328. "පාපිමා තතො ජයබජං උස්සාපෙත්වා"—යනු හා සම්බන්ධයි.)

331. සහස්ස බාහුං, දහසක් අත්; මාපෙත්වා, නිර්මිත කොට; ඡුරිකා, සිරිය; යට්ඨි, යටිය; සත්ති, අඩයටිය යන මෙද; කොදණ්ඩ, දුනුය; චණ්ඩබාණෙච, තියුණුහීය යන මෙද; චක්ක, චක්‍රායුධය; කුන්ත, කුන්තායුධය; ගදාදිච, ගදායුධය යනාදීන්ද.

332. සඞ්කු, හුල්ය; වෙතාලිකා, කැතිය; එරසු, පොරෝය; පාස, පාශය; මුග්ගර, මුගුරුය; අඞ්කුසෙ, අකුසුය යන මෙද; කණයම, මිටිමෙට්රෑද; අථ, යළිත්; තිසූල, ත්‍රිශූලය; වජිරායුධෙ, වජ්‍රායුධය යන මෙද; ගණ්හිත්වා (තරයේ ගෙණ :

333. ආකාසෙ, අහසෙහි; පරිවත්තෙන්ති, සිසාලෙය්; තෙසං, (සිරිආදි) ඒ ආයුධයන්ගේ; අඤ්ඤොඤ්ඤඝට්ටනා, එක්නෙක ගැටීමෙන්; උග්ගතෙහි, නැංගාවූ; සමන්තතො, හාත්පස ; ධාවන්තෙහි, දුවන්නාවූ; ඵුලිඞ්ගෙහි, ගිනිපුපුරු වලින් උපලක්ෂිතව.

334. අග්ගිචක්කපරීතංව කුරුමානො නිජං තනුං,
ආවහන්තො භයං බ්‍රහ්මසුරසිද්ධාදිනං තදා,
සමාරසෙනො සො මාරො භගවන්තමුපාගමි.

335. උදයාචලකූටම්හි භාසන්තොව පභාකරො,
සුප්පතිට්ඨිතමෙරූව තිකූටාචලමුද්ධනි.

336. කත්වාන පිට්ඨිතො බොධිං භූරුහං වජිරාසනෙ,
නිසින්නො භගවා 'තීව නිච්චලො අතිරොචති.

337. අකම්පො සො මුනී එවමග්ගෙ'කාසි නිජං බලං,
සම්මප්පධානසංයුත්තො දයාමෙත්තාමහෙසිකො.

---

334. තදා, එකල්හි; සමාරසෙනො, මරසෙනඟ සහිතවූ; සො මාරො, ඒ වසවත්මරුතෙම; නිජං තනුං, ස්වකීය ශරීරය; අග්ගිචක්කපරීතං ඉව, වහ්නිචක්‍රයෙන් පිරිවැරූවාක් මෙන්; කුරුමානො, කරමින්; බ්‍රහ්මසුරසිද්ධාදීනං, බ්‍රහ්මාමරසිද්ධාදින්ට; භයං ආවහන්තො, බියඑළවමින්; භගවන්තං, භාග්‍යවතුන් වෙත; උපාගමි, එළඹියේය.

335. උදයාචලකූටම්හි, උදයපර්වත මස්තකයෙහි; භාසන්තො, බබලන්නාවූ; පභාකරොඉව, සූර්‍ය්‍යයා මෙන්ද; තිකූටාචලමුද්ධනි, ත්‍රිකූට පර්වත මස්තකයෙහි; සුප්පතිට්ඨිත, මනාකොට පිහිටියාවූ; මෙරුඉව, මහාමෙරු පර්වතය මෙන්ද.

336. අතීව නිච්චලො, අතිශයින්ම නිශ්චලවූ; භගවා, භාග්‍යවතුන්වහන්සේ; බොධිං භූරුහං, බොධිද්‍රැමෙන්ද්‍රයන්; පිට්ඨිතොකත්වාන, පිටිපසැ කොට; වජිරාසනෙ, විදුරසුන් මතුයෙහි; නිසින්නො, වැඩහුන්සේක්; අතිරොචති, අතිශයින් බබලයි.

337. එවං, මෙසේ; අකම්පො, නිශ්චලවූ; සම්මප්පධාන සංයුත්තො, සතර සම්‍යක්ප්‍රධානයෙන් යුක්තවූ; දයාමෙත්තා, කරුණා මෛත්‍රීය; මහෙසිකො, මෙහෙසී කොට ඇත්තාවූ; සො මුනී, ඒ මුනිරාජතෙම; නිජංබලං, ස්වකීයසේනාව හෝ ස්වශක්තිය; අග්ගෙ, අභිමුඛයෙහි; අකාසි, කෙළේය.

338. චතුබුද්ධභූමිසඞ්ඛාත(12) ජයභූමිමුදික්ඛිය,
චතුසඞ්ගහවත්ථූනං යොජෙත්වා ද්වාරකොට්ඨකෙ.

339. යොජෙත්වාන ථිරං තත්ථ සද්ධාදිබලකොට්ඨකෙ,
සතිපට්ඨානපාකාරෙ අභෙජ්ජින්ද්‍රියගොපුරෙ.

340. ථිරඤාණායුධාකිණ්ණෙ මෙත්තාසන්නාහවම්මිතො
අහිත භාරතී භූරි භෙරිසඞ්ඛපුරක්ඛතො.

341. චතුරඞ්ගවිරියුත්තුඞ්ග මාතඞ්ගක්ඛන්ධසඞ්ගතො,
පුඤ්ඤසම්භාරභාරෙන කම්පයං වසුධාතලං.

---

338. චතුසඞ්ගහවත්ථූනං, (දානාදි) සිව් සඟරාවත් සඞ්ඛවූ; ද්වාරකොට්ඨකෙ, දොරටු; යොජෙත්වා, යොදා; චතුබුද්ධභූමිසඞ්ඛාත, චතුර්විධබුද්ධභූමි සඞ්ඛ්‍යාතවූ; ජයභූමිං, ජයබිම; උදික්ඛිය, බලා :—

339. තත්ථ, එහි; සතිපට්ඨාන, (සතර) සිවටන් නැමැති; පාකාරෙ, ප්‍රාකාර ඇති; අභෙජ්ජින්ද්‍රිය, අභෙද්‍යවූ පඤ්චෙන්ද්‍රිය නැමැති; ගොපුරෙ, වහසල් ඇති; සද්ධාදි, (නිශ්චල) ශ්‍රද්ධාදිය නැමැති; බලකොට්ඨකෙ, බලකොටුවූ; ථිරං, ස්ථිරකොට; යොජෙත්වාන, යොදා.

340. ථිරඤාණ, ස්ථිරබුද්ධිනැමැති; ආයුධාකිණ්ණෙ, ආයුධයෙන් යුක්තවූ; මෙත්තා, මෛත්‍රීනැමැති; සන්නාහවම්මිතො, සන්නාහයෙන් සන්නද්ධවූ; අහිතභාරතී, නිශ්චිත වචන නැමැති; භූරි, මහත්වූ; භෙරිසඞ්ඛ, භෙරිනාදයෙන් හා ශඞ්ඛනාදයෙන්; පුරක්ඛතො, පුරස්කෘතවූ.

341. චතුරඞ්ගවිරිය, චතුරඞ්ගවීර්‍ය්‍ය නැමැති; උත්තුඞ්ග, උස්වූ; මාතඞ්ගක්ඛන්ධ, ඇත්කඳපිටට; සඞ්ගතො, පැමිණියාවූ; පුඤ්ඤසම්භාර, පුණ්‍යසම්භාරයාගේ; භාරෙන, බරින්; වසුධාතලං, පෘථිවිතලය; කම්පයං, කම්පා කරන්නාවූ.

342. චරියත්තය*සඞ්ඛාතමුස්සාපිතජයද්ධජො,
එවං විධාය මාරාරි මාරසඞ්ගාමමණ්ඩලං.

343. දානාදයො මහායොධෙ අහූය සහජාතකෙ,
සුණාථ භො ගිරං මය්හං භවතජ්ජ මහාහවො.

344. එථ යාථ සමග්ගාත්ථ න ඔස්සක්කථ යුජ්ඣථ†,
විජෙතුං මාරයුද්ධම්හි න සක්කා සෙසජන්තුහි.

345. අජ්ජ ගච්ඡති නිබ්බානං සො භො පාරමිතාභටා,
සහුස්සාහා මමග්ගම්හි දස්සෙථ විරියං සකං.

---

342. චරියත්තයසඞ්ඛාත, ත්‍රිවිධචර්‍ය්‍යා සඞ්ඛ්‍යාතවූ; උස්සාපිත, ඔසවනලද; ජයද්ධජො, ජයධ්වජය ඇත්තාවූ; මාරාරි, මාරශත්‍රුවූ බෝධිසත්ත්වතෙම; මාරසඞ්ගාමමණ්ඩලං, මාරයුද්ධමණ්ඩලය; එවං විධාය, මෙසේ (යථොක්තාකාරයෙන්) කොට (පිහිටුවා.)

343. සහජාතකෙ, එක්ව උපන්නාවූ; දානාදයො, දානාදීවූ මහායොධෙ, (දශ) මහායොධයන්; අහූය, කැඳවා; භො, භවත්නි; මය්හං, මාගේ; ගිරං, වචනය; සුණාථ, අසව්; අජ්ජ, අද; මහාහවො, මහත්සඞ්ග්‍රාමයක්; භවති, වෙයි.

344. එථ, එව්; යාථ, යව්; සමග්ගා අත්ථ, එක්තු වව්; න ඔස්සක්කථ, පසුනොබසිව්; යුජ්ඣථ, යුධ කරව්; මාරයුද්ධම්හි, (මෙ) මාරයුද්ධයෙහි; සෙසජන්තූහි, (තොප හැර) සෙසු සත්ව යන් විසින්; (නොහොත්) සෙසජන්තූහි, අවශෙෂ සත්වයෝ වනාහි; විජෙතුං, දිනන්ට; නසක්කා, නොහැකි වෙත්.

345. භො පාරමිතාභටා, පින්වත් පාරමිතාභටයෙනි; අජ්ජ, අද; සො, ඒ ආභවය තෙම; නිබ්බානං, නිමාවට; ගච්ඡති, යෙයි සහුස්සාහා, උත්සාහසහිතවූ තොපි; සකං විරියං, ස්වකීය වීර්‍ය්‍යය; මමග්ගම්හි, මා ඉදිරියෙහි; දස්සෙථ, දක්වව් (යයි කී.)

---

* "චරිතත්තය." † "යුජ්ජථ."

346. අථ දානභටො ආහ* අප්ඵොටං දිගුණං භුජං,
පස්සදානි මහාවීර බලං මෙ මාරධංසනෙ,

347. පරමත්ථපාරමීයොධං තථෙව උපපාරමිං,
උභො පස්සෙ කරිත්වාන සසෙනො ධාවි දප්පවා.

348. තථෙව සීලනාමව්හො පාරමීභටමුත්තමො,
නික්ඛම්ම සහ සෙනාය මාරසෙනමභිද්දවි,

349. තථානෙක්ඛම්මනාමොපි සන්නද්ධොසභටොභටො,
මාරසෙනාමිගෙ හන්තුං ධාවි දීපීව සාහසො.

---

346. අථ, ඉක්බිත්තෙන්; දානභටො; දානපාරමී නැමැති භටතෙම; දිගුණං භුජං, බාහුව විගුණකොට; අප්ඵොටං, ආස්ඵොටනය කරමින්; මහාවීර, මහාවීරයන්වහන්ස; ඉදානි, දැන්; මාරධංසනෙ, මාර (බල) විධමනයෙහි; මෙ, මාගේ; බලං, ශක්තිය; පස්ස, බැලුවමැනවයි; ආහ, කීයේය.

347. සසෙනො, සෙනා සහිතවූ; දප්පවා, එඩි ඇත්තාවූ (දානභටතෙම); පරමත්ථපාරමීයොධං, පරමාර්ථපාරමිතා නැමැති යොධයාද; තථෙව, එසේම; උපපාරමිං, උපපාරමිතා නැමැති යොධයාද; උභොපස්සෙ, උභයපාර්ශ්වයෙහි; කරිත්වාන, කොට; ධාවි, දිවී.

348. තථෙව, එසේම; සීලනාමව්හො, ශීලනාමයෙන් අභිඛ්‍යාතවූ; පාරමීභට උත්තමො, උතුම් පාරමිතා යොධතෙම; සහ සෙනාය, සෙනඟ කැටුව; නික්ඛම්ම, නික්ම; මාරසෙනං, මරසෙනඟ කරා; අභිද්දවි, අභිධාවනය කෙළේය.

349. තථා, එසේම; නෙක්ඛම්මනාමො, නෛෂ්ක්‍රම්‍යනම්වූ; සන්නද්ධො, (සන්නාහ) සන්නද්ධවූ; සභටො, (පරිචාරක) යොධ සන්සහිතවූ; භටො අපි, යොධතෙමේද; මාරසෙනාමිගෙ, මාරවාහිනී නැමැති මෘගයන්; හන්තුං, නසන්ට; සාහසො, රෞද්‍රවූ හෝ සාහසිකවූ; දීපීව, දිවියකුමෙන්; ධාවි, දිවී.

---

* "ආහ"

350. පඤ්ඤායොධෝ'පි ගච්ඡන්තො සාටොපො ධාවි දප්පවා,
මාරමේරුමහං අජ්ජ සසෙනුම්මූලයාමිති.

351 විරියපාරමිතායොධො දළ්හො සිංහගජ්ජනො,
සොසෙමි මම තෙජෙන වදං'ගා මාරසාගරං.

352. බත්තිසච්චවහයා චෙව තතො'ධිට්ඨානකො භටො,
ආසු ධාවිංසු පාතෙතුං මාරස්ස මකරධජං.

353. මෙත්තානාමෙ‍ාමහායොධොමාරෙ‍ාමය්හමලන්ති'ගා,
උපෙක්ඛකො'පි සො යොධො මාරසෙනං පදාලිතුං.

---

350. සාටොපො, සංරම්භසහිතවූ; දප්පවා, අහඞ්කාරඇති; පඤ්ඤායොධො අපි, ප්‍රඥානැමැති භටතෙමේද ; ගච්ඡන්තො, යන්නේ ; අහං, මම ; අජ්ජ, අද ; සසෙනං, සෙනාසහිතවූ ; මාරමෙරුං, වසවත්මරුනැමැති මෙරගිර ; උම්මූලයාමි ඉති, මූලොත්පාටනය කෙරෙමියි; ධාවි, දිවී.

351. දළ්හො, තොල්මිටි කතලදවූ; සිංහගජ්ජනො, භයානක ගර්ජනා ඇත්තාවූ ; විරියපාරමිතා, වීර්‍ය්‍යපාරමිතා නැමැති; යොධො, භටතෙම ; මම, මාගේ ; තෙජෙන, තෙජස් කරණකොටගෙණ ; මාරසාගරං, මාරයා නැමැති සමුද්‍රය ; සොසෙමි, වියලවමියි ; වදං, කියමින් ; අගා, ගියේය.

352. තතො, ඉක්බිති ; බත්තිසච්චවහයාච එව, ක්‍ෂාන්තිය සත්‍යය යන නැමැති (යොධයෝ) දෙදෙනාද ; අධිට්ඨානකො, අධිෂ්ඨාන නම්වූ ; භටො, යොධතෙමේද ; මාරස්ස, වශවර්ත්‍ති මාරයාගේ ; මකරධජං, මුවරකොඩිය; පාතෙතුං, හෙලන්ට ; ආසු, වහා ; ධාවිංසු, දිවූවාහුය.

353. මෙත්තානාමො, මෛත්‍රී නැමැති ; මහායොධො, මහාභටතෙම ; මාරෙ, මාරතෙම ; මය්හං, මට ; අලං ඉති, පමණැයි ; අගා, ගියේය ; උපෙක්ඛකො, උපෙක්‍ෂානම්වූ ; සො යොධො අපි, ඒ යොධතෙමේද ; මාරසෙනං, මරසෙනඟ (මට ප්‍රමාණයයි); පදාලිතුං, විදුරණය කරන්ට ; අගා, ගියේය.

354. පෙසෙත්වෙවං ජිනො සෙනං 'සරීරං දළ්හවික්කමං,
නිසීදි තස්ස තෙජෙන නිරුස්සාහාසි සා චමූ.

355. අහො හො විම්හයංදානි සුණාථ මුනිනො මම,
ජෙති එකො නිසින්නොව සමාරං මාරවාහිනිං.

356. කොපානලෙන සන්දිත්තං දුට්ඨං රුට්ඨං පජාපතිං,
අදුට්ඨො ජෙති සම්බුද්ධො අනුභාවො හි තාදිසො.

357 දිත්තායුධෙ ඛිපන්තෙ'පි විජ්ඣන්තෙ වසවත්තිනි,
නිරායුධොව තං ජෙති අනුභාවො හි තාදිසො.

---

354. එවං, මෙසේ; ජිනො, ජිනවූ මහාබොධිසත්වතෙම; අසරීරං, සිරුරුරහිතවූ; දළ්හවික්කමං, දැඩිවිකුම් ඇත්තාවූ; සෙනං, (පාරමිතා) සෙනාව; පෙසෙත්වා, යවා; නිසීදි, (විදුර සුන්පිට) වැඩඋන්සේක; තස්ස, උන්වහන්සේගේ; තෙජෙන, තෙජස් කරණකොටගෙණ; සා චමූ, ඒ මාරසෙනා තොමෝ; නිරුස්සාහා ආසි, උත්සාහරහිත විය.

355. හො, භවත්නි; මුනිනො, මුනි ස්වාමින්වහන්සේගේ; විම්හයං, විස්මය; මම සුණාථ, මාගෙන් අසව්; එකො, හුදකලාවූසේක්; නිසින්නො එව, වැඩහුන්සේක්ම; සමාරං, මාරයා සහිතවූ; මාරවාහිනිං, මරසෙනග; ජෙති, දිනයි; අහො, ආශ්චර්යයි.

356. කොපානලෙන, ක්‍රොධාග්නියෙන්; සන්දිත්තං, දිලිහුනාවූ; දුට්ඨං, දුෂ්ටවූ; රුට්ඨං, රළුවූ; පජාපතිං, මාරයා; අදුට්ඨො, දුෂ්ටනුවූ; සම්බුද්ධො, සම්බුද්ධතෙම; ජෙති, දිනයි; අනුභාවො, (උන්වහන්සේගේ) ආනුභාවයතෙම; තාදිසො හි, එබඳුමැයි.

357. වසවත්තිනි, වශවර්ත්තිමාරයා; දිත්තායුධෙ, දිලිහුනු ආයුධයන්; ඛිපන්තෙ අපි, දමාගසනකල්හිද; විජ්ඣන්තෙ අපි, විදිනකල්හිද; නිරායුධො එව, ආයුධරහිතවූසේක්ම; තං, ඒ මාරයා; ජෙති, දිනයි; අනුභාවො, ආනුභාවය; තාදිසො හි, එබඳුමැයි.

358. සහාටොපං සාහඞ්කාරං මාරං සාඩම්බරං තදා,
නිච්චලො ජෙති සම්බුද්ධො අනුභාවො හි තාදිසො.

359. හත්ථස්සරථපත්තීහි ධාවන්තං තමිතොචිතො,
නිසින්නොව ජිනො ජෙති අනුභාවො හි තාදිසො.

360. භාසන්තං අනෙකධා කණ්ණකඨොරගිරමන්තකං,
නිස්සද්දො ජෙති සම්බුද්ධො අනුභාවො හි තාදිසො.

361. මාරොපාගම්ම අට්ඨාසි ලඞ්ඝිතුං අසමත්ථකො,
බුද්ධතෙජග්ගිපාකාරං දිත්තමබ්භුග්ගතං ථිරං.

---

358. තදා, එකල්හි ; නිච්චලො, නිශ්චලවූ ; සම්බුද්ධො, සම්බුද්ධවූ බොධිසත්වතෙම ; සහාටොපං, දර්පසහිතවූ ; සාහඞ්කාරං, අහඞ්කාර සහිතවූ ; සාඩම්බරං, ගර්ව සහිතවූ ; මාරං, වශවර්ති මාරයා ; ජෙති, දිනයි ; අනුභාවො හි, අනුභාවයනම් ; තාදිසො, එබඳුයි.

359. හත්ථස්සරථපත්තීහි, ඇත් අස් රිය පාබල සෙන් සමග ; ඉතොචිතො, ඔබිනොබ ; ධාවන්තං, දුවන්නාවූ ; තං, ඒ මාරයා ; ජිනො, බොධිසත්වතෙම ; නිසින්නො එව, වැඩහුන්සේක්ම ; ජෙති, දිනයි ; අනුභාවො, අනුභාවය ; තාදිසො හි, එබඳුමැයි.

360. නිස්සද්දො, නිශ්ශබ්දවූ ; සම්බුද්ධො, සර්වඥයන්වහන්සේ ; අනෙකධා, අනෙකප්‍රකාරයෙන් ; කණ්ණකඨොරගිරං, කණ්කටොල් තෙපුල් ; භාසන්තං, කියන්නාවූ ; අන්තකං, මාරයා ; ජෙති, දිනයි ; අනුභාවො, අනුභාවයතෙම ; තාදිසො හී, එබඳුමැයි.

361. මාරො, වශවර්ති මාරතෙම ; දිත්තං, දිළිහිමත්වූ ; අබ්භුග්ගතං, විශෙෂයෙන් උස්ව පැන නැංගාවූ ; ථිරං, ස්ථිරවූ ; බුද්ධතෙජ, බුද්ධතෙද නැමැති ; අග්ගිපාකාරං, ගිනිපවුර කරා ; උපාගම්ම, එළඹ ; ලඞ්ඝිතුං, උල්ලඞ්ඝනයකරන්ට ; අසමත්ථකො, අසමර්ථවූයෙ ; අට්ඨාසි, සිටියේය.

ශ්‍රී ලංකා ජාතික

362\. තදූහ නමුචි කුඩො භුජමුක්ඛිප්ප මීදිසං,
ඛිප්පං සිඛථ ඉහ ගච්ඡ සන්තකෙදං* මමාසනං.

363\. නො චෙ ගච්ඡසි තෙ හදයං ඵාලෙමි නඛසත්තියා,
විචුණ්ණෙමි තුවං පාදෙ ගහෙත්වා පඨවිතලෙ.

364\. පස්ස මෙ මහතිං සෙනං පස්ස ආයුධසඤ්චයං,
තෙන තං අභිමද්දිමි තුවටං ගච්ඡිදං මම.

365\. අථස්ස වචනං සුත්වා ජිනො'හ මධුරඤ්ගිරං,†
සාධු තෙ පූරිතා මාර පල්ලඞ්කත්ථාය පාරමී.

362\. තදූ, එකල්හි ; කුඩො කිපියාවූ ; නමුචි, වශවර්ති මාරතෙම ; භුජං, බාහුව ; උක්ඛිප්ප, ඔසවා ; ඊදිසං, මෙබන් දක් ; ආහ, කීය ; ඉහ සිඛථ, එඹා සිඩාණීය ; ඛිප්පං, වහාම ; ගච්ඡ, (බැහැර) යව ; ඉදං ආසනං, මේ අස්න ; මම සන්තකං, මාසතුයි

363\. චෙ, ඉදින් ; නො ගච්ඡසි, නොයන්නෙහිනම් ; තෙ, තාගේ ; හදයං, ලය ; නඛසත්තියා, නියසැතියා ; ඵාලෙමි, පලමි ; පාදෙ ගහෙත්වා, පය ගෙණ ; තුවං, තා ; පඨවිතලෙ, පෘථිවිතලයෙහි (ගසා) ; විචුණ්ණෙමි, විසුණුකරමි.

364\. මෙ, මාගේ ; මහතිං සෙනං, මහත් සෙනඟ ; පස්ස, බල ; (මෙ, මාගේ) ; ආයුධසඤ්චයං, ආයුධරැස ; පස්ස, බල ; තෙන, එයින් ; තං, තා ; අභිමද්දිමි, වෙසෙසින් මඩිමි ; තුවටං, වහා ; ගච්ඡ, යව ; ඉදං, මේ ආසනය ; මම, මාගේයි.

365\. අථ, ඉක්බිත්තෙන් ; මධුරඤ්ගිරං, මිහිරිතෙපුල් ඇත්තාවූ ; ජිනො, බොධිසත්වතෙම ; අස්ස, ඔහුගේ ; වචනං, කීම ; සුත්වා, අසා ; ආහ, (මෙසේ) වදූළේය ; මාර, එම්බල මාරය ; තෙ, තා විසින් ; සාධු, කවරකලෙක්හි ; පල්ලඞ්කත්ථාය, (මේ) පර්‍ය්‍යඞ්කය පිණිස ; පාරමී, (දශ) පාරමී ධර්මයෝ ; පූරිතා, පුරණලද්දූහුද.

* "සන්තකොයං." † "මධුරං ගිරං."

366. කදා අදාසි සීසාදි-දානං සීලං කථං තව,
තදත්ථාය කථාපෙහි කො තෙ පච්චක්ඛකාරකා.

367. අථාහ ඵරුසො මාරො නෙතං ගරු මුනෙ මම,
අයං සා පරිසා සබ්බා තස්ස පච්චක්ඛකාරකා.

368. උග්ඝොසෙසි මහාසෙනා සක්ඛි'හන්ති විසුං විසුං,
භූමුද්‍රියන* මත්තාව තතො කොලාහලො අහු.

369. අථාහ මාරො සමණ අහං සක්ඛි කථාපසිං,
තව කො සක්ඛි යජ්ජත්ථි කථාපෙහි ලහුං මම.

---

366. කදා, කවරකලක; තදත්ථාය, ඒ පිණිස; සීසාදි, ශීෂාදිවූ; දානං, දානයක්; අදාසි, දුන්නෙහිද; තව, තාගේ; සීලං, ශීලය; කථං, කෙසේද; තෙ, තාගේ; පච්චක්ඛකාරකා, සාක්ෂිකාරයෝ; කො, කවුරුද: කථාපෙහි, කියව.

367. අථ, ඉක්බිත්තෙන්; ඵරුසො, දරුණුවූ; මාරො, මාරතෙම; ආහ, (මෙසේ) කීය; මුනෙ, තපස්විය; මම, මට; එතං, මෙය; නගරු, බර නොවේ; සබ්බා, සියලු; සා අයං පරිසා, ඒ මේ පිරිස්තොමෝ; තස්ස, ඊට; පච්චක්ඛකාරකා, ප්‍රත්‍යක්ෂකාරීහුයි.

368. මහාසෙනා, මහාසේනාතොමෝ; අහං, මම; සක්ඛි ඉති, සාක්ෂිමියි; විසුං විසුං, වෙන වෙනම; උග්ඝොසෙසි, උද්ඝොෂා කළාය; තතො, එයින්; භූමුද්‍රියනමත්තො එව, භූමිවිදාරණ මාත්‍රවූ (පොළෝ පැළීම් පමණවූ)ම; කොලාහලො, කොලාහලයක්; අහු, විය.

369. අථ, ඉක්බිත්තෙන්; මාරො, මාරතෙම; ආහ, (මෙසේ) කීය; සමණ, ශ්‍රමණය; අහං, මම; සක්ඛි, සාක්ෂීන්; කථාපසිං, කියවූයෙමි; තව, තට; කො, කවරෙක්; සක්ඛි, සාක්ෂිද; යදි, ඉදින්; අත්ථි, ඇත්නම්; ලහුං, වහා; මම, මට; කථාපෙහි, කියව.

---

* "පඨවුද්‍රියන."

370. අථාහ භගවා තස්ස ගම්භීරං මධුරං ගිරං,
නිච්ඡාරෙන්තො මයූරස්ස සුනාදං එණිනො යථා.

371. තවෙව මෙ න සන්තීධ පච්චක්ඛත්ථං සචෙතනා,
අචෙතනාව මෙදානි සන්ති පච්චක්ඛවාදිනො.

372. ඉති වත්වාන මාරාරි සඤ්ඣාජීමූතගබ්භතො,
නික්ඛන්තවිජ්ජුසඞ්කාසං කරං චාමීකරජ්ජුතිං.

373. රතනචීවරගබ්භම්හා නීහරිත්වා ජිනො තදා,
ධරණ්‍යභිමුඛං'කාසි උද්දිස්ස භූමිකාමිනිං.

---

370. අථ, ඉක්බිත්තෙන්; භගවා, භාග්‍යවතුන්වහන්සේ; ගම්භීරං, ගැඹුරුවූ; මධුරං, මිහිරිවූ; ගිරං, තෙපුල්; නිච්ඡාරෙන්තො, පිටකරමින්; මයූරස්ස, මයුරයාගේ; සුනාදං, සහපත් නාදය; එණිනො, සපිරෙයකුට; යථා, යම්සේද (එමෙන්); තස්ස, ඕහට; ආහ, වදාළසේක.

371. ඉධ, මෙහි; තවෙව, තට මෙන්; මෙ, මට; පච්චක්ඛත්ථං, සාක්ෂි පිණිස; සචෙතනා, චෙතනා සහිතයෝ; න සන්ති, නැති; මෙ, මට; ඉදානි, දැන්; අචෙතනා එව, චෙතනාරහිතවූම; පච්චක්ඛවාදිනො, සාක්ෂි කියන්නෝ; සන්ති, ඇත්තාහ.

372. මාරාරි, මාරශත්‍රුවූ බොධිසත්ත්වතෙම; ඉති, මෙසේ; වත්වාන, වදාරා; චාමීකර, සුවර්ණයකට බඳුවූ; ජුතිං, ප්‍රභා ඇත්තාවූ; සඤ්ඣාජීමූතගබ්භතො, සන්ධ්‍යාවලාහගර්භයකින්; නික්ඛන්ත, නිෂ්ක්‍රාන්තවූ; විජ්ජුසඞ්කාසං, විදුලියක් වැනිවූ; කරං, ශ්‍රීහස්තය :—

373. ජිනො, බොධිසත්ත්වතෙම; රතනචීවරගබ්භම්හා, රත් සිවුරු ගැබින්; නීහරිත්වා, නිකුත්කොට; තදා, එකල; භූමිකාමිනිං, මහීකාන්තාව; උද්දිස්ස, උදෙසා; ධරණීඅභිමුඛං අකාසි, පෘථිවියට අභිමුඛ කළසේක.

374. දූනමානාදිකම්මෙ මෙ කම්පන්ති ජාතිජාතියං,
කිමජ්ජ නිස්සණ්ණසීති ජිනො වාචමුදාහරි.

375. සක්ඛි 'හන්ති වදන්තීව තතො භූමිවරඞ්ගනා,
සලිලාවනිපරියන්තා ගජ්ජන්ති නච්චි තාවදෙ.

376. මහී*සාගරඌම්මිව උබ්බෙපෙන්ති මහූම්මියො,
ඡබා කම්පි කුලාලස්ස චක්කංවාතිපරිබ්භමි.

377. හිමවා ගිරිරාජා ච යුගන්ධරනගාදයො,
කූටබාහා සමුක්ඛිප්ප නච්චිංසු නටකා විය.

---

374. මෙ, මාගේ ; දූනමානාදි, දූනමානාදිවූ ; කම්මෙ, කර්ම්මයෙහි ; ජාතිජාතියං, ජාති ජාතියෙහි ; කම්පන්ති, කම්පා වන්නී ; කිං, කිම ; අජ්ජ, අද ; නිස්සණ්ණ අසි ඉති, නිශ්ශබ්ද වෙහිදැයි ; ජිනො, බෝසත්තෙම ; වාචං, වචනයක් ; උදාහරි, වදාළසේක.

375. තතො, ඉක්බිති ; භූමිවරඞ්ගනා, මහීකාන්තා තොමෝ ; අහං, මම ; සක්ඛි ඉති, සාක්ෂිමියි ; වදන්ති ඉව, කියන්නියක් මෙන් ; සලිලාවනිපරියන්තා ; ජලපොළව කෙළවරකොට ඇත්තී ; ගජ්ජන්ති, ගර්ජනාකරන්නී ; තාවදෙ, එකෙණෙහි ; නච්චි, නැටීය.

376. මහී, පෘථිවී තොමෝ ; සාගරඌම්මි ඉව, සයුරැ රළ මෙන් : මහූම්මියො, පෘථිවිතරඞ්ගයන් ; උබ්බෙපෙන්ති, නං වන්නී ; ඡබා කම්පි, ඡබාකාරයකින් කම්පා විය ; කුලාලස්ස චක්කං ඉව, කුඹල්සකක් මෙන් ; අතිපරිබ්භමි, අතිශයින් කරකැවීන.

377. හිමවාගිරිරාජාච, හිමවත් පර්වතරාජයාද ; යුගන්ධර නගාදයො, යුගන්ධරාදී පර්වත රාජයෝද ; කූටබාහා, කූළු නැමැති අත් ; සමුක්ඛිප්ප, ඔසවාගෙණ; නටකාවිය, නළුවන් මෙන් ; නච්චිංසු, නැටූහ.

---

* "මහිං."

ශ්‍රී ලංකා ජාතික

378. දිස්වා සුත්වා තමච්ඡෙරං භයෙනුබ්බිග්ගමානසා,
මාරසෙනා පභින්නාසි භින්නවෙලාව සාගරෙ.

379. භයෙනට්ටස්සරා හන්තා පතන්තඤ්ඤොඤ්ඤඝට්ටනා
විකිරිත්වා කචෙ පිට්ඨෙ ධාවිංසු මාරකිඞ්කරා.

380. ගහිතායුධානි ඡඩ්ඩෙත්වා පිදහන්තානනං කරා,
තිවච්ඡවච්ඡමත්තෙන'පි ධාවිංසු අනපෙක්ඛකා.

381. අඞ්ගුලියො මුඛෙ කෙචි පක්ඛිපන්ති රුදන්ති ච,
කෙචි වන්දන්ති යාචන්ති අභයං සාමි දෙහි නො.

---

378. තං අච්ඡෙරං, ඒ ආශ්චර්යය; දිස්වා, දැක; සුත්වා, අසාත්; භයෙන, භයෙන්; උබ්බිග්ගමානසා, තැතිගත් සිත් ඇති; මාරසෙනා, මරසෙන්තොමෝ; භින්නවෙලො, බුන් වෙරළ ඇති; සාගරෙ ඉව, සමුද්‍රයමෙන්; පභින්නා ආසි, ප්‍රභින්න වී.

379. භයෙන, භයින්; අට්ටස්සරා, බැගෑපත් හඬ ඇත්තාවූ; හන්තා, ශ්‍රාන්තාවූ; අඤ්ඤොඤ්ඤඝට්ටනා, ඔවුනොවුන් ගැටීමෙන්; පතන්තා, හෙන්නාවූ; මාරකිඞ්කරා, මාර භටයෝ; කචෙ, කෙශයන්; පිට්ඨෙ. පිටෙහි; විකිරිත්වා, විසුරුවාගෙණ; ධාවිංසු, දිවූ.

380. ගහිත, ගත්තාලද; ආයුධානි, ආයුධයන්; ඡඩ්ඩෙත්වා, හැරදමන්නාහු; කරා, අතින්; ආනනං, මුහුණු; පිදහන්තා, වසන්නාහු; තිවච්ඡවච්ඡමත්තෙන'පි, හැඳිවත පමණෙහිදු; අනපෙක්ඛකා. අපෙක්ෂාරහිතවූවාහු; ධාවිංසු, දිවූහ.

381. කෙචි, සමහරෙක්; අඞ්ගුලියො, ඇඟිලි; මුඛෙ, මුවෙහි; පක්ඛිපන්ති. බහත්; රුදන්ති ච, හඬත්; කෙචි, සමහර කෙනෙක්; සාමි, ස්වාමීනි; නො, අපට; අභයං දෙහි, අභයදානය කරවයි; වන්දන්ති, වඳිත්; යාචන්ති, යාච්ඤා කෙරෙත්.

382\. සබ්බෙසො'යං ජිතො කිත්නු නිස්සාසාරුද්ධභාසනා,
පිප්පස්සමුදික්ඛන්තා ධාවිංසු වකිතා පරෙ.

383\. ගිරිමෙඛලො'පි නාගින්දෙ ජනාදුකෙන පතී තදා.
මාරො'පි පතිතො බිප්පං ධාවිත්වාදස්සනං ගතො.

384\. තඛ්ඛණෙ උග්ගතො ආසි සත්‍ථු කිත්තිජයද්ධජො,
අමෙව්හමෙනතාව සුරාදීනං බ්‍රහ්මලොකාවධිං ගතො.

385\. තදාසි විජයො තස්ස සබ්බුද්ධස්ස සිරිමතො,
චරිමෙ මාරයුද්ධම්හි මාරස්සාසි පරාජයො.

382\. අපරෙ, අනික් මාරභටයෝ: කිත්නු, කිමෙක්ද; අයං, මේ; සබ්බසො, සබ්බාජීවිතෙම; ජිතො, දිනනලද්දදසී; වකිතා, වකිතුවූවාහු; නිස්සාසාරුද්ධභාසනා, නිඃශ්වාසයෙන් වළකනලද තෙපුල් ඇත්තාහු; පිප්පස්සං, පිට්පස; උදික්ඛ න්තා, බලමින් ; ධාවිංසු, දිවූහ.

383\. තදා, එකල්හි; ගිරිමෙඛලො, ගිරිමෙඛල නම්වූ; නාගින්දෙඅපි, ගජෙන්ද්‍රතෙමේත්; ජනාදුකෙන, දනින්; පතී, වැටුණේය; මාරොඅපි, වසවත්මරුතෙමේත්; පතිතො, හුනුයේ; බිප්පං, වහා; ධාවිත්වා, දිව; අදස්සනං, අදශීනයට; ගතො, ගියේය.

384\. තඛ්ඛණෙ, එකෙණෙහි; සත්‍ථු, ශාස්තෘන්වහන්සේ ගේ; කිත්ති, කීත්තිනැමැති; ජයද්ධජෝ, විජයධ්වජය; උග්ගතො, උස්ව පැණනැංගේ; සුරාදීනං, දිව්‍යාදීන්; අමෙව්හමෙනතා ඉව, කෑඳවන්නාක්මෙන්; බ්‍රහ්මලොකාවධිං, බඹලොවහිම් කොට; ගතොආසි, ගියේවී.

385\. තදා, එකල්හි; චරිමෙ මාරයුද්ධම්හි, අන්තිමමාරයුද්ධ යෙහිදී; සිරිමතො, ශ්‍රීමත්වූ; තස්සසබ්බුද්ධස්ස, ඒ සබුද්ධයන්ව හන්සේට; විජයො ආසි, විජය විය; මාරස්ස, මාරයාට; පරාජයො ආසි, පරාජය විය.

386. එවං මහානුභාවොති ඤත්වාන නරසාරථිං,
නිච්චං වන්දථ පූජෙථ සො හි වො සරණං සදා.

ඒකාදසමො විජයො.

---

387. ලද්ධාභිවිජයෙ බුද්ධෙ නිසින්නෙ වජිරාසනෙ,
පරිවාරයුං ගතාගම්ම පුරෙ විය සුරාදයො.

388. දෙවා තෙ නිඛිලා නෙත්වා* නානාපූජාවිධිං තතො,
සන්තුට්ඨා මුනිනො'කාසුං මහන්තං ජයමඞ්ගලං.

389. සමපත්තාථ නිසාකන්තා මානෙතුංව මුනිස්සරං,
පුබ්බාපරම්බරෙ ලග්ගසසීණකන්තකණ්ණභූසණා.

---

386. එවං, මෙසේ; මහානුභාවො ඉති, මහත් අනුභාව ඇත්තෙකැයි; නරසාරථිං, නරසාරථීන්වහන්සේ; ඤත්වාන, දැන; නිච්චං, නිරන්තරයෙන්; වන්දථ, වඳිව්; පූජෙථ, පුදව්; සොහි, හෙතෙම වනාහි; වො, තොපට; සදා, හැමකල්හි; සරණං, පිහිටයි.

එකොළොස්වෙනි මාරවිජයකථාවයි.

---

387. වජිරාසනෙ, විදුරසුන්හි; නිසින්නෙ, වැඩහුන්නාවූ; බුද්ධෙ, බොධිසත්ත්වයන්; ලද්ධාභිවිජයෙ, ලැබූජය ඇතිකල්හි; ගතා, (මාරභයින් තැතිගෙණ) ගියාවූ; සුරාදයො, දෙවාදීහු; පුරෙවිය, පෙරමෙන්; ආගම්ම, අවුත්; පරිවාරයුං, පිරිවැරූහ.

388. තතො, ඉක්බිති; නිඛිලා, සියලූ; තෙ දෙවා, ඒ දෙවියෝ; නානාපූජාවිධිං නෙත්වා, නොයෙක් පූජාවිධි පමුණුවා; සන්තුට්ඨා, සතුටුවූවාහු; මුනිනො, බෝසතුන්ට; ජයමඞ්ගලං, ජයමඟුල්; අකංසු, කළාහුයි.

389. අථ, ඉක්බිති; පුබ්බාපරම්බරෙ, පූර්වාපරාකාශයෙහි; ලග්ග, ලග්නවූ; සසීණ, චන්ද්‍රාත්මනැමැති; කණ්ණභූසණා, කර්ණාභරණඇති; නිසාකන්තා, රාත්‍රිනැමැති ස්ත්‍රී තොමෝ; මුනිස්සරං, මුනීශ්වරයන්වහන්සේ; මානෙතුංඉව, පුදන්ට මෙන්; සමපත්තා, පැමිණියා.

---

* "නීත්වා."

390. සුනීලාකාසධම්මිල්ලෙ ධත්තතාරාලිමාලිකා,
විජෙන්තීව දිසාබාහා ඵුල්ලචූතකචාමරෙ.

391. මල්ලිකාමුකුලාසත්තසම්මත්තාලිගණා තදා,
ධමෙන්තා විය සඞ්ඛානි කූජන්ති මධුරං ගිරං.

392. සාමොදමකරන්දෙහි මන්දමන්දානිලාගතා,
සජුණ්හා ජිනබිම්බම්හි උතුං ගාහෙන්ති සීතලං.

393. අවිජ්ජාදිමහාමූලං තිවට්ටප්පිරඛන්ධකං,
සංසාරවිසරුක්ඛං සො ආරද්ධුම්මූලිතුං තදා.

---

390. සුනීල, අතිනීලවූ; ආකාස, ආකාශ නැමැති; ධම්මිල්ලෙ, කෙශකලාපයෙහි; ධත්ත, දරණ (පලඳින) ලද; තාරාලි, තාරකාපන්ති නැමැති; මාලිකා, මල්දම් ඇත්තී; දිසාබාහා, (පූර්වාදි) දිශානැමැති අතින්; ඵුල්ලචූතකචාමරෙ, පිපියාවූ මීඅඹමල්කැන් නැමැති සෙමර; විජෙන්තී ඉව, සලන්නියක්වැනි වී.

391. තදා, එකල්හි; මල්ලිකාමුකුල, බොලිද්දමල් කැකුලන්හි; ආසත්ත, ඇලුනාවූ; සම්මත්ත, මත්වූ; අලිගණා, භෘඞ්ගශ්‍රෙණීහු; සඞ්ඛානි, ශඞ්ඛයන්; ධමෙන්තා විය, පිඹින්නවුන් මෙන්; මධුරං ගිරං, මිහිරිනාද; කූජන්ති, නඬත්.

392. සාමොද, සුවඳසහිතවූ; මකරන්දෙහි, මුවරදින් යුක්තව; ආගතා, ආවාවූ; සජුණ්හා, ජ්‍යොත්ස්නා සහිතවූ; මන්දමන්ද අනිලා, මන්දමන්දමාරුතයෝ; ජිනබිම්බම්හි, බෝසත් රුවෙහි; සීතලං උතුං, ශීතලසෘතුගුණය; ගාහෙන්ති, ගන්වත්.

393. තදා, එසමයෙහි; සො, ඒ මහාබොධිසත්වතෙම; අවිජ්ජාදි, අවිද්‍යාදි නැමැති; මහාමූලං, මහමුල් ඇති; තිවට්ටප්පිර ඛන්ධකං, (කම්වට කෙලෙස්වට විවාවට යන) ත්‍රිවෘත්තනැමැති සපිරකඳක් ඇති; සංසාරවිසරුක්ඛං, සංසාර නැමැති විෂවෘක්ෂය; උම්මූලිතුං, මූලොත්පාටනයකරන්ට; ආරද්ධො, පටන් ගෙණ (නොහොත්) ආරද්ධො, පටන්ගත්සේක් :—

394. භාවෙන්තො පුරිමෙ යාමෙ සරන්තො ඛන්ධසන්තතිං,
පුබ්බනිවාසානුස්සති ඤාණං ලද්ධා නරිස්සරො.

395. තථා මජ්ඣිමයාමම්හි දිබ්බචක්ඛුවිසොධනා,
චුතූපපාතඤාණඤ්ච අධිගච්ඡාන සබ්බසො

396. රත්තියා පච්ඡිමෙ යාමෙ චින්තයන්තො ජරාදයො,
විපස්සිත්වා නාමරූපෙ ආරොපෙත්වා තිලක්ඛණං.

397. සම්මසන්තො කිලෙසෙහි විවෙචෙත්වා සකං මනං,
ආසවානං ඛයෙ ඤාණං ලද්ධා අග්ගඵලං තදා.

398. පත්තො නිබ්බාණනගරං බොජ්ඣඞ්ගරතනිස්සරො,
සද්ධම්මරාජා හුත්වාන පීතිවාචමුදාහරි.

---

394. නරිස්සරො, නරෙශ්වරවූ බෝසත් තෙම; පුරිමෙ යාමෙ, ප්‍රථමයාමයෙහි; භාවෙන්තො, භාවනාකරන්නේ; ඛන්ධසන්තතිං, ස්කන්ධයන්ගේ පරම්පරාව; සරන්තො, සිහි කරන්නේ; පුබ්බනිවාසානුස්සතිඤාණං, පූර්වේනිවාසානුස්මෘතිඥානය; ලද්ධා, ලැබ :—

395. තථා, එසේම; මජ්ඣිමයාමම්හි, මධ්‍යමයාමයෙහි; දිබ්බචක්ඛු විසොධනා, දිව්‍යචක්ෂුර්විශොධනයෙන්; සබ්බසො, සර්වප්‍රකාරයෙන්; චුතූපපාතඤාණඤ්ච, චුති උත්පත්ති දන්නා ඥානයටද; අධිගච්ඡාන, පැමිණ :—

396. රත්තියා, රාත්‍රිය සම්බන්ධවූ; පච්ඡිමෙ යාමෙ, පශ්චිම යාමයෙහි; ජරාදයො, ජරාදීන්; චින්තයන්තො, සිතන්නේ; නාමරූපෙ, නාමරූපයෙහි; තිලක්ඛණං ආරොපෙත්වා, තිලකුණු ආරොපණය කොට; විපස්සිත්වා, විදර්ශනා කොට.

397. තදා, එකල්හි; සම්මසන්තො, සම්මර්ශනය කරන්නේ; සකං මනං, සියසිත; කිලෙසෙහි, කෙලෙසයන් කෙරෙන්; විවෙචෙත්වා, තොරකොට; ආසවානං, (කාමාදී) ආශ්‍රවයන්ගේ; ඛයෙ, ක්ෂයකිරීමෙහි; ඤාණං, නුවණින්; අග්ගඵලං, උත්තම අර්හත්ඵලය; ලද්ධා, ලැබ :—

398. නිබ්බාණනගරං, නිවන්පුරයට; පත්තො, පැමිණියේ; බොජ්ඣඞ්ගරතනිස්සරො, සප්තබොධ්‍යඞ්ග නැමැති රුවනට ඉසුරුවූ; සද්ධම්මරාජා හුත්වාන, සද්ධර්මරාජව (සම්‍යක් සම්බුදුව): පීතිවාචං, ප්‍රීතිවාක්‍යය: උදාහරි, ගෙණැරපෑසේක.

399. අනෙකජාතිසංසාරං සන්ධාවිස්සං අනිබ්බිසං,
ගහකාරකං ගවෙසන්තො දුක්ඛා ජාති පුනප්පුනං.*

400. ගහකාරක දිට්ඨොසි පුන ගෙහං න කාහසි,
සබ්බා තෙ ඵාසුකා භග්ගා ගහකූටං විසඞ්ඛිතං,
විසඞ්ඛාරගතං චිත්තං තණ්හානං ඛයමජ්ඣගා.†

401. ඉච්චෙවමග්ගමතදානවිධිප්පවීණ
කාරුඤ්ඤපුඤ්ඤහදයෙන මහොදයෙන,
පත්වා භවණ්ණවමපාරමනන්තදුක්ඛං
යෙනොචිතා පරමපාරමිතා ජිනෙන.

---

399. පුනප්පුනංජාති, නැවත නැවත උත්පත්තිතොමෝ ; දුක්ඛා, දුක්ය ; ගහකාරකං, මේ ආත්මභාවසඞ්ඛ්‍යාත ගෙය කරන්නාවූ තෘෂ්ණා නැමැති වඩුවා ; ගවෙසන්තො, සොයමින් ; අනෙකජාති සංසාරං, නොයෙක් ජාති කොටි ශත සහස්‍රයක් ක්‍ෂයකලද සංසාර වෘත්තයෙහි : අනිබ්බිසං, ඒ බොධිඥානය නොලබන්නෙම්ම ; සන්ධාවිස්සං, (චුති ප්‍රතිසන්ධි වශයෙන්) නැවත නැවත ඇවිද්දෙමි.

400. ගහකාරක, ආත්මභාව සංඛ්‍යාත ගෙය කරන්නාවූ තෘෂ්ණා නැමැති වඩුව ; දිට්ඨො අසි, (මා විසින් තෝ) දක්නාලද්දෙහිය ; පුන, නැවත ; ගෙහං, යථොක්ත ගෘහයක් ; නකාහසි ; (මට) නොකරන්නෙහිය : තෙ, තාගේ ; සබ්බා ඵාසුකා, සියලු කෙලෙස් නැමැති පරාළුයෝ ; භග්ගා, බිඳපියනලදහ ; ගහකූටං, යථොක්ත ගෘහයාගේ අවිද්‍යා නැමැති කැණිමඩල ; විසඞ්ඛිතං, විසුරුවා පියනලදී ; චිත්තං, (මාගේ) සිත ; විසඞ්ඛාරගතං, නිර්වාණයටවන ; තණ්හානං ඛයං, තෘෂ්ණාක්‍ෂය සඞ්ඛ්‍යාත අර්හත්ඵලයට ; අජ්ඣගා, පැමිනියෙමි.

401. ඉතිඑවං, මෙපරිද්දෙන් : අග්ග, උතුම්වූ ; අමත දානවිධිප්පවීණ, අමෘත දාන විධියෙහි දක්‍ෂවූ ; කාරුඤ්ඤපුඤ්ඤ, කරුණාවෙන් පවිත්‍රවූ ; හදයෙන, හෘදයක් ඇත්තාවූ ; මහොදයෙන, මහදභිවෘද්ධි ඇති ; යෙන ජිනෙන, යම් බොධිසත්වකෙණකුන් විසින් ; අපාරං, පරතෙර නැත්තාවූ ; අනන්තදුක්ඛං, අප්‍රමාණ දුක් ඇත්තාව ; භවණ්ණවං, සංසාර සාගරයට ; පත්වා, පැමිණ ; පරම, අතිශයින් උතුම්වූ ; පාරමිතා, (දානාදි සමත්‍රිංශත්) පාරමීධම්මයෝ ; උචිතා, රැස් කරණලද්දහුද.

---

* දෙශනාපාලියි. † මඳුලපෙළයි.

402. යොචෙව* සබ්බවිභවං පණුදිත්‍ව රජ්ජං
නික්ඛම්ම පත්‍ව චලපත්තනමිහීරුහස්ස,
මූලෙ නිසජ්ජ සබලං පබලං ච මාරං
පාපාරයො ච විජිතො ස අදෘතු සන්තිං.

අභිසම්බොධි කථා.

---

403. තිලොකනාථො සුගතො තතො තදා
උදානවාචං සමුදාහරිත්‍වා,
පල්ලඞ්කමාභුජ්ජ දුමින්දමූලෙ
විනෙතාසි එවං වජිරාසනස්මිං.

---

402. යොච එව, යමෙක් තෙමෙම ; සබ්බවිභවං, සියලු සම්පත්තියද ; රජ්ජං, රාජ්‍යයද ; පණුදිත්‍වා, දුරුකොට ; නික්ඛම්ම, නික්ම ; පත්‍වා, (මහණබවට) පැමිණ ; චලපත්තනමිහීරුහස්ස, අශ්වත්ථ වෘක්ෂරාජයාගේ ; මූලෙ, සමීපයෙහි ; නිසජ්ජ, වැඩහිඳ ; සබලං, සෙනාසහිතවූ ; පබලං, ප්‍රබලවූ ; මාරංච, වශවර්තිමාරයාද ; පාපාරයොච, පාප නැමැති සතුරන්ද ; විජිතො, දිනූසේක්ද ; සො, ඒ සර්වඥයන්වහන්සේ ; සන්තිං, ශාන්තිසඞ්ඛ්‍යාත නිර්වාණය ; අදෘතු, දේවා.

**අභිසම්බොධි කථායි.**

---

403. තතො, ඉක්බිති ; තදා, එවේලෙහි ; තිලොකනාථො, ත්‍රෛලොක්‍ය ස්වාමීවූ ; සුගතො, සර්වඥයන්වහන්සේ ; දුමින්දමූලෙ, බොධිද්‍රැමෙන්ද්‍රමූලයෙහි ; වජිරාසනස්මිං, වජ්‍රාසන මස්තකයෙහි ; පල්ලඞ්කං ආභුජ්ජ, පලක්බැඳගෙණ ; උදානවාචං, ප්‍රීතිවාක්‍යය ; සමුදාහරිත්‍වා, උදන්අනා ; එවං, මෙසේ ; විනෙතාසි, සිතූසේක.

---

* “ යෙනෙව.”

404. දානාදයො පාරමිතා විචිත්වා
අසඞ්ඛකප්පානි ච ඛෙපයිත්වා,
අස්සෙව පල්ලඞ්කවරස්ස හෙතු
සම්භාවිතං තං භජිතං මයජ්ජ.

405. යාවස්සු* පුණ්ණා මම චෙතනායො
තාවෙත්ථ අච්ඡාමි න වුට්ඨහාමි,
මන්ත්වාන සො නෙකසහස්සසඞ්ඛ්‍යා
ජිනො සමාපත්ති වලඤ්ජි තත්ථ.

406. දෙවාතිදෙවො තිභවෙකනාථො
හතාවකාසො ජිතපඤ්චමාරො,
පිතාමහාදීහි මහීයමානො
ඛෙපෙසි සත්ථා දිවසානි සත්ත.

ඉති පඨමසත්තාහං.

---

404. මයා, මාවිසින් ; දානාදයො, දානාදීවූ; පාරමිතා, පාරමිධර්මයන් ; විචිත්වා, රැස්කොට ; අසඞ්ඛකප්පානිච, අසඞ්ඛ්‍ය කල්පයන්ද ; ඛෙපයිත්වා, ගෙවා ; අස්ස එව, මෙම ; පල්ලඞ්කවරස්සහෙතු, උතුම් පර්‍ය්‍යඞ්කය නිමිත්තකොටගෙණ; සම්භාවිතං, (සසරවට) ධාවනයකරණලදී ; තං, එය ; අජ්ජ, අද ; භජිතං, සෙවනාලදී.

405. සො ජිනො, ඒ සර්වඥයන්වහන්සේ ; යාව, යම්තාක් ; මම, මාගේ ; චෙතනායො, චෙතනාහු ; පුණ්ණාඅස්සු, සම්පූර්ණවන්නාහුද ; තාව, ඒතාක්කල් ; එත්ථ, මෙහි ; අච්ඡාමි, හිඳිමි; න උට්ඨහාමි, නොනැගිටිමියි; මන්ත්වාන, සිතා; අනෙක සහස්සසඞ්ඛ්‍යා, නොයෙක් දහස්ගණන් ; සමාපත්ති සමවතුන්; තත්ථ, ඒ බොධිද්‍රුමමූලයෙහිදී ; වලඤ්ජි, වැලඳූසේක.

406. දෙවාතිදෙවො, දෙවාතිදෙවවූ : තිභව, භවත්‍රයට ; එකනාථො, අද්විතීයස්වාමිවූ ; හත, නසනලද ; අවකාසො, ක්ලේශාවකාශ ඇති; ජිත, පැරදූ ; පඤ්චමාරො, පස්මරුන් ඇති ; පිතාමහාදීහි, මහාබ්‍රහ්මාදීන් විසින් ; මහීයමානො, පුදනුලබන්නාවූ ; සත්ථා, ශාස්තෘවූ සර්වඥයන්වහන්සේ ; සත්ත දිවසානි, සත්දිනක් ; ඛෙපෙසි, ගෙවූසේක.

**පළමුවෙනි සතියයි.**

---

* "යාවස්ස පුණ්ණා."

ශ්‍රී ලංකා ජාතික පු...

407. යස්මාසනං නෙව ජහාති තස්මා
තිසඞ්ඛ්‍යුත්තෙන නිසිදිතෙව,
අජ්ජාපි කාතබ්බමනෙන අත්ථි
දෙවානමිච්චාසි මනම්හි කඞ්ඛා.

408. තෙසං මනං සො මනසා විදිත්වා
විනොදනත්ථං විමතිං තතො තෙසං,
උට්ඨාය තම්හා නභමුප්පතිත්වා
දස්සෙසි තෙසං මුනි පාටිහෙරං.

409. විනොදයිත්වා සුගතො තදෙවං
සුධාසිනං චෙතසි කඞ්ඛරාසිං,
පල්ලඞ්කතො උත්තරපුබ්බකණ්ණං
ආකාසතොරුය්හ ජලං රවිව.

410. ජිනො දුමින්දස්ස ච ආසනස්ස
බහූපකාරත්තමනුස්සරන්තො,
ඨිතො පදං කිඤ්චි අකොපයන්තො
ඉතො චිතො ලොකනමුජ්ජහන්තො.

---

407. යස්මා, යම්හෙයකින් ; ආසනං, වජ්‍රාසනය ; නෙව ජහාති, නොමහරිද ; තස්මා, එහෙයින් ; තිසඞ්ඛ්‍යුත්තෙන, (කර්ම ක්ලෙශ භව යන) සංඛ්‍යාවෙන් යුක්තවූවහු විසින් ; නිසිදිතං එව, වැඩහිඳීමය ; අනෙන, මුන්වහන්සේ විසින් ; කාතබ්බං, (බුද්ධත්වය පිණිස) කටයුතු ; අජ්ජ අපි, අද දක්වාත් ; අත්ථිඉති, ඇතැයි ; දෙවානං, දෙවියන්ගේ ; මනම්හි, සිත්හි ; කඞ්ඛා, ශඞ්කාවක් ; ආසි, වී.

408. සො මුනි, ඒ මුනීන්ද්‍රවූ සර්වඥයන්වහන්සේ ; තෙසං, ඒ දෙවියන්ගේ ; මනං, සිත ; මනසා, තමන් සිතින් ; විදිත්වා, දැන ; තතො, යලි ; තෙසං, ඔවුන්ගේ ; විමතිං, සැකය ; විනොදනත්ථං, දුරුකරණු පිණිස ; තම්හා, ඒ වජ්‍රාසනයෙන් ; උට්ඨාය, නැගිසිට ; නභං, අකාශයට ; උප්පතිත්වා, පැනනැගී ; තෙසං, ඒ දෙවියන්ට ; පාටිහෙරං, පෙළහැර ; දස්සෙසි, දැක්වූසේක.

409–410. තදා, එවේලෙහි ; සුගතො, ශොභනගති ඇත්තාවූ ; ජිනො, සර්වඥයන්වහන්සේ ; සුධාසිනං, දෙවියන්ගේ ; චෙතසි, සිත්හි වූ ; කඞ්ඛාරාසිං, ශඞ්කාරාශිය ; එවං, මෙසේ ; විනොදයිත්වා, දුරුකොට ; පල්ලඞ්කතො, පර්‍ය්‍යඞ්කයෙන් ; උත්තරපුබ්බකණ්ණං, ඉසානකොණට ; රවිඉව, හිරුමෙන් ; ජලං, දිලියෙමින් ; ආකාසතො, අහසින් ; ඔරුය්හ, බැස.—දුමින්දස්සච, බොධිද්‍රැමෙන්ද්‍රයාගේද ; ආසනස්සච, වජ්‍රාසනයාගේද ; බහූපකාරත්තං, බොහෝ උපකාරබව ; අනුස්සරන්තො, සමරණයකරණිසේක් ; පදං, පියවර ; කිඤ්චි, මදකුත් ; අකොපයන්තො, කොප්‍යනොකරමින් ; ඉතොචිතො, ඔබිනොබ ; ඔලොකනං, බැලීම ; උජ්ජහන්තො, හරිමින් ; ඨිතො, සිටිසේක.

411. නීලායතක්ඛාමලකන්තිතොය
ධාරානිපාතෙන දුමින්දරාජං,
නිසිඤ්චමානො දිවසානි සත්ත
පූජෙසි තං 'නිමිසලොචනෙහි.

412. අජ්ජාපි තස්මිං ධරණිප්පදෙසෙ
කතස්ස ථූපස්ස තදෙව නාමං,
අහොසි දෙවා ච නරොරගා ච
මහෙන්ති තෙ තෙන දිවං පයන්ති.

ඉති දුතියසත්තාහං.

---

413. දෙවා තතො දෙවවරස්ස තස්ස
සුවණ්ණකම්මං'කංසු මණීහි නානා,
පලම්බකතො ඨානවරස්ස මජ්ඣෙ
පුබ්බාපරායාමමන්තරාලෙ.

---

411. නීල, නිල්වූ; ආයත, දික්වූ; අක්ඛි, නෙත්‍රයන්ගේ; අමල, නිර්මලවූ; කන්ති, කාන්තිනැමැති; තොයධාරානිපාතෙන, දියදහර වැගීමෙන්; දුමින්දරාජං, බොධිද්‍රැමෙන්ද්‍රොත්තමයන්; නිසිඤ්චමානො, තෙමමින්; සත්තදිවසානි, සත්දිනක් කල්හි; අනිමිස ලොචනෙහි, අනිමිස ලොචනයෙන්; තං, ඒ බොධිද්‍රැමෙන්ද්‍රයන්; පූජෙසි, පිදූසේක.

412. තස්මිං ධරණිප්පදෙසෙ, ඒ පෘථිවිප්‍රදෙශයෙහි; කතස්ස, කරණලද; ථූපස්ස, චෛත්‍යයට; අජ්ජ අපි, අද දක්වාත්; තං එව නාමං. ඒ (අනිමිස) නාමයම; අහොසි, වී; දෙවා ච, දෙවියෝද; නරා, මනුෂ්‍යයෝද; උරගා ච, නාගයෝද; මහෙන්ති, (අනිමිසලොචන චෛත්‍යය) පුදත්; තෙ, ඔහුතුමූ; තෙන, ඒ හේතුකොට ගෙණ; දිවං, දිව්‍යලොකයට; පයන්ති, යෙත්.

දෙවෙනි සතියයි.

---

413. තතො, ඉක්බිති; දෙවා, දෙවතාවෝ; පලම්බකතො, පයිම්බකයටද; ඨානවරස්ස, ස්ථානවරයටද; මජ්ඣෙ, මැද; තස්ස දෙවවරස්ස, ඒ දෙවාතිදෙවයන්වහන්සේට; පුබ්බාපරායාමමන්තරාලෙ, පූර්ව පශ්චිම දෙදිග අතර; නානා, නන්වැදෑරුම්වූ; මණීහි, මිණියෙන්; සුවණ්ණකම්මං, යහපත් සක්මණක්; අකංසු, කළාහුය.

414. නරින්දනාගින්දසුරින්දපූජිතො
ඡබ්බණ්ණරංසීහි සමුජ්ජලන්තො,
නීලම්බරෙ තාරකිතො සසීව
සො චඞ්කමී සත්ත අහානි තත්ථ.

415. අජ්ජාපි තස්මිං ධරණිප්පදෙසෙ
කතස්ස ථූපස්ස තදෙව නාමං,
අහොසි දෙවා ච නරොරගා ච
මහෙන්ති තෙ තෙන දිවං පයන්ති.

ඉති තතියසත්තාහං.

---

416. තතො දුමින්දස්ස සුරාසුරින්ද
මහීතලෙ පච්ඡිමඋත්තරගං,
මාපිංසු නානාරතනාලයග්ගං
නිසජ්ජ පල්ලඞ්කවරෙ තහිං සො.

---

414. නරින්ද, නරෙන්ද්‍රය: නාගින්ද, නාගෙන්ද්‍රය; සුරින්ද, සුරෙන්ද්‍රය යන මොවුන් විසින්; පූජිතො, පුදනලද්දාවූ: ඡබ්බණ්ණරංසීහි, ෂඩ්වර්ණබුද්ධරශ්මියෙන්; සමුජ්ජලන්තො, දිලියෙන්නාවූ; සො, ඒ සර්වඥයන්වහන්සේ; නීලම්බරෙ, නීලාකාශයෙහි; තාරකිතො; තාරකාවන් පිරිවරා යන්නාවූ; සසී ඉව, චන්ද්‍රයා මෙන්; තත්ථ, ඒ චඞ්ක්‍රමණයෙහි; සත්ත අහානි, සත්දිනක්; චඞ්කමි, සක්මන් කළසේක.

415. තස්මිං ධරණිප්පදෙසෙ, ඒ පෘථිවිප්‍රදෙශයෙහි; කතස්ස, කරණලද; ථූපස්ස, චෛත්‍යයට; අජ්ජාපි, අද දක්වාත්; තං එව නාමං අහොසි, ඒ "රත්නචඞ්ක්‍රමණ" යන නාම යම් වී; දෙවා ච, දෙවියෝද; නරා, මනුෂ්‍යයෝද; උරගා ච, නාගයෝද; මහෙන්ති, (ඒ) පුදත්; තෙන, ඒ කරණකොට ගෙණ; තෙ, ඔහුතුමු; දිවං පයන්ති, දිව්‍යලොකයට යෙත්.

තුන්වෙනි සතියයි.

---

416. තතො, ඉක්බිති; සුරාසුරින්ද, දෙවදානවාධිපතීහු; දුමින්දස්ස, බොධිද්‍රුමෙන්ද්‍රයන්ට; පච්ඡිම උත්තරායං, පසුතුරු (වයඹ) දික්හි; මහීතලෙ, පෘථිවිතලයෙහි; අග්ගං, අග්‍රවූ; නානාරතනාලයං, අනෙකප්‍රකාරරත්නමය ප්‍රාසාදයක්; මාපිංසු, මැවූහ; සො, ඒ සර්වඥයන්වහන්සේ; තහිං; ඒ රත්නගෘහයෙහි (පණවනලද); පල්ලඞ්කවරෙ, උතුම් පලඟෙහි; නිසජ්ජ, වැඩහිඳ.

417. සුදුද්දසාගාධමපාරපාරං
සමන්තපඨානතරඞ්ගභඞ්ගිං,
ධම්මොදධිං ඤාණසුමෙරුමන්ථා
සාලොලයං ඛෙපයහානි සත්ත.*

418. අජ්ජාපි (13) තස්මිං ධරණිප්පදෙසෙ
කතස්ස ථූපස්ස තදෙව නාමං,
අහොසි දෙවා ච නරොරගා ච
මහෙන්ති තෙ තෙන දිවං පයන්ති.

ඉති චතුත්ථසත්තාහං.

---

419. තතො ජිනො ගන්ත්වජපාලමූලෙ
විමුත්තිජං සාදුඵලං'නුභොන්තො,
සත්තාහමත්තං අතිවත්තයී සො
දෙවාතිදෙවො කරුණාගුණග්ගො.

---

417. සුදුද්දස, ඉතා දුකසේ දිටියහැක්කාවූ ; අගාධං, අති ගම්භීරවූ ; අපාර පාරං, නොපැමිණියහැකි පරතෙරක් ඇත්තාවූ ; සමන්තපඨාන, පඨාන ප්‍රකරණ නැමැති ; තරඞ්ගභඞ්ගිං, රළුපතර ඇති ; ධම්මොදධිං, සද්ධර්ම නැමැති සමුද්‍රය ; ඤාණ සුමෙරුමන්ථා, නුවණ නැමැති මහමෙර මතින් ; සාලොලයං, අලලමින් ; සත්තඅහානි, සත්දිනක් ; ඛෙපයි, ගතකළසේක.

418. තස්මිං ධරණිප්පදෙසෙ, ඒ පෘථිවිප්‍රදෙශයෙහි ; කතස්ස, කරණලද ; ථූපස්ස, චෛත්‍යයට ; අජ්ජ අපි, අද දක්වාත් ; තං එව නාමං අහොසි, ඒ (රතනඝර යන) නාම යම වී ; දෙවා ච, දෙවියෝද ; නරා, මනුෂ්‍යයෝද ; උරගාච, සර්පයෝද ; මහෙන්ති, (එය) පුදත් ; තෙන, ඒ කරණකොට ගෙණ ; තෙ, ඔහුතුමූ ; දිවං, ස්වර්ලෝකයට ; පයන්ති, යෙත්.

**සතරවෙනි සතියයි.**

---

419. තතො, ඉක්බිති ; දෙවාතිදෙවො, දෙවියන්ට අධි දෙවවූ ; කරුණාගුණග්ගො, කරුණා ගුණයෙන් අග්‍රවූ ; සො ජිනො, ඒ සර්වඥයන්වහන්සේ ; ගන්ත්වා, (රතනඝරයෙන්) වැඩමවා ; අජපාලමූලෙ, අජපල්නුගරුක්මුල්හි ; විමුත්තිජං, අර්හත්ඵල සමාධියෙන් හටගත්තාවූ ; සාදුඵලං, මධුර ඵලය අනුභොන්තො, අනුභව කරමින් ; සත්තාහමත්තං, සත්දිනක් පමණ ; අතිවත්තයි, ඉක්මවූසේක.

---

* ඛෙපි දිනානි සත්ත.

420. තදාගතා මාරවධූ මුනින්දං
පලොභිතුං යා පිතුනො සකාසා,
තාසං පයොගම්පිධ බින්දුමත්තං
කථීයතෙ තං සමුපාගතත්තා.

421. තදා ස මාරො සමරෙ ජිනෙන
පරාජිතො සොචනකො ‘පගන්ත්වා,
පජ්ඣායමානො‘ථ අධොමුඛොව
නිසීදි තුණ්හී විලිඛං ඡමායං.

422. පරාජයං මය්හ මමෙව දොසො
න තස්ස කස්මාහමයංව නාසිං,
සීසක්ඛිමංසාදි ච පුත්තදාරෙ
නාදන්ති එවං මනසී කරොන්තො.

---

420. තදා, එවේලෙහි ; යා මාරවධූ, යම් මාර ස්ත්‍රීහු ; මුනින්දං, මුනීන්ද්‍රයන්වහන්සේ ; පලොභිතුං, පොලඹන්ට ; පිතුනො, පියමරහුගේ ; සකාසා, සමීපයෙන් ; ආගතා, පැමිණියාහුද ; තාසං, ඔවුන්ගේ ; තං පයොගම්පි, ඒ ප්‍රයොගයද; ඉධ, මෙහි ; සමුපාගතත්තා, සම්ප්‍රාප්තහෙයින් ; බින්දුමත්තං, අංශුමාත්‍රයක් ; කථීයතෙ, (මතු) කියනු ලැබේ.

421. තදා, එසමයෙහි ; සමරෙ, යුධයෙහි ; ජිනෙන, බුදුන් විසින් ; පරාජිතො, පරදවනලද ; සො මාරො, ඒ වශවර්තිමාරතෙම ; සොචනකො, ශොකකරන්නේ ; පජ්ඣායමානො, සිතිවිලි සිතන්නේ ; අථ, නැවත ; අධොමුඛො එව, යටබැලූ මුහුණ ඇත්තේම ; තුණ්හී, නිශ්ශබ්දවූයේ ; අපගන්ත්වා, (ඉන්) බැහැරගොස් ; ඡමායං, පොළොවෙහි ; විලිඛං, ඉරි අඳිමින් ; නිසීදි, හුන්නේය.

422. අයං, මේතෙම ; මං, මා ; පරාජි, දිනීය ; මය්හං එව, මාගේම ; දොසො, දොෂය වේ ; තස්ස, ඔහුගේ ; න (දොසො), (දොෂයක්) නොවේ ; කස්මා, කුමක්හෙයින්ද ; අහං, මම ; අයං ඉව, මොහු මෙන් ; න ආසිං, නොවීම්ද (එහෙයිනි); සීසක්ඛිමංසාදිච, හිස් ඇස් මස් ආදීන්ද ; පුත්තදාරෙ, අඹුදරුවන්ද ; නාදං ඉති, නුදුනිමියි ; එවං, මෙසේ ; මනසි කරොන්තො, මෙනෙහිකරමින් ; (නිසීදි, හුන්නේය).

423. පවත්තිමෙතං මකරද්ධජස්ස
සුත්වාන තණ්හා අරතී රගා ච, *
යත්ථච්ඡි මාරො පරිසොචයන්තො
තත්ථාගමුං තා චකිතා ඛණෙන.

424. දිස්වාන තං තත්ථ තථා නිසින්නං
නිස්සාසරුද්ධං ගිරමුග්ගිරන්ති,
තුසාරබින්දූතිවහෙහි'සාර
පඞ්කෙරුහාකාරවිසාලනෙත්තා.

425. හා තාත හා තාත කිමාසි තෙදං
නඨනතු තෙ කිං වද පත්ථසී කිං,
කො තෙ දිසො කෙන පරාජිතො'සි
කිමානසිස්සාම හනාම කං නො.

---

423. තණ්හා, තෘෂ්ණාද ; අරතී. අරතීද ; රගාච, රගාද ; මකරධජස්ස, මකරධවජයාගේ ; තංපවත්තිං, එපවත් ; සුත්වාන, අසා ; තා චකිතා, බියපත්වූ ඔහුතුමු ; මාරෙ, වසවර්ති මාරතෙම ; පරිසොචයන්තො, ශොක කරමින් ; යත්ථ, යම් තැනෙක්හි ; අච්ඡි, නැවතී උන්නේද ; තත්ථ, එතැනට ; ඛණෙන, ක්ෂණයකින් ; අගමුං, ගියාහුයි.

424. තුසාරබින්දු තිවහෙහි, හිමබිඳු වෑහීමෙන් ; අසාර, නිස්සාරවූ ; පඞ්කෙරුහාකාර, පද්මාකාරවූ ; විසාලනෙත්තා, විසාලනෙත්‍ර ඇත්තියෝ ; තත්ථ, එහි ; තථා, එසේ ; නිසින්නං, හුන්නාවූ ; තං, ඒ වශවර්තිමාරයා ; දිස්වාන, දැක ; නිස්සාසරුද්ධං, නිඃශ්වාසයෙන් සිරකරණලද ; ගිරං, තෙපුල් ; උග්ගිරන්ති, උදගිරණය කරන්නාහු:—

425. හා තාත හා තාත, අහෝ පියානෙනි අහෝ පියානෙනි : තෙ, නුඹට ; ඉදං, මේ ; කිං ආසි, කුමක් වීද ; තෙ, නුඹගේ ; කිං නඨනතු, කුමක් නටද ; කිං, කුමක් ; පත්ථසි, පතන්නෙහිද ; තෙ, නුඹගේ ; දිසො, සතුරු ; කො, කවරෙක්ද ; කෙන, කවරෙක් විසින් ; පරාජිතො අසි, පරදවන ලද්දෙහිද ; නො, අපි ; කිං, කුමක් ; ආනසිස්සාම, ගෙණෙන්නෙමුද ; කං, කවරෙකු ; හනාම, නසමුද ; වද, කියමැන වැසි (කිවු).

---

* "තණ්හා අරති රගායො."

426. කිමෙහොතියොදූති න පස්සථෙතං
සුබොදනීයං තතකිත්තිඝොසං,
මුඛමසි මය්හං මසිමක්ඛයන්තං
අතිච්ච යන්තං විසයං පසය්හ.

427. න භාරියං තාත මනුස්සභූතං
කාතුං වසං කො වසමෙති නාමහං,
තං රාගපාසෙන ගජංව මත්තං
සුබන්ධකං බන්ධිය ආනයෙම.

428. න රාගපාසෙන හි ආනනීයො
මාරස්ස ධෙය්‍යං සමතික්කමීව,
අපෙතරාගො අරහා අකම්පො
සොචාම තස්මා සුභගා තනූජ.

---

426. භොතියො, පින්වත් දුහිතෘවරුනි කිං, කිම ; ඉඳුනි, දූන් ; තත කිත්තිඝොසං, පතළ කීර්ත්තිඝොෂා ඇති ; මය්හං, මාගේ ; මුඛමහි, මුවෙහි ; මසිමක්ඛයන්තං, දූලි තවරන්නාවූ ; විසයං, (මාසතු) විජිතය හෝ ගොචරය ; පසය්හ, බලාත් කාරයෙන් මැඩ ; අතිච්ච, ඉක්ම ; යන්තං, යන්නාවූ ; එතං, මේ ; සුබොදනීයං, ශුභොදන පුත්‍රයා ; න පස්සථ, නොදක් විද ?

427. තාත, පියානෙනි ; මනුස්සභූතං, මනුෂ්‍ය වූවක්හු ; වසං කාතුං, වසඟ කරන්ට ; න භාරියං, බර නොවේ ; අම්හං, අපගේ ; වසං, වශයට ; කො, කවරෙක් ; න එති, නොඑද ; තං, ඔහු ; මත්තං, (මදයෙන්) මත්වූ ; ගජං ඉව, හස්තියෙකු මෙන් ; රාගපාසෙන, කාමරාග නැමැති මලපතින් ; සුබන්ධකං, දැඩි බන්ධන ඇතිකොට ; බන්ධිය, බැඳ ; ආනයෙම, ගෙණෙමු.

428. සුභගා, සෞභාග්‍යඇති ; තනූජ, දූවරුනි ; අපෙත රාගො, පහවූරාග ඇත්තාවූ ; අකම්පො, නිශ්චලවූ ; අරහා, අර්හත්වූ බුදුරජතෙම ; මාරස්ස, මාරයාගේ ; ධෙය්‍යං, (මාර) ධෙය්‍යසඞ්ඛ්‍යාත සංසාරය : සමතික්කමි, (යම්හෙයකින්) ඉක්ම විද ; හි, එහෙයින් ; රාගපාසෙන, රාගනැමැති පාශයෙන් (බැඳ) ; න ආනනීයො එව, (හෙතෙම) නොගෙණියහැක් කෙමය ; තස්මා, එහෙයින් ; සොචාම, ශොක කරමු.

429. සචෙතනො සො හි මනුස්සභූතො
අචෙතනංචෙ සමුපාගමාම,
කරෙම තං නො වසගං කිමෙත්ථ
චිත්තං බලං පස්සථ නො ඛණෙන.

430. රූපෙන නෙත්තං සුමනොහරෙන
ගන්ධෙන ඝාණං සවණං සරෙන,
ඵස්සෙන ගත්තං රසසා රසඤ්ඤං
මනඤ්ච පාසෙන ච කාමජෙන.

431. සුබාහුපාසෙනච තස්ස ගීවං
බාහුද්වයං ධාරිතමාලදාමා,*
බන්ධිත්වදානෙව තමානයාම
බලං හි නො පස්සථ තාතදානි.

---

429. සො හි, හෙතෙම වනාහි; සචෙතනො, චෙතනා සහිතවූ; මනුස්සභූතො, මනුෂ්‍යවූවෙක; චෙ, ඉදින්; අචෙතනං, චෙතනාරහිතවූවක් කරා; සමුපාගමාම, එළඹෙමුද; තං, එය; නො, අපට; වසගං කරෙම, වසඟකරමු: එත්ථ, මෙහි; කිං චිත්තං, ආශ්චර්‍ය්‍යකිම්ද; නො, අපගේ; බලං, ශක්තිය; ඛණෙන, ක්‍ෂණයකින්; පස්සථ, බැලුව මැනව.

430. සුමනොහරෙන, ඉතා මනොඥවූ; රූපෙන, රූපය කරණකොටගෙණ; නෙත්තං, නෙත්‍රයද; ගන්ධෙන, (මනොඥවූ) ගන්ධය කරණකොටගෙණ; ඝාණං, නාසයද; සරෙන, (මනොඥවූ) ස්වරය කරණකොටගෙණ; සවණං, කණද; ඵස්සෙන, (මනොඥවූ) ස්පර්ශය කරණකොටගෙණ; ගත්තං, ශරීරයද; රසසා, (මනොඥවූ) රසය කරණකොටගෙණ; රසඤ්ඤං, දිවද; කාමජෙන, කාමජවූ; පාසෙන, මලපතින්; මනඤ්ච, සිතද :—

431. සුබාහුපාසෙන, යහපත් බාහුනැමැති මලපුඩුවෙන්; තස්ස, ඔහුගේ; ගීවංච, ග්‍රීවයද; ධාරිතමාලදාමා (අපසිරුරෙහි) දරණලද මල්දමින්; බාහුද්වයංච, හස්තවයද; බන්ධිත්වා, බැඳගෙණ (අල්වාගෙණ); තං, ඔහු; ඉදානි එව, දැන්ම; ආනයාම, ගෙණෙමු; යි, ඒ එසේමැයි; තාත, පියානෙනි; නො, අපගේ; බලං, ශක්තිය; ඉදානි, දැන්; පස්සථ, බැලුව මැනව.

---

* "ධාරිතමාලදාමං."

ශ්‍රී ලංකා ජාතික

432. වත්වාන එවං වචනං පිතුස්ස
පණම්ම පාදානි පගබ්භිතඞ්ගා,*
යත්ථච්ඡි මාරාරි විරොචමානො
තත්ථාගමුං ඛිප්පමුදග්ගචිත්තා.

433. සාමොදමාලාකුලකෙසභාර
පයොධරා කුඞ්කුමහාරිහාරා,
බිම්බාධරා චාරුසභාපභාසා
උම්මාදයන්ති ජනමානසානි.

434. මුඛෙන මිස්සං මධුරෙ නිමුග්ගං
සෙනෙහෙන තින්තං රසතො ‘නුවිද්ධං,
භාසිංසු වාචං හදයඞ්ගමන්තා †
විලොකනෙනෙව ධිතිං හරන්ති.

---

432. තා, ඒ මාරදූහිතෘහු; එවං, මෙසේ; පගබ්භිතං, බුහු ඵිවූ; වචනං වත්වාන, තෙපුල් බැණ; පිතුස්ස, පියාගේ; පාදානි, පාදයන්ට; පණම්ම, ප්‍රණාමකොට; මාරාරි, මාරශත්‍රුවූ බුදුරජාණන්වහන්සේ; විරොචමානො, බබලමින්; යත්ථ, යම් තැනෙක්හි; අච්ඡි, නැවතී වැඩඋන්සේක්ද; උදග්ගචිත්තා, ඔදවැඩි සිත් ඇත්තීයෝ; තත්ථ, එතැනට; ඛිප්පං, වහා; අගමුං, ගියෝ.

433. සාමොද, ආමොද සහිතවූ හෙවත් ඉතා දුර හමන සුවඳ සහිතවූ; මාලාකුල, මල්දමින් ගැවසීගත්; කෙස භාර, කෙස්වැටි හා; පයොධරා, පියයුරු ඇති; කුඞ්කුම, කොකුම් කලලින්; හාරිහාරා, මනොඥවූ මුක්තාහාර ඇති; බිම්බාධරා, බිඹුපල වැනි තොල් ඇති; චාරු සභා පභාසා, මනොඥවූ සභ්‍යවාග්විලාස ඇති; ජනමානසානි, දනන් සිත්; උම්මාදයන්ති, උමතු කරන්නාවූ :—

434. විලොකනෙන එව, බැලීමෙන්ම; ධිතිං, (ලෞකික ජනයන්ගේ) ශක්තිය; හරන්ති, පැහැරගන්නාවූ; තා, ඒ මාරධීතෘහු; මුඛෙන, ශෘඞ්ගාර රසයෙන්; මිස්සං, මිශ්‍රවූ; මධුරෙ, මාධුර්‍ය්‍ය රසයෙහි; නිමුග්ගං, නිමග්නවූ; සෙනෙහෙන, ප්‍රෙම නැමැති තෙලයෙන්; තින්තං, තෙත්වූ; රසතො, රසවශයෙන්; අනුවිද්ධං, ඕවිදුනාලද; හදයඞ්ගමං, ලයානුගවූ; වාචං, වචන; භාසිංසු, කීහුය; (ඉන් කෙසේදයත් ?).

---

* “පගබ්භිතා තා.” “පගබ්භිතතා,” † “හදයඞ්ගමා තා,”

435. වසනතකාලෙනතා නවයොබබනො'සි
සුවණණවණෙණා හදයඞගමො'සි
එකො නිසිනෙනා'සි වටසස මූලෙ
සීමනතිනී සාමි කුහිනතු තුයහං.

436. තරඞගහීනො'පි තරඞගමාලී
සසඞකහීනා රජනී ච සාමි,
හංසාලිහීනා සරසී සුඵුලලා
නාභාති කනතාවිරහො ධවො'පි.

437. වසනතකාලො ච වනං සුඵුලලං
නිසාකරාභා භමරාලිගීතං,
සුගනධමනෙදූපගතා සමීරා
විරොචසි ත්වමපි ච යොබබනෙන.

---

435. සාමි, ස්වාමීනි (නුඹවහන්සේ); වසනතකාලෙනතා, පුෂ්පවාණයාමෙන් වූයේ; නවයොබබනො අසි, අභිනව යෞවනය ඇත්තෙහිය ; සුවණණවණෙණා, ස්වර්ණවර්ණවූයේ ; හදයඞගමොඅසි, හෘදයඞගමවෙහිය ; එකො, හුදකලාවූයේ ; වටසස මූලෙ, නුගරුක්මුල ; නිසිනෙනා අසි, හුන්නේ වෙහිය; තුයහං, නුඹවහන්සේගේ ; සීමනතිනී, කාන්තා තොමෝ; කුහිනතු, කොසිද ?

436. සාමි, ස්වාමීනි; තරඞගහීනො, රළින් හීනවූ; තරඞගමාලීඅපි, සමුද්‍රයතෙමේද ; සසඞකහීනා, චන්‍ද්‍රයාගෙන් හීනවූ; රජනීච, රාත්‍රිතොමෝද; හංසාලිහීනා, හංසශ්‍රේණීන් හෝ හංසයන්ගෙන් හා භෘඞගයන්ගෙන් හීනවූ ; සුඵුලලා, සුපුෂ්පිතවූ; සරසී, විලද; කනතාවිරහො, කාන්තාරහිතවූ; ධවොඅපි, වල්ලභතෙමේද ; නාභාති, නොබබලයි.

437. වසනතකාලො ච, වසන්තකාලයද ; (හොති, ඇතිවේ); වනං ච, වනයද ; සුඵුලලං, සුපුෂ්පිතයි; නිසාකරාභා, චන්‍ද්‍රකාන්තියද (ඇතිවේ); භමරාලිගීතං, භෘඞගශ්‍රේණීනාදයද (ඇතිවේ); සුගනධ, සුවඳැතිවූ; මනද, මඳවූ; සමීරා, පවන්හුද ; උපගතා, පැමිණියාහුය ; ත්වමපි ච, නුඹවහන්සේත් ; යොබබනෙන, යෞවනයෙන් ; විරොචසි, බබලන්නෙහිය.

438\. මයම්පි එත්ථෙව සමාගතම්හ
මනො'නුකූලා ච මනුඤ්ඤරූපා,
කරොති කිංවජ්ජ* සකාමදුහො
කාමාකරෙදානි සමාගතො නො.

439\. මා තෙදිසං සොබ්භනරූපසාරං
සුවිග්ගහං ඡාදය චීවරෙන,
තෙනෙව නො නෙත්තමනාමයි සාමි
මා දෙහි දුහං තව දසිඝුණෙ†.

438\. මයංඅපිච, අපිද; එත්ථෙව, මෙහිම; සමාගතා අම්හ, සම්ප්‍රාප්තයෝවම්හ; (ඒ අා අපිත්); මනොනුකූලාච, චිත්තානු කූලවූවෝද; මනුඤ්ඤරූපා, මනොඥ (සෙදුහ) ස්වරූප ඇත්ති යෝද (වෙමු); අජ්ජ, අද; සමාගතො, සම්ප්‍රාප්තවූ; සකාම දුහො, කාමදුහ සහිතවූ; කාමාකරෙ, කාමාකර තෙම‡; නො, අපට; ඉදානි, දැන්; කිනනුකරෙති, කුමක්නම් කෙරේද; නොහොත්: කාමාකරෙ, කාමාකරවූයේ; අජ්ජ, අද; කිනනුකරෙති, (සඞගමය) කෙරේද; නො, අපගේ; සො කාමදුහො, ඒ කාමදුහසතෙම; ඉදානි, දැන්; සමාගතො, සම්ප්‍රාප්තයි; නොහොත්: අජ්ජ, අද; සකාමදුහො, කාමදුහසහිතවූයේහෝ ස්වකීය කාමදුහ ඇත්තේ; කිනනුකරෙති, (සඞගමය) කෙරේදැයි; කාමාකරෙ, අනඝතෙම; ඉදානි, දැන්; නො, අපට, සමාගතො, සඞගත වූයේය.

439\. සාමි, ස්වාමීනි; තෙ, නුඹවහන්සේගේ; ඊදිසං, මෙ වැනිවූ; සොබ්භනරූපසාරං, යෞවන ස්වරූපයෙන් සාරවූ; සුවිග්ගහං, යහපත් ශරීරය; චීවරෙන, සිවුරෙන්; මාඡාදය, නොවැසුවමැනව; තෙනෙව, එහෙයින්ම; තව, නුඹවහන් සේගේ; දසීඝුණෙ, දසීජනයාට; දුහංමාදෙහි, දුහ නොදෙනු මැනව; නො නෙත්තමනාමයි, අපගේ නුවන් සිත්හි; දුහං, දූවිල්ල; මාදෙහි, නොදෙනු මැනව.

* "කිනචජ්ජ." † "දසඝුනෙ."

‡ "කාමාකර" යනු ඔවුන් විසින් බුදුන්ට උත්පාදිත නාමයෙකි.

440. නඛංසුසුත්තො'රුණපාණිපාදෙ
නෙත්තින්දනීලානිව ආවුණන්තො,
ත්වමච්ඡි නො* සාමි මුඛම්බුජෙසු
න එන්ති කින්තෙ නයනාලිමාලා.

441. සුධාසිලාගිඤ්ජකලොහදාරු
ජාතෙහි ත්වං ධීර න නිම්මිතො'සි,
රූපී'සි සොම්මො'සි තථාපි සාමි
කිං කාමරාගං මනසා නුදෙසි.

442. අයඤ්ච බාලා චතුරා රතීසු
බාලෙති කඞ්ඛං ජහ මානසම්හි,
කිං මඤ්ජරී භිජ්ජති සම්පඵුල්ලා
මත්තාලිරාජෙ පරිචුම්බමානෙ.

---

440. සාමි, ස්වාමීන්; අරුණපාණිපාදෙ, අරුණුවන් අත් පාහි; නඛංසු, නියරැස් නැමැති; සුත්තො, හූයෙහි; නෙත්ත, නෙත්‍රනැමැති; ඉන්දනීලානි, ඉඳුනිල්මැණික්; ආවුණන්තො ඉව, අවුණන්නෙක් මෙන්; ත්වං, නුඹවහන්සේ; අච්ඡි, හුන්නෙහිය; නො, අපගේ; මුඛම්බුජෙසු, මුවපියුම්හි; තෙ, නුඹවහන්සේගේ; නයනාලිමාලා, නෙත්‍රනැමැති භෘඞ්ගශ්‍රේණිහු; කිං න එන්ති, කුමැයි නොඑද්ද?

441. ධීර, ධීරයන්වහන්ස; ත්වං, නුඹවහන්සේ; සුධා, සුණුය; සිලා, ගල්ය; ගිඤ්ජක, උළුය; ලොහ, ලෝහය; දාරු, දුවය යන; ජාතෙහි, වර්ගවලින්; න නිම්මිතොසි, නිම්මිතවූයේනොවෙහිය; රූපීඅසි, රූපයක් ඇත්තෙහිය; සොම්මො අසි, සෞම්‍යවෙහිය; තථාඅපි, එතකුදුවුවත්; කිං, කිම; කාමරාගං, කාමාශාව; මනසා, සිතින්; නුදෙසි, දුරුකෙරෙහිද.

442. අයං බාලාච, මේ තරුණිතොමෝද; රතීසු, කාමරතියෙහි; චතුරා, දක්‍ෂය; බාලාඉති, බාලයසි; මානසම්හි, සිත්හි; කඞ්ඛං, සැකය; ජහ, හරු; කිං, කිම; සම්පඵුල්ලා, මනාවපිපියාවූ; මඤ්ජරී, මල්කැණ; මත්තාලිරාජෙ, මත්වූ භෘඞ්ගරාජයා; පරිචුම්බමානෙ, පිරිසුඹුනාකල්හි; භිජ්ජති, බිඳේද? (නොබිඳේමය).

---

* "තමච්ඡිතො."

443. අයඤ්ච රාමා රමණීයරූපා
පීණොරුගණ්ඩා කුචමණ්ඩලා ච,
තං කාමිනිං කාමය ඵුල්ලකඤ්ජෙ
හංසො යථා කෙසරසම්පයිඛො.

444. චින්තාමණිං භද්දඝටඤ්ච කප්ප
තරුං සමාපජ්ජ* දළිද්දභාවා†,
නාපෙන්ති සත්තා බලු දුක්ඛගත්තා
තථෙව නො'සි තව පාදසෙවා.

445.. එවං හි තා රජතමඤ්ජුභාසා
සහස්සමෙකඤ්ච සතානි අට්ඨ,
වෙසානි සම්මා අභිනිම්මිණිත්වා
පලොභයුන්තං බහුධා මුනින්දං. (14)

---

443. අයං රාමාච, මේ ස්ත්‍රීතොමෝද ; රමණීයරූපා, රමණීය කටයුතු රූපඇත්තීය; පීණ, පිරුණාවූ; ඌරු, සක්ථීහා; ගණ්ඩා, කොපුල්තල ඇත්තීය ; කුචමණ්ඩලාච, (එසේම පිරුණු) පියයුරු මඬුලුද ඇත්තීය; හංසො, හංසයෙක් ; ඵුල්ලකඤ්ජෙ, පිපි පියුමෙහි; කෙසරසම්පයිඛො, කිඤ්ජල්කාසක්ත වූයේ; යථා, යම්සේද (එසේ); තං කාමිනිං, ඒ ස්ත්‍රියට; කාමය, කැමැති වෙව.

444. දුක්ඛගත්තා, දුඃඛාක්‍රාන්තබැවින් හෝ දුඃඛාක්‍රාන්තමකවූ; සත්තා, සත්වයෝ; චින්තාමණිං, සිතුමිණිරුවනක් කරාද; භද්දඝටං, භද්‍රඝටයක් කරාද; කප්පතරුං, කල්පවෘක්ෂයක් කරාද; සමාපජ්ජ, පැමිණ ; දළිද්දභාවා, දිළිඳු බැවින්; බලු, ඒකාන්තයෙන් ; නාපෙන්ති, (යම්සේ) පහනොවේද්ද ; නො, අපට ; තව පාදසෙවා, ඔබවහන්සේගේ පාදසෙවනය හෝ පා සෙවීමෙන් ; තථෙව ආසි, එසේම වී.

445. එවංහි, මෙසේ වනාහි ; රජතමඤ්ජුභාසා, සිත්අලු වන මිහිරිතෙපුල් ඇති ; තා, ඔහුතුමූ ; වෙසානි, වෙසයන්; එකං සහස්සඤ්ච, එක්දහසක්ද ; අට්ඨසතානි, අටසියයක්ද; (එක් දහස් අටසියයක් වෙසයන්); සම්මා, මනාකොට ; අභිනිම්මිණිත්වා, නිර්මිතකොටගෙණ; බහුධා, බොහෝසෙයින් ; තං මුනින්දං, ඒ මුනීන්ද්‍රයන්වහන්සේ; පලොභයුං, ප්‍රලොභකර වීමට තැත්කළාහුය.

---

* "සමාපජ්ජ." † "දළිද්දභාවං."

තතො තණ්හා :—

446. යක්ඛාසි මත්තාසි (15) සිලාමයොසි
අචෙතනොසාථ අයොමයොසි,
අවීතරාගං හි සචෙතනවෙ
අනෙනුපායෙනුපසඞ්කමාම.

447. ඵලෙය්‍ය ඛිප්පං හදයං හි තස්ස
උණ්හංව රත්තං මුඛතුග්ගමෙය්‍ය,
සියාව ඛිප්පං අපි චිත්තඛෙපං
උම්මාදභාවංව ස පාපුණෙය්‍ය.

448. යථා පලූනො හරිතොපලම්හි
ඛිත්තො නලො සුස්සති ආතපෙන,
ඵවං විසුස්සති විසාදමෙති
සො මුච්ඡති මුය්හති දුක්ඛමෙති.

---

ඉක්බිති තෘෂ්ණාතොමෝ කියන්නී :—

446. යක්ඛාසි, යක්ෂයෙක් වෙහිද; මත්තා අසි, මත්වූයේවෙහිද; සිලාමයො අසි, සෙල්මුවා වෙහිද; අථ, නැවත; අචෙතනො අසි, චෙතනාරහිතයෙක් වෙහිද; අයොමයො අසි, යමුවාවෙහිද; හි (යස්මා), යම්හෙයකින්; වෙ, ඉදින්; අනෙන උපායෙන, මේ උපායෙන්; අවීතරාගං, පහනොකළ රාග ඇත්තාවූ; සචෙතනං, චෙතනාසහිතවූවකු කරා; උපසඞ්කමාම, (අපි) එළඹෙමුද.

447. හි, ඒකාන්තයෙන්; තස්ස, ඔහුගේ; හදයං, ළය; ඛිප්පං, වහා; ඵලෙය්‍ය, පැළෙන්නේය; උණ්හං රත්තං වා, උණුලේ හෝ; මුඛතො, මුඛයෙන්; උග්ගමෙය්‍ය, උතුරන්නේය; ඛිප්පං, වහා; චිත්තක්ඛෙපං වා සියා, චිත්තක්ෂෙපයක් හෝ වන්නේය; අපි, තවද; සො, හෙතෙම; උම්මාදභාවං වා, උමතු බවට හෝ; පාපුණෙය්‍ය, පැමිණෙන්නේසි.

448. පලූනො, කපනලද්දූවූ; හරිතො, හරිවර්ණවූ (අමුවූ); නලො, බට කොපිලක් හෝ තණපතක්; උපලම්හි ඛිත්තො, ගලෙක්හි දමනලද්දේ; ආතපෙන, අව්වෙන්; යථා සුස්සති, යම්සේ වියලේද; එවං, එසේ; සො, හෙතෙම; විසුස්සති, වියලෙන්නේය; විසාදං එති, ඛේදයට පැමිණේ; මුච්ඡති, මුර්ඡිත වේ; මුය්හති, මුළාවේ; දුක්ඛං එති, දුකට පැමිණෙසි.

ශ්‍රී ලංකා ජාතික

449. සොකාවතිණ්ණො* නු වනම්හි ඣායසි
විත්තන්නු ජීනො උද පත්ථයානො,
ආගුන්නු ගාමස්මිං අකාසි කිඤ්චි
ජනෙන කස්මා න කරොසි සක්ඛිං.†

සත්ථා :—

450. අත්ථස්ස පත්තිං හදයස්ස සන්තිං
ජෙත්වාන සෙනං පියසාතරූපං,
එකො'හං ඣායං සුඛමනුබොධිං
ජනෙන තස්මා න කරොමි සක්ඛිං.‡

---

449. සොකාවතිණ්ණො, (සිතෙහි හටගත් ශොකයෙන් වසනලද්දෙහි ; වනම්හි, වෙනෙහි ; ඣායසි නු, සිතිවිලි සිත (මින් හිඳි)න්නෙහිද ; විත්තං, වස්තු (සියයක් හෝ දහසක් හෝ); ජීනොනු, පැරදුනෙහිද ; උද, නොහොත් ; පත්ථයානො ; (වෙනයම් කිසිවක්) පතන්නෙහිද ; ගාමස්මිං, (ඇතුළු) ගමෙහි ; කිඤ්චි ආගුං, (අනුන් මුව දක්නටත් නොහෙමින් වල්හි හැසිරෙන්නේ ප්‍රමාණාතික්‍රාන්ත) කිසියම් පාප කර්ම (අපරාධ)යක් ; අකාසිනු, කිමෙක කෙළෙහිද ; කස්මා, (නැතහොත්) කවර හෙයකින් ; ජනෙන, ජනයා සමග ; සක්ඛිං නකරොසි, සෞහාර්දය (මිතුරු බැව්) හෝ ඇස්හමුබව නොකෙරෙහි ද(යි විචාළේ).

බුදුහු වදාරණසේක් :—

450. අහං, මම ; එකො, හුදකලාවූයෙම් ; ඣායං, ධ්‍යාන කරමින් ; පියසාතරූපං, ප්‍රියස්වරූප සුඛස්වරූපවූ ; සෙනං, ක්ලෙශසෙනාව; ජෙත්වාන, නසා; අත්ථස්ස පත්තිං, (එකාන්ත) හිතාර්ථප්‍රාප්තියවූ (නොහොත්) අර්හත්වයාගේ පැමිණීමවූ ; හදයස්ස සන්තිං, (පරම) චිත්තොපසම (චිත්තශාන්ති) සඞ්ඛ්‍යාතවූ; සුඛං, (අභීත්) සැපය; අනුබොධිං, අනුක්‍රමයෙන් (මාර්ග පටිපාටියෙන්) අවබොධකෙළෙමි (ප්‍රතිවෙධකෙළෙමි); තස්මා, එහෙයින් ; ජනෙන, ජනයා සමග ; සක්ඛිං, මිත්‍රසම්බන්ධය හෝ ඇස්හමුබව ; න කරොමි, නොකෙරෙමි(යි වදාළේ.)

---

* "සොකාවතිණ්ණො."

† "සක්ඛිං න සම්පජ්ජති කෙන චිතෙ"යිද මාරසංයුත්තකපාලියෙහි පෙණේ.

‡ "සක්ඛිං න සම්පජ්ජති කෙන චි මෙ" යි අනිත් පාදයකුදු තිබේ.

ඉමා වෙ පාලියං.

451. පලුට්ඨගත්තං දහනෙන මක්කටිං
සුසානපෙතිඤ්ච ජිගුච්ඡනීයං,
ජෙගුච්ඡියං ජඞ්ගමමීළ්හරාසිං
දිස්වාන කො තං වරයෙ සපඤ්ඤො.

අථ අරතී :—

452. කථංවිහාරී බහුලො ච භික්ඛු
පඤ්චොඝතිණ්ණො අතරීධ ඡට්ඨං,
කථංඣායිං බහුලං කාමසඤ්ඤා
පරිබාහිරා හොන්ති අලද්ධ යො තං.

---

**මේ (යමකී ගාථා) දෙක (දෙශනා) පාලියෙහියි.**

451. කො සපඤ්ඤො, කිනම් නුවණැත්තෙක්; දහනෙන, ගින්නෙන්; පළුට්ඨගත්තං, පුළුටුවූ ගාත්‍ර ඇති; මක්කටිං, වැඳිරියක්ද; විජිගුච්ඡනීයං, විශෙෂයෙන් පිළිකුල් කටයුතුවූ; සුසානපෙතිංච, ශ්මශානප්‍රෙතියක්ද; ජෙගුච්ඡියං, පිළිකුල් කටයුතුවූ හෝ පිළිකුලෙහි හටගත්තාවූ; ජඞ්ගමමීළ්හරාසිං, ගමන්ගත් අශුචිරාශියක්ද; දිස්වාන, දැක; තං, ඒ; වරයෙ, පතන්නේද (නොපතන්නේමැයි).

**ඉක්බිති අරතීතොමෝ කියන්නී :—**

452. ඉධ, මේ (ලොකයෙ) හි; කථං විහාරී, කෙසේ (කිනම් ධ්‍යාන සමාපත්තියකින් යුක්තව) වාසයකරණ සුලුවූ; බහුලොච, (ඒ කිනම් විහරණයක්) බහුලකොටත් ඇති; භික්ඛු, භික්ෂුතෙම; පඤ්චොඝතිණ්ණො, පඤ්චද්වාරික ක්ලෙශෞඝය තරණයකෙළේ; ඡට්ඨං, (මනොද්වාරික) සවෙනි ක්ලෙශෞඝය; අතරි, තරණයකෙළේද; කාමසඤ්ඤා, කාමසංඥවෝ; කථංඣායිං, කෙසේ (කිනම් ධ්‍යානයක්) ධ්‍යානකරණ සුලුවූ; බහුලං, (ඒ කිනම් විහරණයක්) බහුලකොට ඇත්තාවූ; තං, ඒ පුද්ගලයා (නොහොත්) ඔබ; අලද්ධා,* නොලැබ; පරිබාහිරා හොන්ති, හාත්පසින් බැහැරවෙද්ද (යි විචාළී).

---

* "යො" යනු පදපූරණයෙහි නිපාතයි.

ගාථා :—

453. පස්සද්ධකායො සුවිමුත්තචිත්තො
අසඞ්ඛරානො සතිමා අනොකො,
අඤ්ඤාය ධම්මං අවිතක්කඣායී
න කුප්පතී නස්සරතී න ථීනො.

454. එවංවිහාරී බහුලො ච භික්ඛු
පඤ්චොඝතිණ්ණො අතරීධ ඡට්ඨං,
එවංඣායිං බහුලං කාමසඤ්ඤා
පරිබාහිරා හොන්ති අලද්ධ යො තං.

---

බුදුහු වදාරණුවෝ :—

453. පස්සද්ධකායො, (චතුර්ථධ්‍යානයෙන් ආශ්වාස ප්‍රශ්වාස කාය මැඩපැවැත්වූ හෙයින්) සංසිඳුනු කයඇති; සුවිමුත්තචිත්තො, (අර්හත්ඵලවිමුක්තියෙන්) මනාකොට මිදුනු සිත් ඇති; අසඞ්ඛරානො, (පුණ්‍යාභිසංස්කාරාදි ත්‍රිවිධ අභිසංස්කාරයන්) අභිසංස්කරණය නොකරන්නාවූ; සතිමා, සමෘතිමත්වූ; අනොකො, (කාමසම්බන්ධ) ආලය රහිත (වූ උත්තම පුද්ගල) තෙම; ධම්මං, (චතුස්සත්‍ය) ධර්මය; අඤ්ඤාය, දැන; අවිතක්කඣායී, විතර්කරහිත (චතුර්ථධ්‍යාන යෙන්) ධ්‍යානකරණ සුලුවූයේ; නකුප්පතී, (ව්‍යාපාදසම්බන්ධ ද්වේෂ විසින්) නොකිපේ; නස්සරතී, (කාමච්ඡන්දසම්බන්ධ රාග විසින්) සිහි නොකෙරේ; (නොහොත්) අස්ස, ඒ උතුම් පුගුල්හට; නරතී, (කාමච්ඡන්ද සම්බන්ධ) ඇල්මක් නැති; න ථීනො, (මොහ විසින්) ස්ත්‍යාන ඇත්තේ නොවේ—(ථීන මිද්ධාදි ශේෂනීවරණ රහිතවූයේ යථොක්ත ක්‍රමයෙන් දෙඅඩ දහසක් ක්ලෙශප්‍රහාණියෙන් ක්ෂීණාශ්‍රව වෙයි සේයි).

454. ඉධ, මේ ශාසනයෙහි; එවංවිහාරී, මෙසේ (මෙනම් ධ්‍යානසමාපත්තියකින් යුක්තව) වාසයකරණ සුලුවූ; බහුලො ච, (ඒ එනම් විහරණයක්) බහුලකොට ඇති; භික්ඛු, භික්ෂු තෙම; පඤ්චොඝතිණ්ණො, පඤ්චද්වාරික ක්ලේශෞඝය තරණය කෙළේ (හෙවත්) ඔරම්භාගියසංයොජනයන් තරණය කෙළේ; ඡට්ඨං, සවෙනිවූ (මනොද්වාරික) ක්ලේශෞඝය (හෙවත්) උද්ධම්භාගියසංයොජන; අතරි, තරණයකෙළේය; කාමසඤ්ඤා, කාමසංඥාවෝ; එවංඣායිං, මෙසේ ධ්‍යානකරණ සුලුවූ; බහුලං, (ඒ ධ්‍යාන විහරණ) බහුලකොට ඇති; තං, ඒ උත්තමපුද්ගලයා; අලද්ධා, (කාමපාශයෙන් අල්වාගණු) නොලැබ; පරිබාහිරා හොන්ති, හාත්පසින් බැහැර වෙත්(යි වදාළේ).

අථ ගාථා :—

455. අවෙච්චම්හි තණ්හං ගණසඞ්ඝචාරී
අඞා තරිස්සන්ති බහූච සඞා,
බහුං වතායං ජනතාමනොකො*
අචිජ්ජ නෙස්සති මච්චුරාජස්ස පාරං.

සත්ථා :—

456. නයන්ති වෙ මහාවීරා සද්ධම්මෙන තථාගතා,
ධම්මෙන නයමානානං කා උසූයා විජානතං.

ඉමා පච පාළියං.

---

ඉක්බිති ගාථාතොමෝ කියන්නී :—

455. ගණසඞ්ඝචාරී, ගණයා කෙරෙහි හා සඞ්ඝයා කෙරෙ හිද හැසිරෙණ සුලුවූ ශාස්තෲන්වහන්සේ ; තණ්හං, (එකසිය අටක් ප්‍රභෙද විසින්) තෘෂ්ණාව : අවෙච්චම්හි, මුලින්ම සිඳ ලූයේය ; සඞා, (සද්දහනලක්ඛණ) ශ්‍රද්ධා ඇති ; බහූ ච, (අනෘවූ) බොහෝ ජනයෝද ; අඞා, ඒකාන්තයෙන් ; තරිස්සන්ති, (සථොකෙහෘඝයන්) තරණය කරන්නාහුය ; අනොකො, කාමාලයරහිතවූ ; අයං, මේ ශාස්තෲන්වහන්සේ ; මච්චු රාජස්ස, මෘත්‍යුරාජයාගේ (අතින්) ; බහුං ජනතං, බොහෝ ජනසමූහයා ; අචිජ්ජ, සිඳගෙණ ; වත, ඒකාන්තයෙන් ; පාරං, (නිර්වාණ සඞ්ඛාත) පරතෙරට ; නෙස්සති, පමුණුවන් නේය (සි කී.)

බුදුහු වදාරණසේක් :—

456. මහාවීරා, මහාවීරවූ ; තථාගතා, සර්වඥවරයෝ ; සද්ධම්මෙන, යහපත් ධර්මය කරණකොටගෙණ ; වෙ, ඒකාන්තයෙන් ; නයන්ති, (නිර්වාණපාරයට තුමූ) පැමිණෙත් (නොහොත් ජනයන්) පමුණුවත් ; විජානතං, (චතුස්සත්‍ය) දන්නා උත්තමයන් ; ධම්මෙන, (මනා) ධර්මයෙන් ; නයමානානං, (නිර්වාණ පාරයට) පැමිණෙන කල්හි (නොහොත්) පමුණුවන කල්හි ; කා උසූයා, කුමන දෙස් පහළ කිරීමෙක්ද (සි වදාළෝ).

මේ (සටකී ගාථා) පස (දෙශනා) පාළියෙහිසි.

---

* "ජනතා අනොකො."

457. සුත්වාන තං ධම්මවරං ජිනස්ස
පමත්තබන්ධුස්ස රගාදිරාමා,
පලොභිතුං නෙව සමත්ථකා තං
අගංසු ඛිප්පං පිතුනො සකාසං.

458. මාරො තදාරාව සමෙක්ඛමානො
දිස්වාගතා කෙවලමෙව තායො,
මා කත්ථ කාමං මම භාසිතානි
කාමත්ථ පාතුං මිගතණ්හිකාපං.

459. බාලා කුමුදනාලෙහි* පබ්බතං අභිමත්ථථ,
ගිරිං නඛෙන ඛණථ අයො දන්තෙහි ඛාදථ.

460. සෙලංව සිරසි ඌහච්ච පාතාලෙ ගාධමෙසථ,
ඛාණුංව උරසාසජ්ජ නිබ්බිජ්ජාපෙථ ගොතමා†

---

457. පමත්තබන්ධුස්ස, මාරයාගේ ; රගාදිරාමා, (දුහිතෘවූ) රගාදී මාරාඞ්ගනාවෝ ; ජිනස්ස, සර්වඥයන්වහන්සේගේ ; තං ධම්මවරං, ඒ උතුම් ධර්මය ; සුත්වාන, අසා ; තං, උන්වහන්සේ ; පලොභිතුං, පොළොඹන්ට ; නෙවසමත්ථකා, නොපොහොසත්වූවෝම ; පිතුනො සකාසං, පියාහු සමීපයට ; ඛිප්පං, වහා ; අගංසු, ගියාහුයි.

458. මාරො, මාරතෙම ; තදා, එකල්හි ; ආරාව, දුරදීම ; සමෙක්ඛමානො, බලන්නේ ; කෙවලං එව, හුදකලාවම (හෙවත් කැඳවාගෙණ්නු කැමැතිවූ මුනිඳුන් හැර තනිවම); ආගතා, ආවාවූ ; තායො, ඒ මාරදුහිතෘන් ; දිස්වා, දැක ; කාමං, (තොප) කැමැතිසේ; මම භාසිතානි, මාවදන් ; මාකත්ථ, (තෙපි) නොකළහුය ; මිගතණ්හිකාපං, මිරිඟුදිය ; පාතුං, බොන්ට ; කාමා අත්ථ, කැමැත්තෝවහුය (සි කී).

459. බාලා, බාලා (අඥාන ස්ත්‍රී) යෙනි; කුමුදනාලෙහි, කුමුදු නළුවලින් ; පබ්බතං, පර්වතය ; අභිමත්ථථ, මථනයකරව්ද ; ගිරිං, පර්වතය ; නඛෙන, නියෙන් ; ඛණථ, කණින්නහුද ; අයො, යකඩ ; දන්තෙහි, දතින් ; ඛාදථ, කන්නහුද.

460. සිරසි, මස්තකයෙහි ; සෙලං ඌහච්ච, (මහ ඇළ ගෙයක් පමණ) ගලක් ඔසවා තබා ; පාතාලෙ, පාතාලයෙහි ; ගාධං එසථ ඉව, පිහිට සොයන්නාසේ [illegible]; උරසි, ළයෙහි; ඛාණුං ආසජ්ජ ඉව, කණුව [illegible] පහරා (කැණ) ගෙන් ; නිබ්බිජ්ජ, (නමින් ගිය කරුණෙහි) කලකිරී ; ගොතමා, ගෞතම සර්වඥයා කෙරෙන් ; අපෙථ, (තෙපි) පහවන්නහුයයි (මාරතෙම කී.)

---

* "කුමුදනාලෙන." † "ගොතමං."

ඉමා මෙ පාලියං.

461. වත්වාන එවං විමනො ස මාරො
සධීතුකො සම්භවනං පයාසි,
සත්ථාථ රාගා පරිමුත්තචිත්තො*
ජහාසි තස්මිං දිවසානි සත්ත.

462. අජ්ජාපි තං සාඛිවරම්පි තෙන
නුභූතමත්තෙන මහෙන්ති සබ්බෙ.
තෙනෙව තෙ සග්ගගතා විමානෙ
මොදන්ති කාමෙහි අනූපමෙහි.

ඉති පඤ්චම සත්තාහං.

---

**මේ (සම කී ගාථා) දෙක (දෙශනා) පාළියෙහිසි.**

461. විමනො, පෙරළුනු (නොසතුටු) සිත් ඇති; සො මාරො, ඒ මාරතෙම; එවං වත්වාන, මෙසේ (යථොක්තාකාරයෙන්) කියා; සධීතුකො, (තමන්) දූහිතෘන් සහිතවූයේ; සංභවනං, ස්වකීය (මාර) භවනයට; පයාසි, ගියේය; අථ, ඉක්බිති; රාගා පරිමුත්තචිත්තො, රාගයෙන් මිදුනු සිත් ඇති; සත්ථා, ශාස්තෘන්වහන්සේ; තස්මිං, ඒ අජපල් නුගරුක සමීපයෙහි; සත්ත දිවසානි, සත්දිනක්; ජහාසි, හැරියේ (ඉක්මවූයේ) යි.

462. සබ්බෙ, සියල්ලෝ; තෙන අනුභූතමත්තෙන, උන්වහන්සේ විසින් ඒ පරිභුක්තමාත්‍රය හෙතුකොටගෙණ; තං සාඛිවරං අපි, ඒ උතුම් අජපල් නුගරුක පවා; අජ්ජ අපි, අදදක්වාත්; මහෙන්ති, පුදත්; තෙන එව, ඒ (කුශලකර්මය) හෙතුකොටගෙණම; තෙ, ඒ පූජාකරන්නෝ; සග්ගගතා, ස්වර්ගස්ථවූවාහු; විමානෙ, (දෙව්) විමන්හි; අනූපමෙහි, අප්‍රමාණවූ හෝ උපමා රහිතවූ; කාමෙහි, කාම (සම්පත්)යෙන් යුක්තව; මොදන්ති, සතුටුවෙති.

**පස්වෙනි සතිසයි.**

---

* "රාගං පජහිත්ව තාසු."

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය

463. තතො මුනින්දො මුචලින්දමූලෙ
නිසීදි ගන්ත්වා පවරාසනම්හි,
යුගන්ධරෙ බාලරවීව රංසි
ජාලාහි ලොකං පරිපූරයන්තො.

464. අථාග මෙඝො ජලදසතෙහි
පපූරයං ඛං ථනයං සවිජ්ජු,
සසීතවාතො කිරමම්බුධාරං
විරොචමානො විසකණ්ණිකාහි.

465. අමන්දනන්දො මුචලින්දභොගී
දිස්වා මුනින්දං මුචලින්දමූලෙ,
පරික්ඛිපිත්වාන විසාලභොගා
ඡාදෙත්ව සම්මා සඵණෙන ඵණෙන.

---

463. තතො, එතැනින්; මුනින්දො, මුනීන්ද්‍රයන්වහන්සේ; ගන්ත්වා, වැඩමවා; යුගන්ධරෙ, යුගන්ධර මුදුනෙහි (බබලන්නාවූ); බාලරවි ඉව, ලහිරුමෙන්; රංසිජාලාහි, (ෂඩ්වර්ණ ඝනබුද්ධ) රශ්මිජාලා යෙන්; ලොකං, ලොව; පරිපූරයන්තො, පූරවමින්; මුචලින්දමූලෙ, මුචලින්ද වෘක්ෂ සමීපයෙහි; පවරාසනම්හි, උත්තමාසන මස්තකයෙහි; නිසීදි, වැඩඋන්සේක.

464. අථ, ඉක්බිත්තෙන්; ජලදසතෙහි, සියගණින් වලා පටලින් උපලක්ෂිතව; ඛං, අහස; පපූරයං, පූරවමින්; ථනයං, ගර්ජනාකරන්නාවූ; සවිජ්ජු, විදුලි සහිතවූ; සසීත වාතො, සීතලවාත සහිතවූ; අම්බුධාරං, ජලධාරාව; කිරං, විසුරුවන්නාවූ; මෙඝො, මේඝයෙක්තෙම; විසකණ්ණිකාහි, බ්‍රාකාවන් කරණකොටගෙණ; විරොචමානො, බබලමින්; ආග, ආයේය.

465. අමන්ද, මඳනොවූ (ඉතා බොහෝවූ); නන්දො, සතුටු ඇත්තාවූ; මුචලින්දභොගී, මුචලින්ද නම් නාරදතෙම; මුචලින්ද මූලෙ, මිදෙල්ලරුක මුල (වැඩඋන්); මුනින්දං, මුනීන්ද්‍රයන් වහන්සේ; දිස්වා, දැක; සඵණෙණ, පෙණසහිතවූයේ; විසාල, මහත්වූ; භොගා, දරණවැලින්; පරික්ඛිපිත්වාන, පරික්ෂෙප කොට; ඵණෙන, පෙණපතින් සම්මා, මනාකොට; ඡාදෙත්වා, වසා.

466. අපෙක්ඛසි සො තස්ස අනුග්ගහාය
නිසීදි ගන්ත්වා භුජගාසනම්හි,
සත්ථා තදා රූපියමණ්ඩිරෙව
සත්තාහමත්තං සුවිමුත්තචිත්තො.

467. අජ්ජාපි තං සාඛිවරමපි තෙන
'නුභූතමත්තෙන මහෙන්ති සබ්බෙ,
තෙනෙව තෙ සග්ගගතා විමානෙ
මොදන්ති කාමෙහි අනූපමෙහි.

ඉති ඡට්ඨම සත්තාහ.

---

468. තතො පගන්ත්වා යතිරාජරාජා
නිසීදි රාජායතනස්ස මූලෙ,
විමුත්තිජං පීතිසුඛං'නුභොන්තො
සත්තාහමත්තං කරුණාගුණග්ගො.

---

466. අපෙක්ඛසි, ආරාධනා කෙළේය; තදා, එකල්හි; සුවිමුත්තචිත්තො, (ක්ලේශයන් කෙරෙන්) මනාව මිදුනු සිත් ඇති; සො සත්ථා, ඒ ශාස්තෲන්වහන්සේ; තස්ස, ඒ නාගෙන්ද්‍රයන්ට; අනුග්ගහාය, අනුග්‍රහ පිණිස; ගන්ත්වා, වැඩ; භුජගාසනම්හි, නාගාසන (මස්තක) යෙහි; රූපියමණ්ඩිරෙව, රිදී මැඳුරෙක්හි මෙන්; සත්තාහමත්තං, සප්තාහමාත්‍රයක්; නිසීදි, වැඩහුන්සේක.

467. තෙන, ඒ (අපගේ) ශාස්තෲන්වහන්සේ විසින්; අනුභූතමත්තෙන, පරිභුක්ත මාත්‍රයෙන්; සබ්බෙ, සියල්ලෝ; තං සාඛිවරං අපි, ඒ උතුම් මුචලින්ද වෘක්ෂයද; අජ්ජ අපි, අද දක්වාත්; මහෙන්ති, පුදත්; තෙ, ඒ පූජකයෝ; තෙන එව, ඒ කාරණකොට ගෙණම; සග්ගගතා, ස්වර්ගස්ථවූවාහු; විමානෙ, (දෙව්) විමන්හි; අනූපමෙහි, අතුල්‍යවූ; කාමෙහි, කාමසම්පත්තීයෙන්; මොදන්ති, සතුටුවෙත්.

සවෙනි සතියයි.

---

468. තතො, ඉක්බිති; කරුණාගුණග්ගො, කුළුණුගුණෙන් අගපැමිණියාවූ; යතිරාජරාජා, යතිරාජෙන්ද්‍රයන් වහන්සේ; පගන්ත්වා, (ඉන්) පහව වැඩ; රාජායතනස්ස මූලෙ, කිරිපළු රුක්මුලෙහි; විමුත්තිජං, විමුක්තියෙන් හටගත්තාවූ; පීතිසුඛං, ප්‍රීතිසැප; අනුභොන්තො, බුදිනසේක්; සත්තාහමත්තං, සතියක්පමණ; නිසීදි, වැඩහුන්සේක.

469. අජ්ජපි තං සාඛිවරම්පි තෙන
'නුභූතමෙතෙන මහෙන්ති සබ්බෙ,
තෙනෙව තෙ සග්ගගතා විමානෙ
මොදන්ති කාමෙහි අනූපමෙහි.

ඉති සත්තම සත්තාහං.

---

470. ආහාරකිච්චාදිවිවජ්ජිතස්ස
සුඛානුභොන්තස්ස විමුත්තිජං හි,
සම්පීණිතඞ්ගස්ස ජිනස්ස තස්ස
ඉච්චච්චගුං සත්තදිනානි සත්ත.

471. දෙවානමින්දෙන තතොපනීත
මුඛොදකාදිම්පරිභුඤ්ජියාන,
නිසින්නමෙත්ථ සතිරාජරාජෙ
තත්‍රාගමුං වෙ වණිජා ඛණෙන.

---

469. තෙන, ඒ (අපගේ) ශාස්තෲන්වහන්සේ විසින්; අනුභූතමෙතෙන, පරිභුක්තමාත්‍රයෙන්; සබ්බෙ, සියල් ලෝ; තං සාඛිවරම්පි, ඒ උතුම් රාජායතන වෘක්‍ෂයද; අජ්ජඅපි, අදදක් වාය; මහෙන්ති, පුදති; තෙ, ඒ පුදන්නෝ; තෙන එව, ඒ කරණකොටගෙණම; සග්ගගතා, ස්වර්ගස්ථවූවාහු; විමානෙ, දෙව්විමන්හි; අනූපමෙහි, අතුල්‍යවූ; කාමෙහි, කාමසම්පත්තියෙන්; මොදන්ති, සතුටුවෙත්.

**සත්වෙනි සතියයි.**

---

470. ආහාරකිච්චාදි, ආහාරකෘත්‍යාදියෙන්; විවජ්ජිතස්ස, තොරවූ; විමුත්තිජංහි, විමුක්තිජවූ; සුඛෙ, සුවයන්; අනුභොන්තස්ස, අනුභවකරන්නාවූ; සම්පීණිතඞ්ගස්ස, පිණාගිය ශරීරාවයව ඇත්තාවූ; තස්ස ජිනස්ස, ඒ සර්වඥයන්වහන්සේට; ඉති, මෙසේ; සත්ත සත්තදිනානි, සත් සතියක්; අච්චගුං, ඉක්ම ගියාහුයි.

471. තතො, ඉක්බිති; දෙවානමින්දෙන, ශක්‍රදෙවෙන්ද්‍රයන් විසින්; උපනීත, එළවනලද; මුඛොදකාදිං, මුවදෙවුයන්දිය ආදිය; පරිභුඤ්ජියාන, පරිභොගකොට; සතිරාජරාජෙ, සතීන්ද්‍ර රාජවූ සර්වඥයන්වහන්සේ; නිසින්නමෙත්ථ, වැඩහුන් පමණ කල්හි; වෙවාණිජා, (තපස්සු භල්ලුක යන) දෙබෑ වෙළෙන්දෝ; ඛණෙන, ක්‍ෂණයකින්; තත්‍ර, එහි; අගමුං, ගියාහුයි.

472. උස්සාහිතා දෙවවරෙන සම්මා
සාලොහිතා තස්ස තපස්සුහල්ලුකා,
මන්ථඤ්ච සාදුං මධුපිණ්ඩිකඤ්ච
ආදාය නාථං ඉදමබ්‍රවුංතෙ.

473. ඉදං හි නො ධීර අනුග්ගහාය
පටිග්ගහෙත්වා පරිභුඤ්ජ දානං,
හිතාය තං හොති සුඛාය චෙව
අනප්පකප්පෙසු අනාගතෙසු.

474. පටිග්ගහෙත්වා මුනි දෙවදින්න
පත්තෙන පච්චග්ඝසිලාමයෙන,
භුත්වාන තෙසං අනුමොදනත්ථං
දෙසෙසි ධම්මං වරදං පසත්ථං.

---

472. දෙවවරෙන, දෙවොත්තමයෙකු විසින්; සම්මා, මනාකොට; උස්සාහිතා, උත්සාහවත්කරණලද්දාවූ: තස්ස, ඒ දෙවියාගේ; සාලොහිතා (පූර්වජන්මයෙහි) සහලේනෑවූ; තපස්සු හල්ලුකා, තපස්සුය හල්ලුකය යන; තෙ, ඒ වෙළඳ දෙබෑයෝ; සාදුං, මිහිරිවූ; මන්ථංච, හත්වටද; මධුපිණ්ඩිකඤ්ච, මීපිඩුද; ආදාය, ගෙණ; නාථං, සර්වඥයන්වහන්සේට; ඉදං, මෙය; අබ්‍රවුං, කීවු.

473. ධීර, ධීරයන්වහන්ස; නො, අපට; අනුග්ගහාය, අනුග්‍රහ පිණිස; ඉදංහි දානං, මේ දානය; පටිග්ගහෙත්වා, පිළිගෙණ; පරිභුඤ්ජ, වළඳුව මැනව; තං, එය; අනාගතෙසු, අනාගතවූ; අනප්පකප්පෙසු, බොහෝවූ කල්පයන්හි; හිතාය, හිත (වැඩ) පිණිසද; සුඛාය ච, සැප පිණිසද; හොති එව, වේමැයි.

474. මුනි, සර්වඥයන්වහන්සේ; පච්චග්ඝසිලාමයෙන, අලුත් සෙල්මුවාවූ; දෙවදින්න, (සිව්වරන්) දෙවියන් විසින් දෙනලද; පත්තෙන, පාත්‍රයෙන; පටිග්ගහෙත්වා, පිළිගෙණ; භුත්වාන, වළඳා; තෙසං, ඔවුන්ට; අනුමොදනත්ථං, අනුමොදනා පිණිස; පසත්ථං, ප්‍රශස්තවූ; වරදං, උත්තම නිර්වාණය දෙන්නාවූ; ධම්මං, ධර්මයක්; දෙසෙසි, දෙසූසේක.

ශ්‍රී ලංකා ජාතික

475. තෙ භාතිකා වාණිජකා ජිනස්ස
ධම්මං සුණිත්වාන පසන්නචිත්තා,
තෙ වාචිකොපාසකතං ගතාසුං
යාචිංසු තෙ තං පුන පූජනීයං.

476. පරාමසිත්වාන සිරං තතො සො
අදා ජිනො කුන්තලධාතුමුට්ඨිං,
තෙ තෙන තුට්ඨා සුමනා පතීතා
මහිංසු නෙත්වා විභවානුරූපං.

477. සත්ථාථ ගන්ත්වා අජපාලමූලෙ
සහස්සරංසීව යුගන්ධරම්හි,
නිසජ්ජ ලොකං අනුලොකයන්තො
විතක්කි එවං මනසා විතක්කං.

---

475. තෙ භාතිකා වාණිජකා, දෙබෑ වෙළෙන්දෝ; ජිනස්ස, සර්වඥයන්වහන්සේගේ; ධම්මං, ධර්මය; සුණිත්වාන, අසා; පසන්නචිත්තා, පහන්සිත් ඇත්තාහු; තෙවාචිකඋපාසකතං, තෙවාචික උපාසකත්වයට; ගතා අසුං, ගියෝ වූහ; (බුත් සරණ දම්සරණ යාමෙන් තෙවාචික උපාසකවූහයි සේයි) පුන, නැවත; තෙ, ඔහුතුමූ; පූජනීයං, පිදියයුත්තක්; තං, උන්වහන්සේ; යාචිංසු, යැදූහ.

476. තතො, ඉක්බිත්තෙන්; සො ජිනො, ඒ සර්වඥයන්වහන්සේ; සිරං, මස්තකය; පරාමසිත්වාන, පරාමර්ශනයකොට; කුන්තලධාතුමුට්ඨිං, කෙසධාතු මිටක්; අදා, දින; තෙන, එයින්; තුට්ඨා, සන්තුෂ්ටවූ; සුමනා, යහපත් සිත්ඇත්තාවූ; පතීතා, ප්‍රීතියට පැමිණියාවූ; තෙ, ඒ වාණිජයෝ; නෙත්වා, (ඒ ධාතු) ගෙණ ගොස්; විභවානුරූපං, විභවානුරූපව (සම්පත්වූ පරිද්දෙන්); මහිංසු, පිදූ.

477. අථ, නැවත; සත්ථා, ශාස්තෘන්වහන්සේ; ගන්ත්වා, වැඩ; අජපාලමූලෙ, අජපල් නුගරුක සමීපයෙහි; යුගන්ධරෙ, යුගඳුරුපව්හි (බබලන්නාවූ); සහස්සරංසි ඉව, සූර්යයාමෙන්; නිසජ්ජ, වැඩහිඳ; ලොකං, ලොව; අනුලොකයන්තො, බලමින්; එවං, මෙසේ; මනසා, සිතින්; විතක්කං, විතර්කයක්; (කල්පනාවක්); විතක්කි, විතැකූසේක.

478. මයාධිගතො වරධම්මසාරො
සසස්ස සින්ධුව අගාධපාරො,
අබුද්ධසත්තෙහි හමජ්ජ කස්ස
පකාසයිස්සං හි ජළො හි ලොකො.

479. දෙසෙමි චෙ ධම්මවරං පණීතං
කිලන්තභාවොව මමස්ස අස්මා,
කිමත්තදුක්ඛෙනිති චින්තයන්තො
නුස්සාහමම්මාකා* මුනි දෙසනම්හි.

480. සහම්පතී නාම තතො විධාතා
සචෙතසා තස්ස මනං විදිත්වා,
විනස්සතිදං ඛලු සබ්බලොකං
අදෙසිතෙ තෙනිති කම්පමානො.

---

478. මයා, මා විසින්; අධිගතො, අධිගතවූ; වර ධම්මසාරො, උතුම්වූ ධර්මසාරයතෙම; සසස්ස, සසකයෙකු විසින්; සින්ධු ඉව, සාගරය මෙන්; අබුද්ධසත්තෙහි, නොබුදු සතුන් විසින්; අගාධපාරො, (අතිගාම්භීර්‍යයී මෙවගාම්භීර්‍යයෙන්) නොයාහැකි පරතෙර ඇත්තේය; හි, ඒ එසේමය; ලොකො, ලෝවැසිතෙමේ; ජළො හි, ජඩමයි; තං, ඒ ධර්මය; අජ්ජ, මෙකල්හි; කස්ස, කවරෙකුට; පකාසයිස්සං, ප්‍රකාශ කරන්නෙම්ද.

479. චෙ, ඉදින්; පණීතං, ප්‍රණීතවූ; ධම්මවරං, උතුම් ධර්මය; දෙසෙමි, දෙසම්ද; අස්මා, එහෙයින්; මම, මට; කිලන්තභාවො එව, ක්ලාන්තභාවයම; අස්ස, වන්නේය; අත්තදුක්ඛෙන, තමන් දුකින්; කිං ඉති, කවරප්‍රයොජනදැයි; චින්තයන්තො, සිතමින්; මුනි, සර්වඥයන්වහන්සේ; දෙසනම්හි, ධර්මදෙශනා කිරීමෙහි; උස්සාහං, උත්සාහය; න අකා, නොකළසේක.

480. තතො, ඉක්බිති; සහම්පතිනාම, සහම්පති නම්වූ; සො විධාතා, ඒ මහාබ්‍රහ්මතෙම; චෙතසා, සිතින්; (නොහොත්) සචෙතසා, සියසිතින්; තස්ස, උන්වහන්සේගේ; මනං, සිත; විදිත්වා, දැන; (ධම්ම) අදෙසිතෙ, (දහම්) නොදෙසූකල්හි; තෙන, ඒ හෙතුවෙන්; ඉදං, මේ; සබ්බලොකං, මුළුලොව; ඛලු, එකාන්තයෙන්; විනස්සතීති, වැනසෙන්නේයයි; කම්පමානො, කම්පාවෙමින්.

---

* "නුස්සාහමාකා."

481. සකාසමාගම්ම ජිනස්ස තස්ස
සගාරවො බ්‍රහ්මගණෙන තාව,
නිහච්ච ජණ්ණුං පඨවීතලම්හි
නමස්සමානො ඉදමබ්‍රවී සො.

482. ත්වං දෙවදෙවො ස සුමෙධකාලෙ
පලොකිතං ලොකමුදික්ඛමානො,
විහාය දීපඞ්කරපාදමූලෙ
ලද්ධාමතං තං කරුණාගුණෙන.

483. පවිස්ස සංසාරවනං විදුග්ගං
මංසක්ඛිසීසාදිමදාසි දානං,
වෙදෙසි දුක්ඛං අමිතං අසය්හං
තං තෙ පරත්ථංව න අත්තහෙතු.

---

481. සො, ඒ මහාබ්‍රහ්මතෙම ; සගාරවො, ගෞරවසහිත වූයේ ; බ්‍රහ්මගණෙන, බ්‍රහ්මසමූහයා හා යුක්තව ; තස්ස ජිනස්ස, ඒ සර්වඥයන්වහන්සේගේ ; සකාසං, සමීපයට ; ආගම්ම, පැමිණ ; තාව, එසිඳී ; පඨවීතලම්හි, පෘථිවීතලයෙහි ; ජණ්ණුං, දන ; නිහච්ච, ඔබා ; නමස්සමානො, වඳිමින් ; ඉදං, මේ වක්ෂ්‍යමාණකාරය ; අබ්‍රවි, කී.

482. දෙවදෙවො, දෙවාතිදෙවවූ ; සො ත්වං, ඒ තුඹ වහන්සේ ; සුමෙධකාලෙ, සුමෙධතාපස කාලයෙහි ; අපලොකිතං, නිවන් ; ලද්ධා, (දකින්ට) ලබා ; ලොකං, ලොව ; උදික්ඛමානො, බලමින් ; දීපඞ්කරපාදමූලෙ, දිවකුරු බුදුන් පාමුලදී ; තං, ඒ (ලැබුවාවූ) ; අමතං, නිර්වාණය ; කරුණාගුණෙන, කරුණාගුණය කරණකොටගෙණ ; විහාය, හැර :—

483. විදුග්ගං, විශෙෂයෙන් දුර්ගමවූ ; සංසාරවනං, සංසාර නැමැති (මහ) වනයට ; පවිස්ස, ප්‍රවිෂ්ටව ; මංස, ශරීර මාංසය ; අක්ඛි, ඇස්ය, සීසාදිං, හිස්ය යනාදිය ; දානං, දාන වස්තු කොට ; (නොහොත්) මංසක්ඛිසීසාදිං, මස් ඇස් හිස් ආදිවූ ; දානං, දන් ; අදාසි, දින ; අසය්හං, නොඉවසිය හැකිවූ ; අමිතං, අප්‍රමාණවූ ; දුක්ඛං, දුක් ; වෙදෙසි, වින්දෙහිය ; තෙ, තුඹවහන්සේගේ ; තං, ඒ (සියල්ල) ; පරත්ථං එව, මෙරමා පිණිසමය ; න අත්තහෙතු, තමන් හෙතුකොට ගෙණ නොවේ.

484. සන්තීධ සත්තා බලු මන්දරගා
ඤාතුං සමත්ථා සුගතස්ස ධම්මං,
ආරාධිතො මෙ කරුණාගුණෙන
දෙසෙහි ධම්මං අනුකම්පමානො.

485. කාලෙ විකාසන්ති ඛරංසුමිස්සා
ඵුල්ලම්බුජානි කුසුමානි නානා,
තථෙව තෙ ධම්මකරාභිපුණ්ණා
විකාසමායන්ති ජනා අනෙකා.

486. සම්පන්නවිජ්ජාචරණො සතිමා
ජුතින්ධරො අන්තිමදෙහධාරී
පරිග්ගහෙත්වාස්ස නිමන්තනං සො
ජනෙසි සත්තෙ කරුණං මනස්මිං.

---

484. ඉධ, මේ ලොකයෙහි; මන්දරගා, අල්පරජස්කවූ; සුගතස්ස, සුගතයන්වහන්සේගේ; ධම්මං, ධර්මය; ඤාතුං, දැනගන්ට; සමත්ථා, සමර්ථවූ; සත්තා, සත්වයෝ; බලු, ඒකාන්තයෙන්; සන්ති, ඇත්තාහුය; මෙ, මා විසින්; ආරාධිතො, ආරාධිතවූ; කරුණාගුණෙන, කුළුණුගුණෙන් අනූනවූ තුඹවහන්සේ; අනුකම්පමානො, (ලෝසතුන් කෙරෙහි) අනුකම්පාකරමින්; ධම්මං, ධර්මය; දෙසෙහි, දෙසනු මැනව.

485. ඵුල්ලම්බුජානි, පිපුණු ජලජවූ; නානා කුසුමානි, අනෙක කුසුමයෝ; ඛරංසුමිස්සා, රවිරශ්මි සම්මිශ්‍රවූවාහු; කාලෙ, සුදුසු කාලයෙහි; විකාසන්ති, විකසිතවෙත්; තථා එව, එපරිද්දෙන්ම; තෙ, තුඹවහන්සේගේ; ධම්මකරාභිපුණ්ණා, දහම් නැමැති රශ්මීන් සපිරී කාලාවූ; අනෙකා ජනා, නොයෙක් ජනයෝ; විකාසං, ප්‍රබොධයට; ආයන්ති, පැමිණෙත්.

486. සම්පන්න, අධිගතවූ; විජ්ජාචරණො, අෂ්ටවිද්‍යා පසළොස් චරණධම්ම ඇති; සතිමා, ස්මෘතිමත්වූ; ජුතින්ධරො, ප්‍රභාධාරීවූ; අන්තිමදෙහධාරී, චරිම ශරීරධරවූ; සො, ඒ සර්වඥයන්වහන්සේ; අස්ස, ඒ සහම්පති නම් මහාබ්‍රහ්මයාගේ; නිමන්තනං, පැවරීම (ආරාධනාව); පරිග්ගහෙත්වා, පිළිගෙණ; සත්තෙ, සත්වයන් කෙරෙහි හෝ නිසා; කරුණං, කුළුණු; මනස්මිං, (තමන්) සිත්හි; ජනෙසි, ඉපදවූසේක.

487. අපාරුතා තෙසං අමතස්ස ද්වාරා
යෙ සොතවන්තො පමුඤ්චන්තු සද්ධං
විහිංසසඤ්ඤී පගුණං න භාසිං
ධම්මං පණීතං මනුජෙසු බ්‍රහ්මෙ.*

488. පටිග්ගහෙසීති උදග්ගචිත්තො
අජ්ඣෙසනං මෙ චතුරාණනො සො,
නත්වාන නාථං සහපාරිසජ්ජො
පක්කාමි තම්හා භවනං ඛණෙන.

489. තතො ජිනො තෙන ගහීත'නුඤ්ඤො
දෙසෙමි කස්සෙති උදික්ඛමානො,
අළාරඋද්දෙ සමුදික්ඛ ධීරෙ,
ඤත්වාන තෙසං'චිරච්චුතත්තං.

---

487. යෙ, යම් ජනයෝතුමු ; සොතවන්තො, කන් ඇත්තෝද ; තෙසං, ඔවුන්ට ; අමතස්ස, නිර්වාණ (පුර) යාගේ ද්වාරා, (ආර්‍යමාර්ගසඞ්ඛ්‍යාත) ද්වාරයෝ ; අපාරුතා, නොවසනලද්දූහ (විවෘතකරණලද්දූහ) ; සද්ධං, ශ්‍රද්ධාව ; පමුඤ්චන්තු, මුදත්වා (විහිදුවත්වා) ; බ්‍රහ්මෙ, බ්‍රහ්ම (රාජ) ය ; පණීතං, ප්‍රණීතවූ ; පගුණං, ප්‍රගුණවූ ; ධම්මං, ධර්මය ; විහිංසසඤ්ඤී, පීඩා සංඥා ඇත්තෙම් ; (හෙවත් ධර්ම ගාම්භීර්‍යය නිසා අක්ෂමවූ මිනිසුන්ට දෙසීම පීඩා කරය යන අදහසින්) ; මනුජෙසු, මිනිසුන් අතුරෙහි ; න භාසිං, නොකීමි (යි වදාළෝ).

488. සො චතුරාණනො, ඒ චතුර්මුඛතෙම ; මෙ, මාගේ ; අජ්ඣෙසනං, ආරාධනාව ; පටිග්ගහෙසි ඉති, (බුදුහු) පිළිගත්සේකැයි ; උදග්ගචිත්තො, ඔද්වැඩි සිත් ඇත්තේ ; සහපාරිසජ්ජො, පාරිෂද්‍ය සහිතවූයේ ; නාථං, (ලොක) ස්වාමීන් වහන්සේ ; නත්වාන, වැඳ ; තම්හා, එසින් (නික්ම) ; භවනං, (ස්වකීය) භවනයට ; ඛණෙන, ක්ෂණයකින් ; පක්කාමි, ගියේය.

489. තතො, ඉක්බිති ; තෙන, ඒ මහාබ්‍රහ්මයා විසින් ; ගහිතඅනුඤ්ඤො, ගන්නාලද අනුඥා ඇත්තාවූ ; ධීරෙ, ධීරවූ ; ජිනො, සර්වඥතෙම ; කස්ස, කවරෙකුට ; (ධම්මං) දෙසෙමි ඉති, (දහම්) දෙසම්දැයි ; උදික්ඛමානො, බලා වදාරණසේක් ; අළාරඋද්දෙ, අළාරඋද්‍රකරාමයන් ; සමුදික්ඛ, බලා වදාරා ; තෙසං, ඔවුන්ගේ ; අචිරච්චුතත්තං, මිය නොබෝකල් ඇති බව ; ඤත්වාන, දැනවදාරා

---

* මේ ගාථාව දේශනාපාලියි.

90. කහන්නුබො'හං වරධම්මචක්කං
අඤ්ඤෙන කෙනාපි අවත්තනීයං,
ලොකස්ස චින්තාමණිසන්නිභග්ගං
පවත්තයිස්සන්ති විචින්තයන්තො.

491. දිස්වාන භික්ඛූ මුනි පඤ්චවග්ගෙ
ආදාය පත්තඤ්ච තිචීවරඤ්ච,
බාරාණසීයං මිගදායමෙන්තො,
අද්ධානමග්ගං පටිපජ්ජි සත්ථා.

492. තත්ථාමරබ්‍රහ්මගණෙහි පූත
පථෙ ඵණී පක්ඛී චතුප්පදා ච,
ආරඤ්ඤදෙවා තරුපබ්බතා ච
මහිංසු නෙකෙහි සුවිම්හයෙහි.

---

490. අහං, මම; අඤ්ඤෙන කෙන අපි, අන් කිසිවෙක් විසිනුදු; අවත්තනීයං, නොපැවැත්විය හැක්කාවූ; ලොකස්ස, ලොවට; චින්තාමණිසන්නිභං, සිතුමිණක් බඳුවූ; අග්ගං, අග්‍රවූ; වරධම්මචක්කං, උතුම්වූ ධම්මචක්‍රය; කහං නුඛො, කොතැන්හි නම්; පවත්තයිස්සං ඉති, පවත්වන්නෙම්දැයි; විචින්තයන්තො, සිතනසේක් :—

491. මුනි, (මහා) මුනිවූ; සත්ථා, ශාස්තෘන්වහන්සේ; පඤ්චවග්ගෙ භික්ඛූ, පස්වග භික්ෂූන්; දිස්වාන, දැක; පත්තං ච, පාත්‍රයද; තිචීවරංච, තුන්සිවුරුද; ආදාය, රැගෙණ; බාරාණසීයං, බාරාණසී නම් නගරයෙහිවූ; මිගදායං, මෘගදාය නම් ඉසිපතනාරාමයට; එන්තො, වඩනේ; අද්ධානමග්ගං, අදුන් මගට; පටිපජ්ජි, පිළිපන්සේක.

492. තත්ථ, එහි; අමරබ්‍රහ්මගණෙහි, දිව්‍යබ්‍රහ්මසමූහයා විසින්; පූත, පවිත්‍රකරණලද; පථෙ, මාර්ගයෙහි; ඵණී, නාගරාජයෝද; පක්ඛී, පක්ෂීහුද; චතුප්පදා ච, සිව්පාවෝද; ආරඤ්ඤදෙවා, වනවාසි දෙවතාවෝද; තරුපබ්බතා ච, වෘක්ෂ හා පර්වතයෝද; අනෙකෙහි, නොයෙක්; සුවිම්හයෙහි, ඉතා විස්මය දෙසින්; මහිංසු, (ලෝතුමන්) පිදූ.

493. තතොපගො සො මිගදායමග්ගෙ
දිස්වා යතීසං යතයොපගන්ත්වා,
අකංසු වත්තං පටිපත්තිසාරා
පවත්තයී තත්‍ථ ස ධම්මචක්කං.

494. අඤ්ඤාදිකොණ්ඩඤ්ඤවසිප්පධානා
කොටීනමට්ඨාරස බ්‍රහ්මයානී,
අසීතිකොටී'පි සුධාසිසඞ්ඝා
අඤ්ඤාසුමග්ගං කමතො තදා තෙ.

495. අතිච්චයාතම්හි නිදාඝකාලෙ
වස්සානකාලෙ සමුපාගතස්මිං,
තත්ථෙව වස්සං උපගම්ම ධීරො
තෙමාසමත්තං අවසී වසී සො.

---

493. තතො, ඉක්බිති; සො, හෙතෙම; මිගදායං, මෘගදාය වට; උපගො, එළඹියේක; යතයො, (කොණ්ඩඤ්ඤාදී) යතිහු; අග්ගෙ, ඉදිරියෙහි (වඩනාවූ); යතීසං, යතිශ්‍රෙෂ්ඨවූ සම්‍යක් සම්බුදුන්වහන්සේ; දිස්වා, දැක; උපගන්ත්වා, වෙතට පැමිණ; පටිපත්තිසාරා, ප්‍රතිපත්ති නැමැති වස්තුවෙන් ; (තොහොත) ප්‍රතිපත්ති සාරවස්තුකොට ඇත්තාහු; වත්තං අකංසු, වත් කළාහුය; සො, උන්වහන්සේ; තත්ථ, එහි; ධම්මචක්කං, ධර්මචක්‍රය; පවත්තයී, පැවැත්වූසේක.

494. තදා, එවේලෙහි: අඤ්ඤාදිකොණ්ඩඤ්ඤ, 'අඤ්ඤා' යනු ආදිකොට ඇති;* කොණ්ඩඤ්ඤ නම්වූ; වසිප්පධානා, තාපසවින් ප්‍රධානකොට ඇත්තාවූ (පස්වගමහණ) හුද; කොටීනං, කෙළක් සම්බන්ධවූ; අට්ඨාරස බ්‍රහ්මයානී, අටළොසක් බ්‍රහ්ම යෝද; (අටළොස්කෙළක් බ්‍රහ්මයෝද); අසීතිකොටි, අසූකෙළක්වූ; සුධාසිසඞ්ඝා අපි, දිව්‍යසමූහයෝදයි; තෙ, ඒ සම්ප්‍රාප්ත ජනයෝ; මග්ගං (අග්ගං), ආර්‍ය්‍යමාර්ගය; කමතො, අනුක්‍රමයෙන්, අඤ්ඤාසුං, අවබොධකළාහුයි.

495. නිදාඝකාලෙ, ග්‍රීෂ්මකාලය; අතිච්චයාතම්හි, ඉක්ම ගිය කල්හි; වස්සානකාලෙ, වර්ෂා ඍතුව; සමුපාගතස්මිං, සම්ප්‍රාප්ත කල්හි; ධීරො, ප්‍රාඥවූ; වසී සො, (ඒ) මහත්වූ බුදු රජතෙම; තත්ථෙව, ඒ බරණැස්නුවර ඉසිපතනාරාමයෙහිම; වස්සං උපගම්ම, වස්එළඹ; තෙමාසමත්තං, තුන්මසක් පමණ; අවසී, විසූසේක.

---

* "අඤ්ඤාසි වත භො කොණ්ඩඤ්ඤො" යි අප බුදුසඳුන්ස් පළමු කොට නිවන් අවබොධකළ මුන්වහන්සේට "ඉතිහිදං ආයස්මතො කොණ්ඩඤ්ඤස්ස අඤ්ඤාකොණ්ඩඤ්ඤොත්වෙව නාමං අහොසි" යි "අඤ්ඤා" යනු ආදිකොට ඇතිවේ.

496. තතො යසං තස්ස සහායකෙ'පි
පතිට්ඨපෙත්වා අරහත්තමග්ගෙ,
භූතිං ජනානං අනුබ්‍රූහයන්තො
වස්සස්ස අන්තං අකරී තහිං සො.

497. වස්සච්චයෙ ලොකවිදූ මුනින්දො
ආමන්තයී තෙ යතයො සපුත්තෙ,
තෙ'ථාගමුං නිබ්බණිථා කතඤ්ජලී
'දමබ්‍රවී තෙසමනන්තපඤ්ඤො.

498. උග්ඝොසයන්තා මම ධම්මඝොසං
සමාහනන්තා මම ධම්මභෙරිං
සාධුං ධමෙන්තා මම ධම්මසඞ්ඛං
චරාථ තුම්හෙ සනරාමරානං.

---

496. තතො, ඉක්බිති; සො, ඒ මහෂීවූ සර්වඥතෙම; යසං, යසනම් කුලපුත්‍රයාද; තස්ස සහායකෙපි, ඔහුගේ යහළුවන්ද; අරහත්තමග්ගෙ, අර්හත්මාර්ගයෙහි; පතිට්ඨපෙත්වා, පිහිටුවා; ජනානං, ජනයන්ට; භූතිං, සම්පත්තිය; අනුබ්‍රූහයන්තො, වර්ධනය කෙරෙමින්; තහිං, එහිම; වස්සස්ස, වස; අන්තං අකරි, කෙළවර කළසේක.

497. ලොකවිදූ, (චරිතාධිමුක්ත්‍යාදි විසින්) ලොකය දන්නා සුළුවූ; මුනින්දො, මුනීන්ද්‍රයන්වහන්සේ; වස්සච්චයෙ, වස්ගෙවී මෙහිදී; සපුත්තෙ, ස්වකීය පුත්‍රවූ; තෙ යතයො, ඒ යතීන්; ආමන්තයී, කැඳවා වදාළසේක; අථ, ඉක්බිති; නිබ්බණිථා, නිකුත්කළ තෘෂ්ණා ඇති; කතඤ්ජලී, කරණලද ඇඳිලිඇති; තෙ, ඔහු තුමූ; ආගමුං, ආවාහුය; අනන්තපඤ්ඤො, අනන්ත ප්‍රාඥවූ සර්වඥතෙම; තෙසං, ඔවුන්ට; ඉදං, මෙ (වක්‍ෂ්‍යමාණ කාරණ)ය; අබ්‍රැවී, වදාළසේක.

498. තුම්හෙ, (මහණෙනි) තෙපි; සනරාමරානං, දෙව්මිනිස් සහිත ලොකයාට; මම, මාගේ; ධම්මඝොසං, ධර්මඝොෂාව; උග්ඝොසයන්තා, අස්වමින්; මම, මාගේ; ධම්මභෙරිං, ධර්මනැමැති භෙරිය; සමාහනන්තා, මොනවට ගසමින්; මම, මාගේ; ධම්මසඞ්ඛං, ධර්මනැමැති සඞ්ඛය; සාධුං, මනාකොට; ධමෙන්තා, පිඹිමින්; චරාථ, (දෙව්මිනිස් සහිත ලොවැ) හැසිරෙව්.

ශ්‍රී ලංකා ජාතික

499. ජයධජං මෙ භුවනුක්ඛිපන්තා
උස්සාපයන්තා මම ධම්මකෙතුං,
අථුක්ඛිපන්තා මම ධම්මකුන්තං
චරන්ති ලොකෙසු සදෙවකෙසු.

500. සුසජ්ජිතත්තං අමතස්ස මග්ගං
සකණ්ටකත්තං නරකායනස්ස,
මාරානනස්මිං මසිමක්ඛිතත්තං
කථෙන්ති ලොකස්ස සදෙවකස්ස.

501. බුද්ධන්තරං සුපිහිතං අවාරං
පුරස්ස මොක්ඛස්ස විසාලවාරං (16),
අවාපුරී නො භගවා'ධුනා භො
යාථජ්ජ සම්බොධි නිවෙදයමෙහා.

---

499. මේ, මාගේ; ජයධජං, විජයධ්වජය; භුවනෙ, ලොකයෙහි; උක්ඛිපන්තා, ඔසවමින්; මම, මාගේ; ධම්මකෙතුං, ධර්ම නැමැති කෙතුව; උස්සාපයන්තා, ඔසවමින්; අථ, තවද; මම, මාගේ; ධම්මකුන්තං, ධර්ම නැමැති කොන්තය; උක්ඛිපන්තා, නගමින්; සදෙවකෙසු, දෙවියන් සහිතවූ; ලොකෙසු, ලෙව්හි; චරන්ති, හැසිරෙත්.

500. අමතස්සමග්ගං, නිර්වාණමාර්ගය; සුසජ්ජිතත්තං, මොනවට සදනලද්දබවද; නරකායනස්ස, අපායමාර්ගයාගේ; සකණ්ටකත්තං, කටුසහිතබවද; මාරානනස්මිං, මාරයාගේ මුහුණෙහි; මසිමක්ඛිතත්තං, දැලිවැකූබවද; සදෙවකස්ස, දෙවියන් සහිතවූ; ලොකස්ස, ලොකයාහට; කථෙන්ති, කියත්.

501. භො, භවත්නි; නො, අපගේ; භගවා, භාග්‍යවතුන් වහන්සේ; බුද්ධන්තරං, බුද්ධාන්තරයක් මුළුල්ලෙහි; සුපිහිතං, අතිශයින් වසනලද්දාවූ; අවාරං, දනන් හැසුරුම් නැත්තාවූ; මොක්ඛස්ස පුරස්ස, නිර්වාණපුරයාගේ; විසාලවාරං, විසල් දොර; අවාපුරි, හැරියේය; අධුනා, දැන්; සම්බොධි, සියල්ලෝ; යාථ ඉති, (නිවන්මග) යව ත්‍යා; නිවෙදයමෙහා, දැන්වූ.

502. උප්පන්නභාවං භුවනෙ මමජ්ජ
තථෙව ධම්මස්ස ච පාතුභාවං,
උප්පන්නභාවඤ්ච මමොරසානං
පකාසයන්තා ජගතිං චරාථ.

503. වනම්හි පන්තෙ ගිරිගබ්භරායං
රුක්ඛස්ස මූලෙ'පි ච සුඤ්ඤ'ගාරෙ,
වසං යතන්තා මම ධම්මමග්ගං
දෙසෙථ ලොකෙ සනරාමරානං.

504. වත්වාන එවං යතයො දිසාසු
පෙසෙත්ව නාථො උරුවෙලගාමී,*
පටිපජ්ජ (17) මග්ගං අථ අන්තරාලෙ
කප්පාසිකව්හං විපිනං පවිස්ස.

502. භුවනෙ, ලොකයෙහි ; මම, මා ; උප්පන්නභාවං, උපන්බවද ; තථා එව, එසේම ; ධම්මස්ස පාතුභාවං ච, ධර්මය පහළවීමද ; මම, මාගේ ; ඕරසානං, ඖරසවූ ශ්‍රාවක යන් ; උප්පන්නභාවඤ්ච, උපන්බවද ; පකාසයන්තා, ප්‍රකාශ කරමින් ; අජ්ජ, මේ කාලයෙහි ; ජගතිං චරාථ, ලොව හැසිරෙව්.

503. වනම්හි, වනයෙහිවූ ; පන්තෙ, ඉතාදුරසෙනසුන් හිද ; ගිරිගබ්භරායං, පර්වතගුහාවෙහිද ; රුක්ඛස්ස මූලෙපිච, වෘක්ෂමූලයෙහිද ; සුඤ්ඤාගාරෙ, ජනවිවිකතාගාරයෙහිද ; වසං, වාසයකරමින් ; යතන්තා, උත්සාහාත්මක වූවාහු ; මම, මාගේ ; අග්ගං, අග්‍රවූ ; ධම්මං, ධර්මය ; (නොහොත්) ධම්ම මග්ගං, ධර්මමාර්ගය ; ලොකෙ, ලෙව්හි ; සනරාමරානං, දෙව්මිනිස් සහිතයන්ට ; දෙසෙථ, දෙසව්.

504. නාථො, සර්වඥයන්වහන්සේ : එවං, මෙසේ ; වත්වා න, වදාරා ; යතයො, යතීන් (සැටනම) ; දිසාසු, දිශාවන්හි : පෙසෙත්වා, යවා ; උරුවෙලගාමී, උරුවෙල්දනව් ගැමිවූ සේක් ; මග්ගං, මගට ; පටිපජ්ජ, පිළිපන ; අථ, අනන්තර යෙන් ; අන්තරාලෙ, (බරණැස ඉසිපතනාරාමයට හා උරු වෙල් දනව්වටත්) අතරෙහි ; කප්පාසිකව්හං, කප්පාසික නම්වූ ; විපිනං, වනසඬයට ; පවිස්ස, වැඩ :—

* "උරුවෙල ගාමිං."

505. තස්මිං රමණෙය්‍යෙ සමතිංසමත්තෙ
රාජෝරසෙ සො පවරො විනෙත්වා,
දත්වා'මතං ධම්මමුදීරයිත්වා
අගෝරුවෙලං ගජරාජගාමී.

506. තත්‍ථොරුවෙලාධිකකස්සපොති
පසිද්ධනාමස්ස සසිස්සකස්ස,
අග්ගං ඵලං සො පරිපාචයන්තො
වසී වසන්තො වසිනං වරිට්ඨො.

507. තදාහරුං නෙගමනාගරා ච
යඤ්ඤං මහාකස්සපතාපසස්ස,
ජිනො විදිත්වාස්ස මනං මනෙන
වසී විසුං තස්ස පසාදහෙතු.

කථං ?

---

505. පවරො, උතුම්වූ; සො, ඒ සර්වඥයන්වහන්සේ; තස්මිං, ඒ කපාසික නම් වනලැහැබෙහි; රමණෙය්‍යෙ, (ස්ත්‍රීන් සමග) අභිරමණීය කරන්නාවූ; සමතිංසමත්තෙ, සමතිසක් පමණවූ; රාජෝරසෙ, භාද්‍රවර්ගීය රාජකුමාරයන්; විනෙත්වා, හික්මවා; ධම්මං, ධර්මය; උදීරයිත්වා, දෙසනාකොට; අමතං, නිර්වාණය; දත්වා, දී; අථ, ඉක්බිති; ගජරාජගාමී, ගජේන්ද්‍රගාමීසේක්; උරුවෙලං, උරුවෙල් දනව්වට; අගා, වැඩිසේක.

506. තත්‍ථ, එහි; සසිස්සකස්ස, ශිෂ්‍යයන්සමගවූ; උරුවෙලාධිකකස්සපො ඉති, උරුවෙල ශබ්දය අධිකකොට ඇති කාශ්‍යපයයි; පසිද්ධනාමස්ස, ප්‍රසිද්ධ නාමයක් ඇති (උරුවෙල් කසුප්)හට; අග්ගං ඵලං, අග්‍රඵලය (අර්හත්ඵලය); පරිපාචයන්තො, මුහුකුරුවමින්; වසිනං වරිට්ඨො, වසීන්ට අතිශයින් උතුම්වූ; සො, ඒ සර්වඥයන්වහන්සේ; වසන්තො, වසනාකාලයෙහි; වසී, වුසූසේක.

507. තදා, එසමයෙහි; නෙගමා, නියම්ගම්වාසීහුද; නාගරා ච, නුවරවාසීහුද; මහාකස්සපතාපසස්ස, උරුවෙල් මහකසුප් තවුසානන්ට; යඤ්ඤං, යාගද්‍රව්‍ය; ආහරුං, ගෙණහ; ජිනො, සර්වඥතෙම; අස්ස, ඔහුගේ; මනං, සිත; මනෙන, (තමන්) සිතින්; විදිත්වා, දැන; තස්ස, ඔහුගේ; පසාදහෙතු, පැහැදීම හෙතුකොටගෙණ; විසුං, වෙන්ව; වසී, වුසූසේක. (හේ) කෙසේද ?

508. ගන්ත්වාන උත්තරකුරුං භගවා තදනි
පිණ්ඩචරිත්ව රමණීයහිමාලයද්දිං,
ආගම්ම සාදුරසනීරහරාභිරාමෙ
'නොතත්තකෙ මුනිවරො පරිභුජියාන.*

509. චින්තෙසි එවමහමප්පතරංව කාලං
ඨස්සාමි සාසන මමං හි අනාගතෙසු,
ලඞ්කාතලෙ භවති තත්ථ ඉදානි යක්ඛ
සම්බාධමත්ථි මම තත්ථ ගතෙසුදානි.

510. සබ්බාමනුස්සජභයං පවිනස්සතීති
මන්ත්වා තතො යතිවරො කරුණාය සත්තෙ;
සඞ්ඛාසනෙහි පරිනබ්බරවිව රත්තං
නිග්‍රොධපක්කසදිසං වරපංසුකූලං.

---

508. මුනිවරො; මුනිශ්‍රෙෂ්ඨවූ; භගවා, භාග්‍යවතුන්වහන්සේ; තදනි, එකල්හි; උත්තරකුරුං ගන්ත්වාන, උතුරුකුරුදිවයිනට වැඩ; පිණ්ඩං චරිත්වා, පිඩුපිණිස හැසිර; රමණීය, සිත්කලුවූ; හිමාලයද්දිං, හිමාලයපර්වතයට; ආගම්ම, ආගමනයකොට; සාදුරස, මිහිරිරස ඇත්තාවූ; නීරහර, දියබරින්; අභිරාමෙ, සිත්කලුවූ; අනොතත්තකෙ, අනවතප්තවිල සමීපයෙහි; පරිභුජියාන, (පිණ්ඩපාතාහාරය) වළඳා :—

509. එවං, මෙසේ; චින්තෙසි, සිතී; අහං, මම; අප්පතරං එව, ඉතා ස්වල්පවූම; කාලං, කාලයක්; ඨස්සාමි, (ජීවමානව) සිටින්නෙමි; අනාගතෙසු, මතුවන කල්හි; මමං, මාගේ; සාසනං හි, ශාසනයනම්; ලඞ්කාතලෙ, ලක්දිව්තෙලෙහි; භවති, (ඇති) වන්නේය; තත්ථ, එහි; ඉදානි, දැන්; යක්ඛසම්බාධං, යක්ෂපීඩා; අත්ථි, ඇත්තේය; ඉදානි, දැන්; තත්ථ, එහි; මම, මාගේ; ගතෙසු, ගමන්හි :—

510. සබ්බ, සියලු; අමනුස්සජභයං, අමනුෂ්‍යයන්ගෙන් වන භය; පවිනස්සතීති, විධ්වංසනය වන්නේයයි; මන්ත්වා, දැන; තතො, ඉක්බිති; යතිවරො, යතිවර්‍ය්‍යතෙම; සත්තෙ, සත්වයන්කෙරෙහි; කරුණාය, කුළුණින්; සඞ්ඛාසනෙහි, සන්ධ්‍යාවලාහයෙන්; පරිනබ්බ, වළඳනාලද; රවි ඉව, සූර්‍ය්‍යයා මෙන්; රත්තං, රත්වූ; නිග්‍රොධපක්කසදිසං, නුගපලවන්වූ; වරපංසුකූලං, උතුම් පාංශුකූල චීවරය :—

---

* "පරිභුඤ්ජියානං."

ශ්‍රී ලංකා ජාතික

511. ධාරෙත්ථ සෙලමයසුන්දරපත්තහත්ථො
ඡබ්බණ්ණරංසිනිචයං දිසි පූරයන්තො,
සම්බොධිතො නවමපූසසපුණ්ණමායං
ලඞ්කාතලං විජයිතුං නභසා'ගමාසි.

512. බ්‍රහ්මාසුරාමරඵණී ගරුළා ච සිද්ධ
විජ්ජාධරාදි ජනතා සහපාරිසජ්ජා,
කෙත්වාතපත්තඝටදීපුරුතොරණෙහි
පූජං අකංසු මහතිං ගගනායනම්හි.

513. ලඞ්කඞ්ගනාඋරසි භාසුරතාරහාර
සඞ්කාසසීතලමනොහරනීරපූරා,
තස්මිං මහාදිපදවාලුකනාම ගඞ්ගා
භූමජ්ඣගාසි ජනනෙත්තහරාභිරාමා.

---

511. ධාරෙත්වා, දරා; සෙලමය, ශෛලමයවූ; සුන්දර, සොඳුරුවූ; පත්තහත්ථො, පාත්‍රධරහස්ත ඇත්තේ; ඡබ්බණ්ණරංසිනිචයං, ෂඩ්වර්ණ (සත) බුධරශ්මිකදම්බය; දිසි, දික්හි; පූරයන්තො, පුරවන්නේ; සම්බොධිතො, සම්‍යක්සම්බොධියෙන්; නවම, නවවැනිවූ; පූසසපුණ්ණමායං, දුරුතුමැදි පොහෝ දිනයෙහි; ලඞ්කාතලං, ලක්දිව්තලය; විජයිතුං, දිනන්ට; නභසා, අහසින්; ආගමාසි, වැඩිසේක.

512. සහපාරිසජ්ජා, පිරිවර ජනයන් සහිතවූ; බ්‍රහ්ම, බ්‍රහ්මයෝද; අසුර, අසුරයෝද; අමර, දෙවියෝද; ඵණී, නාගරාජයෝද; ගරුළා ච, ගරුඩරාජයෝද; සිද්ධවිජ්ජාධරාදි, සිද්ධවිද්‍යාධරාදීවූ; ජනතා, ජනසමූහයාද; කෙතු, ධ්වජය; ආතපත්ත, ඡත්‍රය; ඝට, (පුන්) කලශය; දීප, පහන්ඇඟෑය; උරු, මහත්වූ; තොරණෙහි, තොරණ්ය යන මෙයින්; ගගනායනම්හි, වියදමාර්ගයෙහිදී; මහතිං, මහත්වූ; පූජං, පූජා; අකංසු, කළාහුයි.

513. ලඞ්කඞ්ගනා, ලකඟනගේ; උරසි, වක්ෂසෙහි; භාසුර, බබලන්නාවූ; තාර, මහත්වූ; හාරසඞ්කාස, මුක්තාහාරයක් වැනිවූ; සීතල, සිහිල්වූ; මනොහර, මනොඥවූ; නීරපූරා, ජලයෙන් පිරුණාවූ; ජනනෙත්තහරා, දනනුවන් පැහැරගන්නාවූ; අභිරාමා, අතිශයින් සිත්කළුවූ; මහාදිපද, මහා යනු ආදිපදකොට ඇති; වාලුකනාමගඞ්ගා, වාලුකනම් ගඟාව හෙවත් මහවැලිගඟ; තස්මිං, ඒ ලක්දිව්තෙලෙහි; භූමජ්ඣගා අසි, පෘථිවිමධ්‍යගත වී.

514. තස්සාවිදූරසුචිරම්මතරෙ පදෙසෙ
ආයාමතො මිතතියොජන විත්ථතෙන,
චත්තාරි ? ගාවුතමිතං නයනාභිරාමං
ආසාරසීතජලනිජ්ඣරභූරිඝොසං.

515. මත්තාලිපාලිඛග ගීතිජමිස්සරාගං
සම්මත්තචිත්තමිගසඞ්ඝනිසෙවිතං තං,
නච්චන්තනෙකසිඛිසඞ්ඝතපාදපින්දං
උය්‍යානමාසි උරුනාගවනාභිධානං.

516. රම්මෙ තදා රතනදීපවරම්හි ලඞ්කා
ලොකාභිධානහරිකණ්ඩකයක්ඛදෙසෙ,
ඔදුම්බරෙ සුමනකූටකතම්බුලෙය්‍ය
සෙලෙසු මාරගිරිමිස්සකරිට්ඨනාමෙ.

---

514. තස්සා, ඒ මහවැලිගඟට ; අවිදූර, නුදුරෙහිවූ ; සුචි, පවිත්‍රවූ ; රම්මතරෙ, අතිරම්‍යවූ ; පදෙසෙ, ප්‍රදෙශයෙහි ; ආයාමතො, අයමින් ; මිත, පමණකරණලද ; තියොජනං, තුන්යොදුන් ඇත්තාවූ ; විත්ථතෙන, විතරින් ; චත්තාරි ගාවුතමිතං, සතරගව් පමණ කරණලද්දාවූ ; නයනාභිරාමං, නෙත්‍රොත්සවවූ ; ආසාර, වෙගවත්වූ ; සීතජල, සිහිල්දිය ඇත්තාවූ ; නිජ්ඣර, ගඟුලැල්ලන්ගේ ; භූරිඝොසං, බොහෝවූ ඝොෂා ඇත්තාවූ ;—

515. මත්ත, මත්වූ ; අලිපාලි, භෘඞ්ගශ්‍රෙණීන්ගේද ; ඛග, පක්ෂීන්ගේද ; ගීතිජ, ගීතිමයවූ ; මිස්සරාගං, ශ්‍රෙෂ්ඨ රාගය ඇත්තාවූ ; සම්මත්ත, ඉතා මත්වූ ; චිත්ත, විචිත්‍රවූ ; මිගසඞ්ඝ, මුවසමූහයෙන් ; නිසෙවිතං, නිති සෙවනාවූ ; නච්චන්ත, නෘත්‍යකරන්නාවූ ; අනෙකසිඛිසඞ්ඝත, නොයෙක් මොණරුන්ගෙන් යුක්තවූ ; පාදපින්දං, වෘක්ෂරාජයන් ඇත්තාවූ ; උරුනාගවනාභිධානං, මහානාගවනය යන නම් ඇති ; උය්‍යානං, උයනක් ; ආසි, වී.

516. තදා, එකල්හි ; රම්මෙ, රම්‍යවූ ; රතනදීපවරම්හි, රත්නද්වීපප්‍රවරයෙහි ; ලඞ්කාලොකාභිධාන, ලඞ්කාලොක යන නම් ඇති (හෙවත්) ලඟ්ගල් ලොග්ගල් නම් ඇති ගල්ය ; හරිකණ්ඩක, හරිකණ්ඩක ගලය ; යක්ඛදෙසෙ, යක්දෙස් සාගලය යන මෙහිද ; ඔදුම්බරෙ, දිඹුලාගලෙහිද ; සුමනකූට, සමන්කුලය ; තම්බුලෙය්‍ය, (රොහණජනපදයෙහි) කූර ගලය යන මෙහිද ; මාරගිරි, මාරගලය ; මිස්සක, මිහින්තලාගල හා ; රිට්ඨනාමෙ, රිටිගලය යන මෙහිදැයි ; සෙලෙසු, (යථොක්ත) පර්වතයන්හිද:—

517, යෙ'ඤ්ඤෙපි සන්ති ගිරයො වනරම්මණෙය්‍යකා
ගඟා නදී ගිරිගුහාසිකතාතලා ච,
තත්ථාවසන්ති රහසා ඵරුසාතිරුද්දා
පාණාතිපාතනිරතා සඞ්කුටයක්ඛා.

518. සඞ්ගම්ම තෙ මහති නාගවනම්හි තම්හි
සම්මන්තයිංසු සහටා සහපාරිසජ්ජා,
ත්වං කො'සි රෙ ඉති පරෙණ අපරං ඛරෙන
තික්ඛෙන වාදකණෙන අරුන්තුදන්තා.

---

517. යෙ, යම්; අඤ්ඤෙ, (පුත්ජලපර්වතය, බලුගලය, මහමුහුණුගල්ලය, යහන්ගලය, තුන්කළුපර්වතය යනාදී) අන්‍යවූ; ගිරයො අපි, පර්වතයෝද; වන, (සනාතනවනාදිවූ) වනහා; රම්මණෙය්‍යක, රමණීය ස්ථානයෝද; ගඞ්ගා, (කැලණි, මාවැලි, කාලු; වලවේ යනාදිවූ) ගඞ්ගාවෝද; නදී, (දුනුතුඹුනදිය, දඳුරඔය, නිල්වලාහොය යනාදී) නදීහුද; ගිරිගුහා, (හත්ථවාගුහාය, ඉසිගුහාය, හසමගුහාය යනාදී) පර්වතගුහාවෝද; සිකතාතලාච, (මහවැලිතලා ආදී) වාලුකාතලයෝද; සන්ති, ඇත්තාහුද; තත්ථ, ඒ (සඳොකත) ස්ථානයන්හි; රහසා, වෙලෙව්වූ; ඵරුසා, කඨෝරවූ; අතිරුද්ද, අතිශයින් රෞද්‍රවූ; පාණාතිපාත, සත්වඝාතනයෙහි; නිරතා, නිරන්තරාභිසක්තවූ; සඞ්කුටයක්ඛා, සැලඅඹුළු යක්ෂයෝ; ආවසන්ති, වෙසෙත්.

518. සහටා, හටයන් සහිතවූ; සහපාරිසජ්ජා, පිරිවරයකුන් සහිතවූ; තෙ, ඒ යක්ෂයෝ; අරෙ, කොල; ත්වං, තෝ; කොසි ඉති, කවරෙක් වෙහිදැයි; අපරෙණ, අනිකෙක්; අපරං, අනිකෙකු; ඛරෙන, කෲරවූ; තික්ඛෙන, තියුණුවූ; වාදකණෙන, වාදනැමැති අඩයටියෙන් (උලින්); අරුන්තුදන්තා, මර්මපීඩාකරන්නාහු; තම්හි මහති නාගවනම්හි, ඒ මහානාගවනයෙහි; සඞ්ගම්ම, රැස්ව; සම්මන්තයිංසු, මන්ත්‍රණය කළාහුය.

519. කුජ්ඣිංසු තෙ අථිතරීතරකාරණෙන
වාක්‍යෙන යුද්ධපරිරබ්ධපගබ්භිතත්තා,
සම්බාධිතාපගපතීව නවට්ඨිතත්තා
සාරම්භගබ්භිතමනා පරිරාවයන්ති.

520. තස්මිං ඛණෙ'භිමතදෙ සුගතො නභම්හි
අගම්ම තෙසමනුකම්පිතමානසෙන,
ගොපානසීසමමනොහරරංසිමාලි
තත්‍රච්ඡි ඛෙ ගුණමණී මණිකණ්ණිකාව.

521. තෙසං ජිනො කලහවූපසමාය හෙතු
මාපෙසි වුට්ඨිතිමිරානිලසීතභීතිං,
තත්‍රාසි ගජ්ජිතඝනො සුරචාපචිත්ත
ධාරාසරෙහි විතුදං නිසිචාරසඞ්ඝං.

---

519. අථ, ඉක්බිති; තෙ, ඒ යක්ෂයෝ; යුද්ධපරිරබ්ධපගබ්භිතත්තා; යුද්ධාරම්භයෙහි ප්‍රගල්භ සිත් ඇත්තාහු; ඉතරඉතර කාරණෙන, අන්‍යෝන්‍යකාරණා ඇති; වාක්‍යෙන, වචනයෙන්; කුජ්ඣිංසු, කිපියාහුය; සම්බාධිත, කැලඹියාවූ; ආපගපතීඉව, සාගරයමෙන්; අනවට්ඨිතත්තා, අනවස්ථිත සිත්ඇත්තාහු; සාරම්භ, කරණොත්තර කරණයෙන්; ගබ්භිතමනා, ගර්විත සිත් ඇත්තාහු; පරිරාවයන්ති, මහත්කොට හඬොවිත්.

520. තස්මිං ඛණෙ, එකෙණෙහි; අභිමතදෙ, අභිමතාර්ථ දායකවූ; ගොපානසීසම, ගොනැස්වැනි; මනොහර, මනොඥවූ; රංසිමාලි, රැස්මාලා ඇත්තාවූ; ගුණමණී, ශීලසමාධ්‍යාදි ගුණනැමැති මිණි ඇති; සුගතො, සර්වඥයන්වහන්සේ; තෙසං, ඒ යක්ෂයන්ට; අනුකම්පිත මානසෙන, කුළුණුසිතින්; නභම්හි, අහස; අගම්ම, වැඩ, මනිකණ්ණිකා ඉව, මිණි කැණිමඬුල්ලක් මෙන්; තත්‍ර, එතන්හිවූ; ඛෙ, ආකාශයෙහි; අච්ඡි, උන්සේක.

521. ජිනො, සර්වඥතෙම; තෙසං, ඒ යක්ෂයන්ගේ; කලහවූපසමාය, ඬබර සංසිඳවීමට; හෙතු, හෙතුවූ; වුට්ඨි, වැසි බියද; තිමිර, අඳුරුබියද; අනිල, වාබියද; සීතභීතිං, සීතලබියද; මාපෙසි, මැවූසේක; සුරචාප, ඉඳුසැව්වෙන්; චිත්ත, විදිතලද; ධාරා, දියදහරනැමැති; සරෙහි, ඊතලවලින්; නිසිචාරසඞ්ඝං, යක්ෂසමූහයා; විතුදං, පෙළන්නාවූ; ගජ්ජිත, ගිගුම්ගත්; ඝනො, මෙඝයක්; තත්‍ර, එහි; ආසි, වී.

522. අන්ධාව තෙ ඝනතරෙ තිමිරෙ නිමුග්ගා
මූළ්හා දිසඤ්ච විදිසං න විදිංසු භීතා,
චණ්ඩානිලුබ්බට මහාගිරිකූටරුක්ඛ
සම්පාතභීත රුදිතා ගතිමෙසයන්ති.

523. සීතෙන තෙ අථ දිජෙ පරිකොටයන්තා
අඤ්ඤොඤ්ඤසඤ්ඤගතගත්තමවලම්බ පරෝදිසිංසු.
රූපානි නෙකභයදානි ච ඝොසණන්ති,
වත්තිංසු තෙන විවිධං භයමාසි තෙසං.

524. බුද්ධාපි දුක්ඛිතමනා පරදුක්ඛකෙන
කස්මා කරොන්ති අනයං'ති න චින්තනීයං,
ලොකො හනාති විටපී ඵලදානහෙතු
සත්ථෙන සොමරිපුගාහකවාසරම්හි.

---

522. ඝනතරෙ, අතිශයින් ඝනවූ; තිමිරෙ, අඳුරෙහි; නිමුග්ගා, ගැලුනාවූ; අන්ධා එව, කිසිවක් නොදක්නා ගෙන්නාවූම (නොපෙණෙන්නාවූම); භීතා, බියපත්වූ; මූළ්හා, මුළාවූ; තෙ, ඒයක්ෂයෝ; දිසඤ්ච, දිශාද; විදිසඤ්ච, විදිශාද; න විදිංසු, නොදත්තාහුය; චණ්ඩ, සැඩවූ; අනිල, වාතයෙන්; උබ්බට, උදුරණලද; මහාගිරිකූට, මහගිරිකුළු හා; රුක්ඛ, වෘක්ෂයන්ගේ; සම්පාත, හීමෙන්; භීතා, බියපත්වූවාහු; රුදිතා, හඬන්නාහු; ගතිං, ගමන (පැණයාමක්); එසයන්ති, මාර්ගනය කෙරෙත්.

523. අථ, ඉක්බිත්තෙන්; තෙ, ඔහුතුමු; සීතෙන, සීතල කරණකොටගෙණ; දිජෙ, දන්තයන්; පරිකොටයන්තා, කොටන්නාහු; අඤ්ඤොඤ්ඤසඤ්ඤගත්තං, ඔවුනොවුන් සිරුරු; අවලම්බ, එල්බ; පරොදිසිංසු, හැඬූහ; අනෙකභයදානි, නොයෙක් බියදෙන්නාවූ; ඝොසණන්ති, ශබ්දකරන්නාවූ; රූපානිච, රූපයෝද; වත්තිංසු, පැවැත්තාහුය; තෙන, ඒ කරණ කොටගෙණ; තෙසං, ඔවුන්ට; විවිධං, අනෙකප්‍රකාරවූ; භයං, බිය; ආසි, විය.

524. පරදුක්ඛකෙන, අනුන් දුක් කරණකොටගෙණ; දුක්ඛිතමනා, දුඃඛිත සිත ඇත්තාවූ; බුද්ධාඅපි, සර්වඥවරයන් වහන්සේලාත්; කස්මා, කුමක්හෙයින්; අනයං, ව්‍යසන; කරොන්ති'ති, කෙරෙද්දැයි; න චින්තනීයං, නොසිතියයුතුයි; ලොකො, ලෝවැසිතෙම; ඵලදානහෙතු, ඵලදානහෙතු වෙන්; සොමරිපුගාහකවාසරම්හි; චන්ද්‍රග්‍රහණ දිනයෙහි; සත්ථෙන, ශස්ත්‍රයෙන්; විටපී, වෘක්ෂයන්; හනාති, පෙළයි (නොහොත්) කොටයි.

525. සත්ථා තතො තමනුදො සභයෙ සසොකෙ
දිස්වාන ගුය්හකජනෙ කරුණාසිතත්තො,
වුට්ඨිං තමම්බු පවනං පණුදිත්ව සබ්බං
දස්සෙසි අත්තාමඛිලං ද්‍යුමණීව ඛම්හි.

526. දිස්වාන තෙ මුනිවර'ඤ්ජලිපඞ්කජෙහි
සජ්ජෙත්ව සීසසරසී ඉදමබ්‍රුවිංසු,
යාචාම නො'භයපදං භවතො සකාසා
දූසෙසු ධීර කරුණං කරණීයමෙව.

527. එවං තද'ච්ච ජිනො මධුරස්සරෙන
ආමන්ත තෙ නිසිචරෙ'වනතෙ සමෙක්ඛ,
තුම්හෙ දදෙථ යදි ඨානම්මෙකදෙසං
සබ්බෙ අපෙන්ති ඝනවාතජසීතදුක්ඛා.

---

525. තතො, ඉක්බිති: තමනුදො, කෙලෙස අඳුරු දුරු කරන්නාවූ; සත්ථා, ශාස්තෘන්වහන්සේ; සභයෙ, භය සහිතවූ; සසොකෙ, ශොක සහිතවූ; ගුය්හකජනෙ, යක්ෂ ජනයන්; දිස්වාන, දැක; කරුණාසිතත්තො, දයාබර සිත් ඇත්තේ; වුට්ඨිං, වැසිද; තමම්බු, අඳුරුද; පවනම්බු, වාතයද; සබ්බං, (යන මේ) සියල්ල; පණුදිත්වා, පහකොට; ඛම්හි, අහස්හි; ද්‍යුමණී ඉව, රවිමණ්ඩලය මෙන්; අඛිලං අත්තානං, සියලු දෙහය; දස්සෙසි, දැක්වූසේක.

526. තෙ, ඒ යක්ෂයෝ; මුනිවරං, මුනීන්ද්‍රයන්වහන්සේ; දිස්වාන, දැක; අඤ්ජලිපඞ්කජෙහි, ඇඳිලි නැමැති පියුමෙන්; සීසසරසී, ශීර්ෂ නැමැති සරසින්; සජ්ජෙත්වා, සඳා; ඉදං, මෙද; අබ්‍රුවිංසු, කීවාහුය; නො, අපි; භවතො සකාසා, පින්වතුන් කෙරෙන්; අභයපදං, නිර්භයකාරණය; යාචාම, යාචනා කරමු; ධීර, ධීරයන්වහන්ස; දූසෙසු, (නුඹවහන්සේගේ) දූසවූ අපකෙරෙහි; කරුණං, කුළුණුසිතක්; කරණීයංඑව, කටයුතුමය.

527. තදා, එවේලෙහි; ජිනො, සර්වඥතෙම; තෙ නිසිචරෙ, ඒ නිශාචරයන්; ආමන්ත, බණවා; අවනතෙ, (තමන්කරා) නැමුනාවූ (යකු)න්; සමෙක්ඛ, බලා; මධුරස්සරෙන, මධුර ස්වරයෙන්; එවං, මෙසේ; අවච, වදාළේය; තුම්හෙ, තෙපි; යදි, ඉදින්; මම, මට; එකදෙසං ඨානං, එකදෙශස්ථානයක්; දදෙථ, දෙන්නාහුනම්; සබ්බෙ, සියලු; ඝනවාතජ, වැසි හා පවනින් නිපන් දුක්ද; සීතදුක්ඛා, සීතලින්වූ දුක්ද; අපෙන්ති, පහවෙය.

528. යදෙජ්ජවමීතිමපයාති කරොම හො තං
ගණ්හාහි ධීර යදි ඉච්ඡසි සබ්බදීපං,
වත්වාන තෙහි පරිදින්නජම්බායමග්ගො
ඔගම්ම තත්ථ පුථු පත්ථරි චම්මඛණ්ඩං.

529. තස්මිං නිසජ්ජ කසිණං සමපජ්ජ තෙජො
ජාලාකුලං ජලිතමග්ගිමමාපයී සො,
සො ධූමකෙතු ගගනුග්ගතතුඞ්ගසිඛො
සන්දඩ්ඪයං ගිරිවනානුරුඝොසයන්තො.

530. රුක්ඛෙහි රුක්ඛවනපබ්බතලඞ්ඝනෙන
සාඛාමිගෙ ච විහගෙ අනුබන්ධයංව,
වෙස්සානරො වනමරූ මිගසූකරෙ'පි
සන්ධාවි ගුය්හකජනෙ ඉති චින්තයන්තො.

---

528. හො, භවත්නි, යදි, ඉදින්; එවං, මෙසේ; ඊති, උවදුර; අපයාති, පහවයේනම්; තං, එය; කරොම, කරමු; ධීර, ධීරයන්වහන්ස; යදි, ඉදින්; ඉච්ඡසි, කැමැත්තෙහි නම්; සබ්බදීපං, මුලුදිවයින; ගණ්හාහි, ගණුවයි; වත්වාන, කියා; තෙහි, ඔවුන් විසින්; පරිදින්න, දෙනලද; ජම්බායං, පොළොවෙහි; අග්ගො, ලොකාග්‍ර සර්වඥතෙම; ඔගම්ම, බැස; තත්ථ, එහි; පුථු, විශාලවූ; චම්මඛණ්ඩං, සම්කඩ; පත්ථරි, අතුළසේක.

529. සො, ඒ සර්වඥතෙම; තස්මිං, එහි; නිසජ්ජ, වැඩහිඳ; තෙජො කසිණං, තෙජො කසිණ සමාපත්තියට; සමාපජ්ජ, සමවැද; ජාලාකුලං, ගිනිදලින් ගැවසුනාවූ; ජලිතං, දිලීයෙන්නාවූ; අග්ගිං, ගින්නක්; අමාපයී, මැවී; ගගනුග්ගත, අහසට නැංගාවූ; තුඞ්ග, උස්වූ; සිඛො, ශෘඞ්ග ඇති; උරුඝොසයන්තො, මහත්කොට ශබ්දකරන්නාවූ; සො ධූමකෙතු, ඒ වහ්නිය; ගිරිවනානි, පර්වතාරණ්‍යයන්; සන්දඩ්ඪයං, දවමින්:—

530. වෙස්සානරො, ගිනි තෙම; රුක්ඛෙහි, වෘක්ෂයන්ගෙන්; රුක්ඛ, වෘක්ෂය; වන, වනය; පබ්බත, පර්වතය (යන මොවුන්ට); ලඞ්ඝනෙන, පැණීමෙන්, සාඛාමිගෙ ච, සාමුවන්ද; විහගෙ, පක්ෂීන්ද; වනමරූ, වනදෙවතාවන්ද; මිගසූකරෙපි, මෘගශූකරයන්ද; අනුබන්ධයං ඉව, ලුහුබඳින්නාක් මෙන්; ගුය්හකජනෙ, යක්ෂයන්ට; ඉති, මෙසේ; චින්තයන්තො, සිතවමින්; සන්ධාවි, දිවී.

531. දිස්වාන තත්‍ථ පචුරාතතවිප්ඵුලිඞ්ග
සම්මිස්සජාලදහනං ගුහකා සමෙච්ච,
ධාවුං විකිණ්ණකචබප්ඵජලද්දනෙත්තා
දූරතතපෙජහි සහිතා ගතිමෙසමානා.

532. සබ්බඤ්ඤුතෙජපරිදඩ්ඪසරීරචිත්තා
අහච්ච සාගරතටං පරිධාවමානා,
තස්මිම්පි තෙ පවිසිතුං සරණං න ලද්ධා
ජම්හී තතො සපදි සන්නිපතිංසු සබ්බෙ.

533. දිස්වාන තෙ මුනිවරො සභයෙ සසොකෙ
රම්මං තදා ජලධිමජ්ඣගතං මහන්තං,
ඉද්ධීහි සෙහි ගිරිදීපමිධානයිත්වා
ආරොපයිත්ව නිඛිලෙ පුන තත්‍ථ'කාසි.

---

531. තත්‍ථ, එහි; ගුහකා, යක්‍ෂයෝ; පචුර, බොහෝවූ; අතත, පතළාවූ; විප්ඵුලිඞ්ග, ගිනිපුපුරින්; සම්මිස්ස, මිශ්‍රවූ; ජාල, ගිනිදැල් ඇති; දහනං, ගිනි; දිස්වාන, දැක; සමෙච්ච, එකතුව; විකිණ්ණකච, විසිරි කෙශයන්හා; බප්ඵජල, බාෂ්ප ජලයෙන්; අද්දනෙත්තා, තෙත්වූ ඇස් ඇත්තාහු; දූරඅතත පෙජහි සහිතා, දූරගතමජයන් සහිතවූවාහු; ගතිං, පිහිට; එසමානා, සොයමින්; ධාවුං, දිවූහ.

532. සබ්බඤ්ඤුතෙජ, සර්වඥතෙජසින්; පරිදඩ්ඪ, දනලද; සරීර, සිරුරු හා; චිත්තා, සිත් ඇත්තාහු; පරිධාවමානා, දිවන්නාහු; සාගරතටං, වෙරළකණ; අහච්ච, හැපී; තස්මිම්පි, එහිදු; පවිසිතුං, ප්‍රවිෂ්ටවන්ට; සරණං, පිහිටක්; නලද්ධා, නොලැබ; තතො, ඉක්බිති; ජම්හි, තැතිගත්තාවූ; තෙ සබ්බෙ, ඒ සියල්ලෝ; සපදි, එකෙණෙහි; සන්නිපතිංසු, රැස්වූහ.

533. තදා, එසමයෙහි; මුනිවරො, සර්වඥතෙම; සභයෙ, භය සහිතවූ; සසොකෙ, සොක සහිතවූ; තෙ, ඔවුන්; දිස්වාන, දැක; සෙහි ඉද්ධිහි, ස්වකීයවූ සෘද්ධින්; රම්මං, රම්‍යවූ; ජලධිමජ්ඣගතං, සාගරමධ්‍යගතවූ; මහන්තං, මහත්වූ; ගිරිදීපං, ගිරිදිවයින; ඉධ, මෙහි; ආනයිත්වා, ගෙන්වා; නිඛිලෙ, සියල්ලන්; ආරොපයිත්වා, (එහි) නංවා; පුන, නැවත; තත්‍ථ, එහි; අකාසි, පිහිටවූසේක.

534. කත්වෙවමෙසමසමොපසමන්තමීතිං
තත්ථෙව භාසුරතරො භගවා නිසීදි,
බ්‍රහ්මාමරාසුරඵණීගරුළාදිසඞ්ඝා
සඞ්ගම්ම'කංසු මහතිං මහමග්ගරූපං.

535. දෙසෙසි සංසදි ජිනො සුතිසාධු ධම්මං
තස්මිං සදාසවනුදං සිවදං ජනානං,
සුත්වාන නෙකසතකොටිපමාණපාණා
ලද්ධා තදා සමභවුං වරධම්මචක්ඛුං.

536. තස්මිං දිනෙ සුමනකූටවරාධිවාසො
තෙජිද්ධිබුද්ධිවිභවො සුමනාභිධානො,
දෙවො පසන්නහදයො රතනත්තයම්හි
සම්පාපුණිත්ථ පඨමං ඵලමුත්තමං සො.

---

534. අසමො, අතුල්‍යවූ; භාසුරතරො, අතිශයින් බබලන්නාවූ; එසො භගවා, ඒ භාග්‍යවතුන්වහන්සේ; එවං, මෙසේ; තං ඊතිං, ඒ උවදුර; උපසමං කත්වා, ව්‍යුපසමනය කොට; නිසීදි, වැඩහුන්සේක; තත්ථෙව, එතන්හිදීම; බ්‍රහ්ම, බ්‍රහ්මය; අමර, දෙවිය; අසුර, දානවය; ඵණී, නාගය; ගරුළාදි, ගරුඬාදීහුය; සඞ්ඝා, සඞ්ඝ යන මොහුද; සඞ්ගම්ම, රැස්ව; මහතිං, විපුලවූ; අග්ගරූපං, අග්‍රාකාරවූ; මහං, පූජා; අකංසු, කළාහුය.

535. ජිනො, සර්වඥතෙම; තස්මිං සංසදි, ඒ සභායෙහි; ජනානං, සත්වයන්ට; සදාසවනුදං, විනෙයයන්ගේ ආශ්‍රවක්ෂය කරන්නාවූ; සිවදං, නිර්වාණය දෙන්නාවූ; සුතිසාධු ධම්මං, කර්ණාමෘත ධර්මය; දෙසෙසි, දෙසූසේක; තං, ඒ ධර්මය; සුත්වාන, අසා; අනෙක, නොයෙක්; සතකොටිපමාණ, සිය කෙළගණන් පමණවූ; පාණා, ප්‍රාණීහු; වර, උතුම්වූ; ධම්මචක්ඛුං, ධර්මචක්ෂුස; ලද්ධා, ලැබ; අසමා අභවුං, අතුල්‍යයෝ වූහ; (නොහොත්) ලද්ධා සමභවුං, ලද්දෝ වූහ.

536. සුමනකූටවර, සමන්තකූට පර්වතවරයෙහි; අධිවාසො, අධිපතිව වසන්නාවූ; තෙජිද්ධිබුද්ධිවිභවො, තෙජස්ය ඍද්ධිය ප්‍රඥාය සම්පත්ය යනමේ ඇති; රතනත්තයම්හි, රත්නත්‍රයෙහි; පසන්නහදයො, පහන්සිත්ඇති; සුමනාභිධානො, සුමනනාමවූ; සො දෙවො, ඒ දිව්‍ය (රාජ) තෙම; තස්මිං දිනෙ, එදවස; උත්තමං, උතුම්වූ; පඨමං ඵලං, පළමුවෙනි ඵලයට; සම්පාපුණිත්ථ, සම්ප්‍රාප්ත වී.

537. උට්ඨාය තුට්ඨවදනො කතපඤ්ජලීකො
මුග්ගො ජිනග්ගනඛරංසිපයොදධිම්හි,
වන්දිත්වා එවමවචාතුල වීර ධීර
ලොකග්ගපුග්ගල වරං දද සාමි ධීස.

538. දාසොස්මි තෙ චරණපඞ්කජපූජකොහං
සද්ධාදයාදිවිභවො තනයො හමස්මි,
තුම්හෙ විනා ඛණලවං වසිතුං න ඉච්ඡෙ
තස්මා දදාතු භගවා මම පූජනීයං.

539. සුත්වාන තං ධිතිමතී පරිමජ්ජ සීසං
සංසත්ත ඡප්පද සරොරුහසන්නිභෙන,
හත්ථෙන නීලසකකුන්තලධාතුමුට්ඨිං
දජ්ජාථ සො මණිමයෙන කරණ්ඩකෙන.

---

537. තුට්ඨවදනො, සන්තුෂ්ටවූ මුව ඇත්තේ; උට්ඨාය, නැගී සිට; කත, කරණලද; පඤ්ජලීකො, ඇඳිලිඇත්තේ; ජින, සර්වඥයන්වහන්සේගේ; අග්ග, අග්‍රවූ; නඛරංසි, නියරැස් නැමැති; පයොදධිම්හි, සාගරයෙහි; මුග්ගො, ගැලුනේ; වන්දිත්වා, වැඳ; එවං, මෙසේ; අවච, කීය; අතුල, අසමවූ; වීර, වීය්‍ර්‍යවත්වූ; ධීර, ධෘතිමත්වූ; ලොකග්ගපුග්ගල, ලොකාග්‍ර පුද්ගලවූ; ධීස, ප්‍රාඥෙශවූ; සාමි, ස්වාමින්වහන්ස; වරං, වරයක්; දද, දුනමැනව.

538. අහං, මම; තෙ, නුඹවහන්සේගේ; චරණපඞ්කජ, පාපියුම්; පූජකො, පුදන්නාවූ; දාසො අස්මි, දාසයෙක්මි; අහං, මම; සද්ධාදයාදි, ශ්‍රද්ධානුකම්පාදී නැමැති; විභවො, සම්පත් ඇති; තනයො අස්මි, පුත්‍රයෙක්මි; තුම්හෙ විනා, නුඹවහන්සේ හැර; ඛණලවං, ක්‍ෂණලවයකුදු; වසිතුං, වසන්ට; න ඉච්ඡෙ, නොකැමැත්තෙමි; තස්මා, එහෙයින්; භගවා, භාග්‍යවතුන්වහන්සේ; මම, මට; පූජනීයං, පිදිය යුත්තක්; දදාතු, දෙනසේක්වා.

539. ධිතිමතී, ධෘතිමත් ප්‍රඥාවත් සර්වඥතෙමේ; තං, ඒ කීම; සුත්වාන, ශ්‍රවණයකොට; සංසත්ත, ඇලුනාවූ; ඡප්පද, ෂට්පදින් ඇති; සරොරුහසන්නිභෙන, පද්මයක් වැනිවූ; හත්ථෙන, අතින්; සීසං, මස්තකය; පරිමජ්ජ, පිරිමැද; නීල, නිල්වූ; සක, ස්වකීයවූ; කුන්තලධාතුමුට්ඨිං, කෙශධාතු මිටක්; දජ්ජා, දුන්සේක; අථ, ඉක්බිති; සො, හෙතෙම; මණිමයෙන, මිණිමුවාවූ; කරණ්ඩකෙන, සුමුගකින් :—

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය

540. පග්ගය්හ බාහුයුගලෙන සිතො නමිත්වා
මුඛා දධාසි මකුටං විය පීණිතත්තා,
කත්වාථ සො වරමහං තිදිවෙහි සද්ධිං
ඔප්පයිත්ව ධීරපරිභුත්තවසුන්ධරායං.

541. සො'කාසි නීලරතනෙහි මහාරහෙහි
උබ්බෙධතො රතනසත්තපමාණථූපං,
නාථෙ ධරන්තසමයෙව (18) පතිට්ඨහි සො
ථූපො තිලොකසුඛදො මණිකාමදොව.

542. පච්ඡා තිලොකසරණෙ පරිනිබ්බුතම්හි
ඛීණාසවො සමහිමො සරභූයතින්දො,
ආදාය තං චිතකතො ජිනගීවධාතුං
තස්මිං නිධාය'කරි බාරසහත්ථථූපං.

---

540. බාහුයුගලෙන, බාහු යුගමයෙන්; පග්ගය්හ, දැඩි කොටගෙණ; සිතො, සිපීයේ; පීණිතත්තො, පිණාගිය සිත් ඇත්තේ; නමිත්වා, නැමී; මකුටං විය, කිරීටයක් මෙන්; මුඛා, මුදුනෙන්; දධාසි, දැරීය; අථ, නැවත; සො, හෙතෙම; තිදිවෙහි සද්ධිං, දෙවියන් සමග; වරමහං, උතුම්වූ පූද; කත්වා, කොට; ධීර, සර්වඥයන්වහන්සේ විසින්; පරිභුත්ත, පරිභොග කළ; වසුන්ධරායං, පොළොවෙහි; ඔප්පයිත්වා, පිහිටුවා :—

541. සො, හෙතෙම; උබ්බෙධතො, උසින්; රතනසත්ත පමාණ, රියන් සතක් පමණවූ; ථූපං, සෑයක්; මහාරහෙහි, මහාර්ඝවූ; නීලරතනෙහි, නිල්මිණියෙන්; අකාසි, කෙළේයි; කාමදො මණි ඉව, චින්තාමාණික්‍යයක් වැනිවූ; තිලොකසුඛදො, තුන්ලොවට සුව දෙන්නාවූ; සො ථූපො, ඒ චෛත්‍යය තෙම; නාථෙ, සර්වඥයන්වහන්සේ; ධරන්තසමයෙ එව, ධරමානකාලයෙහිම; පතිට්ඨහි, පිහිටියේයි.

542. පච්ඡා, පසුව; තිලොකසරණෙ, තුන්ලොවට පිහිටවූ (බුදුරජාණන්වහන්සේ); පරිනිබ්බුතම්හි, පිරිනිවිකල්හි; ඛීණාසවො, ක්ෂයකළ ආශ්‍රවයන් ඇති; සමහිමො, අනුභාව සහිතවූ; සරභූයතින්දො, සරභූ නම් යතීන්ද්‍රයන්වහන්සේ; චිතකතො, (සඳුන්දර) සෑයෙන්; ජිනගීවධාතුං, සර්වඥ ග්‍රීවාධාතුව; ආදාය, ගෙණ; තස්මිං, එහි; තං, ඒ ධාතුව; නිධාය, පිහිටුවා; බාරසහත්ථථූපං, දොළොස් රියන් සෑයක්; අකරි, කෙළේයි.

543. චූළාභයව්හවනිපො සමයෙ'පරස්මිං
බාත්තිංසහත්ථමකරිත්ථ වරොරුථූපං,
දුට්ඨාදිගාමණිනෘපො දමිළෙ හනන්තො
කාරෙසි කඤ්චුකමථො චතුසට්ඨිහත්ථං.

544. එවං ස සීහලමහාසරමජ්ඣරූළ්හං
සෙතම්බුජං'ව මධුපාවලිසෙවනීයං,
භූමඞ්ගනාකරතලෙ සිතවිත්ථලීලො
ථූපො දදාතු මසමොපසමං ජනානං.

545. ලඞ්කොපසග්ගමවධූය විධාය ඛෙමං
ලඞ්කං නිජය වරකුන්තලධාතුයා තං,
කත්වාන භාසුරතරං මුනි මඞ්ගලාය
පායාසි තාරකපථෙනුරුවෙලමෙව.

---

543. අපරස්මිං සමයෙ, මෑත කාලයෙහි; චූළාභයව්හ, චූළාභය නම්වූ; අවනිපො, රජතෙම; වර, උතුම්වූ; උරු, මහත්වූ; ථූපං, සෑය; බාත්තිංසහත්ථං, දෙතිස්රියන් කොට; අකරිත්ථ, කෙළේසි; අථො, නැවත; දුට්ඨාදිගාමණිනෘපො, දුටුගැමුණු අබාරජතෙම; දමිළෙ, දෙමළුන්; හනන්තො, මරන්නේ; කඤ්චුකං, (ඒ) කඤ්චුක සෑය; චතුසට්ඨිහත්ථං, සූසැට රියන් කොට; කාරෙසි, කරවී.

544. එවං, මෙසේ; සීහල මහාසර, සිංහලද්වීප නැමැති මහාතඩාගයාගේ; මජ්ඣරූළ්හං, මධ්‍යයෙහි හටගත්තාවූ; මධුපාවලි, භෘඞ්ග පඞ්ක්තිය විසින්; සෙවනීයං, සෙවියයුතුවූ; සෙතම්බුජංඉව, ශ්වෙත පද්මයක් වැනිවූ; භූමඞ්ගනා, මහීකාන්තා වගේ; කරතලෙ, හස්තතලයෙහි; සිතාවිත්ථලීලො, එලො නිඳුටක ලීලා ඇති; සො ථූපො, ඒ සෑයතෙම; ජනානං, සත්වයන්ට; අසම, අතුල්‍යවූ; උපසමං, ශාන්තිය; දදාතු, දේවා.

545. මුනි, සර්වඥතෙම; ලඞ්කාඋපසග්ගං, ලඞ්කොපද්‍රවය; අවධූන, පහකොට හැර; ඛෙමං විධාය, නිර්භය කොට; මඞ්ගලාය, මඞ්ගල්‍ය පිණිස; නිජය, ස්වකීයවූ; වර, උතුම්වූ; කුන්තලධාතුයා, කෙසධාතුවෙන්; ලඞ්කං, ලංකාව; භාසුරතරං කත්වාන, අතිශයින් ප්‍රභාස්වර කොට; තාරක පථෙන, ආකාශයෙන්; තං උරුවෙලං එව, ඒ උරුවෙල් දනව්වටම; පායාසි, වැඩිසේක.

546. තස්මිං විධාය බහුවිම්හිතපාටිහෙරං
හෙත්වා සසිස්සකිසිනො පුන දිට්ඨිජාලං,
දත්වාන නිබ්බුතිපදං සහසිස්සකස්ස
නිබ්බාණසුන්දරපුරං පරිපූරයිත්ථ.

547. තම්හා විකාසිතකුසෙසයකානනාභ
වීතාසවෙහි නිවුතො සුගතොභගාමි,
පායාසි රාජගහගාමිමුදාරමග්ගං
වෙනෙය්‍යජන්තුකමලාකරභානුරූපො.

548. තස්මිං ගතෙ ජිනවරෙ වරබිම්බිසාරො
පූජං අකාසි මහතිං සහ දෙවතාහි,
තස්මිං හි සංසදි ලභිංසු අනප්පපාණා
මග්ගෙ ඵලෙ ච සරණෙ ච පතිට්ඨහිංසු.

---

546. පුන, නැවත; තස්මිං, එහි; බහු, බොහෝවූ; විම්හිත, විස්මයජනකවූ; පාටිහෙරං, (තුන්දහස් පන්සියයක්) පෙළහැර; විධාය, කොට; සසිස්සක, ශිෂ්‍යගන් සහිතවූ; ඉසිනො, උරුවෙල් කසුප්තවුසන්ගේ; දිට්ඨිජාලං, දෘෂ්ටිජාලාව; හෙත්වාන, බිඳ; සහසිස්සකස්ස, අන්තෙවාසීන් සහිතහුට; නිබ්බුතිපදං, නිර්වාණ පදය; දත්වා, දී; නිබ්බාණ, නිර්වාණ නමැති; සුන්දරපුරං, සොඳුරුපුරය; පරිපූරයිත්ථ, පිරවූසේක.

547. වෙනෙය්‍යජන්තු, විනෙයසත්ව නැමැති; කමලාකර, පියුම් වනයට; භානුරූපො, දිවාකරයා බඳුවූ; විකාසිත කුසෙසයකානනාභ, ප්‍රබුද්ධපද්ම වනයක් වැනි; වීතාසවෙහි, ක්ෂීණාශ්‍රවයන් විසින්; නිවුතො, පරිවෘතවූ; ඉභගාමී, ගජගාමීවූ; සුගතො, සර්වඥතෙම; තම්හා, ඒ උරුවෙල් දනව්වෙන්; (නික්ම); රාජගහගාමිං, රජගහනුවරට යන්නාවූ (නොහොත්) රාජගහගාමී, රජගෘහගාමීසේක්: උදාරමග්ගං, ඒ මහාමාර්ගයට; පායාසි, පිළිපන්සේක.

548. ජිනවරෙ, බුදුරජානන්වහන්සේ; තස්මිං, ඒ රජගහනුවරට; ගතෙ, වැඩිය කල්හි; වර, උතුම්වූ; බිම්බිසාරො, බිම්සර රජතෙම; සහදෙවතාහි, දෙවියන් සමග; මහතිං පූජං, විපුලපූජා; අකාසි, කෙළේය; හි, ඒ එසේමැයි; තස්මිං සංසදි, ඒ සමාගමෙහි; අනප්පපාණා, ඉතා බොහෝවූ ප්‍රාණීහු; මග්ගෙ, මාර්ගයන්ද; ඵලෙච, ඵලයන්ද; ලභිංසු, ලැබූ; සරණෙච, සරණයෙන්ද; පතිට්ඨහිංසු, පිහිටුහ.

549. රාජා තතො විපුලවෙළුවනාභිරාමං
සාලඞ්කතං විවිධපාදපමණ්ඩපෙහි,
පාදාසි දක්ඛිණකරෙ ජලපාතනෙන
කත්වා ධරාධරධරං හිමවඤ්ච කම්පං.

550. තස්මිං සමන්තනයනො නයනාභිරාමො
භූතිං ජනස්ස සතතං අභිවඩ්ඪයන්තො,
ධම්මම්බුවුට්ඨිනිකරං පරිවස්සයන්තො
වස්සං වසී අදුතියො දුතියම්හි වස්සෙ.

551. දෙවින්දමොලිසමලඞ්කතපාදපීඨො
ලොකස්ස අත්ථචරණෙ සතතාභියුත්තො,
තත්ථෙව සො හි තතියෙ'පි චතුත්ථවස්සෙ
වාසං අකාසි සුගතො සිරිසන්නිවාසො.

---

549. තතො, ඉක්බිති; රාජා, බිම්බිසාර මහරජතෙම; විවිධ, නානාප්‍රකාරවූ; පාදපමණ්ඩපෙහි, රැක්මඬුවෙන්; සාලඞ්කතං, සාලඞ්කෘතවූ; විපුල වෙළුවනාභිරාමං, මහත්වූ වෙළුවනාරාමය; ධරාධරධරං; (මහ) පොළොවද; හිමවඤ්ච, හිමාලය පර්වතයද; කම්පං කත්වා, චලිතකොට; දක්ඛිණකරෙ, දක්ෂිණ ශ්‍රී හස්තයෙහි; ජලපාතනෙන, පැන් වත්කිරීමෙන්; පාදාසි, පූජාකෙළේයි.

550. සමන්තනයනො, සමන්තචක්ඛුවූ බුදුරජානන්වහන්සේ; නයනාභිරාමො, නෙත්‍රාභිරාම වූයේ; සතතං, නිරන්තරයෙන්; ජනස්ස, ජනයාගේ; භූතිං, සම්පත්තිය; අභිවඩ්ඪයන්තො, විශෙෂයෙන් වඩන්නේ; ධම්මම්බු වුට්ඨිනිකරං, සද්ධර්ම නැමැති ජලවර්ෂා සමූහය; පරිවස්සයන්තො, වස්වන්නේ; අදුතියො, දෙවැන්නෙක් නැත්තේ; දුතියම්හි වස්සෙ, දෙවෙනි වර්ෂයෙහි; තස්මිං, ඒ රජගහනුවර වෙළුවනාරාමයෙහි; වස්සං වසී, වස් වුසූසේක

551. දෙවින්ද, දෙවෙන්ද්‍රයාගේ; මොලි, කිරීටයෙන්; සමලඞ්කත, සරසනලද; පාදපීඨො; පාපිටු ඇත්තාවූ; ලොකස්ස, ලොකයාට; අත්ථචරණෙ, අර්ථචර්‍ය්‍යායෙහි; සතත, නිරන්තරයෙන්; අභියුත්තො, යුක්තවූ; සිරිසන්නිවාසො, ලක්ෂ්මියට වාසස්ථානවූ; සො සුගතො හි, ඒ සුගතතෙම වනාහි; තතියෙ, තෙවැනි වසෙහිද; චතුත්ථවස්සෙ, සිව්වෙනි වසෙහිද; තත්ථ එව, ඒ රජගහනුවර වෙළුවනාරාමයෙහිම; වාසං අකාසි, විසීම කළසේක.

552. ලොකස්ස ධම්මමමලං සතතං වහන්තො
සාවත්ථියං රුචිරජෙතවනෙ'භිරාමෙ,
වාසං අකාසි සුබුද්ධො මුනි පඤ්චමස්මිං*
වෙනෙය්‍යසත්තසමයං සමුදික්ඛමානො.

ඉති ලඞ්කාය පඨමාගමනං.

---

553. අථ භගවති තස්මිං ජෙතනාමෙ වනස්මිං
නිවසති සති ලඞ්කා මඞ්ගලාවාසරූපා,
උපවනමිව නාකෙ නන්දනං දෙවතානං
අමරඋරගවාසා රම්මරූපා බභූව.

---

552. සුබුද්ධො, (ලෞකික ලොකොත්තර) සුබුද්ධයකවූ; මුනි, සර්වඥතෙම; ලොකස්ස, ලොකයාට; අමලං, නිර්මලවූ; ධම්මං, ධර්මය; සතතං, නිරන්තරයෙන්; වහන්තො, පමුණුවන්නේ; වෙනෙය්‍යසත්ත, විනෙය ජනයන්ගේ; සමයං, ධර්ම ප්‍රතිවෙධය (නොහොත්): වෙනෙය්‍ය සත්තසමයං, විනෙයජන සමූහය; සමුදික්ඛමානො, බලමින්; සාවත්ථියං, ශ්‍රාවස්තිපුරසන්නයෙහි වූ; රුචිර, ශොභනවූ; ජෙතවනෙ'භිරාමෙ, ජෙතවනාරාමයෙහි; පඤ්චමස්මිං, පස්වෙනි වස; වාසං අකාසි, වාසය කළසේක.

**ලක්දිව් වැඩි පළමුවෙනි ගමනයි.**

---

553. අථ, ඉක්බිති; භගවති, භාග්‍යවතුන්වහන්සේ; ජෙතනාමෙ, ජෙත නම්වූ; තස්මිං වනස්මිං, ඒ වෙනෙහි; නිවසති සති, වැඩවසන සමයෙහි; මඞ්ගලාවාසරූපා, මඞ්ගල්‍ය ගෘහයක් බඳුවූ; ලඞ්කා, ලඞ්කාතොමෝ; නාකෙ, දිව්‍යලොකයෙහි; දෙවතානං, දෙවියන්ගේ; නන්දනං උපවනං ඉව, නන්දනොද්‍යානය මෙන් (හෙවත්): උපවනං නන්දනං ඉව, දෙවෙනි නඳුනුයනක් මෙන්; අමරඋරගවාසා, දෙවියන්ගේ හා දිව්‍යනාගයන්ගේ විසීමෙන් හෝ විසීම ඇත්තී; රම්ම රූපා, අභිරම්‍යාකෘති ඇත්තියක්; බභූව, වූලු.

---

* "පඤ්චවෙසු."

554. තහිමතිරුචිරස්මිං වඩ්ඪමානාදිසෙලෙ
මධුරසලිලවාහෙ රම්මකල්‍යාණිකාදෙ,
උදධිභුජගවාසෙ නාගදීපන්තිකෙ ච
මහති මහිමයුත්තා නාගසඞ්ඝා වසන්ති.

555. පචුරමහිමයුත්තො වඩ්ඪමානාචලස්මිං
අධිපති භුජගානං ආසි චූළොදරව්හො,
මහුදර ඉති නාමො නාගදීපොදධිම්හි
නිවසති අථ තෙසං පබ්බතෙය්‍යොරගින්දො.

556. ඉතරභුජගරඤ්ඤො ධීතරං නාගකඤ්ඤං
පියතරමභිරූපං'කාසි දූරං* තදා හි,
අථ ච දුහිතුයා සො දීයමානං දදන්තො,
රුචිරමණිමයග්ඝං ආසනඤ්චාපදාසි.

554. තහිං, එහි; අතිරුචිරස්මිං, ඉතා මනොඥවූ; වඩ්ඪමානාදිසෙලෙ, වඩමන් පර්වතාදී ශෛලයෙහිද; මධුරසලිලවාහෙ, මිහිරිදිය වතුර ඇත්තාවූ; රම්මකල්‍යාණිකාදෙ, රම්‍යවූ කැලණිගඟ ආදී තන්හිද; නාගදීපන්තිකෙ, මණිනාගදීප යට ආසන්නයේ; මහති, මහත්වූ; උදධිභුජගවාසෙ ච, සමුද්‍රයෙහිවූ නාගභවනයෙහිද; මහිමයුත්තා, ආනුභාවයෙන් යුක්තවූ; නාගසඞ්ඝා, නාගසමූහයෝ; වසන්ති, වෙසෙත්.

555. වඩ්ඪමානාචලස්මිං, වර්ධමාන පර්වතයෙහි; පචුර, බොහෝවූ; මහිමයුත්තො, ආනුභාවයෙන් යුක්තවූ; චූළොදරව්හො, චූළොදර නම්වූ; භුජගානං අධිපති, නාගරාජයෙක්; ආසි, වී; නාගදීපෙ, නාගදිවයින සමීපයෙහිවූ; උදධිම්හි, වාරිධියෙහි; මහුදරඉති නාමො, මහොදර නම් නාරජෙක්; නිවසති, වෙසෙයි; අථ, නැවත; තෙසං, ඔවුන් අතුරෙන්; පබ්බතෙය්‍ය, වර්ධමාන පර්වත වාසීවූ; උරගින්දො, නාගෙන්ද්‍රතෙම :—

556. තදා හි, එකල්හි වනාහි; ඉතරභුජගරඤ්ඤො, (මහොදර නම්) අන්‍ය නාගෙන්ද්‍රයාගේ; ධීතරං, දුහිතෘවූ; පියතරං, අතිශයින් ප්‍රියවූ; අභිරූපං, විශිෂ්ටවූ රූප ඇති; නාගකඤ්ඤං, නාගකන්‍යාව; දූරං අකාසි භාය්‍යා කෙළේසි; අථච, නැවතද; සො, ඒ මහොදර සර්පරාජතෙම; ධීතුයා, ධීතෘවට; දීයමානං, දියයුතු දායාද; දදන්තො, දෙන්නේ; රුචිර, මනොඥවූ; මණිමය, මාණික්‍යමයවූ; අග්ඝං, මහගුවූ; ආසනං ච අපි, අස්නක්ද; අදාසි, දින.

* "භරියං."

557. දුහිතරි මතකාලෙ (19) තෙ'ථ පල්ලඞ්කහෙතු
ජලජථලජනාගා යුද්ධසජ්ජා අහෙසුං,
අථ ථලජභුජඞ්ගා භඞ්ගකල්ලොලමාලා
සදිසලුලිතචිත්තා ගබ්බිතෙවං රවන්ති.

558. කිමුදධිජඵණීනං කිත්තිසම්පත්තියා නො
අපි යසපරිවාරා කිං බලෙනිද්ධියා කිං,
අහමහමිති ගබ්බා කිං කිමිස්සාය තෙසං
භවති තිමිර'රීනං භානුමග්ගුන්නති කා.

---

557. අථ, ඉක්බිති; දුහිතරි, දුහිතෘන්; මතකාලෙ, මළ කල්හි; තෙ ජලජථලජ නාගා, ඒ දිය ගොඩ උපන් නාගයෝ; පල්ලඞ්කහෙතු, මිණිපලඟ හෙතුකොටගෙණ; යුද්ධසජ්ජා අහෙසුං, සටනට සැදුනාහුය; අථ, නැවත; ථලජභුජඞ්ගා, පාමිතිය (තන්වඩමන්ගල) නාගයෝ; භඞ්ග, බිඳෙන්නාවූ; කල්ලොලමාලාසදිස, සමුද්‍රතරඟපන්තීන් මෙන්; ලුලිත චිත්තා, සැලුනු සිත් ඇත්තාහු; ගබ්බිතා, ගර්විතවූවාහු; එවං, මෙසේ; රවන්ති, හඬොවිත්.

558. නො, අපට; උදධිජඵණීනං, සාමුද්‍රික නාගයන්ගේ; කිත්තිසම්පත්තියා, කීර්ති සම්පත්තියෙන්; කිං, කිම; අපි, යලි; යසපරිවාරා, යස පිරිවරින්; කිං, කිම; බලෙන, බල යෙන්; කිං, කිම; ඉද්ධියා, ඍද්ධියෙන්; කිං, කිම; අහමහමිති, මමය මමයයි යන; තෙසං, ඔවුන්ගේ; ගබ්බා, ගර්වයෙන්; කිං, කිම; ඉස්සාය, (ඔවුන්ගේ) ඊර්ෂ්‍යායෙන්; කිං, කිම; භානුමග්ග, සූර්‍ය්‍යමාර්ගයෙහි; තිමිරඅරීනං, අඳුරුසතුරන්ගේ; කා උන්නති, කවර උසස් බවක්; භවති, වේද

559\. අථ ජලජලගද්දා ගජ්ජනං ගජ්ජයන්තා
භයජනක පගබ්භා ඵොටයන්තා භුජානං,
අහමහ පහු රෙ රෙ පබ්බතෙය්‍යානමෙතං
පටුතරඩසිතොඨා කක්ඛළෙවං රවන්ති,

560\. පටුතරගරුනාදා තාව ගජ්ජන්ති දන්තී
නයනපථමුපෙන්ත යාව කණ්ණීරවානං,
තථරිව ඵලජාතා ජුම්භයන්තා සමග්ගා
නයනපථගතා තෙ සුඤ්ඤදප්පා භවන්ති.

561\. ඉති තදුභයසෙනා ඝට්ටයන්තාඤ්ඤමඤ්ඤං
විවිධපහරණෙහා උග්ගිරන්ති ගිරං ති,
සතතබුහිතවෙලා සාගරූමිව භන්තා
ලුලිතලුලිතචිත්තා යුද්ධොන්නතා ඨිතාසුං.

---

559\. **අථ,** ඉක්බිති ; **ජලජලගද්දා,** සාමුද්‍රික **නාගයෝ ;** භයජනකපගබ්භා, බිය උපදවන බුහුටි බැව් ඇත්තාහු ; **භුජානං,** බාහු ; **ඵොටයන්තා,** පොළන්නාහු ; රෙරෙ, කොලු කොලු ; අහං අහං, මම මම ; පබ්බතෙය්‍යානං, **පර්වත වාසීන්ගේ ;** එතං, ඊට ; (ප්‍රතිවිරුද්ධව) පහු, පොහොසත්මීයි ; **පටුතර,** අතිශයින් ව්‍යක්තකොට ; ඩසිතඔඨා, ඩැහැගත් ඔෂ්ඨ ඇත්තාහු ; කක්ඛලා, කර්කශ වූවාහු ; එවං, මෙසේ ; **රවන්ති, හඬවිත්.**

560\. **දන්තී,** හස්තිරාජයෝ ; යාව, යම්තාක් ; **කණ්ණීර** වානං, මෘගෙන්ද්‍රයන්ගේ ; නයනපථං, ඇස්හමුවට ; **උපෙ** න්ත, **පැමිණෙද්ද ;** තාව, ඒ තාක් (ඉත්මෙහා); **පටුතර,** **අතිශයින්** ව්‍යක්තවූ ; ගරුනාදා, මහත්වූ නාද ඇත්තාහු හෝ ගර්ජනාවෙන් ; **ගජ්ජන්ති,** ගර්ජනා **කෙරෙත් ; තථරිව,** එසේම ; ජුම්භයන්තා ; විජෘම්භනය කරන්නාවූ ; **සමග්ගා,** **සියලු ; ඵලජාතා,** පර්වතජ නාගයෝ ; තෙ, අපගේ ; නයනපථ ගතා, නෙත්‍රපථයට (ඇස්හමුවට) පැමිණියාහු ; **සුඤ්ඤදප්පා** **භවන්ති,** ශූන්‍ය දර්ප ඇත්තාහු වෙති.

561\. ඉති, මෙසේ ; **තදුභයසෙනා,** ඒ විවිධ සෙනාවෝ ; අඤ්ඤමඤ්ඤං, **ඔවුනොවුන් ; ඝට්ටයන්තා,** ගටන්නාහු ; විවිධපහරණෙහා, නානාවිධ ප්‍රහාරදණ්ඩයෙහි ඊහා ඇත්තාහු ; ඉති, මෙසේ ; ගිරං උග්ගිරන්ති, වචන උසස්කොට කියත් ; **සතත, නිරන්තරයෙන් ;** බුහිත, කැළඹුනාවූ ; වෙලා, වෙරළ ඇති ; සාගරූමි ඉව, සමුද්‍රයාගේ තරඞ්ගයන් මෙන් ; භන්තා, **භ්‍රාන්තවූ ඔහු ;** ලුලිතලුලිතචිත්තා, **අතිශයින් ඇලළුන සිත් ඇත්තාහු ;** **යුද්ධොන්නතා,** සටනට **නැමුනාහු ;** **ඨිතාසුං,** **සිටියාහුයි.**

562. අථ තදහු මුනින්‍දො යාමිනීයාමමජ්ඣෙ
පතිනිය මතිජාලං ලොකමොලොකයන්තො,
සමරවසගතානං භොගිනං භාවිභූතිං*
තදුපරි ච'භිවුඩ්ඪිං පස්සි ලඞ්කාතලස්ස.

563. අථ මුනි මධුමාසෙ'පොසථෙ කාලපක්ඛෙ
කතනිඛිලවිධානො ගය්හ සඞ්ඝාටිකාදිං,
අනුගතිකමුදික්ඛං පච්ඡතො තො සමන්තා
සුමනසුමනනාමං පස්සි දෙවං සමිද්ධිං.

562. මුනින්‍දො, මුනීන්‍ද්‍රයන්වහන්සේ; අථ, ඉක්බිත්තෙන්; තදහු, එදවස්; යාමිනීයාමමජ්ඣෙ, රාත්‍රියගේ පශ්චිමයාමයෙහි; මතිජාලං, නුවණ නැමැති දැල; පතිනීය, පතුරුවා; ලොකං, ලොව; ඔලොකයන්තො, බලනසේක්; සමරවසගතානං, යුද්ධවශංගතවූ; භොගිනං, නාගයන්ට; භාවිභූතිං, මතු වන්නාවූ සම්පත්තියද; තදුපරි, ඉන් මත්තෙහි; ලඞ්කාතලස්ස, ලක්දිව්තලට (වන්නාවූ); අභිවුඩ්ඪිං ච, අභිවෘද්ධියද; පස්සි, දුටුසේක.

563. අථ, නැවත; මුනි, මුනිරජානන්වහන්සේ; කතනිඛිල විධානො, කළාවූ සියලු කටයුතු ඇතිසේක්; මධුමාසෙ, බක්මාසයෙහි; කාලපක්ඛෙ, කෘෂ්ණපක්‍ෂයෙහිවූ; උපොසථෙ, පොහෝදිනයෙහි; සඞ්ඝාටිකාදිං, සඟළසිවුරු ආදිය; ගය්හ, රැගෙණ; පච්ඡතො තො, පසැස් ඇතිසේක්; සමන්තා, හාත්පස; අනුගතිකං, සමග යන්නෙකු, උදික්ඛං, බලනසේක්; සුමන, යහපත් සිත්ඇති; සුමනනාමං, සුමන නම්වූ; සමිද්ධිං දෙවං, සමිද්ධි දෙවියා (සමිද්ධිසුමන දෙවියන්); පස්සි, දුටුසේක,

* "භාවිභොගං."

564. තදහු සුමනදෙවො ජෙතනාමෙ සුරම්මෙ
අධිවසති විහාරෙ වාරකොට්ඨොපකණ්ඨෙ,
ඨිතවිටපසමිද්ධෙ ඛීරිකාපාදපස්මිං
සුගතමභිනමන්තො අන්වහං පූජයන්තො.

565. තමසමමුනි දිස්වා'මන්තයිත්වා'ගතෙ තං
ඉදමවච මයා භො සද්ධිමාගච්ඡ ලඞ්කං,
සහ තව භවනම්හා (20) පුබ්බවුත්ථප්පදෙසෙ
තව භවති පතිට්ඨා භොගිනඤ්චා'භිවුද්ධි.

---

564. තදහු, එසමයෙහි; සුමනදෙවො, සුමනනම් දෙවි තෙම; සුගතං, බුදුන්ට; අන්වහං, දවස්පතා; අභිනමන්තො, නමස්කාරකරමින්; පූජයන්තො, පුදමින්; සුරම්මෙ, අති රම්‍යවූ; ජෙතනාමෙ විහාරෙ, ජෙතවන මහාවිහාරයෙහි; වාරකොට්ඨුපකණ්ඨෙ, දොරකොටු සමීපයෙහි; ඨිත, පිහිටියාවූ; විටපසමිද්ධෙ; අතුපතරින් සමෘද්ධවූ; ඛීරිකාපාදපස්මිං, කිරිපලුරුක්හි; අධිවසති, වෙසෙසි.

565. අසමමුනි, අතුල්‍යවූ සර්වඥතෙම; තං, ඔහු; දිස්වා, දැක; ආමන්තයිත්වා, කැඳවා; ආගතෙ, (ඔහු) ආකල්හි; ඉදං, මේ වක්‍ෂ්‍යමාණවචනය; තං, ඔහුට; අවච, වදාලසේක; භො, පින්වත; තව, තාගේ; භවනම්හා සහ, භවනග සමග; මයා සද්ධිං, මාසමග; ලඞ්කං, ලක්දිවට; ආගච්ඡ, අවමැනව; පුබ්බවුත්ථප්පදෙසෙ, පූර්වයෙහි තා වූසු නාග දිවයින්හි;* තව, තාගේ; පතිට්ඨා, පිහිටීම; භවති, වෙයි; භොගිනං ච, නාග යන්ටද; අභිවුද්ධි, අභිවෘද්ධිය (වෙයි).

---

* කියේමැනො—"දෙවො හි සො නාගදීපෙ මනුස්සො'නන්තරෙ භවෙ,
අහොසි රජ්ජායතනට්ඨිතඨානෙ ස අද්දස.
පච්චෙකබුද්ධෙ භුඤ්ජන්තෙ දිස්වා චිත්තං පසීදිය,
පත්තධොවනසාඛානි තෙසං පාදාසි තෙන සො.
නිබ්බත්ති තස්මිං රුක්ඛස්මිං ජෙතුය්‍යානෙ මනොරමෙ,
වාරකොට්ඨකපස්සම්හි පච්ඡා බහි අහොසි සො.
දෙවාතිදෙවො දෙවස්ස තස්ස බුද්ධිමුපෙක්ඛිය,
ඉදං ඨානං හිතත්ථඤ්ච තස්ස රුක්ඛං ඉධානයි."

මහාවංශ.

566. අථ මුනිවචනං සො මුඛනාමග්ගහෙත්වා
පමුදිතහදයො තං රුක්ඛමුබ්බච්ච මූලා,
සුගතමුපරි කත්වා ධාරයන්තො සුඵුල්ලං
බරිහිබරිහිජාතාකාරමාගා නභම්හි.

567. දසබලතනුභා'භිසඞ්ගමා සො දුමින්දො
තරලමණිව නානා'භාහි සම්භාවනීයො,
විලසිත ඉව සබ්බෙ රුක්ඛසෙලාදයො'පි
අපගතසකවණ්ණා වණ්ණවන්තා විරෙජුං.

568. බහුභුජගසුරාදී මිස්සිතා ඡප්පභාහි
නිජපතිනිජජායා* සමඤ්ඤමඤ්ඤාසු මුය්හුං,
අසිතගගනමජ්ඣෙ සොභමානො මුනින්දො
විතතවිවිධරංසී රංසිමාලීව ගච්ඡි.

566. අථ, ඉක්බිති; සො, ඒ සුමනදෙවතෙම; මුනිවචනං, බුඬවචනය; මුඛනා, මස්තකයෙන්; අග්ගහෙත්වා, පිළිගෙණ; පමුදිතහදයො, ඉතා සතුටුසිත් ඇත්තේ; තං රුක්ඛං, ඒ රුක; මූලා, මුලින්; උබ්බච්ච, උදුරා; සුඵුල්ලං, සුපුල්ලවූ රුක; බරිහි, මොනරුන්ගේ; බරිහිජාතාකාරං, මොනරපිල් සතක් මෙන්; සුගතමුපරිකත්වා, බුදුන් මතුයෙහි කොට; ධාරයන්තො, දරමින්; නභම්හි, ආකාශයෙහි; ආගා, ආගමනය කෙළේයි.

567. සො දුමින්දො, ඒ කිරිපලුරුක්රද; දසබලතනුභා, බුඬශ්‍රී ශරීරකාන්තිය හා; අභිසඞ්ගමා, එක්තුවීම හෙතුකොට ගෙණ; තරලමණී ඉව, කෞස්තුභ මාණික්‍යයක් මෙන්; නානාභාහි, අනෙකකාන්තියෙන්; සම්භාවනීයො, වර්ණනීය විය; සබ්බෙ, සියලු; රුක්ඛසෙලාදයො අපි, රුක්සෙල් ආදීහුද; විලසිතා ඉව, ප්‍රාභාප්‍රාප්තවූවාක් මෙන්; අපගතසක වණ්ණා, පහවගිය ස්වකීය වර්ණ ඇත්තාහු; වණ්ණවන්තා, වර්ණවත්වූවාහු; විරෙජුං, බැබලුහ.

568. ඡප්පභාහි, ෂඩ්විධ ප්‍රභායෙන්; මිස්සිතා, මිශ්‍රිතවූ; බහුභුජගසුරාදී, පක්ෂිනාගාමරාදීහු; අඤ්ඤමඤ්ඤාසු, අනොන්‍යවූ; නිජපතිනිජජායාසු, ස්වකීය ස්වාමීන් හා ස්වකීය භාර්‍ය්‍යාවන් විෂයෙහි; මුය්හුං, මුළාවූහ (නොහොත්); අඤ්ඤමඤ්ඤං, අනොන්‍යන්‍යයෝ; නිජපතිනිජජායාසු, සියහැම් සියබිරිඳුන් විෂයෙහි; සුමුය්හුං, අතිශයින් මුළාවූහු; මුනින්දො, මුනීන්ද්‍රයන් වහන්සේ; විතත, විස්තෘතවූ; විවිධරංසි, නානාවිධ රශ්මීන් ඇතිසේක්; අසිතගගනමජ්ඣෙ, නීලාකාශමධ්‍යයෙහි; සොභමානො, සොබනාසේක්; රංසිමාලී ඉව, (එසේවූ) සූර්‍ය්‍යයා මෙන්; ගච්ඡි වැඩිසේක.

* "හරියා."

569. ජලදපටලසඞ්ඝෙ මජ්ඣමුද්ධුලසිත්වා
බහි විලසිතකායො සොම්මදොසාකරො'ව,
කතුපරිතරුජායො ජොතමානො සමානො
උරගසමරඨානං ගන්ත්වා'කාසෙ නිසජ්ජ.

570. ඝනතරතිමිරං සො ඉද්ධියා සඞ්ඛරිත්වා
තහිමතිරවභීමං ඝොරසංරම්භවන්තං.
අසනිසතනිපාතං වස්සධාරාකරාලං
උරුතරතතමෙඝං මාපසී සීතවාතං.

571. ඉති තිභුවනනාථො දප්පිතෙ නාගසඞ්ඝෙ
විමදකරණහෙතු දස්සසී භෙරවානි,
අථ'පගතපගබ්භෙ තෙ විදිත්වාන සත්ථා
අපනුදි භයජාතං තඞ්ඛණංයෙව තත්ථ.

---

569. කත, කරණලද; උපරි, මත්තෙහි; තරුජායො, වෘක්ෂච්ඡායා ඇත්තාවූ; ජොතමානො සමානො, බබලන්නාමවූ සර්වඥයන්වහන්සේ; උරගසමරඨානං, නාගයන්ගේ යුද්ධස්ථානයට; ගන්ත්වා, වැඩ; ජලදපටලසඞ්ඝෙ, මෙඝපටල සමූහයෙක්හි; මජ්ඣං, මැද; උද්ධුලසිත්වා, විදුරණයකොට; බහි, පිටත්හි; විලසිතකායො, ජොතමාන ශරීර ඇති; සොම්මදොසාකරො ඉව, සෞම්‍යවූ චන්ද්‍රයා මෙන්; ආකාසෙ, අහස්හි; නිසජ්ජ, වැඩහිඳ :—

570. සො, ඒ සර්වඥතෙම; ඉද්ධියා, සෘද්ධිබලයෙන්; ඝනතර, ඉතාඝනවූ; තිමිරං, අන්ධකාරයක්; සඞ්ඛරිත්වා, නිර්මිත කොට; තහිං, එහි; අතිරව, අතිශයධ්වනියෙන්; භීමං, භයානකවූ; ඝොර, දරුණුවූ; සංරම්භවන්තං, වේගවත්වූ; අසනිසතනිපාතං, සියගණින් හෙන හෙන්නාවූ; වස්සධාරාකරාලං, වර්ෂාධාරාවෙන් භයානකවූ; උරුතර, ඉතා මහත්වූ; තත, පතලාවූ; සීතවාතං, සිහිල්පවන් හමන්නාවූ; මෙඝං, මෙඝයක්; මාපසී, මැවූසේක.

571. තිභුවනනාථො, ත්‍රෛලොක්‍ය ස්වාමිවූ සර්වඥතෙම; ඉති, මෙසේ; නාගසඞ්ඝෙ, නාගසමූහය; දප්පිතෙ, දප්පිවත්වූ කල්හි; විමදකරණහෙතු, (ඔවුන්) නිර්මදකිරීමට හෙතුවූ; භෙරවානි, භෛරවයන්; දස්සසී, දක්වූසේක; අථ, ඉක්බිති; සත්ථා, ශාස්තෘන්වහන්සේ; අපගත, පහවූ; පගබ්භ, ප්‍රාගල්භ්‍යඇති; තෙ, ඔවුන් (ඒනයින්); විදිත්වාන, දැන; තත්ථ, එහි; භයජාතං, භයරාසිය; තඞ්ඛණං එව, එකෙණෙහිම; අපනුදි, පහකළසේක.

572. තරුණතරණිසොභා කෙතුමාලාවිලාසිං
සුභරුචිමුඛචන්දං ලක්ඛණකිණ්ණගත්තං,
තිභවවිභවදෘසිං තං විදිත්වාන නාගා
චුතපහරණහත්ථා වන්දමානා මහිංසු.

573. සිරසි නිහිතපාණී රත්තපඞ්කෙරුහෙහි
විකචවදනනෙත්තා'මන්දකඤ්ජුප්පලෙහි,
සකසකධතනානාවණ්ණවම්මාදිකෙහි
විවිධකුසුමවත්ථා'මන්දදීපධජෙහි.

574. උරගභවනවාසා නාගකඤ්ඤා, සමෙච්ච
කුචකලසසහස්සං ධාරයන්තී සලීලං,
ලලිතකණකවල්ලීලීලමාධත්තගත්තා
ථුතිමුඛරමුඛා තා සාධු කීළං අකංසු.

---

572. නාගා, නාගයෝ; තරුණතරණිසොභා, ළහිරුබඳු ශොභා ඇති; කෙතුමාලාවිලාසිං, රශ්මිමාලාවෙන් බබලන්නාවූ; සුභ, සොභනවූ; රුචි, කාන්තිමත්වූ; මුඛචන්දං, මුඛ නැමැති චන්ද්‍රයා ඇත්තාවූ; ලක්ඛණ, දෙතිස් මහාපුරුෂලක්ෂණයෙන්; ආකිණ්ණගත්තං, ගැවසීගත් ශ්‍රීශරීරයක් ඇත්තාවූ; තිභව, භවත්‍රයට; විභවදෘසිං, විභවය (නිර්වාණය) දෙක්නාවූ; තං, ඒ මුනීන්ද්‍රයන්වහන්සේ; විදිත්වාන, හැඳින; චුතපහරණහත්ථා, අයු හල අත් ඇත්තාහු; වන්දමානා, වඳිමින්; මහිංසු, පිදූහ.

573. සිරසි, හිසෙහි; නිහිත, තබනලද; පාණී, අත් නැමැති; රත්තපඞ්කෙරුහෙහි, රත්පියුමෙන්ද; විකච, ප්‍රබුද්ධවූ; වදනනෙත්ත, වක්ත්‍රනෙත්‍ර නැමැති; අමන්දකඤ්ජුප්පලෙහි, බොහෝවූ පියුම් හා නිලුපුලින්ද!; සකසකධත, තම තමන් විසින් දරණලද; නානාවණ්ණ, නන්වන්වූ; වම්මාදිකෙහි, සන්නාහාදියෙන්ද; විවිධ, අනෙකප්‍රකාරවූ; කුසුමවත්ථ, පුෂ්ප වස්ත්‍ර හා; අමන්දදීපධජෙහි, බොහෝවූ වැටකෙහෙල්ලෙන්ද; (තං ඒ බුදුන්; මහිංසු, පිදූ).

574. සලීලං, ලීලාසහිතවූ; කුචකලස සහස්සං, පයොධර ඝට සහස්‍රයන්, ධාරයන්තී, දරන්නාවූ; උරගභවනවාසා, නාග භවනයෙහි වසන්නාවූ; ලලිත, ලීලොපෙතවූ; කණක වල්ලිලීලා, සුවණ්ණලතා ලීලාවෙන්; ආධත්ත, දරණලද; ගත්තා, ශරීර ඇති; ථුතිමුඛරමුඛා, ස්තුති කථායෙන් දෙඩමලුවූ මුව ඇති; තා නාගකඤ්ඤා, ඒ නාගාඞ්ගනාවෝ; සමෙච්ච, එකතුව; සාධුකීළං අකංසු, සාධුක්‍රීඩා කළාහුයි.

575. අථ මුනි උරගානං විග්ගහං තං සමෙතුං
සුතිමනකමනීයං නිච්ඡරං බ්‍රහ්මඝොසං,
අජරමමරමග්ගං සුප්පසත්ථං සුධීහි
වරමති වරධම්මං දෙසයී තං එණ්ණං.

576. න හො හො සංසාරෙ ඛලු භවති සාරං ලවම්පි
විසෙ සාතං සීතං ජලිතදහනෙ විජ්ජති කදා,
සදා රාගං රොගං බාධති ජනතං නෙකදුරිතං
තථාපායුං පාතො රවිරස්මිමුඛුස්සාවසදිසං.

577. සරීරො'යං බත්තිංසවිධකුණපො (21) සාරරහිතො
පරිත්තං යොබ්බඤ්ඤං කුසුමසදිසං නිග්ගතසිරී,
පහන්ත්වා ගන්තබ්බං භවජවිභවං සම්භතමිදං
අථෙවං සන්තෙ හො වරයති භවං කො නු හි බුද්ධො.

---

575. අථ, ඉක්බිති ; වරමති, උතුම් ප්‍රඥා ඇත්තාවූ ; මුනි, සර්වඥයන්වහන්සේ ; උරගානං, නාගයන්ගේ ; තං විග්ගහං, ඒ යුද්ධය ; සමෙතුං, සන්සිඳුවන්නට ; බ්‍රහ්මඝොසං, බ්‍රහ්ම ඝොෂ ; නිච්ඡරං, පතුරුවමින් ; සුතිමනකමනීයං, සවන් මන් පිණ වන්නාවූ ; අජරං, ජරාරහිතවූ ; අමරං, මරණ නැත්තාවූ ; අග්ගං, අග්‍රවූ ; (නොහොත්) අජරමමරමග්ගං, අජරාමර නිර්වාණ මාර්ගවූ ; සුධීහි, ප්‍රාඥයන් විසින් ; සුප්පසත්ථං, අතිශයින් පසස්නාලද ; තං වරධම්මං, ඒ උතුම් ධර්මය ; එණ්ණං, නාගයින්ට ; දෙසයී, දෙසූ සේක. (කෙසෙදයත්)

576. හො හො, භවත්නි භවත්නි ; සංසාරෙ, සසරෙහි ; ලවං අපි, ලෙශමාත්‍රවූද ; සාරං, සාරයක් ; ඛලු, එකාන්තයෙන් ; න භවති, නොවෙයි ; විසෙ, විෂ (ජාත) යෙහි ; සාතං, සැපයක්ද ; ජලිතදහනෙ, දිලියෙන ගින්නෙහි ; සීතං, ශීත ගුණයක්ද ; කදා, කවර කලෙක්හි ; විජ්ජති, විද්‍යමානද ; සදා, සැමකල්හි ; රාගං, රාගයද ; රොගං, රොගයද ; අනෙක දුරිතං, නොයෙක් උවදුරුද ; ජනතං, ජනසමූහයා ; බාධති, පෙළයි ; තථාපි, එසේම ; ආයු, ආයුස ; පාතො, අලුයම ; රවිරශ්මිමුඛ, හිරුහමුවූ ; උස්සාවසදිසං, තුෂාර සදෘශයි (පිනි බඳුයි.)

577. අයං සරීරො, මේ සිරුර ; බත්තිංසවිධ, දෙතිස් වැදෑරුම්වූ: කුණපො, කුණප ඇත්තේය ; සාරරහිතො, නිස්සාරය ; පරිත්තං, මඳවූ ; යොබ්බඤ්ඤං, යෞවනය ; නිග්ගතසිරි, පහවූ සොභා ඇත්තේ ; කුසුමසදිසං, (පර) මලක් බඳුයි; සම්භතං, රැස්කරණලද ; ඉදං, මේ ; භවජවිභවං, භවයොත් පනන සම්පත්තිය ; පහන්ත්වා, හැර ; ගන්තබ්බං, යායුතුය ; අථ, නැවත ; හො, භවත්නි ; එවං සන්තෙ, මෙසේ විද්‍යමාන කල්හි ; කො නු හි බුද්ධො, කිනම් නුවණැත්තෙක් ; භවං, සසර ; වරයති, පතාද ; (නොපතාමැයි).

578. පලාසී මක්ඛී කොධූපහතමනො (22) මානවිහවො
ජනො'තීතො'තො හො පයති නරකං දාරුණතරං,
එණී මජ්ජරෙ සා ගුහකකපයො භූය බහුසො
වධෙන්තඤ්ඤමඤ්ඤං නෙ නනු භවමිදං දුක්ඛමතිසං.

579. පුරෙ කාකොලූකා අථ වනභවා එඳනඉසා
කරිත්වා'ඝාතෙ'සං චිරමනුභවුං දුක්ඛමතිසං,
අහො කප්පට්ඨානං සරථ දුරිතං වෙරජමිදං
න හෙත්ථස්සාදො හො'ණුමපි කලහෙ මෙත්තිමමතං.

---

578. හො, පින්වත්නි; පලාසී, (අනුන් ගුණ හා සම්බැව් සිතන) යුගග්‍රාහය ඇත්තාවූ; මක්ඛී, ගුණමකුවූ; කොධී, කිපෙනසුලුවූ; උපහතමනො, ව්‍යාපාද සහගත සිත් ඇත් තාවූ; (නොහොත්) කොධඋපහතමනො, ක්‍රොධයෙන් පහ රණලද සිත් ඇත්තාවූ; මානවිහවො, මානය වස්තුකොට ඇත්තාවූ (මාන්වූ); ජනො, ජනතෙම; ඉතො, මෙලොවින්; අතීතො, මිය පරලොව ගියේ; දාරුණතරං, ඉතා දරුණුවූ; නරකං, නිරයට; පයති, යේ; තෙ, ඔහු තුමූ; එණීභූය, සපුවද; මජ්ජරෙ (භූය), බළල්වද; සා (භූය), බලුවද; ගුහකකපයො (භූය), යක්ෂව හා වඳුරුවද; බහුසො, බොහෝ සෙයින්; අඤ්ඤමඤ්ඤං, ඔවුනොවුන්ට; වධෙන්ති, වධ කරත්; ඉදං භවං, මේ සසර; අතිසං, සතතයෙන්; දුක්ඛං නනු, දුක් නොවේද ?

579. හො, භවත්නි; පුරෙ, පෙර; කාකොලූකා, කවුඩන් හා බකමූහුණෝද; අථ, සලි; වනභවා, වනජවූ; එඳන ඉසා, කොලොම්රැක් හා වලස්සුද; අඝාතෙ, අඝාතයෙහි; අඝං කරිත්වා, වෛරකොට; චිරං, බොහෝකලක් මුලුල් ලෙහි; අතිසං දුක්ඛං, නිරන්තර දුඃඛය; අනුභවුං, වින්දහුය; (හො, පින්වත්නි); අහො, අද්භූතය: කප්පට්ඨං, කල්පස්ථායීවූ; වෙරජං, වෛරයෙන් උපන්නාවූ; තං ඉදං දුරිතං, ඒ මේ දුක් උවදුරු; සරථ, සමරණය කරව්; (හො, භවත්නි); එත්ථ කලහෙ, මේ ඛබරයෙහි; අස්සාදො, රස විඳගැන්මක්; අණු අපි, බිඳුවකුත්; නහි, නැත්මය; මෙත්ති, මෛත්‍රිය; අමතං, අමෘතයකි.

580. බලං බාලානං භො සකසකවධායෙව භවති
අතීතෙකා ඛුද්දා ලටුකිකද්විජා නට්ඨතනයා,
ගජං බාලං මත්තං පවධි න බලං හොති සරණං
අථඨානෙ කිං භො කුරුථ වීරියං භූතිහනනං.

581. න දුක්ඛං තෙසං යෙ විගතකලහා එකමනසා
අතීතෙ භො ලාපා අඝට්ටිතමනා පෙය්‍යවචනා,
සුඛං වාසං'කාසුං යදහනි හවුං තෙ'ථ විධුරා
වසං ව්‍යාධස්සාගුං තදහනි අහො මෙධගබලං.

582. ඉති තිඛිණසුධිමා කතෙතුමෙතෙ සමග්ගිය
අවදි පවරධම්මං සාධු විඤ්ඤූපසත්ථං,
අථ මුදිතමනා තෙ පීණිතා තස්ස නාගා
මණිමයමතුලං තං ආසනංපූජයිංසු.

---

580. භො, භවත්නි; බාලානං, අඥනයන්ගේ; බලං, ශක්තිය; සකසකවධාය එව, තමතමන්ට වධපිණිසම; භවති, වෙයි; (ඒ එසේමැයි); අතීතෙ, යටගිය දවස; ඛුද්දා, ක්ෂුද්‍රවූ; නට්ඨතනයා, නට දරුවන් ඇති; එකා ලටුකිකද්විජා, එක් කැට කිරිල්ලක්; බාලං, අඥනවූ; මත්තං, මත්වූ; ගජං, ඇතෙකු; පවධි, නැසීය; බලං, ශක්තිය; සරණං න හොති, (තමහට) පිහිට නොවේ; භො, පින්වත්නි; අථ, එසේකල; භූතිහනනං, වැඩ නසන; වීරියං, වීර්‍ය්‍යය; අඨානෙ, අස්ථානයෙහි; කිං කුරුථ; කුමට කරව්ද?

581. යෙ, යමෙක්; විගතකලහා, ඩබර පහකළෝද; එකමනසා, සමසිත් ඇත්තෝද; තෙසං, ඔවුන්ට; දුක්ඛං න, දුකෙක් නොවේ (ඒ එසේමැයි); භො, භවත්නි; අතීතෙ, යට ගිය දවස; අඝට්ටිතමනා, නොගැටුනු සිත් ඇත්තාවූ; පෙය්‍ය වචනා, ප්‍රියකටයුතු වචන ඇත්තාවූ; ලාපා, වටුවෝ හෝ හොත් ගේකුරුල්ලෝ; සුඛං, සැපසේ; වාසං අකාසුං, වාසය කළාහුය; තෙ, ඔහුතුමු; අථ, නැවත; යදහනි, යම් දිනයෙක; විධුරා අහවුං, නොසමගි වූවාහුද; තදහනි, එදවස; ව්‍යාධස්ස, කිරාතයාගේ; වසං, වශයට; අගුං, ගියාහ; මෙධගබලං, කලහයාගේ ශක්තිය; අහො, විස්මය.

582. තිඛිණසුධිමා, තීක්ෂණ බුද්ධිමත් මුනීන්ද්‍රයන්වහන්සේ; එතෙ, මේ නයින්; සමග්ගිය කථං, සමගිවූවන් කරන්ට විඤ්ඤූපසත්ථං, නුවණැත්තන් විසින් පසස්නාලද; පවර ධම්මං, උතුම් ධර්මය; ඉති, මෙසේ; සාධු, මනාකොට; අවදි, දෙසූසේක; අථ, නැවත; මුදිතමනා, සතුටු සිත් ඇත්තාවූ; පීණිතා, පිණගියාවූ; තෙ නාගා, ඒ නාගයෝ; තස්ස, උන්වහන්සේට; මණිමයං, මිණිමුවාවූ; අතුලං, අසදෘශවූ; තං ආසනං, ඒ අස්න; පූජයිංසු, පිදූ.

583. අථ මුනි ගගනමෙහාරුය්හ භූමිප්පදෙසං
තරුණරවිව තස්මිං ආසනෙ ආසි භාසං,
අථ භුජගගණා තෙ දිබ්බඛජ්ජාදිකෙහි
පරිවිසිය මුනින්දං සාධු ධම්මං සුණිංසු.

584. අථ ජලථලජානං තත්ථ යුද්ධාගතානං
අගණිතභුජගානං 'සීතිකොටී භුජඞ්ගා,
විමලසරණසීලෙ සුප්පතිට්ඨා සුතුට්ඨා
අකරුමතිමුළාරං සත්ථු පූජාවිධානං.

585. අථ මහුදරරඤ්ඤො මාතුලො නාගරාජා
මණිනයනකනාමො රම්මකල්‍යාණිදෙසා,
උරගසමරහෙතූ ආගතො නාගදීපං
සුගතවරසරීරං දිස්වා නත්වාලපෙවං.*

---

583. අථ, ඉක්බිත්තෙන්; මුනි, සර්වඥයන්වහන්සේ; ගගනමෙහා, අහසින්; භූමිප්පදෙසං, බිම්පෙදෙසට; ඔරුය්හ, බැස; තරුණරවි ඉව, ළහිරු මෙන්; භාසං, බබලමින්; තස්මිං ආසනෙ, ඒ මාණික්‍යමයාසනයෙහි; ආසි, නිසීදනය කළසේක; අථ, නැවත; තෙ භුජගගණා, ඒ නාගසමූහයෝ; දිබ්බඛජ්ජාදිකෙහි, දිව්‍යඛාද්‍යාදීයෙන්; මුනින්දං, මුනීන්ද්‍රයන්වහන්සේ; පරිවිසිය, වළඳවා; සාධු, මනා කොට; ධම්මං, ධර්මය; සුණිංසු, ඇසූහ.

584. අථ, ඉක්බිත්තෙන්; තත්ථ, එහි; යුද්ධාගතානං, සට නට පැමිණියාවූ; ජලථලජානං, දිය ගොඩ උපන්නාවූ; අගණිතභුජගානං, අප්‍රමාණවූ නාගයන් අතුරෙන්; අසීතිකොටී භුජඞ්ගා, අසූකෙළක් නාගයෝ; සුතුට්ඨා, ඉතා සතුටුවූවාහු; විමල, නිර්මලවූ; සරණසීලෙ, සරණසීලයෙහි; සුප්පතිට්ඨාය, මොනවට පිහිටා; සත්ථු, ශාස්තෲන්වහන්සේට; අතිඋළාරං, ඉතා උදාරවූ; පූජාවිධානං. පූජාවිධිය; අකරුං, කළාහුයි.

585. අථ, ඉක්බිති; මහුදරරඤ්ඤො, මහොදර නම් නාරජහුගේ; මාතුලො, මයිල්වූ; මණිනයනකනාමො, මිණිඅක් නම්වූ; නාගරාජා, සර්පරාජතෙම; රම්ම කල්‍යාණිදෙසා, මනොඥවූ කැලණිපෙදෙසින්; උරගසමරහෙතූ, නාගයුද්ධය හේතුකොටගෙණ; නාගදීපං, නාදිවයිනට; ආගතො, ආයේ; සුගත, බුදුන්ගේ; වර, උතුම්වූ; සරීරං, සිරුර; දිස්වා, දැක; නත්වා, වැඳ; එවං, මෙසේ; අලපි, සැලකෙළේය.

---

* "දිස්වා නත්වා ලපෙමං."

586. යදි සුගත ඉමං ත්වං නාගතො අස්ස ඨානං
මයමපගතපාණා හොම ඛිත්වාඤ්ඤමඤ්ඤං,
රුධිරවහවිකිණ්ණො අස්ස භූමිප්පදෙසො
පසමි දහනදිත්තං අම්බුදෙනෙව තං ත්වං.

587. මම භගව පුරා මෙ දිට්ඨපුබ්බං තවෙතං
රුචිරසිරිසරීරං රංසිජාලාභිකිණ්ණං,
අපි සුමධුරධම්මං දෙසයන්තො සුරානං
දසබල සුතපුබ්බං අනුභාවඤ්ච තුය්හං.

---

586. සුගත, සුගතයන්වහන්ස; ත්වං, නුඹවහන්සේ; යදි, ඉදින්; ඉමං ඨානං, මෙතැනට; නාගතො අස්ස, නොම වැඩි සේක්වෙහි නම්; මයං, අපි; අඤ්ඤමඤ්ඤං ඛිත්වා, ඔවුනොවුන් යුද්ධකොට (මරා); අපගතපාණා හොම, පහවූ ප්‍රාණ ඇත්තෝ වමු; භූමිප්පදෙසො, බිම්පෙදෙස; රුධිරවහ, ලේ හැලීමෙන්; විකිණ්ණො, විකීර්ණවූයේ; අස්ස, වන්නේය; ත්වං, නුඹවහන්සේ; තං, ඒ කලහය; දහනදිත්තං, ගිනි ඇවිලගත්තක්; අම්බුදෙන ඉව, මෙඝයෙන් මෙන්; පසමි, ප්‍රශමනය කළසේක.

587. මම, මාගේ; භගව, භාග්‍යවතුන්වහන්ස; පුරා, පෙර; මෙ, මා විසින්; රංසිජාලාභිකිණ්ණං, රශ්මිජ්වාලායෙන් යුක්තවූ; එතං, මේ; තව, ඔබවහන්සේගේ; රුචිර, මනොඥවූ; සිරිසරීරං, ශ්‍රීශරීරය; දිට්ඨපුබ්බං, දුටුවිරූය; දසබල, දසබලධාරීන්වහන්ස; අපි, සලි; සුරානං, දෙවියන්ට; සුමධුර ධම්මං, සුමිහිරි දහමද; දෙසයන්තො, (ඔබවහන්සේ) වදාරණ කල්හි; තුය්හං, නුඹවහන්සේගේ; අනුභාවං ච, අනුභාවයද; සුතපුබ්බං, ඇසූවිරූය.

ශ්‍රී ලංකා ජාතික

588. අහමසම පුරෙ තෙ විස්සුතොයෙව දූසො
යදි මනසි දයා තෙ හොති දූසෙ පුනා'පි,
පවරරතනදීපෙ හොති කල්‍යාණිගඟා
මම වසති තහිං තං දට්ඨුකාමො'භියාචෙ.

589. ඉති යතිපති තස්සාරාධනං පග්ගහෙත්වා
සකපරිචිතභූම්‍යා චෙතියත්ථං විධාය,
මණිමයපරිභුත්තං ආසනං චා'පි තෙසං
ස සුමනතරුරාජං පූජනත්ථං විධාය.

590. දසබලපරිභුත්තං සබ්බමෙතං භුජඞ්ගා
මණිරිව රුචිදං තෙ ධාතුයො යෙව තස්මා,
මහථ නමථ නිච්චං මං'ව සග්ගාපවග්ගං
දදති ඉති ච වත්වා ඔවදිත්වාන සත්ථා.

---

588. අසම, අසදෘශවූ සර්වඥයන්වහන්ස; අහං, මම; පුරෙ, පෙර; තෙ, නුඹවහන්සේට; විස්සුතො එව, ප්‍රකටවූම; දූසො, දූසවීමි; දූසෙ, (ඒ) දූසවූ මා කෙරෙහි; පුනාපි, නැවත; තෙ, නුඹවහන්සේගේ; මනසි, සිත්හි; දයා, අනුකම්පාවක්; යදි හොති; ඉදින් වේනම්; පවර, උතුම්වූ; රතනදීපෙ, රුවන් දිවයින (හෙවත්) ලඞ්කාද්වීපයෙහි; කල්‍යාණිගඟා, කැලණිනම් නදියක්; හොති, වෙයි; තහිං, එහි; මම, මාගේ; වසති, වාසභවනය වෙයි; (එහිදී) තං, නුඹවහන්සේ; දට්ඨුකාමො, දකිනු කැමැත්තෙම්; අභියාචෙ, යාච්ඤා කරමි.

589. යතිපතී, යතිස්වාමිවූ; සො, ඒ සර්වඥයන්වහන්සේ; ඉති, මෙසේ; තස්ස, ඔහුගේ; ආරාධනං, ආයාචනාව; පග්ගහෙත්වා, පිළිගෙණ; සකපරිචිතභූම්‍යා, තමන් විසින් පුරුදු කරණලද භූමියෙහි; පරිභුත්තං, පරිභොගකළාවූ; මණිමයං, මාණික්‍යමයවූ; ආසනං ච අපි, ආසනයද; තෙසං, ඔවුන්ට; චෙතියත්ථං, සෑයක් පිණිස; විධාය, නියමකොට; සුමන තරුරාජං, සමන්දෙවියන්ගේ කිරිපලුරුකද; පූජනත්ථං, පිදීම පිණිස; විධාය, නියමකොට :—

590. සත්ථා, ශාස්තෘන්වහන්සේ; භුජඞ්ගා, නාගසීනි; දසබල, දසබලධාරීවූ මා විසින්; පරිභුත්තං, පරිභොගකරණලද; එතං සබ්බං, මේ සියල්ල; තෙ, නුඹ(ලා)ට; රුචිදං, කැමැති දෙය දෙන්නාවූ; මණි ඉව, මැණිකක් වැනිය; ධාතුයො එව, ධාතුහුමය; තස්මා, එහෙයින්; මං ඉව, මා මෙන්; නිච්චං, නිතර; මහථ, පුදව්; නමථ, වදිව්; සග්ගාපවග්ගං, ස්වර්ග මොක්ෂ සැප; දදති, දෙයි; ඉති, මෙසේ; වත්වා, වදාරා; ඔවදිත්වාන, අවවාද කොට :—

591. නභතලමුපගන්ත්වා දෙවනාගෙ මහෙන්තෙ
දිසි දිසි විසරන්තෙ නීලපීතාදිරංසි,
මනනයන හරන්තො ජන්තුනං ලොකසාරො
අගමි රවි'ව ඛම්හා ජෙතනාමං විහාරං.

592. අථ මනුජමරානං නන්තසඞ්ඛාදිකානං
සතතමමතධම්මං දෙසයන්තො ඵණීනං,
වනභවනසුරම්මෙ මඞ්කුලව්හෙ නගින්දෙ
අකරි මුනි නිවාසං ඡට්ඨමෙ හායනම්හි.

593. සුරපුරූපවනෙ'ථො පාරිජාතස්ස මූලෙ
අරුණමුදුසිලායං භාසමානො මුනින්දො,
සුනිපුණමභිධම්මං දෙසයන්තො සුරානං
අකරි වරනිවාසං සත්තමෙ තත්‍ථ වස්සෙ.*

---

591. නභතලං, අහස්තලට; උපගන්ත්වා, වැඩ; දෙවනාගෙ, දෙව නාගයන්; මහෙන්තෙ, පුදනකල්හි; නීලපීතාදිරංසි, නීලපීතාදි රශ්මීන්; දිසි දිසි, ඒ ඒ දිශාවන්හි; විසරන්තෙ, පතුරුවන්නාවූ; ජන්තුනං, සත්වයන්ගේ; මනනයනහරන්තො, සිත් නෙත් පැහැරගන්නාවූ; ලොකසාරො, ලොකොත්තමවූ සර්වඥයන්වහන්සේ රවිව, හිරු මෙන්; ඛම්හා, අහසින්; ජෙතනාමං විහාරං, ජෙතවන නම් විහාරයට; අගමි, වැඩ වදාළසේක.

592. අථ, ඉක්බිති; මුනි, බුදුරජතෙම; මනුජමරානං, දෙව්මිනිසුන්ටද; අනන්ත සඞ්ඛාදිකානං, අප්‍රමාණ සඞ්ඛාදීන්ටද; ඵණීනං, නාගයින්ටද; සතතං, නිරන්තරයෙන්; අමතධම්මං, නිර්වාණධර්මය; දෙසයන්තො, දෙසමින්; වනභවනසුරම්මෙ, අරණ්‍යවාසයෙන් අතිරම්‍යවූ; මඞ්කුලව්හෙ නගින්දෙ, මඞ්කුල නම් පර්වතයෙහි (මකුල්පව්වෙහි); ඡට්ඨමෙ හායනම්හි, සවනවසැ; නිවාසං අකරි, විසීම කළසේක.

593. අථො, ඉක්බිති; මුනින්දො, මුනීන්ද්‍රයන්වහන්සේ; සුරපුරඋපවනෙ, දිව්‍යපුරයෙහි උයන්වනයෙහිවූ; පාරිජාතස්ස මූලෙ, පරසතු රුක්මුල්හි; අරුණමුදුසිලායං, පාණ්ඩුකම්බලශෛලාසනයෙහි; භාසමානො, බබලමින්; සුරානං, දෙවියන්ට; සුනිපුණං, ඉතා සියුම්වූ; අභිධම්මං, අභිධර්මය; දෙසයන්තො, වදාරණසේක්; සත්තමෙ වස්සෙ, (බුදුවූ) සත්වෙනි වර්ෂයෙහි; තත්‍ථ, ඒ දිව්‍යලොකයෙහි; වරනිවාසං, උතුම් වාසය; අකරි, කළසේක.

---

* වාහෙ.

594. අථ සුබුද්ධමුනින්දො ජෙතනාමෙ විහාරෙ
අවසි විමලපඤ්ඤො අට්ඨමෙ සාරදස්මිං,
අජරමමරසන්තිං එසමානො පරෙසං
විවිධනයවිචිත්තං දෙසනං දෙසයන්තො.

ඉති ලඞ්කාය දුතියාගමනං.

---

595. එවං ජිනො ජෙතවනෙ වසන්තො
නිස්සාය සාවත්ථිපුරං විහාසි,
සා කීදිසී ආසි පුරී තදානී
තං කීදිසං ජෙතවනං විහාරං.

596. භූමඞ්ගනායාහිත උත්තමඞ්ග
භාසන්තනානාරතනාභිරාමා,
විසාලමොළීව විසාලභොගා
සා ජම්බුදීපම්හි බභූව රම්මා.

---

594. අථ, තදනන්තරව ; විමලපඤ්ඤො, නිර්මල බුද්ධි ඇත්තාවූ ; සුබුද්ධමුනින්දො, (ලෞකික ලොකොත්තර) සුබුද්ධයක මුනීන්ද්‍රයන්වහන්සෙ ; පරෙසං, මෙරමාහට ; අජරං, ජරාරහිතවූ ; අමරං, මරණ රහිතවූ ; සන්තිං, නිර්වාණය ; එසමානො, මාර්ගණයකරණසේක් ; විවිධනය විචිත්තං, නානාප්‍රකාර ක්‍රමයෙන් විචිත්‍රවූ ; දෙසනං, (ධර්ම) දෙසනාව ; දෙසයන්තො, වදුරණසේක් ; අට්ඨමෙ සාරදස්මිං, අටවෙනි වර්ෂයෙහි ; ජෙතනාමෙ විහාරෙ, ජේතවනනම් මහාවිහාරයෙහි ; අවසි, වුසූසේක.

(බුදුන්) ලඞ්කාවට වැඩි දෙවෙනි ගමනයි.

---

595. ජිනො, සර්වඥයන්වහන්සේ ; එවං, මෙසේ ; ජෙතවනෙ, ජෙතවනාරාමයෙහි ; වසන්තො, වැඩවසනසේක් ; සාවත්ථිපුරං නිස්සාය, සැවැත්නුවර නිසා ; විහාසි, වුසූසේක ; තදානී, එසමයෙහි ; සා පුරී, ඒ (ශ්‍රාවස්ති නම්) නගරීතොමෝ ; කීදිසී ආසි, කෙබඳුවීද ; තං ජෙතවනං විහාරං, ඒ ජෙතවන නම්වූ විහාරය ; කීදිසං (ආසි), කෙබඳුවීද ?

596. විසාල, මහත්වූ ; භොගා, සම්පත් ඇත්තාවූ ; රම්මා, රම්‍යවූ ; සා, ඒ පුරීතොමෝ ; භූමඞ්ගනාය, මහීකාන්තාවගේ ; උත්තමඞ්ග, මස්තකයෙහි ; ආහිතා, පිහිටුවනලද ; භාසන්ත, බබලන්නාවූ ; නානාරතන, නන්රුවනින් ; අභිරාමා, සිත්කළුවූ ; විසාල, මහත්වූ ; මොළී ඉව, කිරීටයක් මෙන් ; ජම්බුදීපම්හි, දඹදිව් (තෙලෙ) හි ; බභූව, වී.

597. සිරීනිකෙත සිරිමාවහන්ති
විරාජතෙ යා වසුධාතලස්මිං,
සා දෙවරාජස්ස'මරාවතීව
රඤ්ඤො, කුවෙරස්ස'ලකාව රම්මා.

598. සා පුප්ඵපප්ඵුල්ලජනාධිවුත්ථා
සොණ්ණාදිපුණ්ණාපණකිණ්ණවීථී,
උත්තුඞ්ගමාතඞ්ගතුරඞ්ගරඞ්ගා
සාරාජතෙ කඤ්චනමන්දිරාලී.

599. රරාජ සා භාසුරරාජපුත්තා
පුඤ්ඤඞ්ගනාලාසවිලාසයන්තී,
වෙදඞ්ගපාරඞ්ගතවිප්පචාරා
විපඤ්චසද්දෙහි ච නිච්චඝොසා.

---

597. සිරිමාවහන්ති, ශ්‍රී දරන්නාවූ; යා, යම් නගරියක් තොමෝ; සිරීනිකෙත, ලක්ෂ්මියට වාසස්ථානවූ; වසුධාතලස්මිං, පොළෝතෙලෙහි; විරාජතෙ, බබලාද; සා, ඕතොමෝ; දෙවරාජස්ස, දෙවෙන්ද්‍රයාගේ; අමරාවතී ඉව, අමරාවතී නම් රාජධානිය වැන්නීය; කුවෙරස්ස රඤ්ඤො, කුවෙරරජහුගේ; අලකා ඉව, අලකමන්ද නම් රාජධානිය මෙන්ද; රම්මා, රම්‍යවී.

598. පුප්ඵපප්ඵුල්ල, පිණිත් හා පැණිත් වැඩිහිටියාවූ; ජනාධිවුත්ථා, ජනයන් විසින් අධිවාසිතවූ; කඤ්චනමන්දිරාලී, සුවර්ණ ගෘහපඞ්ක්ති ඇත්තාවූ; සොණ්ණාදි පුණ්ණ, සුවර්ණාදියෙන් පිරුණාවූ; ආපනාකිණ්ණ, සල්පිළින් ගැවසී ගත්; වීථී, විශිඛා ඇති; උත්තුඞ්ග, උස්වූ; මාතඞ්ග, ඇතුන්ගේද; තුරඞ්ග, අසුන්ගේද; රඞ්ගා, පැණුම් ඇති; සා, ඒ නගරීතොමෝ; සාරාජතෙ, මොනවට බබලයි.

599. භාසුර, බබලන්නාවූ; රාජපුත්තා, රාජපුත්‍රයන් ඇත්තාවූ; පුඤ්ඤඞ්ගනාලාස, පුණ්‍ය ස්ත්‍රී ශොභායෙන්; විලාසයන්තී, බබලන්නාවූ; වෙදඞ්ග පාරඞ්ගත, වෙදවෙදාඞ්ගපාර ප්‍රාප්තවූ; විප්පචාරා, බ්‍රාහ්මණ සමූහයාගේ හැසුරුම් ඇත්තාවූ; විපඤ්චසද්දෙහි ච, දශවිධ ශබ්දයෙන්ද; නිච්චඝොසා, නිති (පතල) ඝොෂා ඇත්තාවූ; සා, ඒ නගරීතොමෝ; රරාජ, බැබලී.

600. අනෙකසිප්පිසතසම්පකිණ්ණා
නානාදිසාගතසත්ථවාහා,
පහූතඛීණාසවපාදපූතා
භාස සා මඞ්ගලමන්දිරංව.

601. භවන්තරෙ යො චරියං චරන්තො
සුවොපනිස්සාය වසං ගුණෙන,
යඤ්ඤඞ්ගසාඛිං මතසීනපත්තං
අකා සමිද්ධං ඵලපල්ලවෙහි.

602. ඉදානි පත්වාන භවස්ස අන්තං
නිස්සාය යං සො වසතෙ මුනින්දො,
තස්සා ගුණං කො හි අසෙසයිත්වා
කථෙති සාවස්සූපමාය තස්සා.

---

600. අනෙක, නොයෙක්; සිප්පිසත, සියගණන් ශිල්පීන් ගෙන්; සම්පකිණ්ණා, ගැවසීගත්තාවූ; නානාදිසාහි, නන් දිගින්; ආගත, පැමිණියාවූ; සත්ථවාහා, සාර්ථවාහකයන් ඇත්තාවූ; පහූත, බොහෝවූ; ඛීණාසව, වීතරාගීන්ගේ; පාද පූතා, පා තැබීමෙන් පවිත්‍රවූ; සා, ඒ නගරී තොමෝ; මඞ්ගල මන්දිරං ඉව, මඟුල් ගෙයක් මෙන්; භාස, බැබලී.

601. යො සුවො, යම් කීර පක්ෂියෙක්; භවන්තරෙ, අන්‍ය භවයෙහි; චරියං චරන්තො, සැරිසරන්නේ; ගුණෙන, ගුණය කරණකොටගෙණ; මත, මළාවූ; සීනපත්තං, වගුළ පත් ඇති; යඤ්ඤඞ්ගසාඛිං, හිඹුල්ගසක්; උපනිස්සාය, ඇසුරුකොට; වසං, වාසයකරන්නේ; ඵලපල්ලවෙහි, ඵලයෙන් හා ලපලුයෙන්; සමිද්ධං අකා, සමෘද්ධකෙළේද.

602. සො මුනින්දො, ඒ මුනිරජතෙම; භවස්ස, භවයාගේ; අන්තං, කෙළවරට; පත්වාන, පැමිණ; ඉදානි, දැන්; යං නිස්සාය, යම් පුරියක් නිසා; වසතෙ; වැඩවසනසේක්ද; කො හි, කවරෙක්නම්; තස්සා, ඒ පුරියගේ; ගුණං, ගුණය; අසෙසයිත්වා, නිරවශෙෂ කොට; කථෙති, කියාද; තස්සා, ඒ පුරියට; සා එව, ඕ තොමෝම; උපමාය, උපමාපිණිස; අස්ස, වන්නීයි.

603. තස්සොපකණ්ඨෙ රතනංව'නග්ඝං
මනොහරෙ උත්තමසත්තසෙවී,
ජනානමාකඞ්ඛිතදෙ විහාරෙ
බභූව ජෙතාදිවනව්හයෙන.

604. සමුප්ඵුල්ලපුප්ඵරසමොදිතඡප්පදාලී
ඣඞ්කාරනාදපරිවාදිතතන්තිනාදෙ,
සම්මත්ත'නන්තදිජකූජිතගීතවන්තා
තිට්ඨන්ති යත්ථ තරවො නටකාව ඡෙකා.

605. ඛීරණ්ණවාහරිය ධොවිය ඛීරනීරා
සොසෙත්ව සජ්ඣුමලයෙ සසිකන්තිමිස්සං,
යත්ථොකිරිත්ව තනිතා විය වාලුකායො
සා මාලුකාවලි බභාස පයොදධීව.

---

603. තස්සා, ඒ පුරියගේ; උපකණ්ඨෙ, සමීපයෙහි; අනග්ඝං, අනගිවූ; රතනං ඉව, රුවනක් මෙන්; මනොහරෙ, මනහරවූ; උත්තමසත්තසෙවී, උතුම් ජනයන් සෙවිනාවූ; ජනානං, සත්වයන්ට; ආකඞ්ඛිතදෙ, අභිමතාර්ථ දායකවූ; ජෙතාදිවනව්හයෙන, ජෙතවන යන නමින් (ප්‍රසිද්ධවූ); විහාරෙ, වෙහෙරක්; බභූව, වී.

604. යත්ථ, යම් විහාරොපවනයෙක්හි; සමුප්ඵුල්ල, මොනවට පිපියාවූ; පුප්ඵ, පුෂ්පයන්ගේ; රස, රසපානයෙන්; මොදිත, ප්‍රමුදිතවූ; ඡප්පදාලී, භෘඞ්ගශ්‍රෙණීන්ගේ; ඣඞ්කාරනාද, ඣං යන අනුකරණ ශබ්ද නැමැති; පරිවාදිත, වයනලද; තන්තිනාදෙ, තත්නද ඇත්තාවූ; සම්මත්ත, ඉතාමත්වූ; අනන්ත, අපමණවූ; දිජ, පක්ෂීන්ගේ; කූජිත, රාවප්‍රතිරාව නැමැති; ගීතවන්තා, ගීතිකානාද ඇත්තාවූ; තරවො, වෘක්ෂයෝ; ඡෙකා, දක්ෂවූ; නටකා ඉව, නළුවන් මෙන්; තිට්ඨන්ති, සිටිද්ද.

605. වාලුකායො, (යම්තැනක) වැලි; ඛීරණ්ණවා, කිරිසයුරෙන්; ආහරිය, ගෙණවුත්; ඛීරනීරා, කිරිදියෙන්; ධොවිය, ධොවනයකොට; සජ්ඣුමලයෙ, රිදී ගලතලායෙහි; සසිකන්තිමිස්සං, සඳරැස් මුසුකොට; සොසෙත්වා, වියලා; යත්ථ යම් තැනෙක්හි; ඔකිරිත්වා, ඉස; තනිතා විය, අතුරණලද්දක් මෙන් (බබලද්ද); සා මාලකාවලි, ඒ මලුපෙත්තොමෝ; පයොදධි ඉව, කිරිසයුර මෙන්; බභාස, බැබලූනාල.

606. විජ්ජොතමානරතනප්පමුඛානනම්හි
සොපානමාලපදගණ්ඩිද්ධජෙහි හාසං,
කත්වෙව දෙවභවනානමහං විරාග
වත්තී'ති ගන්ධකුටි යත්ථ පභාසසිද්ධා

607. කම්මාරගග්ගරිමුඛොපරිසම්පපුණ්ණා
අඞ්ගාරකන්තරවිනිග්ගතජාලකාව,
සම්බුද්ධදෙහපරිනිග්ගතරංසිමාලා
දූසග්ග* නිග්ගතකරා විසරන්ති යස්මිං.

608. තුම්හෙ සරාගජනසඞ්ගමතො'තිහීනා
ධඤ්ඤා, මයන්ති විමලෙහි සමඞ්ගිතත්තා,
තුට්ඨාව හාසමකරා සුරපාදපානං
රාජෙන්ති යත්ථ යතිනිස්සිතපාදපින්දා.

---

606. අහං, මම ; විරාගවත්තන්ති, විතරාගීන් ඇත්තියක්මියි ; විජ්ජොතමාන, බබලන්නාවූ ; රතනප්පමුඛ, රත්නාවෙදිකා නැමැති ; ආනනම්හි, වදනයෙහි ; සොපානමාලපදගණ්ඩීද්ධජෙහි, හිණිමංපෙළපියගැට නැමැති දසනින් ; දෙවභවනානං, දිව්‍යභවනයන්ට ; හාසංකත්වා ඉව, සිනා පහළ කොට මෙන් ; යත්ථ, යම් අරමෙක්හි ; ගන්ධකුටි, ගඳකිළිය ; පභාසසිද්ධා, බැබලීද.

607. කම්මාරගග්ගරිමුඛ උපරි, කඹුරුසමමුව මතුයෙහි ; සම්පපුණ්ණා, පරිපුණ්ණවූ ; අඞ්ගාරකන්තර, අඟුරුතුරින් ; විනිග්ගත, නික්මුණු, ජාලකා ඉව, (වන්නි) ජාලා මෙන්ද ; දූසග්ග නිග්ගතකරා (ඉව), චන්ද්‍රග්‍රහණයෙහි නික්මුණු රශ්මීන් මෙන්ද ; (නොහොත්) දූසග්ග, වනඅගින් හෝ කල්පාන්ත යෙහි ; නිග්ගත, නික්මුණු ; කරා (විය), (ගිනි) රැස් මෙන්ද ; (නොහොත්) දූසග්ගි නිග්ගතකරාවිය, ලැව්ගින්නෙන් නිකුත් රැස්මෙන්ද ; සම්බුද්ධ දෙහ, සම්බුදුබඳින් ; නිග්ගත, නික්මුණු ; රංසිමාලා, රශ්මි මාලාවෝ ; යස්මිං, යම් තැනෙක්හි ; විසරන්ති, පැතිරෙද්ද.

608. යතිනිස්සිතපාදපින්දා, යතීන් ඇසුරුකළ වෘක්ෂරාජයෝ ; "තුම්හෙ, තෙපි ; සරාගජනසඞ්ගමතො, සරාගීජනයන් සමඟ විසීමෙන් ; අතිහීනා, අතිශයින් හීනයෝය ; විමලෙහි, විගතකෙලශමල ඇත්තන් හා ; සමඞ්ගිතත්තා, සමුපෙත හෙයින් ; මයං, අපි ; ධඤ්ඤා ඉති, පිණැත්තම්හ" යි ; තුට්ඨා, සන්තුෂ්ටවූවෝ ; සුරපාදපානං, දිව්‍යවෘක්ෂයන්ට ; අව හාසං අකරා ඉව, අපහාස කළාක් මෙන් ; යත්ථ, යම් තැනෙක්හි ; රාජෙන්ති, බබලත්ද,

---

* "දූසග්ගි."

609. පුන්නාගනීපවකුලජ්ජුනරාජරුක්ඛ
නාගාගචූතයුගපත්තකචම්පකානං,
පුප්ඵාභිකිණ්ණධරණී රතනෙහි නානා
පච්ඡන්නදිබ්බභවනං විය භාති යත්ථ.

610. බ්‍රහ්මාසුරාසුරනරොරගලිඞ්ගිසිඛ
විජ්ජාධරාදිජනතාකතවන්දනෙහි,
තෙහෙව ඛුඩ්ඪථුතිමඞ්ගලගීතිකාහි
යත්ථොපගාන මනනෙත්තගණං මුදෙන්ති.

611. නිඝොසිතාමලසුසීතලනිජ්ඣරෙහි
සම්මත්තනෙකදිජඛුඩ්ඪජලාසයෙහි,
කිඤ්ජක්ඛපත්තපරිකිණ්ණසිලාතලෙහි
තුස්සන්ති යත්ථ සතතං යතිනං මනානි.

---

609. පුන්නාග, දොඹය; නීප, බක්මීය; වකුල, මුහුන මල්ය; අජ්ජුන, කුඹුක්ය; රාජරුක්ඛ, ඇසළය; නාගාග, නාය; චූත, මීඅඹය; යුගපත්තක, කොබෝලීලය; චම්පකානං, සපුය යන මොවුන්ගේ; පුප්ඵ, මලින්; අභිකිණ්ණ, ගැවසීගත්තාවූ; ධරණී, දෙරණ; නානාරතනෙහි, නන් රුවනින්; පච්ඡන්න, ප්‍රච්ඡන්නවූ; දිබ්බභවනං විය, දිව්‍ය භවනයක් මෙන්; යත්ථ, යම් පෙදෙසෙක්හි; භාති, බබලාද.

610. බ්‍රහ්ම, බ්‍රහ්මය; සුර, දෙවිය; අසුර, දානවය; නර, මනුෂ්‍යය; උරග, සර්පය; ලිඞ්ගි, සෘෂිය; සිඛ, සිඛය; විජ්ජාධර, විද්‍යාධරය; ආදි, යන මේ ආදීවූ; ජනතා, ජනසමූහයා විසින්; කත, කරණලද; වන්දනෙහි, වැඳීම් කරණකොට ගෙණද; තෙහි එව, ඒ බ්‍රහ්මාදීන් විසින්ම; ඛුඩ්ඪ, ශොභිතවූ; ථුතිමඞ්ගලගීතිකාහි, ස්තුතිමඞ්ගල ගීතිකාවන් කරණකොට ගෙණද; යත්ථ, යම්තැනෙක්හි; උපගානං, එළැඹියාවුන්ගේ; මනනෙත්තගණ, සිත්නෙත්මුලු; මුදෙන්ති, සතුටුවෙද්ද.

611. යත්ථ, යම් තැනෙක්හි; නිඝොසිත, හඬගත් ඝොෂා ඇති; අමල, නිම්මලවූ; සුසීතල, ඉතා සිහිල්වූ; නිජ්ඣරෙහි, ගඟුලැල්ලෙන්ද; සම්මත්ත, අතිශයින් මත්වූ; අනෙක, නොයෙක්; දිජ, පක්ෂීන් විසින්; ඛුඩ්ඪ, ශොභිතවූ; ජලාසයෙහි, ජලාසයවලින්ද; කිඤ්ජක්ඛපත්තපරිකිණ්ණ, පුෂ්පරාග හා පත්‍රයන්ගෙන් ගැවසුනාවූ; සිලාතලෙහි, ගල්තලෙන්ද; යතිනං, යතීන්ගේ; මනානි, සිත්; සතතං, අනවරතයෙන්; තුස්සන්ති, සතුටුවෙත්ද.

ශ්‍රී ලංකා ජාති

612. යො නෙකකප්පසතසඤ්චිතපුඤ්ඤරාසි
හිත්වාමිතං කපිලවත්ථුමහාසිරිම්පි,
ආගම්ම යත්ථ නිරතො සුගතො මහෙසි
කො තත්ථ භූති* මතුලං කථිකො කථෙති.

613. තස්මිං ජිනො වසති ජෙතවනෙ විහාරෙ
ඉන්දු යථා රුචිරනන්දනකානනම්හි,
බ්‍රහ්මාව බ්‍රහ්මභවනෙ සපිතාමහෙහි
තාරාවලීපරිවුතො ගගනෙව චන්දො.

614. තදාගමම මහානාගො මණිඅක්ඛිකනාමකො,
ලඞ්කාතො ජිනපාදස්මිං එණිං පච්චදමබ්‍රවි.

---

612. මහෙසි, මහර්ෂිවූ; අනෙකකප්පසත, නොයෙක් සිය ගණන් කප්හි; සඤ්චිත, රැස්කරණලද; පුඤ්ඤරාසි, පුණ්‍යරාශි ඇති; යො සුගතො, යම් සුගතොත්තමයෙක්; අමිතං, අප්‍ර මාණවූ; කපිලවත්ථුමහාසිරිං අපි, කිඹුල්වත මහරජසිරිසැප තද; හිත්වා, හැර; ආගම්ම, අවුත්; යත්ථ, යම් තැනක; නිරතො, ඇලුනුසේක්ද; තත්ථ, එහි; අතුලං, අතුල්‍යවූ; භූතිං, ශ්‍රීසමෘද්ධිය; කො කථිකො, කවරනම් කථිකයෙක්; කථෙති, කියාද (නොකියාමැයි).

613. රුචිර, මනොඥවූ; නන්දන කානනම්හි, නන්දන යන්හි; ඉන්දු යථා, ශක්‍රදෙවෙන්ද්‍රයා මෙන්ද; බ්‍රහ්මභවනෙ, බ්‍රහ්මභවනයෙහි; පිතාමහෙහි සහ, බ්‍රහ්මයන් සමගවූ; බ්‍රහ්මා ඉව, මහාබ්‍රහ්මයා මෙන්ද; ගගනෙ, ආකාශයෙහි; තාරාවලීපරිවුතො, තරුපෙල පිරිවැරූ; චන්දො ඉව, චන්ද්‍රයා මෙන්ද; ජිනො, (සඟගණ පිරිවැරූ) බුදුරජතෙම; ජෙත වනෙ, ජෙතවන නම්වූ; තස්මිං විහාරෙ, ඒ විහාරයෙහි; වසති, වැඩවාසය කරණසේක.

614. තදා, එසමයෙහි; මණිඅක්ඛික නාමකො, මිණිඅක් නම්වූ; මහානාගො, මහානාගතෙම; ලඞ්කාතො, ලක්දිවින් (නික්ම); අගමම, (දෙව්රම් වෙහෙරට) පැමිණ; ජිනපා දස්මිං, බුදුන් සිරිපාමුල්හි; එණිංපති, නසින් පිණිස; ඉදං, මෙය; අබ්‍රවි, සැලකෙළේයි.

---

* "භූති."

615. සම්බුද්ධා ධීර ලොකස්මිං ලොකස්සත්ථාභිවුද්ධියා,
ජායන්ති සාමි තුම්හාකං දයායනොතා ගධා මයං·

616. තෙන මෙ දුක්ඛභූතස්ස සංසාරන්දුඝරා චිරා,
මුත්තිං යදිච්ඡසෙ මය්හං ගහණීයං නිමන්තණං.

617. සුත්වාන තං මහානාගො මහානාගනිමන්තණං,
පටිග්ගහෙසි තං තුණ්හීභාවෙන කරුණාය සො.

618. ඤත්වා තං සුමනො නාගො ලහුමාගම්ම සීහලං,
කල්‍යාණිගඞ්ගපස්සම්හි මනොනන්දනභූතලෙ.

---

615. ධීර, ධීරයන්වහන්ස; සම්බුද්ධා, සර්වඥවරයෝ; ලොකස්ස, ලෝකයාගේ; අත්ථාභිවුද්ධියා, (උභය) අර්ථාභිවෘද්ධිය පිණිස; ලොකස්මිං, ලෙව්හි; ජායන්ති, පහළවෙත්; සාමි, ස්වාමීන්වහන්ස; මයං, අපි; තුම්හාකං, තුඹවහන්සේගේ; දයාය, කරුණා (ජල) යට; අනොතාගධා, ඇතුළත්හු වෙමු.

616. තෙන, එහෙයින්; චිරා, ස්චිරවූ; සංසාරන්දුඝරා, සසර නැමැති බන්ධනාගාරයෙන්; දුක්ඛභූතස්ස, දුඃඛයෙක්වූ; මෙ, මාගේ; මුත්තිං, මිදීම; යදි, ඉදින්; ඉච්ඡසෙ, (ඔබ) කැමැත්තෙහිනම්; මය්හං, මාගේ; නිමන්තණං, ආරාධනාව; ගහණීයං, පිළිගතයුතුයි.

617. සො මහානාගො, ඒ මහෝත්තමවූ සර්වඥතෙම; තං සුත්වාන, ඒ අසා; තං මහානාගනිමන්තණං, ඒ මහානාග නිමන්ත්‍රණය; කරුණාය, කුළුණින්; තුණ්හීභාවෙන, නිශ්ශබ්ද භාවයෙන්; පටිග්ගහෙසි, පිළිගත්සේක.

618. නාගො, (ඒ මිණිඅක්) නා (රද) තෙම; තං ඤත්වා, ඒ දැන; සුමනො, සතුටුසිත් ඇත්තේ; සීහලං, හෙළදිවට; ලහුං, වහා; ආගම්ම, අවුත්; කල්‍යාණිගඞ්ගපස්සම්හි, කැළණි ගංපසෙහි; මනොනන්දනභූතලෙ, සිත්කලු බිම්තෙලෙහි.

619. සජ්ඣුකම්බුමණිමුත්තපවාලවජිරාමයෙ,
මහාරහෙ මහාථූපෙ ඝටකාදිං නිධාපිය.

620. දත්වා තුලාදයො සෙසමන්දිරඞ්ග තථෙව ච,
විටඞ්කවාලසීහාදි පන්තියො'පි තථෙවහි.

621. සාතකුම්භමයානෙකචිත්තෙහි සාධු චිත්තිතං,
නිම්මාය ගොපානසියො පක්ඛපාසෙ ච කණ්ණිකං.

622. සිඞ්ගිනික්ඛෙන සිඞ්ගං ඡදනින්දමණීහි ච,
සොණ්ණකිඞ්කිණිමාලායො කණ්ණමාලා ච මාපිය.

---

619. සජ්ඣු, රිදීය; කම්බු, රන්ය; මණි, මිණිය; මුත්තා, මුතුය; පවාල, ප්‍රවාලය; වජිරාමයෙ, විදුරුය යන මෙයින් නිමවනලද්දාවූ; මහාරහෙ, මහාර්ඝවූ; මහාථූපෙ, මහ වැම්ද; ඝටකාදිං, කලසාදීයද; නිධාපිය, පිහිටුවා:—

620. තථෙව, එසේම; සෙසමන්දිරඞ්ග, සෙසු මැදුරු අවයවවූ; තුලාදයො, තුලාන් ආදීන්ද; තථෙවහි, එසේම; විටඞ්කවාලසීහාදි, කොබෝගෙඩිවලලූ හා ව්‍යාඝ්‍ර (රූප) සිංහ (රූප) ආදීන් සම්බන්ධ; පන්තියො'පි, පන්තිද; දත්වා, දී.

621. සාතකුම්භමය, සුවර්ණමයවූ; අනෙකචිත්තෙහි, නොයෙක් සිතියමින්; සාධු, මනාකොට; චිත්තිතං, සිතියම් කරණලද; කණ්ණිකං, කණ්ණිකාද; පක්ඛපාසෙ, පුවරුද: (නොනොත්) පියසි පසෙහි; ගොපානසියො, ගොනැස්ද; නිම්මාය, නිම්මිතකොට.

622. සිඞ්ගිනික්ඛෙන, සිඞ්ගි සුවර්ණයෙන්; සිඞ්ගං, (ප්‍රාසාද) ශෘඞ්ග (පහකොත්) ද; ඉන්දමණීහි, ඉඳුනිල්මිණීන්; ඡදනං, පියසිද; සොණ්ණකිඞ්කිණිමාලා යොච, රන්රසු දැල්මාලාද; කණ්ණමාලා ච, (ඡදනාග්‍රයන්හි එල්වනලද) කණ්ණමාලාද; මාපිය, මවා.

623. චිත්‍රවිතානං බන්ධිත්වා මුත්තොලම්බෙ තහිං තහිං,
කත්වාන ගන්ධදාමෙහි පුප්ඵදාමෙහි සඞ්කුලං.

624. ඉන්දනීලමයං භූමිමජ්ඣ'නග්ඝ මහාසනං,
මාපෙසි පරිතො සෙසභික්ඛූනං ච සුභාසනෙ.

625. රතනෙහෙවාපස්සයෙ වෙදිකා ඵලිකාමයෙ,
මුත්තාවාලුකසඞ්කිණ්ණං මාලකං ච මනොරමං.

626. සත්තරතනසම්භූත තොරණූපරිතොරණෙ,
සතනීරකුසුමාකිණ්ණෙ හාටකාදිඝටාකුලං.

---

623. චිත්‍රවිතානං, විසිතුරු වියන්; බන්ධිත්වා, බැඳ; තහිං තහිං, තන්හි තන්හි; මුත්තොලම්බෙ, මුතුලැල්ද; (බන්ධිත්වා, බැඳ); ගන්ධදාමෙහි, ගඳදමින් හා; පුප්ඵදාමෙහි, මල්දමින්ද; සඞ්කුලං කත්වාන, ගැවසිගත්තක් කොට.

624. භූමිමජ්ඣෙ, (යථොක්ත) භූමිමධ්‍යයෙහි; අනග්ඝං අනර්ඝවූ; ඉන්දනීලමයං, ඉඳුනිල්මිණිමුවාවූ; මහාසනං, මහත් අස්නක්ද; පරිතො, (ඒ) හාත්පස; සෙසභික්ඛූනං, සෙසු භික්ෂූන්ට (යොග්‍යවූ); සුභාසනෙ ච, සොභනාසනයන්ද; මාපෙසි, මැවී.

625. රතනෙහි එව, රුවනින්ම; අපස්සයෙ, අපාශ්‍රය (හේත්තුවෙන පුවරු)ද; වෙදිකාඵලිකාමයෙ, පළිඟුමුවාවූ පිල්කඩද; මනොරමං, මනොරම්‍යවූ; මුත්තාවාලුකා, මුතුවැල්ලෙන්; සඞ්කිණ්ණං, ගැවසුනු; මාලකං ච, මලුවද; (මාපෙසි, මැවී.)

626. සත්තරතනසම්භූත, සත්රුවනින් නිපන්; තොරණූපරිතොරණෙ, තොරන් මතු තොරන්ද (මවා); සතනීරකුසුමාකිණ්ණෙ, තැඹිලි මලින් ගැව්සුනු; හාටකාදී; ස්වර්ණාදී මයවූ; ඝටාකුලං, (පූර්ණ) ඝට (පඞ්ක්ති)යෙන් ගැවසුනාවූ.

627. නෙකරඞ්ගධජාකිණ්ණං විතානසමලඞ්කතං,
දීපධූපාලිසඞ්කිණ්ණං ගන්ධපුප්ඵසමාකුලං.

628. එවමාදීහි නෙකෙහි වණ්ණෙහි සමලඞ්කතං,
මාපෙත්වා මණ්ඩපං සෙට්ඨං දෙවමණ්ඩපසන්නිභං.

629. සිතවාලුකසඤ්ඡන්නං මුදුපාදපටත්ථතං,*
මාපෙත්වෙවං මහාමග්ගං සුරඤ්ජසසමඤ්ජසං.

630. සජ්ජිත්වාන තෙ නාගා ඛජ්ජභොජ්ජඵලාඵලෙ,
දිබ්බන්නපානෙ පචුරෙ පටිමග්ගං ගමුං තදා.

---

627. නෙකරඞ්ගධජාකිණ්ණෙ, නානාවර්ණධවජයෙන් ගැවසීගත්; විතානසමලඞ්කතං, වියන්හි මොනවට සැදුනාවූ; දීපධූප, පහන් දුම් හා; අලිසඞ්කිණ්ණෙ, බිඟුපෙළින් ගැවසුනු; ගන්ධපුප්ඵ සමාකුලං, ගඳමලින් ගැවසුනාවූ.

628. දෙවමණ්ඩපසන්නිභං, දිව්‍යමණ්ඩපයක් වැනිවූ, සෙට්ඨං, අතිශයින් ප්‍රශස්තවූ; මණ්ඩපං, මඩුවක්; එවමාදීහි, මේ ආදීවූ; අනෙකෙහි වණ්ණෙහි, අනෙකප්‍රකාරයෙන්; සමලඞ්කතං, සාලඞ්කෘත කොට; මාපෙත්වා, මවා.

629. සිතවාලුකසඤ්ඡන්නං, සුදුවැල්ලෙන් වසනලද්දාවූ; මුදු, මොළොක්වූ; පාදපටත්ථතං, පියවිළි අතුළාවූ; සුරඅජසසමඅජසං, දෙව්මගක් බඳු මගක්වූ; මහාමග්ගං, මහාවීථි මාර්ගය; එවං, මෙසේ (යථොක්තාකාරයෙන්); මාපෙත්වා, මවා.

630. තදා, එකල්හි; තෙ නාගා, ඒ නාගයෝ; ඛජ්ජ, කෑසුතු දෑද; භොජ්ජ, බුදියයුතු දෑද; ඵලාඵලෙ, කුඩු මහත් ඵල යන්ද; පචුරෙ, බොහෝවූ; දිබ්බන්නපානෙ, දිව්‍යාහාරපාන යන්ද; සජ්ජිත්වාන, රැස්කොට; පටිමග්ගං, පෙරමගට; අගමුං, ගියාහුයි.

---

* "මුදුපච්චත්ථරත්ථතං."

631. තතොකාරුණිකොනාථොබොධිතොඅට්ඨමෙසමෙ,
වෙසාඛපුණ්ණමාසිම්හි සන්නිපාතිය සාවකෙ

632. එථජ්ජ භික්ඛවො ලද්ධං නාගානං'නුග්ගහායහො,
මණිඅක්ඛිකො නිමන්තෙතාසි පසන්නො බුද්ධසාසනෙ.

633. සුත්වාන වචනං තස්ස සම්බුද්ධස්ස සිරීමතො,
අස්සවා පෙසලා භික්ඛූ පච්චස්සොසුං සමාහිතා.

634. සාරිපුත්තො තතො ථෙරො පඤ්ඤායග්ගධුරන්ධරො,
පත්තචීවරමාදාය අගමා ජිනුපන්තිකං,

---

631. තතො, ඉක්බිති; කාරුණිකො, කරුණාපරවූ; නාථො, ලොකස්වාමීන්වහන්සේ; බොධිතො, සම්‍යක්සම්බොධියෙන්; අට්ඨමෙ සමෙ, අටවැනි අවුරුද්දෙහි; වෙසාඛපුණ්ණමාසිම්හි, වෙසක් පුණු පොහෝදිනයෙහි; සාවකෙ, ශ්‍රාවකයන්; සන්නිපාතිය, රැස්කොට.

632. හො භික්ඛවො, හවත්නි මහණෙනි; නාගානං අනුග්ගහාය, නාගින්ට අනුග්‍රහ පිණිස; අජ්ජ, අද; ලද්ධං, ලක්දිවට (යනු පිණිස); එථ, එව්; බුද්ධසාසනෙ, බුදු සසුන්හි; පසන්නො, ප්‍රසන්නවූ; මණිඅක්ඛිකො, මිණිඅක් නාගිඳුතෙම; නිමන්තෙතාසි, ආරාධනා කෙළේය.

633. අස්සවා, සුවචවූ; සමාහිතා, එකඟවූ; පෙසලා භික්ඛූ, ප්‍රියශීලී භික්ෂූහු; සිරීමතො, දෙහශ්‍රීයෙන් හා ඥාන ශ්‍රීයෙන් යුක්තවූ; තස්ස සම්බුද්ධස්ස, ඒ සම්‍යක්සම්බුද්ධයන්ගේ; වචනං, වචනය; සුත්වාන, අසා; පච්චස්සොසුං, පිළිවදන් ඇස්සූහ.

634. තතො, ඉක්බිති; පඤ්ඤාය, ප්‍රඥාවෙන්; අග්ගධුරන්ධරෙ, අග්‍රධුරය දරන්නාවූ; සාරිපුත්තො ථෙරෝ, ශාරිපුත්‍ර ස්ථවිරතෙම; පත්තචීවරං, පාසිවුරු; ආදාය, රැගෙණ; ජිනුපන්තිකං, බුදුන් සමීපයට; අගමා, වැඩිසේක.

635. මොග්ගල්ලානනාමහාථෙරො දුතියො අග්ගසාවකො,
පත්තචීවරමාදාය සොපාග ජිනසන්තිකං.

636. ධුතපාපො ධුතඞ්ගග්ගො මහාකස්සපනාමකො,
පත්තචීවරමාදාය ආගමා ජිනසන්තිකං.

637. සාසනෙ විනයඤ්ඤූනමග්ගොපාලිව්හයො යති,
පත්තචීවරමාදාය ජිනන්තිකමුපාගමි.

638. දිබ්බචක්ඛූනමග්ගො යො රූඩපාපාරිදප්පකො,
ථෙරො'නුරුද්ධො වරදෙ සොපාග මුනිසන්තිකං.

---

635. දුතියො අග්ගසාවකො, දෙවැනි අග්‍රශ්‍රාවකවූ; මොග්ගල්ලානො, මුගලන් නම්වූ; සො මහාථෙරො, ඒ මහා ස්ථවිරතෙම; පත්තචීවරං, පාසිවුරු; ආදාය, රැගෙණ; ජින සන්තිකං, බුදුන් සමීපයට; උපාග, එළැඹිසේක.

636. ධුතපාපො, නැසූ පව් ඇති; ධුතඞ්ගග්ගො, ධුතඞ්ග ධරයන්ට අග්‍රවූ; මහාකස්සපනාමකො, මහාකාශ්‍යප නම් ස්ථවිරයන්වහන්සේ; පත්තචීවරං ආදාය, පාසිවුරු ගෙණ; ජින සන්තිකං, බුදුන් සමීපයට; ආගමා, වැඩිසේක.

637. සාසනෙ, බුදුසස්නෙහි; විනයඤ්ඤූනං, විනය දන්නවුන් අතුරෙන්; අග්ගො, අග්‍රවූ; උපාලිව්හයො, උපාලි නම්වූ; යති, යති (ශ්‍රෙෂ්ඨ)තෙම; පත්තචීවරං ආදාය, පාසිවුරු ගෙණ; ජිනන්තිකං, බුදුන් කරා; උපාගමි, එළැඹිසේක.

638. යො, යමෙක්; දිබ්බචක්ඛූනං, දිවැස් ඇත්තවුන් අතුරෙන්; අග්ගො, අග්‍රද; රූඩපාපාරිදප්පකො, වළහන ලද පව් නැමති සතුරුදප් ඇත්තේද; වරදෙ, ආත්මාර්ථ දායකවූ; අනුරුද්ධො, අනුරුද්ධ නම්වූ; සො ථෙරො අපි, ඒ ස්ථවිරතෙමේද; මුනිසන්තිකං, බුදුන් සමීපයට; අගා, එළැඹි සේක.

639. මණීව කාමදො කාමමුපවානො'ති විස්සුතො,
සුවණ්ණී ගණී දක්ඛිණෙය්‍යො ථෙරොපාගජිනන්තිකං.

640. බක්කුලො විමලො සීලසමාධාදිගුණාකරො,
ආගතො සපරික්ඛාරො භික්ඛූනං සමිතිං තදා.

641. බුද්ධසාසනධොරය්‍යො ථෙරො අඞ්ගුලිමාලකො,
සහාගන්තුං මුනින්දෙන සනාථො සහසාගතො.

642. සාසනොදයසෙලග්ගෙ සූරියො විය භාති යො,
සො'යං රාහුලථෙරො'පි ලහුගා පිතු සන්තිකං.

---

639. මණී ඉව, (සිතූ) මිණිරුවනක් මෙන්; කාමං, ඒකාන්තයෙන්; කාමදො, ඉෂ්ටාර්ථප්‍රසවය කරන්නාවූ; සුවණ්ණී, නුවණැත්තාවූ; ගණී, (ආයසී) ගණයා ඇත්තාවූ; දක්ඛිණෙය්‍යො, දක්ෂිණාර්හවූ; උපවානො'ති විස්සුතො, උපවානයයි සුප්‍රසිද්ධවූ; ථෙරො අපි, ස්ථවිරතෙමේද; ජිනන්තිකං, බුදුන් සමීපයට; ආග, පැමිණිසේක.

640. තදා, එවේලෙහි; විමලො, නිර්මලවූ; සීලසමාධිඅදී, ශීලසමාධ්‍යාදිවූ; ගුණාකරො, ගුණයන්ට ආකරවූ; බක්කුලො, බක්කුල නම් ස්ථවිරතෙම; සපරික්ඛාරො, (පාසිවුරු සඞ්ඛ්‍යාත) පිරිකර සහිතවූයේ; භික්ඛූනං, භික්ෂූන්ගේ; සමිතිං, සමාගමට; ආගතො, ආසේක.

641. බුද්ධසාසනධොරය්‍යො, බුදුසසුන් ධුරය උසුලන්නාවූ; අඞ්ගුලිමාලකො ථෙරො, අඞ්ගුලිමාල නම් ස්ථවිරතෙම; මුනින්දෙන සහ, මුනිඳුන් සමග; ආගන්තුං, (ලක්දිව්) වඩින්ට; සනාථො, සැරසුණේ; සහසා, වහා; ආගතො, ආසේක.

642. යො, යමෙක්; සාසන, බුදුසසුන් නැමැති; උදයසෙලග්ගෙ, උදයපර්වතාග්‍රයෙහි; සූරියො විය, හිරුමෙන්; භාති, බබලාද; සො අයං, ඒ මේ; රාහුලථෙරොපි, රාහුල නම් ස්ථවිරතෙමේද; පිතුසන්තිකං, පියවූ බුදුන් සමීපයට; ලහුං, වහා; අගා, ගියසේක.

643. භද්දවාරො භද්දියව්හො ථෙරො භද්දඝටො විය,
පාකටො භුවනෙ සො'පි ගන්තා සම්බුද්ධසන්තිකං.

644. දෙවද්දුමො'ව ලොකස්ස යො දදාතිච්ඡිතිච්ඡිතං,*
ජිනොරසො'පි සෙලව්හො ගන්තා සම්බුද්ධසන්තිකං.

645. යාමිනීසාමිකො'වාතිභාති යො සාසනම්බරෙ,
මහානාමමහාථෙරො සොපාග මුනිසන්තිකං.

646. මනොසිලාතලග්ගම්හි ජම්භමානො'ව කෙසරී,
සුභූතිව්හමහාථෙරො බුද්ධූපන්තිකමාගතො.

---

643. භද්දවාරො, සුන්දරවාර ඇත්තාවූ; භද්දඝටො විය, බදුරැකලයක් මෙන්; භුවනෙ, ලොකයෙහි; පාකටො, ප්‍රකටවූ; භද්දියව්හො, භද්දිය නම්වූ; සො ථෙරො'පි, ඒ ස්ථවිර තෙමේද; සම්බුද්ධසන්තිකං, බුදුන් සමීපයට; ගන්තා, ගියේක.

644. යො, යමෙක්; දෙවද්දුමො ඉව, සුරතුරක් මෙන්; ලොකස්ස, ලොකයාහට; ඉච්ඡිතිච්ඡිතං, කැමැති කැමැති දෙය; දදාති, දේද; ජිනොරසො, බුද්ධපුත්‍රවූ; සෙලව්හො අපි, (ඒ) සෙලනම් ස්ථවිරතෙමේද; සම්බුද්ධසන්තිකං, බුදුන් සමීප යට; ගන්තා, ගියේක.

645. යො, යමෙක්; යාමිනීසාමිකො ඉව, චන්ද්‍රයා මෙන්; සාසනම්බරෙ, බුදුසසුන් නැමැති අහස්හි; අතිභාති, අතිශයින් බබලාද; සො මහානාමමහාථෙරො අපි, ඒ මහානාම නම්වූ මහාස්ථවිරතෙමේද; මුනිසන්තිකං, බුදුන් සමීපයට; ආග, පැමිණියේක.

646. මනොසිලාතලග්ගම්හි, රත්ගල්තලා මතුයෙහි; ජම්භමානො, විජෘම්භමාන වන්නාවූ; කෙසරී ඉව, මෘගෙන්ද්‍රයෙක් වැනිවූ; සුභූතිව්හ මහාථෙරො, සුභූති නම් මහාස්ථවිර තෙමේද; බුද්ධූපන්තිකං, බුදුන් සමීපයට; ආගතො, ආයේක.

---

* "ඉච්ඡිතං."

647. බුද්ධසාසනඡද්දන්තසරසී සාරසො විය,
විස්සුතො තිස්සථෙරො'පි ගතො භික්ඛුසමාගමං.

648. ජිනසාසනසම්ඵුල්ලසරසීරුහමජ්ඣගො.
මධුබ්බතනිභො රාධථෙරො'පි සහසා ගතො.

649. භග්ගු දබ්බොපසෙනො ච කොණ්ඩඤ්ඤස්සජිසීවලී,
එතෙ ජිනත්‍රජා ථෙරා ගතාසුං මුනිසන්තිකං.

650. කුමාරකස්සපොපුණ්ණසොණසොභිතරෙවතා,
ථෙරාපෙතෙ අභිඤ්ඤාතා ගතාසුං සත්ථුසන්තිකං.

651. වඞ්ගීසො සාගතො නන්දො භාරද්වාජො ගවම්පති,
පත්තචීවරමාදාය ගතාසුං ජිනසන්තිකං.

---

647. බුද්ධසාසන, බුදුසසුන් නැමැති; ඡද්දන්තසරසී, ඡද්දන්ත (සදත්) විලෙහි; සාරසො විය, මහාපද්මයක් හෝ විල් ලිහිණියෙක් වැනිවූ; විස්සුතො, ප්‍රසිද්ධවූ, තිස්සථෙරො'පි, තිස්සස්ථවිරතෙමේද; භික්ඛුසමාගමං, භික්ෂුසමාගමයට; ගතො, ගියසේක.

648. ජිනසාසන, බුද්ධසාසන නැමැති; සම්ඵුල්ල, සුපිපුලුවූ; සරසීරුහමජ්ඣගො, සහස්‍රපත්‍රමධ්‍යගතවූ; මධුබ්බතනිභො, මධුකරයෙක් වැනිවූ; රාධථෙරොපි, රාධ නම් ස්ථවිරතෙමේද; සහසා, වහා; ගතො, ගියසේක.

649. භග්ගු, භගුය; දබ්බො, දබ්බය; උපසෙනො ච, උපසෙනය; කොණ්ඩඤ්ඤ, කෞණ්ඩිණ්‍යය; අස්සජි, අස්සජිය; සීවලී, සීවලීය (යන); ජිනත්‍රජා, බුද්ධපුත්‍රවූ; එතෙ ථෙරා, මේ ස්ථවිරයන්වහන්සේලාද; මුනිසන්තිකං, බුදුන් සමීපයට; ගතාසුං, වැඩියාහුයි.

650. කුමාරකස්සපො, කුමාරකාශ්‍යපය; පුණ්ණ, පුණ්ණය; සොණ, සොණය; සොභිතරෙවතා, සොභිතය රෙවතය (යන); අභිඤ්ඤාතා, ප්‍රසිද්ධවූ; එතෙ ථෙරා අපි, මේ (යථොක්ත) ස්ථවිරයන්වහන්සේලාද; සත්ථුසන්තිකං, ශාස්තෘන්වහන්සේ සමීපයට; ගතාසුං, වැඩියාහුයි.

651. වඞ්ගීසො, වඞ්ගීසය; සාගතො, සාගතය; නන්දො, නන්දය; භාරද්වාජො, භාරද්වාජය; ගවම්පති, ගවම්පතිය (යන ස්ථවිරයන්වහන්සේලාද); පත්තචීවරං ආදාය, පා සිවුරු ගෙණ; ජිනසන්තිකං, බුදුන් සමීපයට; ගතාසුං, වැඩියාහුයි.



ශ්‍රී ලංකා ජාතික

652. එවමාදී මහානාගා පඤ්චසතජිනෝරසා,
සමාගඤ්ඡුං සභාගන්තුං* මුනිනා ලෝකසාමිනා.

653. තතො සො ජගදානන්දො කරුණායාභිරාධිතො,
මෙරුං පරික්ඛිපන්තොව අනෙකජ්ජුතිවිජ්ජුයා.

654. නිවාසෙත්වා සුබරංසිවිසරන්තරවාසකං,
තස්සූපරි ජිනො රත්තං බන්ධිත්වා කායබන්ධනං.

655. අච්චුග්ගතං මහාථූපං චාරුචාමීකරජ්ජුතිං,
පච්ඡාදයමානොව රත්තකම්බලකඤ්චුනා.

656. වණ්ණෙ† නිග්‍රොධපක්කංච සුරත්තං පංසුකූලිකං.
සඞ්ඝාටියා කරිත්වාන සගුණං උත්තරීයකං.

---

652. එවමාදී, මේ ආදිවූ ; මහානාගා, මහායතීවූ; පඤ්චසතජිනෝරසා, පන්සියයක් පමණවූ බුද්ධපුත්‍රයෝ ; ලෝකසාමිනා, ලෝකස්වාමිවූ; මුනිනා සහ, මුනීන්ද්‍රයන්වහන්සේ සමග; අගනාතුං, (ලක්දිව්) වඩින්ට සංආගඤ්ඡුං, ආහුසී (නොහොත්) රැස්වූවාහුයි.

653, 654. තතො, ඉක්බිති ; ජගදානන්දො, ලෝසතුන් පිණවන්නාවූ ; සො ජිනො, ඒ සර්වඥතෙම ; කරුණාය, කුළුණින් ; අභිරාධිතො, ආරාධිතවූයේක් ; අනෙකජ්ජුති, අනෙකද්‍යුතිමත්වූ ; විජ්ජුයා, විදුලියෙන් ; මෙරුං, මහමෙර ; පරික්ඛිපන්තො ඉව, පරික්ෂෙප කරන්නාක් මෙන් (වටකරන්නාක් මෙන්).—සුබරංසි, නිර්මලරශ්මින්ගේ ; විසර, පැතිරීම් ඇති; අන්තරවාසකං, හඳනා සිවුර ; නිවාසෙත්වා, හැඳ ; තස්ස, ඒ හඳනයට ; උපරි, මතුයෙහි ; රත්තං, රක්තවර්ණවූ ; කායබන්ධනං, කාබහන : බන්ධිත්වා, බැඳ.

655 අතිඋග්ගතං, ඉතා උස්වූ ; චාරු, මනොඥවූ ; චාමීකරජ්ජුතිං, සුවර්ණවර්ණප්‍රභා ඇත්තාවූ ; මහාථූපං, මහදාගැබක් ; රත්තකම්බලකඤ්චුනා, රත්කම්බිලි සැට්ටයකින් ; පච්ඡාදය මානො ඉව, වසාලන්නාක් මෙන්.

656. වණ්ණෙ, වර්ණයෙන්; නිග්‍රොධපක්කං ඉව, නුගපලයක් බඳුවූ; සුරත්තං, අතිරක්තවූ; පංසුකූලිකං, පාංශුකූලිකවූ; උත්තරීයකං, උත්තරාසඞ්ගය; සඞ්ඝාටියා, සඟළ සිවුරහා; සගුණං කරිත්වාන, සගුණ කොට (හෙවත්) එකට අල්ලා.

---

* "ආගඤ්ඡුං සභාසා ගන්තුං." † "පක්කං."

657. භුත්වාන සුපරිච්ඡන්නො පාරුපිත්වාන සාධුකං,*
පත්තත්ථාය පසාරෙසි ජාලාකුලකරං ජිනො.

658. ලොකනාථප්පභාවෙන තතො පත්තමධුබ්බතො,
පාණිසරොරුහස්සන්තො සමපත්තොසි තමග්ගහි.

659. තතො සසිස්සකො නාථො උග්ගන්ත්වා ගගනඞ්ගනං,
නානාවණ්ණම්බුදෙ තත්ථ මද්දන්තො ගන්තුමාරභි.

660. තතො සබ්බදෙහස්මා නික්ඛන්තාසුං ඡ රංසියො.
හෙමකණ්ණිකතො යාත මණිගොපානසී යථා.

---

657. ජිනො, සර්වඥතෙම; සාධුකං, මොනවට; පාරුපිත්වාන, පොරවා; සුපරිච්ඡන්නො භුත්වාන, සුපිළිසන්ව; ජාලාකුලකරං, ජාලලක්ෂණයෙන් යුක්තවූ හස්තය; පත්තත්ථාය, පාත්‍රයපිණිස; පසාරෙසි, දිගුකළසේක.

658. තතො, ඉක්බිති; ලොකනාථප්පභාවෙන, ලොකස්වාමීන්ගේ ප්‍රභාව (අනුභාව) යෙන්; පත්තමධුබ්බතො, පාත්‍ර නැමැති භ්‍රමරතෙම; පාණිසරොරුහස්ස, හස්තතලනැමැති පද්මයාගේ; අන්තො, ඇතුළතට; සමපත්තොසි, පැමිණියේය; තං, ඒ පාත්‍රය; අග්ගහි, ග්‍රහණය කළසේක.

659. තතො, ඉක්බිති; සසිස්සකො, ශිෂ්‍ය (ශ්‍රාවක) යන් සහිතවූ; නාථො, ලොකස්වාමීතෙම; ගගනඞ්ගනං, ආකාශාඞ්ගනයට; උග්ගන්ත්වා, පැණනැගී; තත්ථ, එහි; නානාවණ්ණම්බුදෙ, නන්වන් වලාපටලයන්; මද්දන්තො, මඩිමින්; ගන්තුං, වඩින්ට; ආරභි, පටන්ගත්සේක.

660. තතො, ඉක්බිති; හෙමකණ්ණිකතො, රන්කැණි මඩලකින්; යාත, නික්මුණු; මණිගොපානසි, මිණි ගොනැස්; යථා, යම්සේද (එමෙන්); සබ්බදෙහස්මා, බුදු බඳින්; ඡ රංසියො, ෂඩ්වර්ණ (බුද්ධ) රශ්මීහු; නික්ඛන්තාසුං, නික්මුණාහුය.

---

* "සාධු තං."

661. බාණින්දීවරපුප්ඵෙහි මෙචකින්දමණීහි ච,
ඡාදෙන්තී විය නික්ඛන්තා නීලංසූ මුනිදෙහතො.

662. චම්පකුද්දාලමාලාහි හෙමචුණ්ණම්බරෙහි ච,
පූරයන්තී වියාසගා පීතංසූ ජිනදෙහතො.

663. බන්ධුපුප්ඵකදම්බෙහි ලොහිතඞ්කමණීහි ච,
ලොහිතාභා පපූරෙන්තී දිසා'ගා මුනිදෙහතො.

664. හාරමල්ලිකමාලාහි සොමංසුඵලිකාදිහි,
පූරයන්තී වියාසගා ඔදාතා මුනිදෙහතො.

665. පිඤ්ජමඤ්ජෙට්ඨරාසීහි පදුමාභමණීහි ච,
දිසං ඡාදයමානාගා මඤ්ජිට්ඨාභා ජිනඞ්ගතො.

---

661. බාණඉන්දීවරපුප්ඵෙහි, ගිරිනිල්ල හා නිලුපුල්මලින්ද; මෙචකඉන්දමණීහිච, සැඳැස්පිල් හා ඉඳුනිල්මිණියෙන්ද; ඡාදෙන්තීවිය, වසාලන්නාක් මෙන්; නීලඅංසු, නිල්රැස්; මුනිදෙහතො, බුදුශරීරයෙන්: නික්ඛන්තා, නික්මුණහ.

662. චම්පකකුද්දාලමාලාහි, සපු හා ඇසල මල්දමින්ද; හෙමචුණ්ණඅම්බරෙහි ච, රන්සුණු හා රන්වතින්ද; පූරයන්තී විය, (දිගුන්) පුරන්නාක්මෙන්; පීතඅංසු, රන්වන්රැස්; ජිනදෙහතො, බුදුබඳින්; ආසගා, එල්වුනාහ.

663. බන්ධුපුප්ඵකදම්බෙහි, වදමල්කලම්බින්ද; ලොහිතඞ්කමණීහි ච, රත්මිණෙන්ද; දිසා, දිගුන්; පූරයන්තී ඉව, පුරවන්නාක් මෙන්; ලොහිතාභා, ලොහිත රශ්මිය; මුනිදෙහතො, බුදුබඳින්; අගා, (නික්ම) ගියාය.

664. හාරමල්ලිකමාලාහි; මුක්තාහාර හා මාලතීමාලාවෙන්ද; සොමංසුඵලිකාදිහි, සඳරැස හා පළිඟුආදියෙන්ද; පූරයන්තීවිය, (දිගුන්) පුරන්නාක්මෙන්; ඔදාතා, ශ්වෙත රශ්මීහු; මුනිදෙහතො, බුදුබඳින්; ආසගා, දිසාගතවූහ.

665. පිඤ්ජමඤ්ජෙට්ඨරාසීහි, පීතරක්තවර්ණ මදටරැයියෙන් හෝ රන්හිරියල් හා මදටරායියෙන මෙයින්ද; පදුමාභමණීහිච, පියුම්රැම්ණියෙන්ද; දිසං, දිශාව; ඡාදයමානා, වසාලමින් (මෙන්); මඤ්ජිට්ඨාභා, මාඤ්ජෙෂ්ඨප්‍රභාතොමෝ; ජිනඞ්ගතො, බුදු බඳින්; අගා, (නික්ම) ගියාය.

666. නෙකින්දචාපකිණ්ණං ව දිවසං රතනුජ්ජලං,
විතානපටංව මුඤ්චන්තං මිස්සාභාගා ජිනඞ්ගතො.

667. ගිරිකූටකූටාගාරමත්තා ඡබ්බණ්ණරංසියො,
ආවෙලාවෙලා ධාවන්ති දිප්පමානෙතරෙතරා.

668. ගච්ඡමානාහනිත්වාන චක්කවාළසිලුච්චයෙ,
උග්ගන්ත්වා පරතො යන්ති නීරනිජ්ඣරසන්නිභා.

669. සම්මුඛෙ සම්මුඛෙ තායො රුක්ඛපබ්බතආදයො,
කාරයන්තා සකං වණ්ණං ධාවන්තා'පිච සින්ධවො.

670. උබ්බුග්ගතරංසීහි රඤ්ජිතා ජලදා තදා,
නානාවණ්ණො පුනෙවාසි නූතනො රවිමණ්ඩලො.

---

666. දිවසං, දිවසභාගය; නෙකඉන්දචාපආකිණ්ණං ඉව, නොයෙක් ඉඳුසැව් ආකීර්ණවූවාක්මෙන්ද; රතනුජ්ජලං ඉව, රුවන් උජ්වලාක්මෙන්ද; විතානපටං, සිරියම්පටක්; මුඤ්චන්තං ඉව, දිගහරින්නාක්මෙන්ද; මිස්සාභා, මිශ්‍ර (ප්‍රභාස්වර) රශ්මි; ජිනඞ්ගතො, බුඬදෙහයෙන්; අගා, (නික්ම) ගියාය.

667. ගිරිකූට, පර්වතකූට හා; කූටාගාරමත්තා, කුළුගෙවල් පමණවූ; ඡබ්බණ්ණරංසියො, සවණක්සඳුඹු; දිප්පමානා, දිලියෙන්නාහු; ඉතරඉතරා, ඔවුනොවුන්; ආවෙලාවෙලා, සරළ සරළව; ධාවන්ති, දිවත්.

668. ගච්ඡමානා, යන්නාහු; චක්කවාළසිලුච්චයෙ, සක්වළගලෙහි; ආහනිත්වාන, හැපී (ඇනී); උග්ගන්ත්වා, පැන නැගී; නීරනිජ්ඣරසන්නිභා ජලනිර්ඣර සමාන වූවාහු; පරතො, පිටත්හි; යන්ති, යෙත්.

669. තායො, ඒ රශ්මීහු; සම්මුඛෙ සම්මුඛෙ, හමුහමුවූ; රුක්ඛපබ්බතආදයො, වෘක්ෂපර්වතාදීන්; සකංවණ්ණං, ස්වකීය වර්ණඇතිසේ; කාරයන්තා, කරවමින්; අපිච, යළිත්; සින්ධවො, සමුද්‍රයන් කරා; ධාවන්ති, දිවත්.

670. තදා, එවේලෙහි; උබ්බං, උඩට; උග්ගතරංසීහි, නැංගාවූරැසින්; ජලදා, වලාමෙව්; රඤ්ජිතා, රඳනලද්දූහ; පුන, නැවත; නානාවණ්ණො, නන්වන්වූ; රවිමණ්ඩලො, හිරුමඬල; නූතනො එව ආසි, අභිනවම විය.

671. ජිනප්පභාපවාහෙසු නිමුග්ගා දෙවතා'ගතා,
පූජෙතුංව නිජත්තෙහි නානාවණ්ණා සියුං තදා.

672. පවිට්ඨා බුද්ධරංසීනමන්තරං දෙවධීතරො,
අසඤ්ජානිය මුය්හිංසු මුහුත්තං අත්තනො ධවං.

673. සුරාසුරොරගබ්‍රහ්මසිද්ධවිජ්ජාධරාදයො,
චාමරච්ඡත්තකෙතූහි පූජයන්තා ජිනන්වගුං.

674. අග්ඝිකාපන්තියො කෙචි තොරණූපරිතොරණෙ,
ඝටදීපාලියො තත්ථ කරොන්ති අභිතො'භිතො.

675. පාදපෙට පත්ථරන්ති විතන්වන්ති විතානකෙ,
තත්ථූපරි අනෙකානි කුසුමානොකිරන්ති ච

---

671. තදා, එවේලෙහි; ආගතා, ආවාවූ; දෙවතා, දෙව්යෝ; ජිනප්පභාපවාහෙසු, බුදුරැස්වතුරෙහි; නිමුග්ගා, ගැලුනාහු; නිජත්තෙහි, ස්වකීයාත්මභාවයෙන්; පූජෙතුං ඉව, පුදන්ට මෙන්; නානාවණ්ණා සියුං, නන්වන් වෙත්.

672. බුද්ධරංසීනං අන්තරං, බුදුරැස් අතර; පවිට්ඨා, ප්‍රවිෂ්ටවූ; දෙවධීතරො, දිව්‍යාඞ්ගනාවෝ; අත්තනො ධවං, ස්වකීයවල්ලභයා; අසඤ්ජානිය, නොහැඳින; මුහුත්තං, මොහොතක්; මුය්හිංසු, මුලාවූහ.

673. සුර, දෙවිය; අසුර, දානවය; උරග, නාගය; බ්‍රහ්ම, බ්‍රහ්මය; සිද්ධ, සිද්ධය; විජ්ජාධර, විද්‍යාධරය; ආදයො, යනමි ආදීහු; චාමර, සෙමරින්ද; ඡත්ත, සතින්ද; කෙතූහි, ධ්වජයෙන්ද; ජිනං, බුදුන්; පූජයන්තා, පුදමින්; අන්වගුං, අනුව ගියාහුයි.

674. කෙචි, සමහරු; තත්ථ, එතන්හි; අභිතොඅභිතො, හාත්පස හාත්පස; අග්ඝිකාපන්තියො, ඇගෑ පන්තීන්ද; තොරණූපරිතොරණෙ, තොරන්පිට තොරන්ද; ඝටදීපාලියො, පුන්කලස් හා වැටපෙළද; කරොන්ති, කෙරෙත්.

675. පාදපෙට, පියවිලි; පත්ථරන්ති, පතුරුවත් (හෙවත්) එලත්; විතානකෙ, වියන්; විතන්වන්ති, විශෙෂයෙන් පතුරුවත්; තත්ථ, ඒ පියවිලිපිට; අනෙකානි කුසුමානිච, නොයෙක් පුෂ්පයන්ද; ඔකිරන්ති, විසුරුවත්.

676. කතමං දෙවලොකන්නු යාති ලොකග්ගනායකො,
යාති කිං බ්‍රහ්මලොකන්නු අම්හාකං භවනන්නුඛො.

677. කත්ථ නුඛො දෙවදෙවො කස්සානුග්ගහබුද්ධියා,
යාතී'ති කඞ්ඛිතා කෙචි සංසරන්ති ඉතොචිතො.

678. මාපෙත්වා අභිතො මග්ගෙ මණ්ඩපෙ රතනාමයෙ,
සයනාසනං පඤ්ඤපෙත්වා කාචි තිට්ඨන්ති දෙවතා.

679. තහිං තහිං පට්ඨපෙන්තා සුධන්නමධුරොදකං,
යාචමානා ජිනං කෙචි තිට්ඨන්ති ච මහන්ති ච.

680. එවං මහාමහෙ නාථො වත්තමානෙ අනූපමෙ,
ජලං සබ්බසිරියා නූතනො සූරියො විය.

---

676. ලොකග්ගනායකො, ලෝකාග්‍රනායකවූ සර්‍වඥතෙම; කතමං දෙවලොකං, කවරනම් දෙව්ලොවකට; යාතිනු, වඩනේදෝ හෝ; කිං, කිම, බ්‍රහ්මලොකං, බඹලොවට; යාතිනු, වඩනේදෝ හෝ; අම්හාකං, අපගේ; භවනං, භවන යට; යාතිනුඛො, වඩනේදෝ හෝ.

677. කෙචි, ඇතැම් දෙවියෝ; දෙවදෙවො, දෙවාතිදෙව තෙම; කස්ස, කවරෙකුට; අනුග්ගහබුද්ධියා, අනුග්‍රහබුද්ධියෙන්; කත්ථ යාතිනුඛො ඉති, කොතැන්හි වඩනේදෝ හෝයි; කඞ්ඛිතා, ශඞ්කිතවූවාහු; ඉතොචිතො, ඔබිනොබ; සංස රන්ති, හැසිරෙත්.

678. කාචි දෙවතා, ඇතැම්දෙවියෝ; මග්ගෙ, මාර්‍ගයෙහි; අභිතො, හාත්පස; රතනාමයෙ මණ්ඩපෙ, රුවන්මුවා මඩු; මාපෙත්වා, මවා; සයනාසනං, සෙනසුන්; පඤ්ඤපෙත්වා, පණවා; තිට්ඨන්ති, සිටිත්.

679. කෙචි, සමහරු; තහිං තහිං, තන්හි තන්හි; සුධන්න මධුරොදකං, දිව්‍යබොජුන් හා මිහිරි පැන්; පට්ඨපෙන්තා, පිළි යෙළකොට තබත්නාහු; ජිනං, බුදුන්; යාචමානා, යදින් නාහු: තිට්ඨන්ති ච, සිටිත්; මහන්තිච, පුදත්.

680. නාථො, සර්‍වඥතෙම; අනූපමෙ, අතුල්‍යවූ; මහා මහෙ, මහත්වූපූජා; එවං, මෙසේ; වත්තමානෙ, පවත්නා කල්හි; සබ්බසිරියා, සර්‍වඥශ්‍රියෙන්; ජලං, දිලියෙනසේක්; නූතනො, අලුත්වූ; සූරියො විය, හිරුමෙන්ද.

681. බ්‍රහ්මසෙනාභිනොයාතො බ්‍රහ්මාවාථ සහම්පති,
සුරසෙනාභිනොයාතො සක්කොව සමලඞ්කතො.

682. ගහාලිමභිනොයාත ගහඩගාමිණීසන්නිභො,
ධතරට්ඨඛගින්දොව හංසසෙනාලිපුබ්බගො.

683. අපෙතරාගදොසෙහි වීතමොහෙහි සබ්බසො,
පටිසම්භිදත්තසම්පන්න සාවකෙහි අනුගතො.

684. යෙසං යෙසං මනස්මිං යං යමත්ථි කිඤ්චි සංසයං,
තෙසං තං තං පණුදෙන්තො දෙසනාය සුධාසිනං.

685. තත්ථ තත්ථානුරූපෙන පාටිහාරියකම්මුනා,
ලොකස්ස නයනාලී සො තොසස්සුසු නිමුජ්ජයං.

---

681. බ්‍රහ්මසෙනාභිනොයාත, බඹසෙන් පිරිවරා යන; බ්‍රහ්මා සහම්පතිඉව, සහම්පතිබ්‍රහ්මයා මෙන්ද: අථ, නැවත; සුරසෙනාභිනොයාත, සුරසෙන් පිරිවරා යන; සක්කො ඉව, ශක්‍රයා මෙන්ද; සමලඞ්කතො, සාලඞ්කෘත සේක්.

682. ගහාලිමභිනොයාත, තාරුපෙළ පිරිවරා යන; ගහඩගාමිණීසන්නිභො, ග්‍රහාධිගාමිණීකාන්ත (චන්ද්‍රයා) මෙන්ද; හංසසෙනාලිපුබ්බගො, හංසශ්‍රේණීන් පූර්වයෙහි සත්නාවූ: ධතරට්ඨඛගින්දො ඉව, ධෘතරාෂ්ට්‍ර නම් හංසරාජයා මෙන්ද.

683. සබ්බසො, සර්වප්‍රකාරයෙන්; අපෙතරාගදොසෙහි, පහකළ රාගද්වේෂ ඇත්තාවූ; වීතමොහෙහි, දුරුකළ මොහ ඇත්තාවූ; පටිසම්භිදත්තසම්පන්න, (සිව්) පිළිසිඹියාවට පැමිණියාවූ; සාවකෙහි, සව්වන් විසින්; අනුගතො, අනුව යනලද්දේ :—

684. යෙසං යෙසං, යම් යම් අයගේ; මනස්මිං, සිත්හි; යංයං, යම් යම් බඳුවූ; කිඤ්චිසංසයං, කිසි සැකයක්; අත්ථි, ඇද්ද; තෙසං සුධාසිනං, ඒ දෙවියන්ගේ; තං තං, ඒ ඒ සැක; දෙසනාය, ධර්මදෙශනාවෙන්; පණුදෙන්තො, දුරලමින් :—

685. සො, ඒ සර්වඥතෙම; තත්ථ තත්ථ, ඒ ඒ තැන්හි; අනුරූපෙන, සුදුසුවූ; පාටිහාරියකම්මුනා, පෙළහැරකර්මයෙන්; ලොකස්ස, ලෝකයාගේ; නයනාලි, නෙත්‍රශ්‍රේණීන් හෝ නෙත්‍රපඞ්ක්තීන්, තොසස්සුසු, සතුටුකඳුළෙහි; නිමුජ්ජයං, නිමග්න කරමින් :—

686. සම්පත්තා 'ලඞ්කතං ලඞ්කමථාගු ඵණිනො තදා,
පටිමග්ගං කරොන්තා තෙ තත්ථ තත්ථ මහාමහං.

687. උරගානමනන්තරෙ දෙවා බ්‍රහ්මාසුං තෙසමන්තරෙ,
එවං සම්මිස්සකො ලොකො බ්‍රහ්මලොකා පපූරයි.

688. යෙ පස්සන්ති ජිනං තත්ථ සසිස්සං සිරියා ජලං,
සුලද්ධා තෙහි නෙත්තානි තෙසමක්ඛීනි ලොචනා.

689. යෙ සුණන්ති තදා ධම්මං ධම්මිස්සරපභාවිතං,
සුලද්ධා තෙහි සොතානි තෙසං සොතානි සොතකා.

---

686. අථ, ඉක්බිති; අලඞ්කතං, සරසනලද; ලඞ්කං, ලක් දිවට; සම්පත්තා, සම්ප්‍රාප්තවූසේක; තදා, එවේලෙහි; තෙ ඵණිනො, ඒ නාගයෝ; තත්ථ තත්ථ, ඒ ඒ තන්හි; මහාමහං, මහත්වූ පූජා; කරොන්තා, කරමින්; පටිමග්ගං, පෙරමගට; ආගු, ආවාහුයි.

687. උරගානං අනන්තරෙ, නාගින් අතුරෙහි; දෙවා ආසුං, දෙවියෝ වූහ; තෙසං, ඒ දෙවියන්ගේ; අනන්තරෙ, අතුරෙහි; බ්‍රහ්මා ආසුං, බ්‍රහ්මයෝවූහ; එවං, මෙසේ; සම්මිස්සකො, වනමිශ්‍රවූ; ලොකො, ලොකයතෙම; බ්‍රහ්මලොකා, බඹලොව දක්වා; පපූරයි, පිරීණ.

688. තත්ථ, එහි; සිරියාජලං, (බුබ) ශ්‍රීයෙන් බබලන්නාවූ; සසිස්සං, ශ්‍රාවකයන් සහිතවූ; ජිනං, බුදුන්; යෙ, යමෙක්; පස්සන්ති, දකිද්ද; තෙහි, ඔවුන් විසින්; නෙත්තානි, නෙත්‍රයෝ; සුලද්ධා, මොනවට ලද්දාහුය; තෙසං, ඔවුන්ගේ; අක්ඛිනි, ඇස්; ලොචනා, ලොචන (ඇස්) නම් වෙත්.

689. තදා, එදවසැ; යෙ, යමෙක්; ධම්මිස්සරපභාවිතං, බුදුන් විසින් විශෙෂ භාවිතවූ (දෙසනලද); ධම්මං, ධර්මය; සුණන්ති, අසද්ද; තෙහි, ඔවුන් විසින්; සොතානි, ශ්‍රොත්‍රයෝ; සුලද්ධා, මොනවට ලද්දාහ; තෙසං, ඔවුන්ගේ; සොතානි, කන්; සොතකා, කන් (නම්) වෙත්.

690. යෙ ලපන්ති තදා බුද්ධගුණං හි ගුණභූසණා,
සුලද්ධා තෙහි වෙ ජිව්හා තෙසං ජිව්හා රසඤ්ඤුකා.

691. යෙ වන්දන්ති ජිනං යන්තං සසඞ්ඝං ගගනඞ්ගණෙ,
සුලද්ධා තෙහි හත්ථානි තෙසං යෙව භුජා භුජා.*

692. තදා තථාගතං දිස්වා යෙ සන්තුට්ඨා තථාගතා,
තථාගතානං සබ්බෙසං සො තොසො හොතු සබ්බදා.

693. ගතො කල්‍යාණියං නාථො මහෙනෙවං සදෙවකෙ,
තෙසං පූජාවිධානං කො මුඛෙනෙකෙන භාසති.

---

690. තදා, එසමයෙහි; බුද්ධගුණං, බුදුගුණ; ගුණභූසණා, සද්ගුණයම ආභරණකොට ඇති; යෙ, යම් කෙනෙක්; ලපන්ති, බෙණෙද්ද; තෙහි, ඔවුන් විසින්; වෙ, එකාන්තයෙන්; ජිව්හා, දිව්; සුලද්ධා, මොනවට ලදහ; තෙසං, ඔවුන්ගේ; ජිව්හා, ජිහ්වාවෝ; රසඤ්ඤුකාහි, රසඥ (ජිහ්වා)ම වෙත්.

691. යෙ, යමෙක්; ගගනඞ්ගණෙ, ආකාශාඞ්ගණයෙහි; යන්තං, වඩනාවූ; සසඞ්ඝං, ශ්‍රාවක සමූහයා සහිතවූ; ජිනං, බුදුන්; වන්දන්ති, වඳිද්ද; තෙහි, ඔවුන් විසින්; හත්ථානි, අත්; සුලද්ධා, මොනවට ලදහ; තෙසං, ඔවුන්ගේ; භුජා එව, අත්ම; භුජා, අත් නම් වෙත්.

692. තදා, එසමයෙහි; යෙ තථාගතා, යම් සත්වයෝ: තථාගතං දිස්වා, බුදුන් දැක; සන්තුට්ඨා, සතුටු වූද; සබ්බෙසං තථාගතානං, සියලු සත්වයන්ට; සො තොසො, ඒ සන්තොෂය; සබ්බදා, හැමකල්හි; හොතු, වේවා.

693. සදෙවකෙ, දෙවියන්සහිත ලොකයා; එවං, මෙසේ; මහෙනෙන, පූජාකරණ කල්හි; නාථො, ලොකස්වාමිතෙම; කල්‍යාණියං, කැලණියට; ගතො, වැඩිසේක; කො, කවරෙක්; තෙසං, ඔවුන්ගේ; පූජාවිධානං, පූජාවිධිය; එකෙන මුඛෙන, එක්මුවෙකින්; භාසති, කියාද; (නොකියාමැයි.)

---

* “ තෙසං බාහාව වෙ භුජා.”

694. තතො ගඟා මනුඤ්ඤාහි සම්පතන්තං තං සපුත්තකං,
තරඞ්ගමුදුබාහාහි ගහෙත්වා චරණම්බුජෙ.

695. පාදෙ පක්ඛාලයී සම්මා ඵෙණපුප්ඵපහාරිකා,
තතො තතොතුං ගණ්හිත්වා අකා දෙහස්සනුග්ගහං.

696. තතො සො යාචිතො සත්ථා නාගසඞ්ඝෙහි වන්දිය.
අගමා මණ්ඩපං රම්මං මනොනන්දනමාවහං.

697. ගන්ත්වා මණ්ඩපමජ්ඣම්හි බුද්ධාරහමහාසනෙ,
නිසීදොභාසයං ආසා රවිව උදයාචලෙ.

---

694. තතො, ඉක්බිති; ගඟා, කල්‍යාණීනදීතොමෝ; මනුඤ්ඤං. මනොඥවූ; සපුත්තකං, ශ්‍රාවකයන් සහිතව; සම්පතන්තං, වැඩියාවූ; තං, ඒ බුදුන්; (දිසවා, දැක); තරඟ මුදු බාහාහි, රළනැමැති මොළොක් අතින්; චරණම්බුජෙ, (උන්) පාපියුම්; ගහෙත්වා, පිළිගෙණ.

695. පාදෙ, ශ්‍රීපාදයන්; සම්මා, මනාකොට; පක්ඛාලයී, ධොවනය කළාය; ඵේනපුප්ඵපහාරිකා, පෙණ නැමැති අසෙනියමල් ඇත්තී; තතො තතො, ඒ ඒ දිගින්; උතුං ගණ්හිත්වා, ඍතුග්‍රහණය කොට; දෙහස්ස, (උන්) සිරුරට; අනුග්ගහං අකා, අනුග්‍රහ කළාය.

696. තතො, ඉක්බිති; නාගසඞ්ඝෙහි, නාග සමූහයන් විසින්; වන්දිය, වැඳ; යාචිතො, අයදනලද; සො සත්ථා, ඒ ශාස්තෘන් වහන්සේ; මනොනන්දනමාවහං, සිත් සතුටු එළවන්නාවූ; රම්මං මණ්ඩපං, රම්‍යවූ මණ්ඩපයට; අගමා, වැඩිසේක.

697. ගන්ත්වා, වැඩ; මණ්ඩපමජ්ඣම්හි, මණ්ඩපමධ්‍යයෙහි (පණවනලද); බුද්ධාරහමහාසනෙ, බුද්ධාර්හවූ මහ අස්නෙහි; උදයාචලෙ, උදයපර්වත මස්තකයෙහි (බබළන); රවි ඉව, හිරු මෙන්; ආසා ඔභාසයං, දිගුන් බබුළුවමින්; නිසීදි, වැඩහුන් සේක.

698. තතො භික්ඛූ නිසීදිංසු පත්තපත්තාසනෙ තදා,
බභාස මණ්ඩපං'තීව සරංව පදුමාකුලං.

699. ජනනෙත්තාලිනො'ගම්ම වසී සොම්මමුඛම්බුජෙ,
පතන්තා කුසලාමොදෙ ගණ්හන්තා තිත්තිං නො ගතා.

700. තථා සභික්ඛුකා නාගා මුනිනො රූපසාගරෙ,
නෙත්තින්දමණිනාවාහි පාරං ගන්තුං න තෙ පහු*.

701. තතො සසඞ්ඝං සුගතං සජ්ජනො මණිඅක්ඛිකො,
සක්කච්චං සකහත්ථෙහි අන්නපානෙන තප්පසී.

---

698. තතො, ඉක්බිති ; භික්ඛූ, භික්ෂූහු ; පත්තපත්ත ආසනෙ, පත් පත් අසුන්හි ; නිසීදිංසු, වැඩහුන්හ ; තදා, එකල්හි ; මණ්ඩපං, මඬුව ; පදුමාකුලං, පියුමින් ගැවසුනු ; සරං ඉව. තඩාගයක් මෙන් ; අතීව බභාස, අතිශයින්ම බැබලීල.

699. ජනනෙත්තාලිනො, ජනයන්ගේ නෙත් නැමැති බඹරු ; ආගම්ම, අවුත් ; වසි, වසී (යති) න්ගේ ; සොම්ම මුඛම්බුජෙ; සෞම්‍යවූ මුඛ නැමැති පද්මයෙහි ; පතන්තා, හෙන්නාහු ; කුසලාමොදෙ, කුසල් නැමැති සුගන්ධයන් ; ගණ්හන්තා, ගන්නාහු ; තිත්තිං, තෘප්තියක්ට ; නො ගතා, නොම ගියහ.

700. තථා, එසේම ; සභික්ඛුකා, භික්ෂූන් සහිතවූ ; තෙ නාගා, ඒ නාගයෝ ; මුනිනො, බුදුන්ගේ ; රූපසාගරෙ, රූප නැමැති සමුද්‍රයෙහි ; නෙත්ත, නෙත්‍ර නැමැති ; ඉන්දමණි නාවාහි; ඉඳුනිල්මිණි නැවින් ; පාරං, පරතෙරට ; ගන්තුං, යන්ට ; න පහු, නොපොහොසත් වූහ.

701. තතො, ඉක්බිති ; සජ්ජනො, ජනයන් සමගවූ ; මණි අක්ඛිකො, මිණිඅක් (නයිඳු) තෙම ; සකහත්ථෙහි, සියතින් ; සසඞ්ඝං, සඟ සහිතවූ ; සුගතං, බුදුන් ; අන්නපානෙන, ආහාරපාන (වර්ග) යෙන් ; සක්කච්චං, සකස්කොට ; තප්පසී, සැතැප්පී.

---

* "තෙපහුං."

702. අථොනීතපත්තපාණිමච්චසිත්වා තථාගතං,
හත්ථිනිනෙතා නිමන්තෙසි දෙසනත්ථානුමොදනං.

703. තතො බ්‍රහ්මස්සරො සත්ථා නිච්ඡරං බ්‍රහ්මඝොසනං,
විඤ්ඤාපෙන්තො ජනෙසබ්බෙ සකසද්දෙන දෙසනං.

704. දෙසෙසෙවං ජිනො ධම්මමනිලාසනකාදිනං,
පීතිපාමොජ්ජජනනං නිබ්බාණමතමාවහං.

705. හො හො සුණාථ ගුජගා භවසාගරම්හි
පාපාරිනක්කමකරාකුලදුග්ගමම්හි,
මග්ගා ජනා බලු ලභන්ති කදා පතිට්ඨං
ඔහාය බුද්ධපීරසාරතරිං* විසාලං.

---

702. අථ, නැවත; ඔනීතපත්තපාණිං, පාත්‍රයෙන් ඉවත් කළ අත් ඇති; තථාගතං, තථාගතයන්වහන්සේ; අච්චසිත්වා, පුදා; හත්ථිනිනෙතා, හස්තියෙන් නැමුනාවූ මිණිඅක්නසිඳු තෙම; අනුමොදනං, භුක්තානුමොදනාව; දෙසනත්ථං, දෙසනුපිණිස; නිමන්තෙසි, ආරාධනා කෙළේය.

703. තතො, ඉක්බිති; බ්‍රහ්මස්සරො, බ්‍රහ්මස්වරඇති; සත්ථා, ශාස්තෘතෙම; බ්‍රහ්මඝොසනං, බ්‍රහ්මඝොෂ; නිච්ඡරං, පතුරුවමින්; සකසද්දෙන, ස්වකීයශබ්දයෙන්; දෙසනං, (ධර්ම) දෙශනාව; සබ්බෙ ජනෙ, සියලුදනාට; විඤ්ඤාපෙන්තො, හඟවමින් :—

704. ජිනො, සර්වඥතෙම; එවං, මෙසේ; අනිලාසනකාදිනං, නාගාදීන්ට: පීතිපාමොජ්ජජනනං, ප්‍රීතිප්‍රමොද්‍ය උපදවන්නාවූ; අමතාවහං, අමා (සැප) එලවන්නාවූ; නිබ්බාණං ධම්මං, නිර්වාණධර්මය; (නොහොත්) නිබ්බාණමතමාවහං, නිර්වාණසඞ්ඛ්‍යාත අමා එලවන්නාවූ; ධම්මං, ධර්මය; දෙසෙසි, වදාළසේක්.

705. හො හො, භවත් භවත්; භුජගා, නාගයිනි; සුණාථ, (මාගේ වචනය) අසව්; පාපාරිනක්කමකර, පාපනැමැති සතුරුනක්‍ර මකරයන්ගෙන්; ආකුල, ගැවසීගත්තාවූ; දුග්ගමම්හි, දුකසේ යායුතුවූ; භවසාගරම්හි, සසර සයුරෙහිදී; ජනා, ජනයෝ; විසාලං, මහත්වූ; බුද්ධ, සර්වඥනැමැති; පීරසාර, සපීරසාරවූ; තරිං, නෞකාව; විහාය, හැර; මග්ගා, ගන්නාහු හෝ ගිලුනාහු; බලූ, එකාන්තයෙන්; පතිට්ඨං, පිහිටක්; කදා, කවරකලෙක්හි; ලභන්ති, ලබද්ද (නොලබත්මැයි).

---

* "තරං."

706. ලද්ධාන දුල්ලභතරං මුනිපාතුභූත
කාලං චිරෙන භුජගා න පමාදයිත්ථ,
ජාතිජරාමරණදුක්ඛපරිද්දවා ච
සංසාරිකස්ස න තතො'පගතස්ස හොති.

707. තාරුඤ්ඤමම්බුජසිරීංව පරිත්තකාලං
පාණං තුසාරලව'සාරතරං ජනානං,
භොගං දධාති ජලධිම්හි තරඞ්ගභඞ්ගිං
නිච්චං මනො දහති සොකසිඛීහි නානා.

708. කත්වාන රාගමිසයො'පි ඛගා දුපඤ්ඤා
පීරූපිනාරිකුසුමෙසුපි රූපගිද්ධා,
පත්තා'නයං ඛලු පුරෙ පරිහීනඣානා
රූපෙ න රජ්ජථ තතො ඛලු සාධුපඤ්ඤා.

---

706. භුජගා, නාගයිනි (තෙපි); දුල්ලභතරං, අතිශයින් දුල්ලභවූ; මුනිපාතුභූතකාලං, බුද්ධොත්පාදකාලය; චිරෙන, බොහෝකලකින්; ලද්ධාන, ලැබ; නපපමාදයිත්ථ, පමාදනො වව්; සංසාරිකස්ස, සසර වසන්නාහට; ජාති, (ඒ ඒ සත්ත්වනිකායෙහි) ඉපදීමය; ජරා, දිරීමය; මරණ, මියයාමය; දුක්ඛ, (කායික චෛතසික) දුඃඛය; පරිද්දවා ච, පරිදෙවය යන මොහු (වෙත්); තතො, ඒ සසරින්; අපගතස්ස, මුක්තයාහට; න හොති, (ඒ සංසාරික දුඃඛය ඇති) නොවේ.

707. ජනානං, සත්ත්වයන්ගේ; තාරුඤ්ඤං, තරුණබව; අම්බුජසිරිං ඉව, පද්මශ්‍රියක්මෙන්; පරිත්තකාලං, ස්වල්පකාලයක් ඇතිවේ; ජනානං, සත්ත්වයන්ගේ; පාණං, ප්‍රාණය; තුසාරලව, පිනිබිඳක්මෙන්; අසාරතරං, අතිශයින් නිස්සාරයි; භොගං, වස්තුව; ජලධිම්හි, සමුදුරෙහි; තරඞ්ගභඞ්ගිං, රළබිඳපීම; දධාති, දරයි (සමානයි); මනො, සිත; නානාසොකසිඛීහි, අනෙකශොකාග්නියෙන්; නිච්චං, නිතර; දහති, දයි.

708. පුරෙ, පෙර; ඛගා, ආකාශචාරීවූ; දුපඤ්ඤා, දුෂ්ප්‍රාඥවූ; රූපගිද්ධා, රූපයෙහි ගිජුවූ; ඉසයො අපි, ඍෂීහුද; පීරූපිනාරිකුසුමෙසු අපි, ස්ත්‍රීරූපාකාරවූ නාරිලතාමල්හිදු; රාගං කත්වාන, ආලයකොට; පරිහීනඣානා, පිරිහුනු ධ්‍යාන ඇත්තාහු; ඛලු, ඒකාන්තයෙන්; අනයං, අක්‍රමයට (නොහොත්) ව්‍යසනයට; පත්තා, පැමිනියහ; තතො, එහෙයින්; සාධුපඤ්ඤා, යහපත්පැණැත්තෙනි (තෙපි); ඛලු, ඒකාන්තයෙන්; රූපෙ, රූපය කෙරෙහි; න රජ්ජථ, නොඇලෙව්.

709. සද්දානුරාගමනුගො'පි පුරෙ සිඛණ්ඩී
සුත්වාන මොරිමධුරං ගිරමිඤ්ජිතඞ්ගො,
ව්‍යාධස්ස හත්ථමගමාසි භවෙසු තස්මා
නත්ථෙව සද්දසමදුක්ඛකරං ජනානං.

710. ඝාය නෙකකුසුමෙසු පරාගරාගං
මත්තෙභකුම්භමගමා මදගන්ධලුද්ධො,
භිඞ්ගො පභග්ගගත්තකො කරිකණ්ණතාලා
නත්ථෙව ගන්ධසදිසං තිභවෙසු පාසං.

711. ගම්භීරනීරධිභවො පචුරාසනො'පි
මච්ඡො ගිලිත්ව බලිසං රසගෙධහෙතු,
පප්පොති දුක්ඛමතුලං න රසෙසු සාත
මත්ථීති මත්වා පජහාථ රසෙසු ගෙධං.

---

709. පුරෙ, පූර්වකාලයෙහි; සිඛණ්ඩී, මයුරයෙක්; සද්දානුරාගං, ශබ්දානුරාගයට; අනුගො අපි, අනුවර්තීයේද; මොරී, මොණරියගේ; මධුරං ගිරං, මිහිරිනාදය; සුත්වාන, අසා; ඉඤ්ජිතඞ්ගො, කම්පිතදෙහ ඇත්තේ; ව්‍යාධස්ස, වැද්දාගේ; හත්ථං අගමාසි, හස්තප්‍රාප්තවිය; තස්මා, එහෙයින්; භවෙසු, සසර; ජනානං, සත්වයන්ට; සද්දසම, ශබ්දයසමානවූ; දුක්ඛකරං, දුඃඛකාරී කාරණයක්; නත්ථිඑව, නැත්මැයි.

710. භිඞ්ගො, මධුකරතෙම; අනෙකකුසුමෙසු, නොයෙක් කුසුම්හි; පරාගරාගං, මුවරදඇල්ම; ඝාය, හැර; මදගන්ධලුද්ධො, මදගඳැ ගිජුවූයේ; මත්තෙභකුම්භං, මදුනුත් කුඹුතලට; අගමා, ගියෙ; (සො, හෙතෙම;) කරිකණ්ණතාලා, ඇත්කන්තලින්; පභග්ගගත්තකො, ප්‍රකර්ෂයෙන් භින්න ගාත්‍ර ඇතිවිය; තිභවෙසු, භවත්‍රයෙහි; ගන්ධසදිසං, ගන්ධයසමානවූ; පාසං, මලපතක්; නත්ථි එව, නැත්මැයි.

711. ගම්භීර, ගැඹුරුවූ; නීරධිභවො, උදධිසම්භවවූ; මච්ඡො, මත්ස්‍යතෙම; පචුරාසනො අපි, බොහෝ ආහාර ඇත්තේනමුදු; රසගෙධහෙතු, රසාස්වාදනාශා හෙතුකොට ගෙණ; බලිසං, බිලිය; ගිලිත්ව, ගිල; අතුලං දුක්ඛං, අසමාන දුඃඛයට; පප්පොති, පැමිණේ; රසෙසු, රසයන්හි; සාතං, සැපයක්; න අත්ථීති, නැතැයි; මත්වා, සිතා හෝ දැන; රසෙසු, රසවිඳගැන්මෙහි; ගෙධං, ආසාව; පජහාථ, දුරුකරව්.

712. යො බ්‍රහ්මලොකා'ගතසුද්ධසත්තා (23)
බුද්ධත්තමෙව නියතො අපි බොධිසත්තො,
ථීසඞ්ගමාය පරිහායි සරජ්ජතො'පි
තස්මා හි ඵස්සසදිසො අනයො නචත්ථි.

713. හෙරණ්ඩපෙලකකපුද්දකහෙතුහීන
සත්තාපි දූතරුචිද්දනමණිප්පභාවා,
පත්තාපවග්ගවරසාරපුරං භුජඞ්ගා
කො නප්පදූති ධනිකො සිවමෙසමානො.

714. පාලෙත්ව සීලමමලං විසකණ්ඨිකාපි
ඉන්දස්ස නන්දනවනෙ'සි පියා මහෙසී,
තස්මා පසත්ථවිභවං යදි පත්ථයෙථා
පාලෙථ සීලමමලං ඛලු ජීවිතංව.

---

712. යො, භවත්නි ; හි (යස්මා), යම්හෙයකින් ; බ්‍රහ්මලොකා, බඹලොවින් ; ආගත, පැමිණියාවූ ; සුද්ධසත්තා, පරිශුද්ධ සත්වවූ ; බොධිසත්තො, බෝසත්තෙම ; බුද්ධත්තං එව, බුදුබවට (පැමිණෙන්ට)ම ; නියතො අපි, නියතවූයේත් ; සරජ්ජතොඅපි, ස්වකීය රාජ්‍යයෙනුදු ; ථීසඞ්ගමාය, ස්ත්‍රී සඞ්ගමය කරණකොටගෙණ ; පරිහායි, පිරිහිනිද ; තස්මා, එහෙයින් ; ඵස්සසදිසො, ස්පර්ශය සමානවූ ; අනයො, ව්‍යසනයෙක් ; නචඅත්ථි, නොම ඇති.

713. හෙරණ්ඩ, කැණහිල්ය ; පෙලක, සසකය ; කපි, වඳුරුය ; උද්දක, ජලවිඩාලය යන ; හෙතුහීනසත්තා අපි, ත්‍රිහෙතු විහෙතු ප්‍රතිසන්ධිහීන සත්වයෝද ; දූත, දීම් නැමැති ; රුචිද්දනමණිප්පභාවා, කැමැතිදේ ගෙණදෙන චින්තාමාණික්‍යානුභාවයෙන් ; අපවග්ගවර, උතුම් නිර්වාණ නැමැති ; සාරපුරං, ශ්‍රෙෂ්ඨපුරයට ; පත්තා, පැමිණියාහ ; භුජඞ්ගා, නාගයෙනි ; කො ධනිකො, කිනම් ධනවතෙක් ; සිවං, නිර්වාණය ; එසමානො, සොයන්නේ : (දූතං, දූතය) ; නප්පදූති, නොදේද (දේමැයි).

714. විසකණ්ඨිකා අපි, කණකොක්ණාද ; අමලං, නිර්මලවූ ; සීලං, ශීලය ; පාලෙත්වා, රැක ; ඉන්දස්ස, ශක්‍රයාගේ ; නන්දනවනෙ, නන්දනෝද්‍යානයෙහි ; පියා, ප්‍රියවූ ; මහෙසී ආසි, මෙහෙසියක් විය ; තස්මා, එහෙයින් ; පසත්ථවිභවං, ශ්‍රෙෂ්ඨ සම්පත්තිය ; යදි, ඉදින් ; පත්ථයෙථා, පතන්නාහු නම් ; අමලං, නිර්මලවූ ; සීලං, ශීලය ; ජීවිතං ඉව, ප්‍රාණය මෙන් ; ඛලු, එකාන්තයෙන් ; පාලෙථ, රක්ව.

715. සග්ගො විසාලරතනාලයසම්පකිණ්ණො
සානන්ද'මන්දසුරසුන්දරිසුන්දරො සො,
ඵුල්ලම්බුජාකරවනාදිහි නන්දනීයො
තස්සාමරාවිය'මරා'විරතං රමන්ති.

716. තම්හාපි භො රුචිරබ්‍රහ්මනිකායභූති
රම්මා තතොපි මහිතං අමතං වරිට්ඨං,
තස්මාත්තකාමනිරතා ජනතා සපඤ්ඤා,
තණ්හක්ඛයාය සතතං විරියං කරොථ.

---

715. සො සග්ගො, ඒ ස්වර්ගයතෙම; විසාලො, මහත්වූ; රතනාලය, මිණිමුවාගෙයින්; සම්පකිණ්ණො, ඉවසෙසින් ගැවසීය; සානන්ද, සතුටු සහිතවූ; අමන්ද, බොහෝවූ; සුර සුන්දරී, දෙවඟනන්ගෙන්; සුන්දරො, සොඳුරුය; ඵුල්ල, පිපි යාවූ; අම්බුජාකරවනාදිහි, පද්මාකර හා උද්‍යානාදියෙන්; නන්ද නීයො, සිත්කළුය; තස්ස, ඒ ස්වර්ගයෙහි; අමරා, දෙවියෝ; අමරාවිය, නොමියන්නන් මෙන්; අවිරතං, නිතර; රමන්ති, රමණය කෙරෙති.

716. භො, පින්වත්නි; තම්හා අපි, ඊටත්වඩා; රුචිරබ්‍රහ්ම නිකායභූති, සිත්කලු බ්‍රහ්මනිකාය සම්පත්තිය; රම්මා, රම්‍යයි; තතො අපි, ඊටත්වඩා; අමතං, නිර්වාණ (සම්පත්ති)ය; මහිතං, පූජිතයි; වරිට්ඨං, අතිශයින් උතුම්; තස්මා, එහෙයින්; අත්ත කාමනිරතා, ආත්මාර්ථයෙහි ඇලුනාවූ; සපඤ්ඤා, ප්‍රඥාසහිතවූ; ජනතා, ජනසමූහයෙනි (තෙපි); තණ්හක්ඛයාය, තෘෂ්ණා ක්ෂය (නිර්වාණ)ය පිණිස; සතතං, නිරන්තරයෙන්; විරියං කරොථ, වීර්‍ය කරව්.

717. එවං සබ්බමග්ගං වරමති සුගතො දෙසයී පනනගානං
සුත්වා තෙ සම්පහට්ඨා මහමහමකරුං නිජ්ජරා දීහි සද්ධිං,
තෙසං චෙ දෙසනායං සුරවිටපිසමා සාත්ථිකා තත්ථ ජාතා
සො නාථො තඤ්ච ධම්මං භගවති තනයා (24) තෙ ච වො පාලයන්තු.

කල්‍යාණිදෙසාගමනං.

---

718. නගාධිරාජෙ සුමනාභිධානෙ
වසං සුමෙධො සුමනාභිධානො,
දෙවො තදාගම්ම සපාරිසජ්ජො
කල්‍යාණියං තත්ථ එණීහි සද්ධිං.

---

717. වරමති, උතුම් ප්‍රඥාසිශය ඇති; සුගතො, සර්වඥයන් වහන්සේ; එවං, මෙසේ; අග්ගං, අග්‍රවූ; සබ්බමං, සබ්මීමය; (නොහොත්) සබ්බමග්ගං, සබ්මී මාර්ගය; පනනගානං, නාගයින්ට; දෙසයී, දෙශනාකලසේක; තෙ, ඒ නාගයෝ; සුත්වා, (ඒ ධර්මය) අසා; සම්පහට්ඨා, මනාකොට ප්‍රහෘෂ්ටවූවාහු; නිජ්ජරාදීහිසද්ධිං, දෙවාදීන් සමග; මහාමහං, මහත් පූජා; අකරුං, කලාහුය; අයං දෙසනා, මේ දෙශනාතොමෝ; සුර විටපිසමා, කල්පද්‍රැමයක් බඳුවූවා; තත්ථ, එහි; තෙසං, ඔවුන්ට; සාත්ථිකා ජාතා, සාර්ථික වූවාය; සො නාථො, ඒ ලොකස්වාමි තෙමේද; තං ධම්මං ච, ඒ ධර්මයද; භගවති තනයා, බුද්ධපුත්‍රශ්‍රාවකයෝද; තෙච, ඒ දෙවාදීහුද; වො, තොප; පාලයන්තු, රක්ෂා කෙරෙත්වා.

කැලණිදෙසට වැඩි ගමනයි.

---

718. තදා, එකල්හි; සුමනාභිධානෙ, සුමනනම්වූ; නගාධි රාජෙ, පර්වතරාජ (සමන්තකූට පර්වත) යෙහි; වසං, වාසය කරන්නාවූ; සුමෙධො, යහපත් ප්‍රඥා ඇති; සුමනාභිධානො, සුමන නම්වූ; දෙවො, දෙව් (රජ) තෙම; සපාරිසජ්ජො, පාරි ෂද්‍ය සහිතවූයේ; තත්ථ, එහි; කල්‍යාණියං, කැලණියෙහි; එණීහිසද්ධිං, නාගයින් සමග; ආගම්ම, අවුත් :—

719. දත්වා'පවග්ගස්ස නිදස්සනං
සුත්වාන ධම්මං සුතිසීතිභූතං,
පහට්ඨචිත්තා උපගම්ම බුද්ධං
නත්වාහ එවං කතපඤ්ජලීකො.

720. න වෙ එණ්ණීනං න පි මානුසානං
නානිම්මිසානං න පිතාමහානං,
හිතත්ථමෙවාඛිලලොකනාථා
ජයන්ති ලොකෙ කරුණාගුණග්ගා.

721. අනොතාගධා නූන මයම්පි තුය්හං
දයාය තස්මා එණ්ණීනං විසෙසං,
කරොහි මය්හං භවනම්හි ධීර
පාදංසුනා 'තීව පවිත්තරූපං.

---

719. අපවග්ගස්ස, නිර්වාණයට; නිදස්සනං, හෙතුවූ දානයක්; දත්වා, දී; සුතිසීතිභූතං, කණට සිහිල්වූ; ධම්මං, ධම්මයක්; සුත්වාන, අසා; පහට්ඨචිත්තා, පහටුසිත් ඇත්තේ; බුද්ධං උපගම්ම, බුදුන් කරා එළඹ; නත්වා, වැඳ; කතපඤ්ජලීකො, කරණලද ඇඳිලි ඇත්තේ; එවං ආහ, මෙසේ කී.

720. කරුණාගුණග්ගා, කුළුණුගුණින් අගතැන්පත්වූ; අඛිලලොකනාථා, සියලු ලොක ස්වාමීහු; වෙ, එකාන්තයෙන්; එණ්ණීනං, (හුදෙක්) නාගයින්ට; හිතත්ථං එව, හිත (වැඩ) පිණිස ම; ලොකෙ, ලොකයෙහි; න ජයන්ති, පහළනොවෙත්; මානුසානං, මිනිසුන්ට (හිතපිණිසම); නපි (ජයන්ති), නූපදිත්; අනිම්මිසානං, දෙවියන්ට (හිතපිණිසම); න (ජයන්ති), නූපදිත්; පිතාමහානං, බ්‍රහ්මයන්ට (හිතපිණිසම); න (ජයන්ති), නූපදිති—(සියල්ලන්ට හිත පිණිස උපදිතියි සේයි).

721. තස්මා, එහෙයින්; මයං අපි, අපිදු; තුය්හං, නුඹවහන්සේගේ; දයාය, කරුණා (ජලයට); නූන, එකාන්තයෙන්; අනොතාගධා, ඇතුළත්හුවමු; ධීර, ධීරයන්වහන්ස; ඉමෙසං එණ්ණීනං ඉව, මේ නාගයින්ට (අනුග්‍රහ කළාක්) මෙන්; මය්හං, මාගේ; භවනම්හි, භවනයෙහි; පාදංසුනා, (ඔබවහන්සේගේ) ශ්‍රීපාද රශ්මියෙන්; අතීව, අතිශයින්ම; පවිත්තරූපං, පිවිතුරු සටහනක්; කරොහි, කළමැනවි.

722. යො'යං නගො දිස්සති'තො පුරත්ථ
භූමඞ්ගනාමොලිසිරිං වහන්තො,
සමන්තකූටොති සමන්තචක්ඛු
ජානාති ලොකො වසතිං මමෙතං.

723. යො නීලනානාවනරාජිරාජිතො
ආසාරධාරාගිරිනිජ්ඣරාකුලො,
ආපීතනීලාරුණපල්ලවාවලී
ජීමූතකූටො විය භාති උග්ගතො.

724. යො සින්ධුවාරිං උරසා පහෙජ්ජ
ආගම්ම තෙ පාදපණාමහෙතු,
විජ්ජොතමානො විය චක්කපාණි
මහාතිතුඞ්ගග්ගධරාධරින්දො.

722. සමන්තචක්ඛු, සමන්තචක්ඛුවූ බුදුරජාණන්වහන්ස ; භූමඞ්ගනා, මහීකාන්තාවගේ ; මොලිසිරිං, මෞලිශ්‍රීය ; වහන්තො, උසුලන්නාවූ ; යො අයං නගො, යම් මේ පර්වතයෙක් ; ඉතො, මෙයින් ; පුරත්ථ, පූර්වදිශායෙහි ; දිස්සති, පෙණේද ; ලොකො, ලෝවැසිතෙමේ ; මම, මාගේ ; වසතිං, වාසස්ථානයවූ ; එතං, මෙල පව්ව ; සමන්තකූටො ඉති, සමන්කුළයයි ; ජානාති, දනී.

723. නීල, නිල්වූ ; නානාවනරාජි, නොයෙක් වන රේඛායෙන් ; රාජිතො, බබලනලද්දූවූ ; ආසාර, වෙගවත්වූ ; ධාරා, ජලධාරාවෙන්ද ; ගිරි, පර්වතයන් සම්බන්ධවූ ; නිජ්ඣර, ගඟුලැල්ලෙන්ද ; ආකුලො, ගැවසුනාවූ ; ආපීත, මඳරන්වන්වූද ; නීල, නිල්වන්වූද ; අරුණ, අරුණුවන්වූද ; පල්ලවාවලී, ළපලු පෙළඇති ; යො, යම් පර්වතයෙක් තෙම ; උග්ගතො, උස්ව නැංගාවූ ; ජීමූතකූටො විය, (මහ) මේකුළක් මෙන් ; භාති, බබලාද.

724. චක්කපාණි, විෂ්ණුතෙම ; සින්ධුවාරිං, සාගරජලය ; උරසා, ළයින් ; පහෙජ්ජ, පහරා ; තෙ, නුඹවහන්සේගේ ; පාදපණාමහෙතු, පාදාභිවාදන හෙතුවෙන් ; ආගම්ම, අවුත් ; විජ්ජොතමානො විය, බබලන්නාක් මෙන් ; යො, යම්බඳුවූ ; මහා, මහත්වූ ; අතිතුඞ්ගග්ග, අතිශයින් උස්වූ අග්ඇති ; ධරාධරින්දො, පර්වතරාජයෙක් ; (භාති, බබලාද).

725. ගඞ්ගාවධූ කූටකිරීටධාරී
සාමන්තසෙලින්දචමූපතීකො,
යො'යං ධරාධාරමහාමහීපො
රරාජ ලඞ්කානගරඞ්ගණම්හි.

726. පාරොහදන්තො චිතකූටකුම්භො
අනෙකසොණ්ඩික්ඛසවන්තිහත්ථො,
යො නිජ්ඣරාසාරමදප්පවාහො
ගජෙරිවාභාති සුරාධිපස්ස.

727. සම්ඵුල්ලපුප්ඵත්ථබකාතපත්තා
සණ්ඨතාරත්තඞ්කුරමොලිමාලා,
කානනාලතාලිඞ්ගිතඛන්ධදෙහා
තිට්ඨන්ති භූපාව යහිං කුඤ්ජා.

---

725. ගඞ්ගාවධූ, (මහවැලි ආදී) ගඞ්ගා නැමැති ස්ත්‍රීන් ඇත්තාවූ; කූට, (පර්වත) කූට නැමැති; කිරීටධාරී, කිරුළු දරවූ; සාමන්තසෙලින්ද, සමීපවර්තී පර්වතෙන්ද්‍ර නැමැති; චමූපතීකො, අමාත්‍ය සමූහයන් ඇත්තාවූ; යො අයං, යම් මේ; ධරාධාර මහාමහීපො, පර්වතරාජ නැමැති මහත් පෘථිවීපාල යෙක්තෙම; ලඞ්කානගරඞ්ගණම්හි, ලඞ්කාවීප නැමැති පුරාඞ්ගණයෙහි; රරාජ, බැබලීද.

726. පාරොහ, අරළු නැමැති; දන්තො, දළඇති; චිත, (පුෂ්පාදියෙන්) ගහනවූ; කූට, පර්වතකූට නැමැති; කුම්භො, කුඹුතල ඇති; අනෙක, නොයෙක්; සොණ්ඩික්ඛ, ගල් කෙම් නැමැති ඇස් හා; සවන්තිහත්ථො, ගඞ්ගා නැමැති සොඬ ඇති; නිජ්ඣර, ගඟුලැල් නැමැති; ආසාර, වෙගවත්වූ; මදප්පවාහො, මදවතුරු ඇත්තාවූ; යො, යම් පර්වතයෙක් තෙම; සුරාධිපස්ස, සුරෙන්ද්‍රයාගේ; ගජො ඉව, ඓරාවණ හස්තියා මෙන්; ආභාති, බබලාද.

727. සම්ඵුල්ල, මනාව පිපියාවූ; පුප්ඵත්ථබක, පුෂ්පස්තවක (මල්පොකුරු) නැමැති; ආතපත්තා, ඡත්‍රඇති; සණ්ඨත, මොනවට දරණලද; රත්තඞ්කුර, රක්තාඞ්කුර නැමැති; මොලිමාලා, කිරීටමාලා ඇති; කානනා, කානනා නැමැති; ලතාආලිඞ්ගිත, ලියෙන් වෙලඳිනලද; ඛන්ධ, කඳ නැමැති; දෙහා, ශරීර ඇත්තාවූ; කුඤ්ජා, වෘක්ෂරාජයෝ; භූපා ඉව, රජුන් මෙන්; යහිං, යම් පර්වත ප්‍රදෙශයෙක්හි; තිට්ඨන්ති, සිටිද්ද.

ශ්‍රී ලංකා ජාතික

728. සිඞ්ගනාරත්තපදම්බුජාලී
සමඟිනනහත්ථාභරණාලියුත්තා,
කෙකීකලාපුප්පලමාලමාලී
සිලාතලාකඤ්ජනී හනති යත්ථ.

729. මඞ්ගුරපාඨීනසවඞ්කසිඞ්ගු
රොහිච්චමුඤ්ජාමරපාවුසෙහි,
කුලීරනක්කාදනිමෙසකෙහි
නික්කීළිතං දද්දුරරත්තපෙසි.

730. නිච්චං හි සංරාවවිරාවිතානං
බලාකකාදම්බකදම්බකානං,
ආපානසාලා විය සාරසානං
හංසාලිනං මඞ්ගලවාසභූතං.

---

728. සිඞ්ගනා, සිදඟනන්ගේ; රත්ත, රතුවූ; පදම්බුජාලී, පාදනැමති පද්මපඞ්ක්ති ඇති; සමඟිනන, ප්‍රමොදගතවූ; හත්ථාභරණ, (ඉඳුනිල්මිණි වැල්ආදි) හස්තාභරණ නැමැති; අලි යුත්තා, භෘඞ්ගයන්ගෙන් යුක්තවූ; කෙකීකලාප, මයූරපිඤ්ඡ නැමැති; උප්පලමාලමාලී, උපුල්මල්පෙළ ඇති; සිලාතලා, ගල්තලානැමැති; කඤ්ජනී, පදුමිනීහු; යත්ථ, යම් පර්වත ප්‍රදෙශයෙක්හි; හනති, බබලද්ද.

729. මඞ්ගුර, මඟුරැය; පාඨීන, පෙටිය; සවඞ්ක, ලෙහෙලුය; සිඞ්ගු, සුඟුය; රොහිච්ච, රෙහෙරැය; මුඤ්ජ, මොද්දුය; අමර, කළුමහය; පාවුසෙහි, අඳුය යන මොවුන් විසින්ද; කුලීර, කකුළුය; නක්කාදි, කැසුබුය යනාදීවූ; අනිමෙසකෙහි, ජලචරයන් විසින්ද; දද්දුර, මැඩිය; රත්තපෙසි, ජලෞකාය යන මොවුන් විසින්ද; නික්කීළිතං, (යම් පෙදෙසක්) නිරන්තර ක්‍රීඩිතද.

730. සංරාවවිරාවිතානං, රාවපිළිරාව ඇත්තාවූ; බලාක, කොක්ය; කාදම්බ, කලහංසය; කදම්බකානං, (යන මොවුන්) සමූහයන්ටද; සාරසානං, විල්ලිහිණීන්ටද; නිච්චං, නිත්‍යයෙන්; ආපානසාලාවිය, පැන්හලක්මෙන් විද; හංසාලිනං, හංසශ්‍රෙණීන්ට; මඞ්ගලවාසභූතං, මඞ්ගල්‍යවාසයක් විද.

731. නිරන්තරාමොදමුදුවහෙහි
සුඵුල්ලකොකාසරවින්දකෙහි,
සොගන්ධිකින්දීවරකෙරවෙහි
කිඤ්ජක්ඛජනණ්ණතලෙහි චිත්තං.

732. සීතච්ඡසාතොදකසම්පපුණ්ණ
සරොජිනීලඞ්කතභූමිභාගො,
යො'යං පුරෙ භාති මනුඤ්ඤරූපො
සමන්තකූටො ස සමන්තකූටො.

733. දලිතවිපිනසණ්ඩා යත්ථ සෙලෙ සමන්තා
සමුපගතජනානං චිත්තමාමොදයන්ති,
මධූකවටකරෙරිබොධිජම්බීරහලලි
ඛදිරභයකදම්බා ඵුල්ලසෙලුපලාසා.

---

731. නිරන්තර, අනවරතයෙන්; ආමොද මුදුවහෙහි, සුවඳින් සතුටුඑලවන්නාවූ; සුඵුල්ල, සුපිපුල්ලවූ; කොකාස, රත්පියුම්ය; අරවින්දකෙහි, හෙලපියුම්ය යන මෙයින්ද; සොගන්ධික, කල්හාරය; ඉන්දීවර, නිලුපුල්ය; කෙරවෙහි, කෙරවය යන මෙයින්ද (පත්නවූ); කිඤ්ජක්ඛජනන, පරාග යෙන් ප්‍රතිබජනනවූ; අණ්ණතලෙහි, දියතෙලෙන්; චිත්තං, (යම්තැනක්) විසිතුරුද.

732. සීත, සිහිල්වූ; අච්ඡ, ප්‍රසන්නවූ; සාත, මධුරවූ; උදක සම්පපුණ්ණ, දියෙන් පිරුණාවූ; සරොජිනී, පද්මිනීන් විසින්; අලඞ්කත, විභූෂිතවූද; භූමිභාගො, භූමිප්‍රදෙශඇති; මනුඤ්ඤ රූපො, මනොඥ ස්වරූප ඇති; සමන්තකූටො, හාත්පසැ පැවති පව්කුළු ඇති; යො අයං, යම් මේ පර්වතයක්තෙම; පුරෙ, පෙරදිග; භාති, බබලාද; සො, ඒ පර්වතය; සමන්ත කූටො, සමන්කුළයි.

733. යත්ථ සෙලෙ, යම් පර්වතයෙක්හි; සමන්තා, හාත් පස; මධූක, මීය; වට, නුගය; කරෙරි, ලුණුවරණය; බොධි, බෝය; ජම්බීර, දැඹුළුය; හලලී, බදුලුය; ඛදිර, කිහිරිය; අභය, අරළුය; කදම්බා, කොලොම්හෝ බක්මියයන මොවුන් ඇත්තාවූ; ඵුල්ල, පිපියාවූ; සෙලු, ලොලුය; පලාසා, කැළය යන මොවුන් ඇත්තාවූද; දලිත, පත්‍රයෙන් ගැවසුනාවූ හෝ දීප්තිමත්වූ; විපිනසණ්ඩා, වනලැහැබ්හු; සමුපගත, සම්පසළවූ; ජනානං, ජනයන්ගේ; චිත්තං, සිත; ආමොදයන්ති, සතුටු කෙරෙද්ද.

734. පණසා'මතපිලක්ඛා කණ්හවණ්ටක්ඛවිභීතා
ලබුජබදරිනීපා එකඤනින්දීවරා ච,
වකුලසනපියාලා ගද්දභණ්ඩජ්ජුනා ච
කමුකසල්ලතින්දූ දුම්බරම්බස්සකණ්ණා.

735. පුනනාගචම්පකදුමුප්පලදාඩිමා ච
ඛජ්ජුරිතාලගිරිමල්ලිකාසොකතාලා,
හින්තාලනාගනිචුලා යුගපත්තරිට්ඨ
සෙතම්බ එරවතකාපිච කෙතකා ච

736. සම්ඵුල්ලභණ්ඩිසුමනජ්ජකයූථිකා ච
වාසන්තිචිත්තකජපා රවිමාලතී ච,
කුන්දස්සමාරකකුරණ්ඩකබීජපූර
සෙඵාලිකා ච තිණසූලසමීරණා ච.

---

734. පණස, කොස්ය; අමත, අමෘත (නෙල්ලි) ය; පිලක්ඛා, පුලිලය යන මොහුද; කණ්හවණ්ට, පලොල්ය; අක්ඛ, බුළුය; විභීතා, සිනිඹලාය; ලබුජ, දෙල්ය; බදරි, ඩෙබරය; නීපා, බක්මීය යන මොහුද; එඤන, කොලොම්ය; ඉන්දීවරා ච, ඇසළය යන මොහුද; වකුල, මුනමල්ය; අසන, පියාය; පියාලා, පියල් (මොර) ය යන මොහුද; ගද්දභණ්ඩ, තෙලැසටුය; අජ්ජුනා ච, කුඹුක්ය යන මොහුද; කමුක, පුවක්ය; සල්ල, හොරය; තින්දු, තිඹිරිය; උදුම්බර, දිඹුල්ය; අම්බ, අඹය; අස්සකණ්ණ, සල්ය යන මොහුද.

735. පුනනාග, දොඹය; චම්පක, සපුය; දුමුප්පල, කිණිහිරිය; දාඩිමා ච, දෙළුම් යන මොහුද; ඛජ්ජූරි, හිඳිය; තාල, තලය; ගිරිමල්ලික, කෙලින්දය; අසොක, හොපලුය; තාලා, තල් යන මොහුද; හින්තාල, කිතුල්ය; නාග, නාය; නිචුලා, මිදෙල්ලය යන මොහුද; යුගපත්ත, කොබෝලීලය; අරිට්ඨ, කොසඹය; සෙතම්බ, ඇටඹය; එරාවතකා, නාරංග යන මොහුද; අපිච, යළිත්; කෙතකාව, වැටකේද.

736. සම්ඵුල්ල, සුපිපියාවූ; භණ්ඩි, මහරිය; සුමන, බඳුවදය; අජ්ජක, හෙළඅඳුන; යූථිකාව, සීනිද්ද යන මොහුද; වාසන්ති, යොහොඹුය; චිත්තක, රත්නෙටුල්ය; ජපා, වදය; රවි, වරාය; මාලතීච, දාසමන් යන මොහුද; කුන්ද, කොඳය; අස්සමාරක, කණේරුය; කුරණ්ඩක, කටුකරඬුය; බීජපූර, ලප්නාරංග; සෙඵාලිකාච, එනම් ගස්ය යන මොහුද; තිණසූල, බෝලිද්දය; සමීරණ ච, සිහින් පණීසය යන මොහුද.

737. මොචුච්ඡුකීචකහලිද්දිවිලඞ්ගබිම්බ
නීලිච්චාතිවිසලාබුච නාගවල්ලී,
වල්ලිභසාරදපරාජිතවාරුසීර
එලාදිනෙකවනරාජිවිරාජිතො සො

738. තිට්ඨන්ති කෙචි තරවො සුරභිං කිරන්තා
තත්ථෙව කෙචි ඵලිතා මධුරප්ඵලානි,
අන්දොලිතා ඵලිතපල්ලවිතා ලතායො
සන්ධාරයං විටපජන්තුසු හනන්ති කෙචි.

739. සාමන්තගෙ ජනගණෙ සතතං දුමින්ද
සම්පීණයන්ති දලිතා ඵලිනො ච යස්මිං,
තෙ අව්හයන්ති විය ලොචනගොචරෙහි
වාතෙරිතෙහි තරුණාරුණපල්ලවෙහි.

---

737. මොච, ඇටකෙසෙල්ය; උච්ඡු, උක්ය; කීචක, රණ බටය; හලිද්දි, කසාය; විලඞ්ග, වල්ගසාල්ය; බිම්බ, කෙම්ය; නීලි, බේරුය; වචා, වදකසාය; අතිවිසා, අතිවිඩයන්ය; ලාබුච, ලබුය; නාගවල්ලි, නාලියය; වල්ලිභ, කොම්බුග; සාරද, ලියනගල්ලාය; අපරාජිත, කටරොළුග; වාරි, හීරිවේරිය; උසීර, සුවඳකොටග යන මොහුය; එලාදි, එන්සාල් ආදිය යන මෙකීන් යුක්තවූ; අනෙක, නොයෙක්; වනරාජි, වනරේඛායෙන්; විරාජිතො, හෙබුනේ; සො, ඒ පර්වතයයි.

738. කෙචි තරවො, ඇතම් වෘක්ෂයෝ; සුරභිං, සුවඳ; කිරන්තා, විසුරුවමින්; තිට්ඨන්ති, සිටිත්; ඵලිතා, ඵලදරන්නාවූ; කෙචි, සමහර වෘක්ෂයෝ; මධුරප්ඵලානි, මිහිරි පල; තත්ථෙව, එහිම; (කිරන්ති, විරුසුවත්;) කෙචි, ඇතම් වෘක්ෂයෝ; අන්දොලිතා; (මාරුතයෙන්) පැදුනාහු; ඵලිතපල්ලවිතා, ඵලපල්ලව ඇත්තාවූ; ලතායො, ලතාවන්; විටපජන්තුසු, වෙලෙප් නැමති දසරුවෙහි; සන්ධාරයං, දරමින්; හනන්ති, බබලත්.

739. යස්මිං, යම් පර්වතයෙක්හි; දලිතා, පතුවත්වූ; ඵලිනො, පලඇත්තාවූ; දුමින්ද, වෘක්ෂරාජයෝ; සාමන්තගෙ, සම්පගතවූ; ජනගණෙ, ජනසමූහයන්; සතතං, නිතර; සම්පීණයන්ති, පිණවද්ද; තෙ, ඒවෘක්ෂයෝ; ලොචන ගොචරෙහි, නෙත්‍රයන්ට ගොදුරුවූ; වාතෙරිතෙහි, වාතයෙන් කම්පිතවූ; තරුණ, තරුණවූ; අරුණපල්ලවෙහි, අරුණුවන්ලපලුයෙන්; අව්හයන්ති විය, (ජනයන්) කැඳවන්නවුන් මෙන් වෙද්ද.

740\. තස්මිං වනෙ වනසුරා නිජසුන්දරීහි
රමෙම සිලාතලදහෙ සිකතාතලෙ ච,
නච්චන්ති තන්ති තුරියානි ච වාදයන්ති
ගායන්ති මාලභරිනො සතතං පතීතා.

741\. සිඛා ච සිඛවතීතාහි තහිං තහිං තෙ
දිබ්බන්ති පුප්ඵඵලපත්තරසාභිනන්දී,
අච්ඡන්ති තත්ථ ගිරිපාදපරමණෙය්‍යෙ
සොගෙහි සඞ්ගතමනා බහිතාපසාපි.

742\. තස්මිං වනෙ හරිණරොහිතපුණ්ඩරීක
ගොකණ්ණසල්ලසසජම්බුකසූකරා ච,
සාඛාමිගෙණිමිගබබ්බුරුරූකුරුඞ්ග
ගොධාඛුපම්පකකපීගවයා ච නෙකා.

---

740\. තස්මිං වනෙ, ඒ වෙනෙහි; වනසුරා, වනදෙවතාවෝ; මාලභරිනො, මල්බර ඇත්තාහු; පතීතා, සන්තුෂ්ට වූවාහු; නිජසුන්දරීහි, ස්වකීය භාර්‍ය්‍යාවන් සමඟ; රමෙම, සිත් කළවු; සිලාතලදහෙ, ගල්තෙලෙහි හා විල්හිද; සිකතාතලෙ ච, වැලිතෙලෙහිද; සතතං, නිරන්තරයෙන්; නච්චන්ති, නටත්; තන්ති, තන්ත්‍රීන්ද; තුරියානි ච, තූර්‍ය්‍යයන්ද; වාදයන්ති, වයත්; ගායන්ති, ගයත්.

741\. තෙ සිඛා ච, ඒ සිඛයෝද; පුප්ඵඵලපත්තරස, මල් පල කොළරසින්; අභිනන්දී, අතිශයින් සතුටුවූවාහු; සිඛවතීතාහි, සිඳුභතන් සමඟ; තහිං තහිං, තන්හි තන්හි; දිබ්බන්ති, ක්‍රීඩා කෙරෙත්; තත්ථ, එහි; ගිරිපාදප, පර්වතයෙන් හා වෘක්ෂයෙන්; රමණෙය්‍යෙ, රමණීයට සුදුසු තැන්හි; සොගෙහි, යොගවලින්; සඞ්ගතමනා, සංයුක්ත සිත් ඇත්තාවූ; බහිතාපසාපි, (සස්නෙන්) පිටත් තව්සෝද; අච්ඡන්ති, හිඳිත්.

742\. තස්මිං වනෙ, ඒ වෙනෙහි; අනෙකා, නොයෙක්; හරිණ, මෘගය; රොහිත, එනම් මෘගය; පුණ්ඩරීක, දිවිය; ගොකණ්ණ, ගෝන්නුය; සල්ල, ඉත්තෑය; සස, හාය; ජම්බුක, සිවල්ය; සූකරා ච; හූරැය යන මොහුද; සාඛාමිග, සාමුවය; එණිමිග, එණිමෘගය; බබ්බු, විඩාලය; රුරූ, එනම් මෘගය; කුරුඞ්ග, එනම් මුවය; ගොධා, ගොයිය; ආඛු, මීය; පම්පක, හුනපුපුළුය; කපි, වඳුරැය; ගවයා ච, ගවරැය යන මොහුද; (වසන්ති, වෙසෙත්).

743. තෙ වග්ගවග්ගචරිනො හයමාරකාදී
නානාචතුප්පදගණා මුදිතා වසන්ති,
පක්ඛීපි කොසියකපොතකනීලගීව
ධඞ්කාටලාපපරපුට්ඨමධුබ්බතා ච.

744. නිජ්ජීවහදින්දිභචකොරකසාළිකා ච
චක්කවාකකීරකුරර කුලලාව කඞ්කා,
චිත්‍රච්ඡදා මධුරකූජකානෙකපක්ඛී
සඞ්ගම්ම යත්‍ර නිවසන්ති මනුඤ්ඤරූපා.

745. තෙසං වනන්තමථ නාටකමණ්ඩලංව
ගීතාලයං විය අහොසි ච ගායකානං,
ආපානභූමිසදිසං මිගපක්ඛිකානං
නිච්චුස්සවං රතිකරං නයනාභිරාමං.

---

743. හයමාරකාදි, මහිෂාදිවූ; තෙ නානාචතුප්පදගණා, ඒ නොයෙක් සිව්පා සමූහයෝ; වග්ගවග්ගචරිනො, වර්ග වර්ගචාරීහු; මුදිතා, සතුටුවූවෝ; වසන්ති, වෙසෙත්: කොසිය, මහවත්ය; කපොතක, කොබෙව්ය; නීලගීව, මයූරය; ධඞ්ක, කවුඩුය; ආට, ඒනම් උකුසුය; ලාප, කැටකිරිල්ල; පරපුට්ඨ, කොවුල්ය; මධුබ්බතා ච, මීමැසිය යන; පක්ඛිපි, පක්ෂීහුද; (මුදිතා, මුදිතවූවාහු; වසන්ති, වෙසෙත්).

744. නිජ්ජීවහ, වලිකුකුල්ය; දින්දිභ, කිරල්ය; චකොරක, ඇටිකුකුල්ය; සාළිකා ච, සැළලිහිණිය යන මොහුද; චක්ක වාක, සක්වාලිහිණිය; කීර, ගිරාය; කුරර, කබරුස්ය; යන මොහුද; කුලලාව, උකුස්සෝද; කඞ්කා, ලෝකුඹුවෝද (යන); චිත්‍රච්ඡදා, විසිතුරු පියාපත් ඇති; මනුඤ්ඤරූපා, මනොඥ ස්වරූපඇති; මධුර, මිහිරිකොට; කූජක, නාදකරන්නාවූ; අනෙකපක්ඛී, නොයෙක් පක්ෂීහු; සඞ්ගම්ම, එකතුව; යත්‍ර, යම් පර්වතවනයෙක්හි; නිවසන්ති, වෙසෙද්ද.

745. වනන්තං, වනත; තෙසං, ඔවුන්ට; නාටකමණ්ඩලං ඉව, නළුමඩුවක් වැන්න; අථ, යළි; ගායකානං, ගායනා කරන්නාවුන්ට; ගීතාලයං වියච, ගීතිකා ගෘහයක් මෙන්ද; අහොසි, විය; මිගපක්ඛිකානං, මෘගපක්ෂීන්ට; ආපානභූමි සදිසං, ආපානභූමියක් සමානය; නිච්චුස්සවං, නිත්‍යොත්සව ඇත්තේ; රතිකරං, මනොරඤ්ජනය කරන්නේය; නයනාභිරාමං, නෙත්‍රාභිරාමයි.

746. එවංවිධො විපිනරාජිවිරාජිතෙහි
කූටෙහි නෙකසුරසුන්දරිමණ්ඩිතෙහි,
අච්චුච්චනීලසිඛිගීවසමානවණ්ණෙ
එසො සමන්තගිරි මෙ වසතී මුනින්ද.

747. එවං පතීතමනසො සුමනාභිධානො
වත්වාන නත්වමසමං ගමනොපයුත්තං,
කාසාථ සොපි මුනි තස්ස වචං පටිච්ච
සඞ්ඝිකො නික්ඛමි ජිනො ගගනායනම්හි.

748. නිච්චෙතනාපි ගිරිපාදපආදයොපි
නාගා සුපණ්ණමිගපක්ඛිකහෙතුකාපි,
විජ්ජාධරාමර'සුරා චතුරාණනාපි
සඞ්ගම්ම'කංසු සුමනා මහමබ්භුතං තෙ.

---

746. මුනින්ද, මුනීන්ද්‍රයන්වහන්ස ; විපිනරාජි, වනරෙඛා යෙන් ; විරාජිතෙහි, හෙබියාවූ ; අනෙක සුරසුන්දරි, නොයෙක් සුරඟනන්ගෙන් ; මණ්ඩිතෙහි, විභූෂිතවූ ; කූටෙහි, පව්කුළින් ; අතිඋච්ච, ඉතා උස්වූ ; නීලසිඛිගීවසමාන, නිල්මොණර කර කට සමවූ ; වණ්ණෙ, පැහැඇති ; එසො සමන්තගිරි, මේ සමනතකූට පර්වතයතෙම ; එවං විධො, මෙබඳු වූයේ ; මෙ, මාගේ ; වසති, වාසස්ථානයයි.

747. පතීතමනසො, සතුටුසිත් ඇති ; සුමනාභිධානො, සුමන නම්වූ දිව්‍යරාජතෙම ; එවං, මෙසේ ; වත්වාන, සැලකොට ; අසමං, අසමවූ බුදුන් ; නත්වා, වැඳ ; ගමනොපයුත්තං, (සමන්කුළට) වැඩීමෙහි ප්‍රයුක්ත වූවක්හු ; අකාසි, කෙළේය ; අථ, ඉක්බිති ; ජිනො, (පස්මරුන්) දිනූ ; සො මුනි අපි, ඒ මුනීන්ද්‍රතෙමේද ; තස්ස, ඔහුගේ ; වචං පටිච්ච, වචනය සඳහා ; සඞ්ඝිකො, ශ්‍රාවකයන් සහිතවූයේත් ; ගගනායනම්හි, වියත්පථයෙහි ; නික්ඛමි, නික්ම වැඩිසේක.

748. තෙ, ඒ ; නිච්චෙතනා, අවිඥානකවූ ; ගිරිපාදප ආදයො අපි, පර්වත වෘක්ෂාදීහුද ; අහෙතුකා, අහේතුකවූ ; නාගා අපි, ඵණීහුද ; සුපණ්ණ, ගරුඩයෝද ; මිග, මෘගයෝද ; පක්ඛිකාපි, පක්ෂීහුද ; විජ්ජාධර, විද්‍යාධරයන් හා ; අමර අසුරා, දෙවදානවයෝද ; චතුරාණනා අපි, බ්‍රහ්මයෝද ; සඞ්ගම්ම, රැස්ව ; සුමනා, සතුටු සිත් ඇත්තාහු ; අබ්භුතං, ආශ්චර්යවූ ; මහං, පූජා ; අකංසු, කළාහුයි.

749. මුනින්දෙ පයන්තෙ සම්බං තිලොකං
ගිරින්දාභිනන්දූ දුමින්දූ පබුද්ධා,
මිගින්දා සුතුට්ඨා ඛගින්දා සුඝුට්ඨා
පවුට්ඨො මහින්දෙ පණාදො නිඝෝසො.

750. ගච්ඡන්තෙ ගගනායනෙන සුගතෙ භානූ'සි
සන්තො තදා
වාරෙසුං සුරියාතපඤ්ච ජලදා සිඤ්චිංසු භූමිං ජලං,
මන්දමන්දසුගන්ධමුද්ධපවනො පාපෙති සීතං සුඛං,
දෙවාදී ධජඡත්තචාමරකරා පූජෙන්ති මානෙන්ති ච.

751. සනීරහින්තාලගසින්දිපූග
තාලම්බසාලාදි මහීරුහින්දා.
තිට්ඨන්ති තෙ චාමරහත්ථකාව
පුප්ඵෙහි ඡන්නා ගගනඞ්ගනොපි.

---

749. මුනින්දෙ, මුනීන්ද්‍රයන්වහන්සේ; පයන්තෙ, වඩින කල්හි; තිලොකං, තුන්ලොව; සම්බං, සමෘබ විය; ගිරින්දා; පර්වත රාජයෝ; අභිනන්දූ, අභිරාමවූහ; දුමින්දා, වෘක්ෂරාජයෝ; පබුද්ධා, ප්‍රබුද්ධ වූහ; මිගින්දා, මෘගරාජයෝ; සුතුට්ඨා, අතිශයින් සන්තුෂ්ටවූහ; ඛගින්දා, පක්ෂිරාජයෝ; සුඝුට්ඨා, විශේෂ ධවනි පැවැත්වූහ; මහින්දෙ, මහීන්ද්‍රතම (පෘථිවිය); පවුට්ඨො, වස්නාලද; නිඝෝසො, ඝෝෂය; පණාදො, ප්‍රකාශියෙන් නැඟුවිය.

750. තදා, එසමයෙහි; සුගතෙ, සුගතවූ බුදුන්; ගගනායනෙන, වියත්මගින්; ගච්ඡන්තෙ, වඩින කල්හි; භානු, හිරුතෙම; සන්තො ආසි, ශාන්තවිය; ජලදාච, මෙඝයෝද; සුරියාතපං, හිරු රැස්; වාරෙසුං, ඇවුරූහ; භූමිං, මිහි තෙලෙහි; ජලං, ජලය; සිඤ්චිංසු, විකිරණය කළහ; මන්දමන්ද, මඳින්මඳ; සුගන්ධමුද්ධපවනො, සුවඳමුදු පවන; සුඛං, සැපවූ; සීතං, ශීතගුණය; පාපෙති, පමුණුවයි; දෙවාදී, දෙව බ්‍රහ්මාදීහු; ධජ, ධවජය; ඡත්ත, කුඩය; චාමර, සෙමරය යන මේ; කරා, ගත්අත් ඇත්තාහු; පූජෙන්ති, පුදත්; මානෙන්ති ච, බුහුමන්ද කෙරෙත්.

751. සනීර, තැඹිලි හා; හින්තාල'ග, කිතුල්ගස්ය; සින්දි, හිඳිය; පූග, කමුකය; තාල, තල්ය; අම්බ, අඹය; සාලාදි, සල්ය යනාදිවූ; තෙ මහීරුහින්දා, ඒ ද්‍රුමෙන්ද්‍රයෝ; චාමරහත්ථකා ඉව, සෙමෙර ගත් අත්ඇත්තන් මෙන්; තිට්ඨන්ති, සිටිත්; ගගනඞ්ගනො අපි, ආකාශාඞ්ගනයද; පුප්ඵෙහි, මලින්; ඡන්නා, ගැවසීන.

752. අනෙන විධිනා ජගදෙකනාථො
පවත්තමානෙසු මහාමහෙසු,
දිසඤ්ච විදිසං පරිපූරයන්තො
ඡබ්බණ්ණරංසීහි අගා නගින්දං.

753. තස්මිං සමන්තනගමුද්ධනි ලොකනාථො
ඡබ්බණ්ණරංසිනිකරං දිසි පත්ථරන්තො, (24)
භික්ඛූහි සො පරිවුතො පරසාගරන්තං
ඔලොකයං ඨිතිමකාසි අනොමවණ්ණො.*

754. ලඞ්කාවධූසුමනකූටකිරීටකූටං
සජ්ජෙසි'නග්ඝජිනරාජමණී මහන්තො,
ඉච්ඡත්ථදං සිවදමප්පටිමං තිලොකෙ
තං දානි හො භජථ සෙවථ සබ්බකාලං.

---

752. අනෙන විධිනා, මේ ආකාරයෙන්; මහාමහෙසු, මහ[illegible] පූජා; පවත්තමානෙසු, පවත්නා කල්හි; ජගදෙකනාථො, ලොකෛකනාථයකවූ බුදුරජතෙම; ඡබ්බණ්ණරංසීහි, ෂඩ්වර්ණරශ්මියෙන්; දිසං ච, දිශාද; විදිසං ච, විදිශාද; පරිපූරයන්තො, හාත්පසින් පුරවමින්; නගින්දං, (සමන්තකූට) පර්වතරාජයාකරා; අගා, වැඩිසේක.

753. භික්ඛූහි, භික්ෂූන් විසින්; පරිවුතො, පිරිවැරූ; සො ලොකනාථො, ඒ ලොකස්වාමිතෙමේ; අනොමවණ්ණො, අලාමක වර්ණ ඇතිසේක්; ඡබ්බණ්ණරංසිනිකරං, ෂඩ්වර්ණබුද්ධරශ්මිකදම්බය; දිසි, දිශායෙහි; පත්ථරන්තො, පතුරුවමින්; අපරසාගරන්තං, අවරදිග සයුරුකොණ; ඔලොකයං, බලාවදාරමින්; තස්මිං සමන්තනගමුද්ධනි, ඒ සමන් පව් මුදුන්හි; ඨිතිං අකාසි, ස්ථිතිය කළසේක.

754. මහන්තො, මහත්වූ; අනග්ඝො, අනර්ඝවූ; ජිනරාජමණී, ජිනෙන්ද්‍ර නැමැති මිණිරුවන; ලඞ්කාවධූ, ලකඟනගේ; සුමනකූට, සමන්කුළු නැමැති; කිරීටකූටං, කිරුළු කුළු; සජ්ජෙසි, සැදී; හො, භවත්නි; ඉදානි, දැන්; තිලොකෙ, තුන්ලෙව්හි; ඉච්ඡත්ථදං, රිසිඳු දෙන්නාවූ; සිවදං, නිවන් දෙන්නාවූ; අප්පටිමං, අසදෘශවූ; තං, ඒ (සුමනකූටාඛ්‍ය කිරීට කූටය); සබ්බකාලං, සියලු කල්හි; භජථ, භජනය කරව්; සෙවථ, සෙවනය කරව්.

---

* "ඨිතිමකාසමනොමවණ්ණො."

755. කාසුං තදා සුරවරා සුරසුන්දරීහි
ලඞ්කාය සෙලසිඛරෙසු මහාසමජ්ජං,
වජ්ජිංසු භෙරිවිතතී සයමෙව සබ්බා
හස්සිංසු දිබ්බකුසුමාභරණා නභම්හා.

756. ලඞ්කම්බරං නිඛිලමාසි ච ඡත්තඡන්නං
නානාවිරාගධජකෙතුසමාකුලඤ්ච,
නානාසුගන්ධකුසුමාදිදිසන්තරාලං*
නානඞ්ගිකාවලිවිරාජිතමන්තලික්ඛං.

757. තස්මිං දිනෙ'සි රතනං මණිතොරණෙහි
දීපාලිපුණ්ණඝටපන්තිහි දස්සනීයං,
සම්බුද්ධදෙහපරිතො ගතඡප්පභාහි
රත්තං නභාවනිචරාචරසබ්බදබ්බං.

---

755. තදා, එසමයෙහි; සුරවරා, දෙවොත්තමයෝ; සුරසුන්දරීහි, දෙවඟනන් සමඟ; ලඞ්කාය, ලක්දිව්හිවූ; සෙලසිඛරෙසු, පර්වතකූටයන්හි; මහාසමජ්ජං, මහොත්සව; [illegible]සුං, කළහ; සබ්බා, සියලු, භෙරිවිතතී, බෙරවිශෙෂයෝ; සයං එව, තුමූම; වජ්ජිංසු, වැයූහ; දිබ්බකුසුමාභරණා, දිව්‍යමාල්‍යාභරණයෝ; නභම්හා, අහසින්; හස්සිංසු, (තුමූම) බැස්සාහ.

756. නිඛිලං ලඞ්කම්බරං, සියලු ලඞ්කාම්බරය; ඡත්තඡන්නං ච ආසි, ඡත්‍රයෙන් වැසුනේද විය; නානාවිරාග, අනෙකවර්ණවූ; ධජකෙතු, පතාකායෙන් හා කොඩියෙන්; සමාකුලං ච ආසි, ගැවසුනේද විය; නානාසුගන්ධකුසුමාදී, නොයෙක් සුවඳමල් ආදියෙන් (ගැවසුනු); දිසන්තරාලං, දිගන්තර ඇති; අන්තලික්ඛං, අහස; නානාඞ්ගිකාවලි, නන් ඇඟෑපෙළින්; විරාජිතං, බබලනලදී.

757. තස්මිං දිනෙ, එදවස්හි; රතනං, රත්නදීපය; මණිතොරණෙහි, මිණිතොරණින්ද; දීපාලි, පහන් වැටපෙළින්ද; පුණ්ණඝටපන්තිහි, පුන්කලස් පෙළින්ද; දස්සනීයං ආසි, දැකුම්කළු විය; සම්බුද්ධදෙහ, බුද්ධශරීරයාගේ; පරිතො, හාත්පසින්; ගත, නික්මුණාවූ; ඡප්පභාහි, ෂඩ්වර්ණ ප්‍රභායෙන්; නභාවනි, අහස් පොළෝ දෙක්හි වූ; චරාචර, ජඞ්ගමාජඞ්ගමවූ; සබ්බදබ්බං, සියලු දෙය; රත්තං, රඤ්ජිත විය.

---

* "ඝනන්තරාලං."

758. මාලාවතංසසමකා ගිරයො සමන්තා
හුත්වා නමන්ති ච භමන්ති සචෙතනාව,
සබ්බෙපි තත්ථ තරවො ච ලතාදයො ච
නච්චන්ති දිබ්බනටකා විය ඔනතග්ගා.

759. එවං තදා මහති විම්හයපාටිහෙරෙ
බුද්ධානුභාවජනිතෙ ඉධ වත්තමානෙ,
නත්වාන ධීරචරණං සුමනො සුධාසී
එවං වදී පරමපීතිමනො උදග්ගො.

760. යෙ තෙ මුදූ කොමලරත්තපාදා
සුරත්තඵුල්ලම්බුරුහොපමානා,
වට්ටානුපුබ්බායතඅඞ්ගුලීකා
සුතම්බතුඞ්ගග්ගනඛාවලීකා.

---

758. සමන්තා, හාත්පසැ වූ; ගිරයො, පර්වතයෝ; මාලාවතංසසමකා හුත්වා, මල්ඔටුනු ඇත්තන් බඳුව; සඤ්චෙතනා ඉව, [illegible]ත් ඇත්තන් මෙන්; නමන්ති, නැමෙත්; සචෙතනා ඉව, චෙතනා සහිතවූවන් මෙන්; භමන්තිච, කැරකැවෙත්; තත්ථ, එහි; සබ්බෙපි තරවො, සියලුම වෘක්ෂයෝද; ලතාදයො ච, ලියආදීහුද; ඔනතග්ගා, නැමුනාග්‍ර ඇත්තාහු; දිබ්බනටකාවිය, දිව්‍යනළුවන් මෙන්; නච්චන්ති, නටත්

759. තදා, එසමයෙහි; ඉධ, මේ ලක්දිව්හි; බුද්ධානුභාවජනිතෙ, බුද්ධානුභාවයෙන් උපන්නාවූ; මහති, මහත්වූ; විම්හයපාටිහෙරෙ, ආශ්චර්ය්‍ය ප්‍රාතිහාර්ය්‍යයන්; එවං, මෙසේ; වත්තමානෙ, පවත්නාකල්හි; සුමනො සුධාසී, සුමන නම් දෙව්තෙම; උදග්ගො, ඔදවැඩියේ; පරමපීතිමනො, අතිශයින් ප්‍රීතිමත් සිත් ඇත්තේ; ධීරචරණං, සර්වඥ ශ්‍රීපාදය; නත්වාන, වැඳ; එවං, මෙසේ; අවදී, සැලකෙළේය.

760. තෙ, තුඹවහන්සේගේ: මුදූ, මෘදුවූ; කොමල, මොළොක්වූ; යෙ රත්තපාදා, යම් සුරක්ත පාදයෝ වෙද්ද; (තෙ, ඒ ශ්‍රීපාදයෝ); සුරත්ත අතිරක්තවූ; ඵුල්ල, පිපියාවූ; අම්බුරුහඋපමානා, පියුම් බඳුහ; වට්ට, වටවූ; අනුපුබ්බ, පිළිවෙළින්; ආයත, දික්වූ; අඞ්ගුලීකා, ඇඟිලි ඇත්තෙත්; සුතම්බ, ඉතා තඹවන්වූ; තුඞ්ග, ප්‍රාංශුවූ; අග්ගනඛාවලීකා, අග් නිය පෙල ඇතිවෙති.

761. සුවණ්ණකුම්මුන්නතපාදපිට්ඨී
නිගූළ්හගොප්ඵායතපණ්හිභාගා,
සමච්ඡමායං සකලං පතිට්ඨිතා
න ලිම්පතෙ සුච්ඡවිතා රජාදි.

762. සම්මත්තහත්ථොසභහංසසීහ
සමානලීලාය යහිං පයාති,
නින්නුන්නතා භෙරිතලාව භූමි
හොතාථ පුප්ඵාදිසුමණ්ඩිතා ච.

763. අපෙන්ති මග්ගා සයමෙව ඛාණු
සකණ්ටමූලා කඨලා ච සබ්බෙ,
ගම්භීරනීරාපගපඞ්කදුග්ගා
හිත්වා සභාවං රමණීයමෙන්ති.

---

761. සුවණ්ණකුම්ම, රන් ඉදිබු බඳුවූ; උන්නතපාදපිට්ඨී, උස්වූ පාපිටු ඇත්තාහු; නිගූළ්හ, සැඟවුනාවූ; ගොප්ඵා, ගොප් ඇත්තාහු; ආයත, දික්වූ, පණ්හිභාගා, විලුම්පෙදෙස් ඇත්තාහු; සමච්ඡමායං, සමබිමෙහි; සකලං, සියලු අවයව සහිතව; පතිට්ඨිතා, පිහිටියාහු; සුච්ඡවිතා, සුබුම්වූ ඡවි ඇති බැවින්; රජාදි, රජසාදිය; නලිම්පතෙ, නොතැවරෙසි.

762. සම්මත්ත, මත්වූ; හත්ථි, ඇත්ය; උසභ, වෘෂභය; හංස, හංසය; සීහ, සිංහය; සමානලීලාය, යනමොවුන් වැනිවූ ලීලා (ශොභා) යෙන්; යහිං, යම් පෙදෙසෙක්හි; පයාති, වඩනේද; (ඒ පෙදෙස්හි); නින්නුන්නතා භූමි, වළගොඩබිම්; භෙරිතලා ඉව, බෙරඇස් මෙන්; හොති, (සම) වේ; අථ, ඉක්බිති; පුප්ඵාදිසුමණ්ඩිතා ච, පුෂ්පාදියෙන් අලඞ්කෘතද වේ.

763. ඛාණු, කණුද; සකණ්ටමූලා, කටුමුල් සහිතවූ; සබ්බ කඨලා ච, සියලු කැබිලිතිද; සයමෙව, තුමූම; මග්ගා, මාර්ගයෙන්; අපෙන්ති, පහවෙත්; ගම්භීරනීර, ගැඹුරුජලාවාට හා; ආපග, ගඞ්ගාය; පඞ්ක, කර්දමය යන; දුග්ගා, දුර්ගස්ථානයෝ; සභාවං හිත්වා, (තපුරු) ස්වභාව හැර: රමණීයං, සිත්කළුබවට ; එන්ති, පැමිණෙත්.



ශ්‍රී ලංකා ජාතික පුස්ත

764. වජන්ති භූමිං ගිරයො පුරත්ථ
පසාරිතෙ පාදවරෙ ජිනස්ස,
නිබ්බාති අග්ගි නරකොදරෙපි
ගණ්හන්ති පාදෙ පදුමාදයො ච.

765. ඉදං හි තෙ පාදතලෙ යතීස
සනාභිනෙමිසපිකාවලීහි,
සුසණ්ඨිතං චාරසහස්සවන්තං
සන්දිස්සතෙ චක්කවරං මහන්තං.

766. තමෙව චක්කං පරිවාරයිත්වා
සිරිවච්ඡසොවත්ථිවතංසකා ච,
පාසාදභද්‍රාසනපුණ්ණපාති
සිතාතපත්තාසිමයූරහත්ථා.

---

764. ජිනස්ස, සර්වඥයන්වහන්සේගේ; පාදවරෙ, උතුම් ශ්‍රීපාදය; භූමිං පසාරිතෙ, බිමට දිගුකළ කල්හි; ගිරයො, පර්වතයෝ; පුරත්ථ, ඉදිරියෙහි; වජන්ති, යෙත්; නරකොදරෙඅපි, නරකාභ්‍යන්තරයෙහිදු; අග්ගි, ගිනි; නිබ්බාති, නිවේ; පදුමාදයො ච, පද්මාදීහුද; පාදෙ ගණ්හන්ති, සිරිපා (පිළි) ගණිත්.

765. යතීස, යතිශ්‍රේෂ්ඨයන්වහන්ස; තෙ, නුඹවහන්සේගේ; පාදතලෙ, සිරිපාතෙලෙහි; සනාභි, නැබසහිතවූ; නෙමිසපිකාවලීහි, නිම් හා සපිකාපන්තියෙන් යුක්තවූ; සුසණ්ඨිතං, සුප්‍රතිෂ්ඨිතවූ; අරසහස්සවන්තං, අර (දැව්) දහසක් ඇති; මහන්තං, මහත්වූ; ඉදං හි චක්කවරං ච, මේ උතුම් චක්‍රලක්ෂණ යද; සන්දිස්සතෙ, පෙණේ.

766. තං එව චක්කං, ඒ චක්‍රලක්ෂණයම; පරිවාරයිත්වා, පිරිවරා; සිරිවච්ඡ, සිරිවැස (දෙක) ය; සොවත්ථි, සෝවැති (දෙක) ය; අවතංසකාච, අවතංස (දෙක) ය යන මොහුද; පාසාද, ප්‍රාසාද (දෙක) ය; භද්‍රාසන, භද්‍රපීඨ (දෙක) ය; පුණ්ණපාති, පූර්ණපාත්‍ර (දෙක) ය; සිතාතපත්ත, ශ්වෙතච්ඡත්‍ර (දෙක) ය; අසි, ඛඩ්ග (දෙක) ය; මයූරහත්ථා, මයූරහස්ත (දෙක) යන මොහුද.

767. නීලාදිභෙදකමලුප්පලා ච
සමෙරු සත්තද්දි මහාසමුද්දා
සත්තාපගා සත්ත මහාසරා ච
හිමාලයො චක්කවාළද්දිකො ච.

768. චන්දක්කතාරා ච ඡදෙවලොකා
පිතාමහාවාසමනුස්සලොකං,
සුවණ්ණනාවා සිවිකා ච සඞ්ඛං
කෙලාසසෙලං ධජතොරණා ච.

769. චින්තාමණුණ්හීසසවච්ඡධෙනු
මීනද්වයං චක්කවත්ති සසෙතො,
සීහස්සමාතඞ්ගවියග්ඝරාජා
හංසොසභො කිම්පුරිසො මයූරො.

---

767. නීලාදිභෙද, නීලාදි ප්‍රභෙදවූ; කමලුප්පලා ච, කමලුපුල්ද; සමෙරු, මහාමෙරුපර්වත සහිතවූ; සත්තද්දි, සප්ත කුල පර්වතය; මහාසමුද්දා, සප්තමහාසාගරය යන මොහුද; සත්ත ආපගා, සප්තමහාගඞ්ගාවෝද; සත්ත මහාසරා ච, සප්ත මහා තඩාගයෝද; හිමාලයො ච, හිමාලය පර්වතයද; චක්කවාළද්දිකො ච, චක්‍රවාට පර්වතයද.

768. චන්දක්කතාරා ච, සඳ හිරු තරුද; ඡදෙවලොකා, සදෙව්ලෝද; පිතාමහාවාස, බඹලොව හා; මනුස්සලොකං, මිනිස්ලොවද; සුවණ්ණනාවා, සුවර්ණනෞකාද; සිවිකා ච, සිවිගේද; සඞ්ඛං, හක්ද; කෙලාසසෙලං, කෙලෙස්කුළද; ධජතොරණා ච, දද හා තොරන්ද.

769. චින්තාමණි, සිතුමිණිය; උණ්හීස, උෂ්ණීෂපට්ටය; සවච්ඡ, වසුසහිතවූ; ධෙනු, දෙනය යන මොහුද; මීනද්වයං, මත්ස්‍යයුගලය; සසෙතො, සෙතාසහිතවූ; චක්කවත්ති, සක්විතිරජය; සීහ, සිංහය; අස්ස, අශ්වය; මාතඞ්ග, හස්තිය; වියග්ඝරාජ, ව්‍යාඝ්‍රරාජය යන මොහුද; හංසො, හංසය; උසභො, වෘෂභය; කිම්පුරිසො, කින්නරය; මයූරො, මොණරය (යන මොහුද).

770. කොඤ්චා ච එරාවණහත්ථිරාජා
සචක්කවාකා මකරාදයො ච,
නානාමහාමඞ්ගලලක්ඛණා තෙ
විරොචමානා විලසන්ති නිච්චං.

771. ජාතක්ඛණෙ යස්ස මහිං පහෙජ්ජ
විසාලසත්තුද්දයපඞ්කජානි,
පටිග්ගහෙසුං චරණානි යානි
තෙ තානිමානවජ්ජරියානි ලොකෙ.

772. චන්දුපනත්ථායුපනීතකාලෙ
පිතූහි තෙ දෙවලතාපසිඳ්ඳං,
පාදානි ගන්ත්වාන ජටාසු තස්ස
ආසුං තවෙතඞ්ඝියුගං අහො හො.

---

770. කොඤ්චා ච, කොස්වාලිහිණිද ; එරාවණහත්ථිරාජා, එරාවණ හස්තිරාජද ; සචක්කවාකා, චක්‍රවාකසහිතවූ ; මකරාද යොච, මොරාදීහුද (යන) ; විරොචමානා, බබලන්නාවූ ; තෙ නානා මහාමඞ්ගලලක්ඛණා, ඒ නොයෙක් මහමඟුල් ලකුණු ; නිච්චං, සතතයෙන් ; විලසන්ති, බබලත්.

771. යස්ස, යම් බෝසතාණෝ ; ජාතක්ඛණෙ, උපන් කෙණෙහි ; මහිං, පෘථිවිය ; පහෙජ්ජ, පළා(නැගී) ; විසාල, මහත්වූ ; සත්තුද්දයපඞ්කජානි, සත්බුමුපියුම් ; යානි චරණානි, යම් පාද යන් ; පටිග්ගහෙසුං, පිළිගත්තාහුද ; තෙ, තුඹවහන්සේගේ ; තානි ඉමානි, ඒ මේ ශ්‍රීපාදයෝ ; ලොකෙ, ලොකයෙහි ; අච්ඡ රියානි, ආශ්චර්‍ය්‍ය(රූප)යෝසි.

772. තෙ, තුඹවහන්සේගේ ; පිතූහි, මව්පියන් විසින් ; දෙවලතාපසිඳ්ඳං, දෙවලතාපසශ්‍රෙෂ්ඨයා ; චන්දුපනත්ථාය, වන් දවනුපිණිස, උපනීතකාලෙ, (තුඹවහන්සේ) එළඹවූකල්හි ; පාදානි, ශ්‍රීපාදයෝ ; ගන්ත්වාන, ගොස් ; තස්ස, ඒ තවුසානන් ගේ ; ජටාසු, දළමඬුල්ලෙහි ; ආසුං, වූහ ; හො, හවත්නි ; තව, තුඹවහන්සේගේ ; එතං අඞ්ඝියුගං, මේ ශ්‍රීපාදයුගමය ; අහො, විස්මයයසි (විස්මයජනකයි).

773. සුද්ධොදනව්හයස්ස නරාධිපස්ස
සනෙත්තාසතොයෙහි පපූරිතස්ස,
සිරෙවිසුද්ධම්බුරුහාකරස්ස
සමොරුහාසුං චරණානි තුය්හං.

774. යෙ චඞ්කමෙ චඞ්කමණාවසානෙ
ඔනම්ම මෙරූදයපබ්බතින්දා,
පටිග්ගහෙසුං චරණානි යානි
තෙ තානිමානච්ඡරියානි ලොකෙ.

775. යං වන්දමානො තිදිවාධිපො සො
යස්සානුභාවෙන ගතායුකොපි,
සකීයඨානෙ'සි පුනාපි තෙ'වං
පාදම්බුජං ධීර මහානුභාවං.

---

773. තුය්හං, නුඹවහන්සේගේ; චරණානි, ශ්‍රීපාදයෝ; සනෙත්තාසතොයෙහි, සතුටු (කඳුළු) දියෙන්; පපූරිතස්ස, පිරුණාවූ; සුද්ධොදනව්හයස්ස, ශුද්ධොදනනම්වූ; නරාධිපස්ස, නරනිඳුන්ගේ; සිරෙවිසුද්ධම්බුරුහාකරස්ස, ශිරස් නැමැති පරිශුද්ධපද්මාකරයාගේ; සමොරුහා ආසුං, පදමයෝ වූහ.

774. චඞ්කමෙ, (රතන) චඞ්ක්‍රමණයෙහි; චඞ්කමණාවසානෙ, සක්මන්කෙළවර; යෙ, යම්; මෙරූදයපබ්බතින්දා, මෙරු උදය යන පර්වතරාජයෝ; ඔනම්ම, නැමී; යානි චරණානි, යම් පාදයන්; පටිග්ගහෙසුං, පිළිගත්තාහුද; තෙ, නුඹවහන්සේගේ; තානි ඉමානි, ඒ මේ ශ්‍රීපාදයෝ; ලොකෙ, ලෝකයෙහි; අච්ඡරියානි, ආශ්චර්ය්‍යජනකයෝයි.

775. යං, යම් ශ්‍රීචරණයක්; වන්දමානො, වඳනාවූ; සො තිදිවාධිපො, ඒ ශක්‍රදෙවෙන්ද්‍රතෙමේ; ගතායුකො අපි, ගෙවුනු ආයු ඇත්තේ නමුත්; යස්ස, යම් ශ්‍රීචරණයකගේ; අනුභාවෙන, අනුභාවයෙන්; පුනාපි, නැවතත්; සකීයඨානෙ අසි, ස්වකීය ස්ථානයෙහි වීද; ධීර, ප්‍රාඥයින්වහන්ස; තෙ, නුඹවහන්සේගේ; පාදම්බුජං, ඒ පාපියුම; එවං මහානුභාවං, මෙසේ මහත් අනුභාව ඇත්තේයි.

776. දෙහීනමග්ගොපි නිසාකරාරි
මානුන්නතො සො සසිතස්ස තුය්හං,
පාදස්ස අන්තම්පි න සක්ඛි දට්ඨුං
අච්ඡෙරරූපං ඉදමඞ්ඝිකඤ්ජං.

777. ගඞ්ගාය ගඞ්ගාපති සන්නිධානෙ
තීරෙ තදා නම්මදජ්ඣගස්ස,
පාදස්ස ලඤ්ඡං අකරී මුනින්ද
මය්හංපි හොතං කරුණා තවෙසා.

778. ආරාධිතො සච්චකතාපසෙන
අකා තුවං සච්චබද්ධසෙලෙ,
පාදස්ස ලඤ්ඡං ජගතො හිතාය
මය්හම්පි හොතං තමනුග්ගහෙන.

---

776. දෙහීනං, සත්වයන්ට; අග්ගො, (කසින්) අග්‍රවූ; මානුන්නතො, මානොන්නතවූ; සො නිසාකරාරි අපි, ඒ චන්ද්‍ර ශත්‍රෘ (රාහුඅසුරෙන්ද්‍ර) තෙමේද; සසිතස්ස, ශයනස්ථවූ; තුය්හං, තුඹවහන්සේගේ; පාදස්ස, ශ්‍රීපාදයාගේ; අන්තං අපි, අන්තයද; දට්ඨුං, දක්නට; න සක්ඛි, නොහැකිවිය; ඉදං, මේ; අඞ්ඝිකඤ්ජං, (තුඹවහන්සේගේ) ශ්‍රීපාදපද්මය; අච්ඡෙරරූපං, (මෙසේ) ආශ්චර්‍ය්‍යස්වරූපයි.

777. තදා, එකල්හි; ගඞ්ගාය, ගඞ්ගාව හා; ගඞ්ගාපතිසන්නිධානෙ, මුහුදඑකතුවූතන්හි; නම්මදජ්ඣගස්ස තීරෙ, නම්මදා නම් ගංතෙර; පාදස්ස ලඤ්ඡං, සිරිපාලකුණ; අකරී, (ලෝසත්නට හිතපිණිස) කළසේක්ද; මුනින්ද, මුනීන්ද්‍රයනවහන්ස; තව, තුඹවහන්සේගේ; එසා කරුණා, මේ කරුණාතොමෝ; මය්හං අපි, මටද; හොතං, වේවා.

778. සච්චකතාපසෙන, සච්චකතවුසානන් විසින්; ආරාධිතො, ආයාචනා කරණලද්දවූ; තුවං, ඔබවහන්සේ; ජගතො හිතාය, ලෝවැස්සාට හිතපිණිස; සච්චබද්ධසෙලෙ, සච්චබද්ධපර්වතයෙහි; පාදස්සලඤ්ඡං, ශ්‍රීපාදලාඤ්ඡනය; අකා, කළසේක; තෙ, තුඹවහන්සේගේ; තං අනුග්ගහං, ඒ අනුග්‍රහය; මය්හංඅපි, මටද; හොතං, වේවා; (භවත්) තං, ඒ සිරිපාලකුණ; මය්හං අපි, මටද; අනුග්ගහං හොතං, අනුග්‍රහ ඇතිවේවා.

779. සුත්වාන නාථො ගිරමෙතමස්ස
පස්සං මහාභූතිමනාගතෙසු,
ලොකස්ස ලොකෙහි මහීයමානො
අකාසි වාමෙන පදෙන ලඤ්ඡං.

780. සම්බොධිතො අට්ඨමසාරදස්මිං
වෙසාඛමාසෙ මුනි පුණ්ණමායං,
පාදස්ස'භිලක්ඛණමකාපරණ්හෙ
සදෙවකෙ සස්සමණෙ මහෙන්තෙ.

781. පතඞ්ගිකා සිත්ථකම්මත්ථකම්හි
යථාඞ්කිතා ඛත්තියමුද්දිකාය,
ආසෙවමෙවං ජිනපාදලඤ්ඡං
සමන්තකූටම්හි නමස්සනීයං.

---

779. නාථො, ලොකස්වාමිවූ බුදුරජතෙම; අස්ස, ඒ සමන් දෙවිහුගේ; එතං ගිරං, මෙවදන්; සුත්වාන, අසා; අනාගතෙසු, මතුවනකාලයෙහි; ලොකස්ස, ලොකයාට; මහාභූතිං, මහත් ඓශ්වර්‍ය්‍ය (සම්පත්)ය; පස්සං, බලා වදාරණසේක්; ලොකෙහි, ලෝවැස්සන් විසින්; මහීයමානො, පුදනලබමින්; වාමෙන පදෙන, වාමපාදයෙන්; ලඤ්ඡං අකාසි, ලාඤ්ඡනය (සලකුණු) කළසේක.

780. මුනි, සර්වඥතෙම; සම්බොධිතො, සම්‍යක්සම්බොධියෙන් (බුදුවීමෙන්); අට්ඨමසාරදස්මිං, අටවෙනි අවුරුද්දෙහි; වෙසාඛමාසෙ, වෙසක්මසැ; පුණ්ණමායං, පෞර්ණමාසීයෙහි; අපරණ්හෙ, අපරාහ්න (සන්ධ්‍යාකාල) යෙහි; සස්සමණෙ, ශ්‍රමණයන් සහිතවූ; සදෙවකෙ, දෙවියන් සහිත ලොකයා; මහෙන්තෙ, පුදනකල්හි; පාදස්ස, ශ්‍රීපාදයාගේ; අභිලක්ඛණං, සලකුණ; අකා, කළසේක.

781. සිත්ථකම්මත්ථකම්හි, ඉටිමත්තෙහි; පතඞ්ගිකා, එනම් ක්ෂුද්‍රමක්ෂිකාතොමෝ; ඛත්තියමුද්දිකාය, ක්ෂත්‍රියමුද්‍රිකායෙන්; යථා අඞ්කිතා, යම්සේ මුද්‍රණය (සලකුණු) කරණලද්දීද; එවං එව, එපරිද්දෙන්ම; සමන්තකූටම්හි, සමන්තකූට පර්‍වතයෙහි; නමස්සනීයං, නමස්කාර කටයුතුවූ; ජිනපාදලඤ්ඡං, බුදුන් සිරිපාලකුණ; ආසි, වී.

782. අකාලමෙඝො ච තතො පවස්සි
වස්සිංසු නානාරතනානි බ්‍රහ්මා,
තථා පරිතො* කුසුමම්බරානි
සුවණ්ණවුණ්ණානි ජිනෙකවණ්ණෙ.

783. තතො පහන්ත්වා සුගතෙහගාමී
තස්මිං නිතම්බෙ ගිරිගබ්භරියං,
දිවාවිහාරිය නිසිදී යත්ථ
සුපාකටං තං 'භගවාගුහා'ති.

784. තතො'රහන්තා සුගතොරසා තෙ
ගන්ධාදිනා සාධු මහෙත්ව සබ්බෙ
වන්දිත්ව කත්වාන පදක්ඛිණන්තං
තහිං තහිං කංසු දිවාවිහාරං.

---

782. තතො, ඉක්බිති; අකාලමෙඝො ච, නොකල්වැස් සද; පවස්සි, වැස්සේය; බ්‍රහ්මා, අහසින්; නානාරතනානි, අනෙක රතනයෝ; වස්සිංසු, වැස්සාහ; තථා, එසේම; පරිතො, හාත්පස; ජිනෙකවණ්ණෙ, බුදුන්සම වණීණ ඇති; කුසුමම්බරානි, ' මල්සළු; සුවණ්ණවුණ්ණානි, රන්සුණුද; (වස්සිංසු, වැස්සාහුයි).

783. තතො, ඉක්බිති; ඉහගාමී, ගජගාමිවූ; සුගතො, සර්වඥතෙම; අපගන්ත්වා, වැඩ; තස්මිං නිතම්බෙ, ඒ පර්වතප්‍රාන්ත යෙහි හෝ පාර්ශ්වයෙහි ; යත්ථ ගිරිගබ්භරියං, යම් ගල්ගුහා වෙක්හි; දිවාවිහාරිය, දිවාවිහරණයට ; නිසිදී, වැඩහුන් සේක්ද; තං, ඒ ගුහාස්ථානය; භගවාගුහා ඉති, "භගවා ගුහා" යයි; සුපාකටං, අතිප්‍රකටයි.

784. තතො, ඉක්බිති; අරහන්තා, අර්හත්වූ; සබ්බෙ, සියලු; තෙ සුගතොරසා, ඒ සර්වඥපුත්‍රයන් වහන්සේලා; ගන්ධාදිනා, සුගන්ධාදියෙන්; සාධු, මනාකොට; තං, උන් වහන්සේ; මහෙත්වා, පුදා; වන්දිත්වා, වැඳ; පදක්ඛිණං කත්වාන, පැදකුණු කොට; තහිං තහිං, තන්හි තන්හි; දිවා විහාරං, දිවාවිහරණය; අකංසු, කළාහුයි.

---

* "තථොපරිසො."

785. ලතාඞ්ගනායො විටපීධවාන
මාලම්බ සාඛාපුථුලංසපස්සෙ,
සුඵුල්ලමඤ්ජූකරමඤ්ජරීහි
නමස්සමානාව සදොනතග්ගා.

786. තිට්ඨන්ති රුක්ඛා* නටකාව තත්ථ
සුඵුල්ලසාඛාකරමුක්ඛිපිත්වා,
නමස්සමානා විය ඔනතග්ගා
වත්තන්තිමානච්ඡරියානි නිච්චං.

787. තථෙව උච්චාවචපබ්බතා ච
නමස්සමානා විය පාදලඤ්ඡං,
තිට්ඨන්ති නින්නතග්ගසිඛා සමන්තා
ඉදම්පි නිච්චබ්භුතමෙව තත්ථ.

---

785. ලතාඞ්ගනායො, ලියගෙනෝ; විටපීධවානං, වෘක්ෂ නැමැති හිමියන්ගේ; සාඛා, අතු නැමැති; පුථුල, පළල්වූ; අංසපස්සෙ, දසරැපස; සුඵුල්ල, සුපිපියාවූ; මඤ්ජූ, මනොඥවූ; කරමඤ්ජරීහි, මල්කැන් නැමැති අත්වලින්; අලම්බ, එල්බ ගෙණ; නමස්සමානා ඉව, (සිරිපාලකුණ) වඳින්නියන් මෙන්; සද, හැමකල්හි; ඔනතග්ගා, නැමුනු අග් ඇතිවෙත්.

786. තත්ථ, එහි; රුක්ඛා, වෘක්ෂයෝ; සුඵුල්ල, සුපිපියාවූ; සාඛාකරං, අතුඅත්; උක්ඛිපිත්වා, ඔසවාගෙණ; නටකා ඉව, නළුවන්මෙන්; තිට්ඨන්ති, සිටිත්; ඔනතග්ගා, අවනතවූ අග් ඇත්තාහු; නමස්සමානා විය, (සිරිපාලකුණ) වඳින්නවුන්මෙන් (සිටිත්); ඉමානි අච්ඡරියානි, මේ ආශ්චර්ය්‍යයෝ; නිච්චං, නිතර; වත්තන්ති, (එහි) පවතිත්.

787. තථෙව, එසේම; නින්නතග්ගසිඛා, නැමුනු අග්සිළු ඇති; උච්චාවචපබ්බතා ච, කුඩුමහත් පර්වතයෝද; පාදලඤ්ඡං, සිරිපාලකුණ; නමස්සමානා විය, වඳින්නවුන්මෙන්; සමන්තා, හාත්පසැ; තිට්ඨන්ති, සිටිත්; ඉදං අපි, මේද; තත්ථ, එහි; නිච්ච බ්භුතං එව, නිතිපවත්නා විස්මයමැයි.

---

* "විටපී."

788. තස්මිං නගෙ පාදවරඞ්කිතස්මිං
බලමණ්ඩලොකාසපදෙසමත්තෙ (26),
සමොසරණෙන බහූකෙ ජනෙපි
හොතෙව ඔකාසමහො පදඞ්කං.

789. සමොසරිත්වාන මහෙත්ව සන්තෙ
නික්ඛන්තමත්තෙ ජලදෙ සමෙච්ච,
සොධෙන්ති මාලම්බුවහෙහි සාධු
ඉදම්පි නිච්චබ්භුතමෙව තත්ථ.

790. පාදෙන ඵුට්ඨස්ස සිලාතලස්ස
එතාදිසානච්ඡරියානි හොන්ති,
ලොකෙකනාථස්ස අනාසවස්ස
මහබ්භුතං කො නු කථං භණෙය්‍ය.

---

788. පාදවරඞ්කිතස්මිං, ශ්‍රීපාදයෙන් විහනිතවූ; තස්මිං නගෙ, ඒ පව්වෙහි; බලමණ්ඩලඔකාසපදෙසමත්තෙ, කලවිටක් පමණ අවකාශඇති පෙදෙසෙහි; බහූකෙ ජනෙ, බොහෝවූ ජනයා; සමොසරණෙනාපි, රැස්වත්ම; ඔකාසං හොති එව, අවකාශවේමය; පදඞ්කං, චරණලක්ෂණය; අහො, විස්මයයකි.

789. සන්තෙ, සත්වයන්; සමොසරිත්වාන, රැස්ව; මහෙත්වා, පුදා; නික්ඛන්තමත්තෙ, නික්මුනුකල්හි; ජලදෙ, මෙඝයෝ; සමෙච්ච, කැටිව; අම්බුවහෙහි, ජලවාහීයෙන්; මාලං, මලුව; සොධෙන්ති, ශුද්ධකෙරෙත්; ඉදං අපි, මෙද; තත්ථ, එහිවූ; නිච්චබ්භුතං එව, නිරන්තර විස්මයමැයි.

790. පාදෙන ඵුට්ඨස්ස, ශ්‍රීපාදයෙන් ස්පර්ශීකරණලද; සිලාතලස්ස, ගල්තලහුගේ; අච්ඡරියානි, ආශ්චර්යයෝ; එතාදිසානි හොන්ති, මෙබඳුවෙත්; අනාසවස්ස, ක්ෂීණාශ්‍රවවූ; ලොකෙකනාථස්ස, ත්‍රෛලොක්‍යෛකස්වාමීන්වහන්සේගේ; මහබ්භුතං, මහත් විස්මය; කො නු, කවරෙක්නම්; කථං, කෙසේ; භණෙය්‍ය, කියාද නොකියාමැයි.

791. දිවාවිහාරං භගවා සසඞ්ඝො
කත්වාන තස්මිං පන කිඤ්චිකාලං,
මහීයමානෙසු (?) සදෙවකෙසු
තතො ගතො රොහණමම්බරම්හා.

792. තස්මිං සසඞ්ඝො මුනි දීඝවාපියං
ථූපස්ස ඨානෙ පරමාය භූමියා,
ගරුං කරොන්තො පන තං මහීතලං
නිරොධභාවෙන නිසීදි සත්‍රජො.

793. තතො'නුරාධං භගවා නභම්හා
ගන්ත්වාන බොධිට්ඨිතභූමියා ච,
ඨානෙ මහාමඞ්ගලචෙතියස්ස*
තථෙව අක්ඛනිහිතස්ස ඨානෙ.

---

791. සසඞ්ඝො, ශ්‍රාවක සඞ්ඝයා සහිතවූ ; භගවා, භාග්‍යවතුන්වහන්සේ; තස්මිං පන, ඒ භගවා ලෙනෙහි; කිඤ්චිකාලං, මඳවේලාවක්; දිවාවිහාරං කත්වාන, දිවාවිහරණය කොට; සදෙවකෙසු, දෙවියන් සහිත ලොකයා; මහීයමානෙසු, පුද කරත්ම; තතො, එතනින් නික්ම; අම්බරම්හා, අහසින්; රොහණං, රුහුණු ජනපදයට; ගතො, වැඩියේක.

792, 793. මුනි, සර්වඥතෙම; සසඞ්ඝො, ශ්‍රාවක සඞ්ඝසහිතවූසේක්; තස්මිං, එහිදී; දීඝවාපියං, දිඝාවැවෙහි; ථූපස්ස ඨානෙ, චෛත්‍යස්ථානයෙහි; පරමාය භූමියා, උතුම් බිමෙහි වූ; තං පන මහීතලං, ඒ මිහිතලය; ගරුං කරොන්තො, ගරුකරමින්; නිරොධභාවෙන, නිරොධ සමාපත්තියෙන්; නිසීදි, වැඩහුන්සේක.—තතො, ඉක්බිති; සත්‍රජො, පුත්‍රයන් සහිතවූ; භගවා, භාග්‍යවතුන්වහන්සේ; නභම්හා, අහසින්, අනුරාධං ගන්ත්වාන, අනුරාධපුරයට වැඩ; බොධිඨිතභූමියා, සිරිමහබෝ පිහිටි බිම්හිද; මහාමඞ්ගල චෛතියස්සඨානෙ, මහමඟුල්සෑ පිහිටි තන්හිද; තථෙව, එසේම; අක්ඛනිහිතස්ස ඨානෙ, අකුදඬු තැන්පත්කල තන්හිද :—

---

* "චෙතියම."

794. නිසීදි පත්වාන නිරොධපීතිං
සසාවකො පෙක්ඛමනාගතද්ධං,
පතිට්ඨිතා මෙ පන බොධිධාතූ
කරොන්ති ලොකෙති ජනස්ස වුද්ධිං.

795. වුට්ඨාය තුට්ඨො භගවා නිරොධා
ගන්ත්වා සිලාථූපවරස්ස ඨානං,
ඨිතො තහිං ධම්මමුද්දිසිත්වා *
ගන්ත්වා නභා ජෙතවනං සුරම්මං.

---

794. සසාවකො, ශ්‍රාවකයන් සහිතවූයේ; නිරොධපීතිං, නිරොධ සමාපත්තිජ ප්‍රීති සැපයට; පත්වාන, පැමිණ; නිසීදි, වැඩහුන්සේක; අනාගතද්ධං, භවිෂ්‍යත් කාලය; පෙක්ඛං, බලනසේක්; පතිට්ඨිතා පන, (මෙහි) ප්‍රතිෂ්ඨිතවූ; මෙ, මාගේ; බොධිධාතූ, බොධි හා ධාතූහු; ලොකෙ, ලොව්හිවූ; ජනස්ස, ජනයාට; වුද්ධිං, අභිවෘද්ධිය; කරොන්ති, කරත්යයි :—

795. තුට්ඨො, සන්තුෂ්ටවූ; භගවා, භාග්‍යවත්තෙම; නිරොධා වුට්ඨාය, නිරොධ සමවතින් නැගිට; සිලාථූපවරස්ස ඨානං, උත්තම ශෛලචෛත්‍ය ස්ථානයට; ගන්ත්වා, වැඩිසේක්; තහිං, එහි; ඨිතො, වැඩසිටිසේක්; අථ, ඉක්බිති; ධම්මං උද්දිසිත්වා, දහම් දෙසා; නභා, අහසින්; සුරම්මං, අතිරම්‍යවූ; ජෙතවනං, ජෙතවන මහාවිහාරයට; ගන්ත්වා, වැඩිසේක.

---

* “ධම්මමදෙසයිත්වා.”

796. එවං සො ධම්මරාජා ජනහිතවිහිතො විත
මදොසාරිවග්ගො
ලඞ්කාරාමාය රම්මෙ සුමනගිරිසිරෙ'කාසි යං
පාදලඤ්ඡං,
තං වො සග්ගාපවග්ගං දදති මුනිසමං චින්ත
මත්තෙන පසන්නා
තස්මා භො භො පහට්ඨා නමථ මහථ තං සාධු
සාධුප්පසත්ථං.

ඉති සමන්තකූටවණ්ණනා නිට්ඨිතා.

---

796. එවං, මෙසේ; සො ධම්මරාජා, ඒ ධර්මරාජයන්වහන්සේ; ජනහිතවිහිතො, ජනයාකෙරෙහි කළ හිතවැඩ ඇතිසේක්; විතමදොසාරිවග්ගො, පහකළ වෙෂ නැමැති ශත්‍රුවර්‍ගයා ඇතිසේක්; ලඞ්කාරාමාය, ලඞ්කා ලක්‍ෂ්මියගේ; රම්මෙ, රම්‍ය ස්ථානවූ; සුමනගිරිසිරෙ, සමන්පව් මුදුන්හි; යං පාදලඤ්ඡං, යම් සිරිපා ලකුණක්; අකා, (ස්ථාපනය) කළසේක්ද; තං, ඒ ශ්‍රීපාද ලාඤ්ඡනයතෙම; චින්තමත්තෙන, චින්තාමාත්‍රයක්; පසන්නා, පහන්කල්හිම; වො, යුෂ්මතුන්ට; මුනිසමං, මුනිඳුන් මෙන්; සග්ගාපවග්ගං, ස්වර්ගාපවර්ග සැප; දදති, දෙනසේක; තස්මා, එහෙයින්; භො භො, භවත් භවත්නි; පහට්ඨා, පහටුවූවාහු; සාධුප්පසත්ථං, සජ්ජනයන් විසින් පසස්නාලද; තං, ඒ චරණබධාතුව; සාධු, මනාකොට; නමථ, වඳිව්; මහථ, පුදව්.

මෙතෙකින් සමන්තකූටවණ්ණනා නම් මාගධී පද්‍යප්‍රබන්ධය සමාප්තයි.

## ග්‍රන්ථසමාප්තිය.

1. අනන්තරා සමත්තායං සුමනද්දිසුවණ්ණනා,
තථෙව සාධුසඞ්කප්පා ඛිප්පං පප්පොන්තු පාණිනං.

2. යො යාචිතො'රඤ්ඤවාසී ගුණධාරසුධීමතා,
රාහුලත්ථෙරනාමෙන විස්සුතෙන මහීතලෙ

3. භුවනොදරමහි පඤ්ඤාතො රවිවම්බරමණ්ඩලෙ,
අරඤ්ඤරතනානන්ද මහාථෙරො මහාගණී.

4. ජීවිතං විය යො සත්ථුසාසනස්ස මහාකවි,
සාරො සුප්පටිපත්තීසු සත්ථසාගරපාරගො.

---

1. අනන්තරා, පරස්පර විලක්ෂණත්ව රහිතවූ හෝ ඇවජී දුවූ; අයං සුමනද්දිසුවණ්ණනා, මේ **සමන්තකූට වර්ණනා** තොමෝ; සමත්තා, (මෙතෙකින්) සමාප්තයි; තථෙව, එසේම; පාණිනං, සත්වයන්ගේ; සාධුසඞ්කප්පා, යහපත් සඞ්කල්පයෝ; ඛිප්පං, වහා; පප්පොන්තු (මුදුන්) පැමිණෙත්වා.

2. යො, යමෙක්තෙම; අරඤ්ඤවාසී, වනවාසීවූ; ගුණධාර, සද්ගුණයන්ට ආධාරවූ; සුධීමතා, සුන්දර ප්‍රඥාතිශය ඇති; මහීතලෙ, මිහිතෙලෙහි; විස්සුතෙන, ප්‍රසිද්ධවූ; රාහුලත්ථෙරනාමෙන, රාහුලස්ථවිරයන්වහන්සේ විසින්; යාචිතො, (මේ ප්‍රබන්ධනය කරණුපිණිස) ආරාධනා කරණලද්දේද:—

3, 4. මහාගණී, මහත් ගණයා ඇත්තාවූ; යො අරඤ්ඤරතනානන්ද මහාථෙරො, යම් වනරතනානන්දාභිධාන මහා ස්ථවිරොත්තම කෙනෙක්; අම්බරමණ්ඩලෙ, නභොමණ්ඩලයෙහි; රවි ඉව, හිරු මෙන්; භුවනොදරමහි, ලොකාභ්‍යන්තරයෙහි; පඤ්ඤාතො, ප්‍රසිද්ධද; සත්ථු සාසනස්ස, ශාස්තෘශාසනයාගේ; ජීවිතං විය, ජීවිතෙන්ද්‍රිය බඳුද; මහා කවි, මහා පණ්ඩිතද; සුප්පටිපත්තීසු, මනා පිළිවෙත්හි; සාරො, සාරද; සත්ථසාගරපාරගො, ශාස්ත්‍රාර්ණවයාගේ පාරප්‍රාප්තද :—

5. තස්ස සිස්සො'සි යො විප්පගාමවංසෙකකෙතුකො,
සද්ධාගමො'රඤ්ඤවාසී සීලාදිගුණභූසණො.

6. යො'කා සීහලභාසාය සීහලං සද්දලක්ඛණං,
තෙන වෙදෙහථෙරෙන කතායම්පියසීලිනා.

සිද්ධිරත්ථු.

---

5. තස්ස, උන්වහන්සේගේ; සිස්සො, ශිෂ්‍යවූ; විප්පගාමවංසෙකකෙතුකො, බ්‍රාහ්මණවංශයට අද්විතීය ධ්වජයක් වැනිවූ; සද්ධාගමො, දන්නාලද ආගමශාස්ත්‍ර ඇති; අරඤ්ඤවාසී, වනවාසීවූ; සීලාදිගුණභූසණො, සීලාදි සද්ගුණම ආභරණකොට ඇති; යො අසි, යමෙක් වීද :—

6. යො, යමෙක්තෙම; සීහලභාසාය, හෙළදිව් බසින්; සීහලං සද්දලක්ඛණං, සිංහල ශබ්දලක්ෂණය; අකා, කෙළේද; පියසීලිනා, ප්‍රියශීලිවූ; තෙන වෙදෙහථෙරෙන, ඒ වෛදෙහ ස්ථවිරයන්වහන්සේ විසින්; අයං, මේ සමන්තකූට වණ්ණනා තොමේ; කතා, කරණලදී.

නිමි.

H. C. COTTLE, GOVERNMENT PRINTER, COLOMBO, CEYLON.